249 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 249 - இல. 3
Volume 249 - No. 3

2016 නොවැම්බර් 22 වන අඟහරුවාදා
2016 நவம்பர் 22, செவ்வாய்க்கிழமை
Tuesday, 22nd November, 2016

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
වවුනියාව ශන්මුගපුරම් ප්‍රදේශයේ යටිතල පහසුකම්

**එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානයේ නියමය:**
විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**විසර්ජන පනත් කෙටුම්පත, 2017 -[නවවන වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 126, 207, 209, 212, 213 (අධ්‍යාපන); ශීර්ෂ 163, 206, 208, 226, 227 (අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු)]- කාරක සභාවේදී සලකා බලන ලදී.

**කල් තැබීමේ යෝජනාව:**
ජාතික විගණන සේවා පනත් කෙටුම්පත සම්මත කිරීමේ ප්‍රමාදය

---

# பிரதான உள்ளடக்கம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
வவுனியா சண்முகபுரம் கிராமத்திற்கான அடிப்படை வசதிகள்

**ஐக்கிய நாடுகளின் கல்வி, அறிவியல் மற்றும் கலாசார அமைப்பின் தீர்மானம்:**
வெளிநாட்டலுவல்கள் அமைச்சரின் கூற்று

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2017 [ஒதுக்கப்பட்ட ஒன்பதாம் நாள்] :**
[தலைப்புகள் 126, 207, 209, 212, 213 (கல்வி); தலைப்புகள் 163, 206, 208, 226, 227 (உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள்)] – குழுவில் ஆராயப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
தேசிய கணக்காய்வுச் சட்டமூலத்தை நிறைவேற்றுவதிலான தாமதம்

---

# PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

PUBLIC FINANCE COMMITTEE REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Infrastructure Facilities in Shanmugapuram, Vavuniya

RESOLUTION BY UNITED NATIONS EDUCATIONAL, SCIENTIFIC AND CULTURAL ORGANIZATION:
Statement by Minister of Foreign Affairs

APPROPRIATION BILL, 2017 - [Ninth Allotted Day]:
Considered in Committee - [ Heads 126, 207, 209, 212, 213 (Education); Heads 163, 206, 208, 226, 227 (Internal Affairs, Wayamba Development and Cultural Affairs)]

ADJOURNMENT MOTION:
Delay in Passage of National Audit Bill

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2016 නොවැම්බර් 22 වන අඟහරුවාදා*
*2016 நவம்பர் 22, செவ்வாய்க்கிழமை*
*Tuesday, 22nd November, 2016*

---

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [ மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව-

2012 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ V කොටස;

2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ I කොටස;

2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IV හා V කොටස්, දෙවැනි කාණ්ඩයේ XVII කොටස හා තුන්වැනි කාණ්ඩයේ V කොටස; සහ

2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ I සහ II කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ் சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீர மைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා 2015 වර්ෂය සඳහා ජනාධිපති කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, කාරක සභා වාර්තා පිළිගැන්වීම.

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Speaker, I am pleased to present the Report of the Committee on Public Finance on Assessment of the Fiscal, Financial and Economic Assumptions of the Budget 2017. The Report has been tabled, Sir. I wish to say a few words with regard to this Report since this is the first Report this Committee is presenting.

We were mandated by the Resolution to present this Report within four days of the presentation of the Budget.

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

Although the Committee worked without a Parliamentary Budget Office this year, we are indebted to the service rendered to us by a few individuals - Dr. (Mrs.) Anila Dias Bandaranaike, Mrs. Rose Cooray, Mr. Themiya Hurulle, Mr. Sarath Mayadunne and a team of economists working through Verité Research headed by Dr. Nishan de Mel - who gave their invaluable input and assistance without any remuneration.

I have highlighted one or two matters in the introduction. We were given a set of figures on the 2nd of November, which later turned out to be not the basis on which the Minister of Finance presented his Budget. Thereafter, on the 12th of November, another set of figures were given to us, and now we have based our Report on that new set of figures that have been given to us. We have recommended to the Government to distribute the second set of figures that were given to us on the 12th of November to the Members, which is not published as yet. We find that the Estimates in the Red Books do not accord with the actual figures by which the Ministry of Finance is working. Therefore, we have recommended that those figures, which we have called "figures of 12th of November, 2016" be circulated to all Members of Parliament at least during the Committee Stage Discussion.

Thank you.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද අමරවීර මහතා - පැමිණ නැත.

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரவீந்திர சமவீர - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - State Minister of Labour and Trade Unions Relations)
ගරු කථානායකතුමනි, හාලිඇල, නුගසෙවනගම, කොබ්බෑකඩුව මාවත, අංක 04 ඒ දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.එම්. රණතුංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලකී ජයවර්ධන මහතා - පැමිණ නැත.

ගරු එස්.සී. මුතුකුමාරණ මහතා - පැමිණ නැත.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මොරටුව, රාවතාවත්ත පාර, අංක 102/2 ඒ දරන ස්ථානයේ පදිංචි බී.ඒ.ආර්. සෝමසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අම්පාර, නාමල්ඔය, අංක 2 බී/33 ඒ දරන ස්ථානයේ පදිංචි කේ. කරුණාසේන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) දෙහිඅත්තකණ්ඩිය, බක්මීදෙණිය අංක 320 දරන ස්ථානයේ පදිංචි විජේරත්න සුදසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1-535/'16 (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සේවක අර්ථ සාධක අරමුදල් ගිණුම් : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
### ஊழியர் சேமலாப நிதியக் கணக்குகள் : திருகோணமலை மாவட்டம்
### EMPLOYEES' PROVIDENT FUND ACCOUNTS: TRINCOMALEE DISTRICT

771/'16

**2. ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවල ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ,

(i) ලියාපදිංචිව තිබූ සේවක අර්ථ සාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

(ii) අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථ සාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 2013, 2014 සහ 2015 වර්ෂවල අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථ සාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව,

(i) රජයට අයත් සමාගම්;

(ii) අර්ධ රාජ්‍ය ආයතන;

(iii) පෞද්ගලික අංශය;

(iv) කර්මාන්ත අංශය;

(v) කෘෂිකර්මාන්ත අංශය;

(vi) සේවා අංශය;

අනුව සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் திருகோணமலை மாவட்டத்தில்,

(i) பதிவு செய்திருந்த ஊழியர் சேமலாப நிதியக் (EPF) கணக்குகளின் எண்ணிக்கை;

(ii) புதிதாகப் பதிவு செய்துள்ள ஊ. சே. நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை;

ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித் தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் புதிதாகப் பதிவு செய்துள்ள ஊ.சே.நி. (EPF) கணக்குகளின் எண்ணிக்கை,

(i) அரசாங்கத்துக்கு உரித்தான கம்பனிகள்;

(ii) பகுதியளவிலான அரச நிறுவனங்கள்;

(iii) தனியார் துறை;

(iv) கைத்தொழில்துறை;

(v) விவசாயத்துறை;

(vi) சேவைத் துறை;

இற்கு அமைய ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியே யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Trade Unions Relations:

(a) Will he inform this House separately in relation to years 2013, 2014 and 2015 -

(i) the number of registered Employees' Provident Fund (EPF) accounts; and

(ii) the number of Employees' Provident Fund (EPF) accounts registered anew;

in the District of Trincomalee?

(b) Will he also inform this House separately in relation to years 2013, 2014 and 2015, the number of Employees' Provident Fund (EPF) accounts registered anew and by -

(i) State-owned companies;

(ii) semi-Government institutions;

(iii) the private sector;

(iv) the industrial sector;

(v) the agricultural sector; and

(vi) the service sector?

(c) If not, why?

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)

ගරු කථානායකතුමනි, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| වර්ෂය | ලියාපදිංචිව තිබූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| 2013 | 10,283 |
| 2014 | 10,763 |
| 2015 | 10,885 |

(ii)

| වර්ෂය | අලුතින් ලියාපදිංචි වූ සේවක අර්ථසාධක අරමුදල් (EPF) ගිණුම් සංඛ්‍යාව |
|---|---|
| 2013 | 4,007 |
| 2014 | 5,120 |
| 2015 | 4,558 |

(ආ) ඉහත පරිදි වර්ගීකරණය කරන ලද පද්ධතියක් දැනට සේවක අර්ථසාධක අරමුදල සතුව නොමැත.

කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව A සිට X දක්වා වූ අක්ෂරයන් අනුව නම් කරනු ලබන කලාපයන්ට අනුකූලව සේවායෝජකයන් ලියාපදිංචි කරන දත්ත පද්ධතියක් පවත්වා ගෙන යනු ලබයි. එලෙස ලියාපදිංචි වූ සේවායෝජකයෙකුගෙන් යම් සාමාජිකයෙකු වෙනුවෙන් දායක මුදලක් ලද විට අදාළ සේවායෝජකයාට හිමි අක්ෂරය හා අංකය යටතේ එම සාමාජිකයා ලියාපදිංචි කෙරේ.

(ඇ) පැන නොනඟී.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා බඳවාගත් III සහ II පංතියේ නිලධාරීන්: MN 05 වැටුප් පරිමාණයට අන්තර්ග්‍රහණය නොකිරීම

பதிவாளர் நாயகத் திணைக்களத்திற்கு ஆட்சேர்க்கப் பட்ட IIIஆம், IIஆம் வகுப்பு ஊழியர்கள்: MN 05 சம்பளத்திட்டத்தில் உள்வாங்காமை

OFFICERS RECRUITED TO GRADE III AND II OF DEPARTMENT OF REGISTRAR GENERAL: NON-ABSORPTION TO SALARY SCALE MN 05

905/'16

**3. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2005 වර්ෂයේදී රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සඳහා III වන පංතියේ සහ II වන පංතියේ නිලධාරීන් 350ක කණ්ඩායමක් සහ පසුව නිලධාරීන් 180ක කණ්ඩායමක් බඳවාගෙන තිබේද;

(ii) 2005 වර්ෂයේදී බඳවා ගන්නා ලද නිලධාරීන් 350, MN 05 වැටුප් පරිමාණයට අන්තර්ග්‍රහණය කරන ලෙස හිටපු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා නිර්දේශ කර තිබේද;

(iii) එසේ නම්, අංක 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව MN 05 වැටුප් පරිමාණයට අන්තර්ග්‍රහණය නොකරන්නේ මන්ද;

(iv) මෙම ගැටලුව විසඳීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005ஆம் ஆண்டில் பதிவாளர் நாயகத் திணைக் களத்திற்கு III ஆம் வகுப்பையும் IIஆம் வகுப் பையும் சேர்ந்த 350 ஊழியர்கள் கொண்டதொரு குழுவும் பின்னர் 180 பேரைக் கொண்டதொரு குழுவும் ஆட்சேர்ப்புச் செய்யப்பட்டதா என்பதையும்;

(ii) 2005ஆம் ஆண்டில் ஆட்சேர்ப்பு செய்யப்பட்ட 350 உத்தியோகத்தர்களை MN 05 சம்பளத் திட்டத்திற்கு உள்வாங்குமாறு முன்னாள் பதிவாளர் நாயகம் விதப்புரை செய்துள்ளாரா என்பதையும்;

(iii) ஆமெனில், 6/2006ஆம் இலக்க பொது நிர்வாகச் சுற்றறிக்கைக்கேற்ப MN 05 சம்பளத் திட்டத்திற்கு உள்வாங்காமைக்கான காரணம் யாதென்பதையும்;

(iv) இப்பிரச்சினையைத் தீர்ப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House -

(i) whether a group of 350 officers of Grade III and II and later another group of 180 officers have been recruited to the Department of Registrar General in the year 2005 ;

(ii) whether it has been recommended by the former Registrar General that the 350 officers recruited in the year 2005 be absorbed to the Salary Scale MN 05;

(iii) if so, as to why they are not absorbed to the Salary Scale MN 05 as per the Public Administration Circular No. 6/2006; and

(iv) whether action will be taken to solve this issue?

(b) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) අන්තර්ග්‍රහණය කර ඇත.

(iv) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

## න්‍යෂ්ටික බලශක්ති ව්‍යාපෘතිය : ප්‍රගතිය

அணுசக்திக் கருத்திட்டம் : முன்னேற்றம்

NUCLEAR ENERGY PROJECT: PROGRESS

932/'16

**4. ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විදුලි උත්පාදනය සඳහා න්‍යෂ්ටික බලශක්තිය භාවිතා කිරීමට අදාළ ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

(ii) ශ්‍රී ලංකාවට ආසන්නව ඉන්දියාවේ පිහිටා ඇති න්‍යෂ්ටික බලාගාරවල ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීමට ශ්‍රී ලංකාවට හැකියාව තිබේද;

(iii) එකී බලාගාරවල ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மின்சார உற்பத்திக்கு அணுசக்தியைப் பயன் படுத்துவது தொடர்பான கருத்திட்டத்தின் முன்னேற்றம் யாது;

(ii) இந்தியாவில் அமைந்துள்ள இலங்கைக்கு அண்மித்த அணுசக்தி நிலையங்களின் செயற் பாட்டை அவதானிப்பதற்கான இயலுமை இலங்கைக்கு உள்ளதா;

(iii) மேற்படி அணுசக்தி நிலையங்களின் செயற் பாட்டை அவதானிக்க முடியாவிடின், அதற்கான காரணம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House -

(i) the progress of the project relating to the using of nuclear power to generate electricity;

(ii) whether Sri Lanka has the ability to observe the functioning of the nuclear power plants, which have been located in India close to Sri Lanka; and

(iii) if the functioning of those power plants cannot be observed, the reasons for that?

(b) If not, why?

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2010.09.08 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලශක්ති වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය (IAEA) වෙතින් ඉල්ලීමක් කරන ලදී. TC PROJECT - SRL/2/008 දරන තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය යටතේ 2012 වසරේදී "බලශක්ති සැලසුම් කිරීම හා සුදුසු ස්ථානයක් තෝරා ගැනීම." සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය මඟින් සහයෝගීතාව ලබාදීමට එකඟ වී ඇත. මේ යටතේ ශ්‍රී ලංකාව තුළ න්‍යෂ්ටික විදුලිබල ව්‍යාපෘතියක් ඉදි කිරීමේ ශක්‍යතාව සහ ඒ සඳහා සුදුසු ස්ථානයක් තිබේ දැයි යන්න අධ්‍යයනය කිරීමට කමිටුවක් පත් කර ඇත. මෙය තමයි අපට තිබෙන විශාලම අභියෝගය. මෙවැනි බලාගාරයක් සඳහා ගැලපෙන ස්ථානයක් තිබෙනවා ද කියන කාරණය තමයි අපට තිබෙන විශාල අභියෝගය, ගරු මන්ත්‍රීතුමනි.

(ii) ඔව්.

(iii) මම කලින් පිළිතුරු දුන්නා වාගේ, අපට එය නිරීක්ෂණය කරන්න හැකියාව තිබෙනවා.

ඉන්දියාව ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය සමඟ අත්සන් තබා ඇති ආරක්ෂණ ගිවිසුම අනුව, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියට ඒවා පරීක්ෂා කර බැලීමට හැකියාව තිබෙනවා. ඒ වාගේම, ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ වෙනත් සාමාජික රාජ්‍යයන් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය සමඟ අත්සන් කර ඇති න්‍යෂ්ටික ආරක්ෂණ සම්මුතියට - Convention on Nuclear Safery - අනුව එක එක රටෙහි න්‍යෂ්ටික බලාගාරවල පවතින තත්ත්වය සහ ඒවායේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ විස්තර, ඒවා පාලනය වන ක්‍රමවේදය අවුරුදු තුනකට වරක් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියට ලබා දෙන්න අවශ්‍යයි. එම වාර්තා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ ආරක්ෂිත වෙබ් අඩවියක පළ කරනවා. ඒ තොරතුරු සෑම රාජ්‍යයකටම ලබා ගන්න පුළුවන්. ඒ වාගේම, එම රාජ්‍යයේ සම්මුතියේ ප්‍රධාන සම්බන්ධීකාරක නිලධාරියාට එම තොරතුරු වෙත ප්‍රවේශවීමට විශේෂ හැකියාවක් තිබෙනවා.

මෙම වාර්තා අවුරුදු තුනකට වරක් අදාළ රාජ්‍යයන් සමඟ පවත්වනු ලබන රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය කරනවා. ඊට අදාළව යම් ප්‍රශ්න තිබෙනවා නම්, ඒ අදාළ රටවලට ඒ ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට හැකියාව තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

කෙසේ වෙතත්, න්‍යෂ්ටික අනතුරක් සිදුවූ අවස්ථාවකදී ඉන්දියාව ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය සමඟ දැනට අත්සන් තබා ඇති න්‍යෂ්ටික අනතුරකදී දැනුම් දීමේ සම්මුතියට - Convention on Notification in Case of Nuclear Accident - අනුව එම අනතුර සම්බන්ධව විස්තර ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියට වහාම දැනුම් දිය යුතුව තිබෙනවා.

එසේම, එම සම්මුතිය අත්සන් කර ඇති වෙනත් රටවලට ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය මඟින් එම විස්තර සම්මුතියට අනුව නොකඩවා ලබා දිය යුතු වන අතර, විකිරණ අනතුරු සිදුවූ රාජ්‍යයෙන් ද එහි බලපෑම් සිදු විය හැකි අනෙක් රටවලටද එම විස්තර ලබා දෙන්නට අවශ්‍යයි. ශ්‍රී ලංකාව ද මෙම සම්මුතියට අත්සන් කර තිබෙනවා. ඒ නිසා ශ්‍රී ලංකාවටත් ඒ සියලු තොරතුරු ලබා ගැනීමට අයිතියක් තිබෙනවා.

ශ්‍රී ලාංකික ජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා වෙනත් රාජ්‍යයක ආධාරයක් නොමැතිව විකිරණ ආපදාවක් මුලදී දැන ගැනීම සඳහා අපේ රාජ්‍යය අවශ්‍ය ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. ඒ නිසා ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. ශ්‍රී ලංකාව තුළ යම් යම් ප්‍රදේශවල ස්වයංක්‍රිය විකිරණ මැනීමේ උපකරණ සහිත විකිරණ අනතුරු හැඟවීමේ පද්ධති සවි කරලා තිබෙනවා. ඒවායින් නිරතුරුව පාරිසරික විකිරණ ප්‍රමාණය මනිනවා. ඒ උපකරණ ආධාරයෙන් යම් කිසි විකිරණ ආපදාවකින් -ඉන්දියාවේ බලාගාරයක් නිසා වෙන්න පුළුවන්, වෙනත් බලාගාරයක් නිසා වෙන්න පුළුවන්- ලංකාවට යම් බලපෑමක් ඇති වෙනවා නම්, එය ඉතාම පහසුවෙන් හඳුනා ගන්න පුළුවන් වෙනවා. ඒ මැනීමේ මධ්‍යස්ථාන කොළඹ, පුත්තලම, මන්නාරම, ඩෙල්ෆ් දූපත, කන්කසන්තුරය, ත්‍රිකුණාමලය, ගාල්ල සහ මහනුවර යන ප්‍රදේශවල පිහිටා තිබෙනවා. ඒ වාගේම ඒවා පිහිටා තිබෙන්නේ ඒ ප්‍රදේශවල තිබෙන නාවික කඳවුරු හෝ විශ්වවිද්‍යාලවලයි. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ඒ වගකීම් දරමින් තමයි ඒ සෑම ස්ථානයකම ඒ උපකරණ ස්ථාපනය කරලා තිබෙන්නේ.

(ආ) අදාළ නොවේ.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයෙන් ඉතාම වටිනා ප්‍රශ්නයක් නැඟීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, ඉන්දියාවේ පිහිටා තිබෙන න්‍යෂ්ටික විදුලි බලාගාර හේතුවෙන් ලංකාවට යම් අනතුරක් සිදු වෙන්න පුළුවන් කියලා ලංකාව තුළ යම් අදහසක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ, තිරුනෙල්වෙලි දිස්ත්‍රික්කයේ, කූඩන්කුලම් කියන ප්‍රදේශයේ තමයි අපට ආසන්නම න්‍යෂ්ටික විදුලි බලාගාරය පිහිටා තිබෙන්නේ. ඒ බලාගාරය දැන් ක්‍රියාත්මක වෙනවා. එයින් විදුලිය උත්පාදනය වෙනවා. කල්පිටියේ ඉඳලා බැලුවොත් එහෙම අපට කිලෝ මීටර 220ක් දුරින් තමයි එය පිහිටා තිබෙන්නේ. නමුත් අපට තිබෙන තොරතුරු අනුව කිලෝ මීටර 100කට වඩා දුරින් පිහිටා තිබෙන න්‍යෂ්ටික බලාගාරයක යම් අනතුරක් සිදු වුණත්- එවැනි අනතුරක් සිදු වීමේ හැකියාව ඉතාම අඩුයි.- ඊට ප්‍රතිචාර දැක්වීමේ හැකියාවක් සහ සූදානමක් ශ්‍රී ලංකා රාජ්‍යයට තිබෙනවා.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් අහන්න අවශ්‍යයි. විදුලි සහ බලශක්ති අර්බුදයට විසඳුමක් විධියට කලාපයේ අනෙක් රටවල න්‍යෂ්ටික බලාගාර ඉදි කර තිබෙනවා. ඔබතුමන්ලා ගණනය කරන විධියට අපේ රටේ න්‍යෂ්ටික බලාගාරයක් ඇති කරන්න කොපමණ කාලයක් ගත වෙයිද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, අපේ දිගුකාලීන ජනන සැලැස්මේ option එකක් හැටියට; තෝරා ගත හැකි විකල්පයක් හැටියට අපි න්‍යෂ්ටික බලාගාරයක් අන්තර්ගත කර තිබෙනවා. අපේ දිගුකාලීන සැලැස්මෙන් තවමත් ඒක ඉවත් කරලා නැහැ. නමුත් අද රටේ තිබෙන සමහර සංවේදී කාරණාත්, ඉඩම් පිළිබඳව තිබෙන භීතියත්, වඩාත් පරිසර හිතකාමී සුළං සහ සූර්ය බලශක්තිය වෙත අපේ තිබෙන යොමු වීමත්, වඩා පහසුවෙන් කළමනාකරණය කරන්න පුළුවන් LNG කෙරෙහි අපේ තිබෙන යොමු වීමත් නිසා න්‍යෂ්ටික බලාගාරයක් ඉදි කරන්න තවමත් අපි ස්ථිරසාර තීරණයක් අර ගෙන නැහැ. කෙසේ වෙතත් අනාගතයේ අපට එවැනි න්‍යෂ්ටික බලාගාරයක් ඇති කරන්න සිදු වුණොත් නිසි ක්‍රමවේදය අනුව ඒ සඳහා වසර 15ක් 20ක් වගේ කාලයක් ගත වෙනවා. ඒ නිසා අපි මූලික කටයුතු කරලා ඒ පිළිබඳව සූදානමක් තිබෙනවා. රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ස්ථිරසාරව ඒ සඳහා යොමු විය යුතු බවට නිගමනයක් ලැබෙන තුරු අපට යොමු වීමේ හැකියාවක් නැහැ.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, යම් කිසි ආපදාවක් සම්බන්ධයෙන් බලපෑමක් ඇති වුණාම හඳුනා ගැනීම සඳහා නගර කිහිපයක නම් ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වුණා. මම එතැනදී විශේෂයෙන් බැලුවේ කොළඹ සිට දකුණ හරහා උතුරු නැඟෙනහිර පළාත ගැනයි. කොළඹ එකක් තිබෙනවා.

ගාල්ලේ එකක් තිබෙනවා. ත්‍රිකුණාමලයේ එකක් තිබෙනවා. මේ පිළිතුරේ විධියට, මේ අතර ස්ථානයක හඳුනා ගැනීමේ උපකරණ හෝ හඳුනාගැනීමේ මධ්‍යස්ථානයක් නම් කරලා නැහැ. ඔබතුමා හිතන්නේ නැද්ද, කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය අතර තව ස්ථානයක් හෝ දෙකක් තිබුණොත් හොඳයි කියලා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

කොළඹ,පුත්තලම, මන්නාරම, ඩෙල්ෆ් දූපත, කන්කසන්තුරේ, ත්‍රිකුණාමලය, ගාල්ල, මහනුවර කියන ප්‍රදේශවල දැනට පිහිටුවලා තිබෙනවා. දැනට අපට කිට්ටුම බලාගාරය තිබෙන්නේ කූඩන්කුලම් හින්දා, උතුර සහ බස්නාහිර වෙරළත් ඒ වාගේම නැඟෙනහිර ත්‍රිකුණාමලයත් තමයි අපි ආවරණය කරලා තිබෙන්නේ. නමුත් ඔබතුමාගේ අදහස අනුව, තවත් නිරීක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවිය යුතුද කියලා සොයලා බලන්නම්. බොහොම ස්තුතියි, ඒ ප්‍රශ්නය ගැන අපේ අවධානය යොමු කිරීම ගැන.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්නයක් අහන්න අවසරද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට පිළිතුරු දෙන්න නියෝජ්‍ය ඇමතිතුමාට පුළුවන්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පුළුවන්.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයටම අදාළ කාරණයක් තමයි මම අහන්නේ. බොහොම හොඳයි, මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන එක. නමුත් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරියේ ගොඩනැඟිල්ල කොලොන්නාව ආසනයේයි ඉදිවෙන්නේ. ඒක සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අපට තවම බැරි වෙලා තිබෙනවා, මේ සම්බන්ධයෙන් තිබෙන දුර්මත නැති කරන්න. ඒ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමනි, මෙම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ එහි රසායනාගාරය ඉදිකිරීමට යෝජිත ගොඩනැඟිල්ලේ දැනටමත් අත්තිවාරම් සකස් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව භූමිය අවට ජනතාවගේ විරෝධයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙය තාක්ෂණය පිළිබඳව තිබෙන නොදැනුවත්කම නිසා ඇති වුණු තත්ත්වයක්. දැනට සාකච්ඡා වට ගණනාවක් පවත්වලා තිබෙනවා. දැන් අපේ අපේක්ෂාව වෙන්නේ පරිපාලන ගොඩනැඟිලි වෙනමත්, පරීක්ෂණාගාර වෙනමත් ස්ථාන දෙකක පිහිටුවන්නයි. ඒක තමයි දැනට තිබෙන තත්ත්වය වන්නේ.

මෙය ටිකක් සංකීර්ණ තත්ත්වයක්. මේ නිසා තවත් සංවර්ධන කටයුතු ගණනාවක් අඩාළ වෙලා තිබෙනවා. අපට ඇත්තටම ලොකු අභියෝගයක් තිබෙනවා. පරමාණු බලයෙන් -න්‍යෂ්ටික බලයෙන්- විදුලිය උත්පාදනය කිරීම කියන කටයුත්තට යෑමට කලින්, 'න්‍යෂ්ටික බලය සාමකාමී භාවිතය' මහ ජනතාවගේ සෞඛ්‍යය, කෘෂිකර්මය, කර්මාන්ත කෙරෙහි ඉතා පහසුවෙන් යොදා ගත හැකි සුදුසු තාක්ෂණයක් බව ජනතාවට අවබෝධ කර දිය යුතු තත්ත්වයක් අද පවතිනවා. අදාළ මූලස්ථානය ඉදි කිරීම වාගේම මේ පිළිබඳව වඩාත් වැඩි අධ්‍යයනයකට අවස්ථාවක් පාසල් මට්ටමේදී ලබා දිය යුතු තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නය මතු කළාට බොහොම ස්තුතියි. අපි ඉක්මනින්ම ඒ ප්‍රශ්නය විසඳනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊළඟ ප්‍රශ්නය ඇසීමට ප්‍රථම මා කාරණයක් කියන්නම්. අපට තිබෙන කාලය බොහොම සීමිතයි. පෙර වරු 10.00 වන කොට අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය ආරම්භ කරන්නත් තිබෙනවා. Ministerial Statements කීපයකුත් තිබෙනවා.

## විදුලි දුම්රිය ව්‍යාපෘතිය: ප්‍රගතිය

மின்சக்திப் புகையிரதக் கருத்திட்டம் : முன்னேற்றம்
ELECTRIC TRAIN PROJECT: PROGRESS

936/'16

**5. ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ විදුලි බලයෙන් ක්‍රියා කරන දුම්රිය භාවිතය පිළිබඳව රජය විසින් දෙන ලද පොරොන්දුව ප්‍රකාරව එම කටයුතු ඉටු කරනු ලබන්නේ කවදාද;

(ii) විදුලි බලයෙන් දුම්රිය ධාවනය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සැලසුම් කර අවසන් වී තිබේද;

(iii) එසේ නම්, එම ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(v) එම මුදල් ප්‍රමාණය සොයා ගැනීමට අපේක්ෂා කරන ක්‍රමවේදය කවරේද;

(vi) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂා කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் மின்சக்தியில் இயங்கும் புகையிரதப்பாவனை குறித்து அரசாங்கத்தினால் வழங்கப்பட்டுள்ள வாக்குறுதிக்கமைய இந்த நடவடிக்கைகள் நிறைவேற்றப்படுவது எப்போது;

(ii) மின்சக்தியின் மூலம் புகையிரதத்தை இயக்குவிக்கும் கருத்திட்டத்தின் திட்டமிடல் பூர்த்தி செய்யப்பட்டுள்ளதா;

(iii) ஆமெனில், மேற்படி கருத்திட்டத்தின் முன்னேற்றம் யாது;

(iv) இக்கருத்திட்டத்தை வெற்றிபெறச் செய்வதற்காக முதலீடு செய்ய எதிர்பார்க்கப்பட்டுள்ள பணத் தொகை யாது;

(v) மேற்படி பணத்தொகையைப் பெற்றுக்கொள்வதற்கு எதிர்பார்க்கும் முறைமை யாது;

(vi) மேற்படி கருத்திட்டத்தை நிறைவு செய்வதற்கு எதிர்பார்க்கும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House -

(i) as to when the actions would be fulfilled as per the promise given by the government in connection with the operation of electric trains in Sri Lanka;

(ii) whether the plan of the project of running electric trains has been completed;

(iii) if so, what the progress of that project is;

(iv) the amount of money expected to be invested to make that project a success;

(v) the methodology through which that amount of money is expected to be raised; and

(vi) the date the project is expected to be completed?

(b) If not, why?

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ විදුලි දුම්රිය භාවිතාව ඇති කිරීම සඳහා ස්ථාපිත කරන ලද "කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය" 2016.07.07 දින ආරම්භ වූ අතර, ප්‍රධාන අදියර 5ක් යටතේ වසර 5ක ව්‍යාපෘතියක් සේ ක්‍රියාත්මක වනු ඇත.

දැනට මෙහි ශක්‍යතා අධ්‍යයනය සිදු කෙරිමින් පවතින අතර, මෙමඟින්:

1. විදුලි දුම්රිය පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සුදුසුම දුම්රිය මාර්ග කොට්ඨාසය හඳුනා ගැනීම.
2. විදුලි දුම්රිය ධාවනයට සුදුසු තත්ත්වයට දැනට පවතින දුම්රිය මාර්ග, සංඥා පද්ධති, දුම්රිය ස්ථාන, දුම්රිය හරස් මාර්ග ආදිය පත් කිරීමට කළ යුතු කාර්යයන් හඳුනා ගැනීම සහ කළ යුතු දේ යෝජනා කිරීම.
3. 2030දී ගමනාගමනය සඳහා දුම්රිය යොදා ගැනීමට මහ ජනතාවගේ නැඹුරුතාව පරිගණක ක්‍රමවේද භාවිතයෙන් හා දත්ත එකතු කිරීම මඟින් සොයා බැලීම හා ගණනය කිරීම.
4. ඉහත නැඹුරුතා ගණනය කිරීම් භාවිතයෙන්, 2030දී ඇති වන මගී සංඛ්‍යාව ගැන සහ 2030දී මගී ජනතාවගේ අවශ්‍යතා ගැන අධ්‍යයනය කිරීම සහ එම අවශ්‍යතා සැපිරීම සඳහා කොපමණ දුම්රිය ප්‍රමාණයක් ධාවනය කළ යුතුද, කිනම් පහසුකම් වැඩි දියුණු කළ යුතුද යන්න අධ්‍යයනය කර හඳුනා ගැනීම.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

5. කැලණිවැලි මාර්ගය සඳහා විශේෂ අවධානය යොමු කර අධ්‍යයනය කිරීම.

6. ඉඩම් අත්පත් කර ගැනීම් සහ සමාජ ආරක්ෂණ ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනය කර ක්‍රමවේද යෝජනා කිරීම.

7. විදුලි දුම්රිය ධාවනයේදී, මහා මාර්ග පාලම්වල උස වැඩි කර ගැනීමට අවශ්‍ය යෝජනා සැකසීම.

8. විදුලි දුම්රිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි දැනට ඇති හැකියාවන් සහ වැඩි දියුණු කර ගත යුතු අංශ සොයා බලා යෝජනා ඉදිරිපත් කිරීම ආදිය අධ්‍යයනය කරනු ඇත.

(ii)

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලිකම සැලසුම් අවසන් කර ඇත.
- ව්‍යාපෘති Steering Committee (ආයතන 28කින් සමන්විත) පත් කර රැස්වීම් තබා ඇත.
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවා ඇත. මේ සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගෙන ඇත.
- ඉඩම් අත්පත් කර ගැනීමේ සහ සමාජ ආරක්ෂණ කටයුතුවලට අදාළ කාර්ය මණ්ඩලය ඉදිරි මාසය තුළ බඳවා ගැනීමට නියමිතය.
- දුම්රිය දෙපාර්තමේන්තුව, විදුලි බල මණ්ඩලය, LECO ආයතනය, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ නිලධාරින්ගෙන් සමන්විත තාක්ෂණ කමිටුවක් පත් කර ඇත.

විදුලි දුම්රිය ධාවනය කිරීම සඳහා සැලසුම් (designs) සකස් කිරීම, මෙම ශක්‍යතා අධ්‍යයනයෙන් පසුව (ශක්‍යතා අධ්‍යයනය අවසන්වීමට පළමුව) සිදු කිරීමට නියමිතය. ඒ සඳහා සුදුසු උපදේශනාත්මක සේවා ආයතනයක් තෝරා ගැනීම සඳහා මිලදී ගැනීම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(iii) ව්‍යාපෘතියේ ප්‍රගතිය.

1. ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පත් කර ඇත.

2. ශක්‍යතා අධ්‍යයන ආයතනය තෝරාගෙන, දැනට ශක්‍යතා අධ්‍යයනය සිදුවෙමින් පවතී. මෙම ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ අතුරු වාර්තාව 2016.11.15 දින ලබා දීමට නියමිත වූ අතර 2016.11.30 දින මේ පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීමට නියමිතය.

3. දැනට දුම්රිය භාවිත කරන දුම්රිය මගී සංඛ්‍යාව සහ දුම්රිය භාවිතයෙන් ගමනාගමන පහසුකම් ඉටු කර ගැනීමට මහජනයාගේ නැඹුරුතාව මැන බැලීම සඳහා සමීක්ෂණ දෙකක් පවත්වා ඇත.

4. දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරින් හා බල සැපයුම් පිළිබඳව කටයුතු කෙරෙන ආයතන (විදුලි බල මණ්ඩලය, LECO ආයතනය) සමඟ තාක්ෂණ මට්ටමේ සාකච්ඡා දිගින් දිගටම සිදුවෙමින් පවතී.

5. විදුලි දුම්රිය පද්ධතිය ස්ථාපිත කිරීමට අවශ්‍ය වන උස ලබා ගැනීම සඳහා කොළඹ නගරය තුළ මහාමාර්ග පාලම් අවශ්‍ය ප්‍රමාණයකින් ඉස්සීමට සාකච්ඡා පැවැත්වෙමින් ඇත.

6. මිළඟ උපදේශනාත්මක සේවාව (Design and Procurement Support Consultancy) ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී.

(iv) ව්‍යාපෘතියෙහි අදියර 5 සඳහා ආසියානු සංවර්ධන බැංකුව හරහා ආයෝජනය වන මුදල පහත දැක්වේ.

* ශක්‍යතා අධ්‍යයනයට - ඇ.ඩො.මි. 1.0යි.

  එය ලබා දී තියෙනවා.

* සැලසුම් හා මිල දී ගැනීම් සහයෝගිතාව සඳහා උපදේශාත්මක සේවා - ඇ.ඩො.මි.10.0

  එහි ගිවිසුම අත්සන් කර තිබෙනවා.

* ආයතන හැකියා වර්ධනය (Capacity building ) - ඇ.ඩො.මි. 1.0

* ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදියර I - ඇ.ඩො.මි. 300

  අදියර II - ඇ.ඩො.මි. 300

(v) ආසියානු සංවර්ධන බැංකුව මඟින් මුදල් ලබා දේ.

(vi) 2016-07-07 දින ආරම්භ වූ අතර ව්‍යාපෘති කාල සීමාව වසර 5කි.

(ආ) පැන නොනඟී.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු කථානායකතුමනි, කාලවේලාව පිළිබඳ ප්‍රශ්නය තිබෙන නිසා එක අතුරු ප්‍රශ්නයක් අහනවා ගරු කථානායකතුමනි. මේ ශක්‍යතා අධ්‍යයනය සඳහා තෝරා ගත් සමාගම කුමක්ද? ඒ සමාගමේ අත්දැකීම් අපි භාවිත කරන්න බලාපොරොත්තු වෙන්නේ කොහොමද?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ඒ පිළිබඳව තවම ආයතනයක් තෝරාගෙන නැහැ. දැන් මේ පිළිබඳව සාකච්ඡා කෙරෙමින් පවතිනවා. පළමු සාකච්ඡාව ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය ඇමතිවරයා විධියට මමත්, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍ය අජිත් පී. පෙරේරා මැතිතුමාත්, විශේෂයෙන්ම ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍ය නිරෝෂන් පෙරේරා මැතිතුමාත් එක් වී සාකච්ඡා කළා. දැන් සාකච්ඡා වට කිහිපයක් ගිහින් තිබෙනවා. තවම තෝරාගෙන නැහැ. ඉදිරියේදී තෝරා ගැනීමට නියමිතයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවෙනි වටය.

## ශ්‍රී ලංකාවට පැමිණි ඇමෙරිකා එක්සත් ජනපද රජයේ නිලධාරින්: විස්තර

## இலங்கைக்கு வருகைதந்த ஐக்கிய அமெரிக்க அரச உத்தியோகத்தர்கள் : விபரம்

## OFFICIALS OF UNITED STATES OF AMERICA VISITING SRI LANKA: DETAILS

940/'16

**6. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில சார்பாக)

(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Udaya Prabhath Gammanpila)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2015 ජනවාරි 09 දින සිට 2016 අගෝස්තු 31 දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට පැමිණි ඇමෙරිකා එක්සත් ජනපද රජයේ නිලධාරින්ගේ නම්, පැමිණි දින සහ පැමිණීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2015 சனவரி 09ஆம் திகதி தொடக்கம் 2016 ஆகஸ்ட் 31ஆம் திகதி வரையிலான காலத்தினுள் இலங்கைக்கு வருகை தந்த ஐக்கிய அமெரிக்காவின் அரசாங்க உத்தியோகத்தர்களின் பெயர்கள், சமுகமளித்த திகதிகள், சமுகமளித்தமைக்கான காரணங்கள் தனித் தனியே யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House of the names of the officials of the United States of America who visited Sri Lanka during the period from 09th January, 2015 to 31 st August, 2016 dates on which they arrived and the reasons for their visits, separately?

(b) If not, why?

**ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு மங்கள சமரவீர - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)

(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)

Sir, I **table*** the Answer.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(a) Yes. Please see the Annex. I table** the Annex.

(b) Does not arise.

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

## ගොඩකවෙල "බණ්ඩාර හේන්යාය" නමැති ඉඩම: ඉන්ධන පිරවුම්හලක් ඉදිකිරීම

## கொடகவெலவிலுள்ள "பண்டார ஹேன்யாய" எனும் காணி: எரிபொருள் நிரப்பு நிலைய நிர்மாணம்

## LAND NAMED "BANDARA HENYAYA" IN GODAKAWELA:CONSTRUCTION OF FILLING STATION

947/'16

**7. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු ටී. රංජිත් ද සොයිසා මහතා වෙනුවට)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா சார்பாக)

(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. T. Ranjith De Zoysa)

ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බලවින්න නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් බණ්ඩාර හේන්යාය නමැති ඉඩමක් තිබේද;

(ii) එසේ නම්, එම ඉඩමේ මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(iii) දැනට එම ඉඩම මුඩු ඉඩමක්ද; නැතහොත් වගාවන් සහිත ඉඩමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඉඩමේ කොටසක් කොමිෂන් සභාව විසින් ඉන්ධන පිරවුම්හලක් සඳහා ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අමාත්‍යවරයාගේ අනුමතිය ලබා දී තිබේද;

(iii) අනුමතිය ලබා දී ඇති පදනම කවරේද;

(iv) ඉඩම ලබා ගෙන ඇති පුද්ගලයාගේ නම හා ලිපිනය කවරේද;

(v) එම ඉඩම සඳහා ලබා දී ඇති මුදල කොපමණද;

(vi) ලබා දී ඇති ඉඩම් කොටසේ ප්‍රමාණය කොපමණද;

(vii) මෙලෙස රජය සතු වටිනා ඉඩම් විකිණීම හෝ බදු දීම රජයේ ප්‍රතිපත්තියද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொடகவெல பிரதேச செயலாளர் பிரிவில், பலவின்ன கிழக்கு கிராம அலுவலர் பிரிவில், காணி மறுசீரமைப்பு ஆணைக்குழுவிற்கு உரித் தான பண்டார ஹேன்யாய எனும் பெயரிலான காணியொன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி காணியின் மொத்த நிலப்பரப்பு யாது என்பதையும்;

(iii) தற்போது மேற்படி காணி ஒரு தரிசு நிலமா அல்லது பயிர்செய்கைகளுடன் கூடிய காணியா என்பதையும்;அவர் இச்சபைக்கு அறிவிப் பாரா?

(ஆ) (i) மேற்படி காணியின் ஒரு பகுதி ஆணைக்குழு வினால் எரிபொருள் நிரப்பும் நிலையமொன் றுக்காக வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு அமைச்சரின் அங்கீகாரம் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(iii) அங்கீகாரம் வழங்கப்பட்டுள்ள அடிப்படை யாது என்பதையும்;

(iv) காணியைப் பெற்றுக்கொண்ட ஆளின் பெயர் மற்றும் முகவரி யாது என்பதையும்;

(v) மேற்படி காணிக்கு வழங்கப்பட்டுள்ள பணத் தொகை யாது என்பதையும்;

(vi) வழங்கப்பட்டுள்ள காணித்துண்டின் அளவு யாது என்பதையும்;

(vii) இவ்வாறு அரசுக்கு உரித்தான பெறுமதிமிக்க காணிகளை விற்பனை செய்தல் அல்லது குத்தகைக்கு வழங்குதல் அரசின் கொள்கையா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Will he inform this House -

(i) whether there is a land named "Bandara Henyaya" belonging to the Land Reform Commission in Balavinna East Grama Niladhari Division in Godakawela Divisional Secretary's Division;

(ii) if so, the total extent of the aforesaid land; and

(iii) whether the aforesaid land is a barren land or is cultivated at present?

(b) Will he also inform this House-

(i) whether a part of the aforesaid land has been given by the Commission for the construction of a filling station;

(ii) if so, whether the approval of the Minister has been given for that;

(iii) the basis on which such approval has been given;

(iv) the name and the address of the person who has obtained the land;

(v) the amount at which the land was granted;

(vi) the extent of the plot of land that has been granted; and

(vii) whether it is the policy of the Government to grant in this manner the valuable lands that belong to the State?

(c) If not, why?

**ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சரும்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands)

Sir, I **table*** the Answer.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) Yes.

(ii) Twenty acres, 03 roods, 17 perches.

(iii) It is a bare land at present. (It will be granted for development purposes in future.)

(b) (i) No.

(ii) Not relevant.

(iii) Not relevant.

(iv) Not relevant.

(v) Not relevant.

(vi) Not relevant.

(vii) Not relevant.

(c) Since requests have already been made to grant the allotments of this land for various projects, further relevant measures will be taken following due procedures.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාලය ගතවෙලා තිබෙනවා, තව සීමිත වේලාවයි තිබෙන්නේ. Next, the Hon. Douglas Devananda to raise the Question under Standing Order 23 (2).

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### වවුනියාව ශන්මුගපුරම් ප්‍රදේශයේ යටිතල පහසුකම්
### வவுனியா, சண்முகபுரம் கிராமத்திற்கான அடிப்படை வசதிகள்
### INFRASTRUCTURE FACILITIES IN SHANMUGAPURAM, VAVUNIYA

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 23/2 இன் கீழ் சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ் வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர் கௌரவ டி.எம். சுவாமிநாதன் அவர்களிடம் இந்தக் கேள்வியைக் கேட்க அனுமதித்ததற்கு நன்றி தெரிவிக் கின்றேன்.

வடக்கில் யுத்தம் நிலவிய 1990ஆம் ஆண்டு காலகட்டங் களில் மடு, முல்லைத்தீவு, காங்கேசன்துறை, இரணை இலுப் பைக்குளம், புங்குடுதீவு போன்ற பகுதிகளிலிருந்து பல்வேறு இடங்களுக்கு இடம்பெயர்ந்த நிலையில் இறுதியாக பூந்தோட்டம் மற்றும் வாரிக்குட்டியூர் முகாம்களில் அகதிக ளாகத் தங்கியிருந்த 83 குடும்பங்களைச் சேர்ந்த மக்கள் வவுனியா, செட்டிக்குளம் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட கங்கன்குளம் கிராம சேவையாளர் பிரிவிலுள்ள சண்முகபுரம் கிராமத்தில் 2007ஆம் ஆண்டு மீள்குடியேற்றம் செய்யப் பட்டனர். தற்காலிக வீடுகள் வழங்கப்பட்டாலும் அடிப்படை வசதிகள் முழுமையாக மேற்கொள்ளப்படாத நிலையிலேயே இம்மக்கள் மீள்குடியேற்றம் செய்யப்பட்டனரென்றும் இவர்களது குடும்பத்திற்கு வாழ்வாதாரத்தை மேற்கொள்வதற் காக ஓர் ஏக்கர் பயிர்ச்செய்கைக்கான நிலம் தரப்படுமெனக்

கூறப்பட்ட நிலையில் உவர்த் தன்மையும் கற்பாறைகளும் கொண்டதான நிலத்தில் கால் ஏக்கர் வீதமே ஒவ்வொரு குடும்பத்திற்கும் வழங்கப்பட்டதாகவும் அந்த மக்கள் கூறுகின்றனர். வடக்கில் ஏனைய பகுதிகளில் வீட்டுத் திட்டங்கள் பல வழங்கப்பட்டபோதிலும் இம்மக்களுக்கு இதுவரையில் எவ்வித வீட்டுத் திட்டங்களும் வழங்கப்படவில்லையென்றும் இங்குள்ள பாதைகள் மிகவும் பாதிப்படைந்துள்ள நிலையில் மழைக் காலங்களில் போக்குவரத்துச் செய்வதில் மாணவர்கள், நோயாளிகள், கர்ப்பிணிகள் போன்றோர் பாரிய சிரமங்களுக்கு உள்ளாகி வருவதாகவும் சுத்தமான குடிநீரின்மை காரணமாகப் பலர் சிறுசீரகப் பாதிப்புக்களுக்கு உள்ளாகி வருவதாகவும் அவர்கள் தெரிவிக்கின்றனர்.

**இம்மக்களுக்கு நிரந்தர வீட்டுத் திட்டம் மற்றும் அடிப்படை வசதிகளை ஏற்படுத்திக் கொடுக்க தங்களது அமைச்சு நடவடிக்கை எடுக்குமா என்பதைப் பற்றிக் கூறமுடியுமா?**

**தற்போது மழைக்காலம் ஆரம்பமாகியிருப்பதனால் இக் கிராமத்திற்கான உட்கட்டமைப்பு வசதிகளை உடனடியாக மேற்கொள்ளக்கூடிய சாத்தியங்கள் உள்ளனவா?**

**மேலும், இம்மக்களுக்கு வழங்கப்பட்டுள்ள காணிகளில் விவசாயச் செய்கையினை மேற்கொள்ள முடியாதுள்ள நிலையில் இம்மக்களது வாழ்வாதாரம் கருதி எடுக்கப்படக்கூடிய மாற்று நடவடிக்கைகள் தொடர்பில் கூறமுடியுமா?**

மேற்படி, எனது கேள்விகளுக்கு கௌரவ அமைச்சர் அவர்கள் பதில் கூறுவாரென எதிர்பார்க்கின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)
මේකට මම දවස් තුනක් තිස්සේ ලෑහැස්ති වෙලායි හිටියේ. ඔබතුමා හිටියේ නැහැ. Tomorrow, I will reply to that. අද කැබිනට් මණ්ඩලය රැස් වෙනවා නේ.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
இது மீள்குடியேற்ற அமைச்சருக்கான கேள்வியாகும். That was not referred to you. That was referred to the Hon. Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
But, it was referred to me.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
But, it is wrong.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
Okay, we will sort it out when I answer tomorrow.

## එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානයේ නියමය : විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## ஐக்கிய நாடுகளின் கல்வி, அறிவியல் மற்றும் கலாசார அமைப்பின் தீர்மானம்: வெளிநாட்டலுவல்கள் அமைச்சரின் கூற்று
## RESOLUTION BY UNITED NATIONS EDUCATIONAL, SCIENTIFIC AND CULTURAL ORGANIZATION: STATEMENT BY MINISTER OF FOREIGN AFFAIRS

**ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)
Hon. Speaker, this in response to the Question raised by the Hon. Dinesh Gunawardena on 28th October, under Standing Order No. 23 (2).

Sir, Sri Lanka is a Member of the Executive Board of UNESCO along with 57 other member countries. On 13th October, 2016, among the proposals placed before the Executive Board was one that was introduced by seven sponsors - Algeria, Egypt, Lebanon, Morocco, Oman, Qatar and Sudan. These proposals which deal with the Al-Aqsa Mosque/Al-Haram al-Sharif and its surroundings, the Ascent to the Mughrabi Gate in Al-Aqsa Mosque/Al-Haram ash-Sharif and so on were considered to contain contentious and controversial elements, on which the 58 Members of the Executive Board of UNESCO could not reach consensus.

We are very aware of the position taken by the State of Palestine in this matter. However, there were concerns pertaining to the nature of the language that was used, including concerns that the sites were referred to only in their Arabic names. These reasons meant that there were divisions in the positions of the Members of the Executive Board. As you are aware, Sir, even the Director-General of UNESCO, Madam Irina Bokova expressed concerns stating that, I quote, "Jerusalem is the sacred city of the three monotheistic religions - Judaism, Christianity and Islam. To deny, conceal or erase any of the Jewish, Christian or Muslim traditions undermines the integrity of the site..."

Sir, we in Sri Lanka, the Sri Lankan people, know very well the destruction, the loss and the pain caused by conflict. Just as much as we want to try to ensure that such violence does not recur in our country, this is the message that we want to give to the world. We yearn and strive today to build a nation that respects all cultures, all religions and all beliefs, not a nation that merely tolerates diversity, but a nation that truly respects all cultures, all regions, all beliefs and upholds everyone's dignity.

Having seen the devastation of conflict, Sri Lanka stands firmly for dialogue as the means for resolution of conflict. Therefore, Sir, Sri Lanka's position is that issues pertaining to Palestine and Israel too, should be resolved through dialogue. Resolutions of this nature that relate to the preservation of cultural and religious heritage too, therefore, should be framed and formulated in a manner

[ගරු මංගල සමරවීර මහතා]

that helps resolve problems and not in a manner that could cause further stress and strain to the communities concerned or to already complex issues through divisive action and positioning.

Sir, as you know, UNESCO is an organization that stands for peace and understanding in the world, an organization which promotes understanding and respect for each other's cultures, traditions, religions and beliefs. The Constitution of UNESCO states, "Since wars begin in the minds of men, it is in the minds of men that the defences of peace must be constructed."

A Resolution of this nature, to us, did not seem to help find a solution to the issues concerned. This is why Sri Lanka decided to abstain on this particular vote. It must be noted, Sir, that Sri Lanka did not vote against the Resolution. There are allegations that Sri Lanka succumbed to the pressures exerted by the United States and Israel. That is absolutely incorrect. In fact, no country has lobbied us to adopt the position that we did on this particular issue in UNESCO. UNESCO stands for peace and the promotion of peace, understanding and respect for each other's ways, cultures, traditions and religions. Accordingly, Sir, Sri Lanka wants to see UNESCO being used as a forum for the promotion of peace and understanding and for approaching issues in a manner that helps resolve them through peaceful means and not through divisive means that can add to already complex situations. Reaffirming our commitment to the principles of UNESCO, we, in fact, received the Director-General of UNESCO, Madam Irina Bokova in Sri Lanka this year.

The Hon. Dinesh Gunawardena has also asked whether our decision to abstain means that the Government has abandoned or reversed Sri Lanka's long-standing policy of support for the legitimate rights of the Palestinian people or whether the Government has abandoned or reversed Sri Lanka's long-standing Non-Aligned foreign policy.

First of all, let me assure this House that Sri Lanka has not changed, reversed or abandoned this country's long-held position of support for Palestine.

Along with Sri Lanka, 13 other Non-Aligned Movement Members in the Executive Board abstained on the said Resolution. This includes India and Nepal in our region. As this House is aware, India is a founding member of the Non-Aligned Movement, and India is also home to the third largest Muslim population in the world. In fact, more members of the Executive Board of UNESCO abstained than supporting this particular Resolution.

This issue has nothing to do with NAM. Sri Lanka remains a member of NAM and Sri Lanka has not abandoned its Non-Aligned stance. In fact, I believe that a strong policy of Non-Aligned Movement is to refrain from action that would further aggravate already complex issues, but to strive to resolve such issues in a manner that is peaceful, and in a manner that would ensure a durable solution.

Hon. Speaker, Sri Lanka stands firm in its support for the Palestinian cause. Successive Governments of Sri Lanka have maintained support for the just cause of Palestine and solidarity with the Palestinian people for their struggle. As this House is aware, the Palestinian Declaration of Independence proclaimed the establishment of the State of Palestine on the 15th of November, 1988 and Sri Lanka, almost immediately after that - three days later, on the 18th of November, 1988 - recognized the State of Palestine

The cause of the Palestinian people and commitment to the Palestinian cause has been a consistent and core feature of Sri Lanka's Foreign Policy, maintained by all Governments since then. The National Unity Government under the leadership of President Maithripala Sirisena and Prime Minister Ranil Wickremesinghe upholds and continues this policy.

The Embassy of the PLO was established in Sri Lanka in 1975. In 1976, the Palestine-Sri Lanka Solidarity Committee was founded. With formal recognition of the State of Palestine in 1988, the Embassy was renamed the Embassy of the State of Palestine on the 6th of February 1989.

Mr. Yasser Arafat visited Sri Lanka during the tenure of President Chandrika Bandaranaike Kumaratunga and he was honoured as a Head of State. President Mahmoud Abbas visited Sri Lanka at the invitation of President Mahinda Rajapaksa in 2008 and once again in 2012, and President Rajapaksa visited Palestine in January 2014.

In 2007, Sri Lanka established a Representative Office in Ramallah and appointed a Resident Representative to the State of Palestine and this Office continues to function there even today.

A Sri Lankan Parliamentary delegation headed by the Minister of Health, Nutrition and Indigenous Medicine, Hon. Rajitha Senaratne, visited Palestine from 10 - 13 October this year.

In fact, our friendship is as strong as ever. Just last week on the sidelines of the Climate Change Conference in Marrakech, Morocco, I had the honour of having discussions with the Prime Minister of Palestine, Hon. Rami Hamdallah and Palestine's Ambassador to the United Nations in New York, Dr. Riyad Mansour. We had the most cordial and friendly discussions. I can assure you that the relations between Palestine and Sri Lanka is as strong as ever.

Mr. Speaker, Sri Lanka has always supported Palestine in multilateral fora through successive Governments.

Sri Lanka has chaired the UN Special Committee to Investigate Israeli Practices Affecting the Human Rights of the Palestinian People and other Arabs of the Occupied Territories for over three decades since its inception in 1968. Sri Lanka has chaired this Committee without a break, through successive Governments. In fact, when I met Prime Minister Hamdallah he again thanked Sri Lanka for our support by chairing this Committee. Sri Lanka has thus been a significant voice in the UN consistently on the violation of human rights in the occupied territories.

In 2011, Sri Lanka in fact supported Palestine joining UNESCO as a full-fledged member. In 2012, at the UN,

Sri Lanka supported the Resolution granting Palestine non-member Observer Status in the UN. Sri Lanka continues to support full membership for Palestine in the UN.

In September 2015, Sri Lanka voted for the Palestine-sponsored Resolution in the United Nations in support of non-member Observer States being allowed to raise their flags at the United Nations Headquarters, alongside the flags of member States of the United Nations, thereby supporting Palestine to raise its flag at the United Nations Headquarters.

In fact, ලංකාවේ ඡන්දයත් ඇතිව තමයි ඉතිහාසයේ ප්‍රථම වතාවට පලස්තීනයේ ජාතික කොඩිය අද එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ ලෙළ දෙන්නේ. ඒ ඡන්දයේ දී ශ්‍රී ලංකාව බොහොම සක්‍රීයව සහයෝගය ලබා දුන්නා.

Every year, Sri Lanka supports approximately 15 Resolutions in the United Nations related to Palestine. පසුගිය අවුරුද්දේ විතරක් අපි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විවිධ රැස්වීම්වලදී, පලස්තීන රාජ්‍යයට සහයෝගය පළ කරපු යෝජනා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ යෝජනා මා **සභාගත*** කරන්න කැමැතියි, පාර්ලිමේන්තුවේ දැන ගැනීම සඳහා.

Additionally, this year, Sri Lanka also expressed support for Palestine's membership in the World Trade Organization - WTO - and INTERPOL.

Mr. Speaker, Sri Lanka's principled support for the Palestinian cause remains, as you can see, steadfast and unchanged. Sri Lanka has consistently called for a negotiated solution resulting in a sovereign, independent, viable and united State of Palestine, with East Jerusalem as its capital, living within secure and recognized borders, side by side, and at peace with Israel, as endorsed in the Quartet roadmap and relevant UN Security Council Resolutions.

The decision to abstain on this particular vote in the UNESCO Executive Board is by no means a change of Sri Lanka's position on Palestine. In fact, as stated earlier, Sri Lanka wholeheartedly supported Palestine obtaining membership in UNESCO and we have done so ever since.

As you are aware, Hon. Speaker, the former President and current Member of Parliament of this House, Hon. Mahinda Rajapaksa was the first Head of State of this country to visit Israel. He visited Israel on 8th and 9th of January 2014.

This did not mean that Sri Lanka abandoned its position on Palestine. This Government too will not abandon Sri Lanka's support for Palestine and the Palestinian people.

The visit to Israel undertaken by the former President Mahinda Rajapaksa is considered as a high point in Sri Lanka-Israel relations. President Rajapaksa's visit contributed to strengthening relations between Sri Lanka and Israel too. The National Unity Government continues to build on this relationship. As recognized by former President Mahinda Rajapaksa as well, Israel is an important country in the world, with advanced technological knowledge and expertise in areas that can be helpful to the people of Sri Lanka and in our journey towards economic progress. There are many areas of cooperation such as agriculture, agricultural research, solar energy, water management and horticulture that can be explored. In fact there is ongoing defence cooperation between the two countries, and over 6000 Sri Lankans are currently working in Israel with more employment opportunities in the future.

As this House is aware, the President of Israel just concluded a very successful State visit to India, a country that is home, as I said earlier, to the third largest Muslim population in the world, from 14 to 21 November.

Maintaining good relations with Israel does not mean in any way that Sri Lanka has abandoned Palestine or the Palestinian cause. Sri Lanka cannot have enemies. Sri Lanka cannot afford to quarrel with other countries. We should position ourselves in this world as a nation that stands for peace, reconciliation, democracy, human rights and the preservation of a rules based international order.

It is very unfortunate that some sections with hidden agendas try to use and manipulate issues of this nature to drive wedges between people and communities in our country. They try to arouse emotions and fear, misleading and misguiding people, and thereby attempting to create situations to militate against the Government.

Hon. Speaker, I urge my Colleagues in this House to refrain from engaging in cheap theatrics when it concerns Sri Lanka's relations with the world. We are today seeking peace and reconciliation, and we must embody that spirit of peace, and that spirit of reconciliation, in word and deed when dealing with the international community as well. This is what we seek to do and we will, at all times, act in the best interest of the people that we represent.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මෙන්න මේ කාරණයත් කියන්න ඕනෑ. ජනතාව නොමඟ යවන මෙවැනි ප්‍රකාශ කරලා, අප සහ ජාත්‍යන්තර ප්‍රජාව අතර තිබෙන හොඳ හිත නැති කරන්නට, කප්පාදු කරන්නට බංකොලොත් දේශපාලනඥයන් අද කුමන්ත්‍රණය කරනවා. ඒ කුමන්ත්‍රණකාරයෝ එසේ කරද්දී, විශේෂයෙන්ම අවුරුදු දහස් ගණනාවක් තිස්සේ ඉතාමත්ම හොඳින් මේ රට තුළ සහජීවනයෙන් ජීවත් වුණු මුස්ලිම් සහ සිංහල ජනතාව අතර විවිධාකාරයේ හැප්පිලි ඇති කරන්නටත් කුමන්ත්‍රණය කරනවා.

පසුගියදා මහනුවරදී අපි ඒක දැක්කා. විශේෂයෙන්ම මේවා සිදු වෙන්නේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ කණ්ඩායමේ සිටින මන්ත්‍රීවරයෙකුගේ නායකත්වයෙන් කියලා මම කියනවා. පසුගියදා මහනුවර පල්ලිය පාරේ තිබෙන නාම ලේඛනය පවා විනාශ කර තිබෙනවා අපි දැක්කා. ඒවා විනාශ කර මුස්ලිම් ජනතාවට මේ රට තුළ ජීවත් වෙන්නට අයිතියක් නැහැයි කියන භයානක පණිවුඩය දෙන්න අද පටන් අරගෙන තිබෙනවා. නිල් බලකායේ සිටින නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ ප්‍රබල පාක්ෂිකයෙකු මුස්ලිම් විරෝධී ඉතාමත්ම කාලකණ්ණි බලවේගයක් ඇති කිරීමට උත්සාහ කිරීම නිසා ඔහු සිර භාරයට අරගෙන තිබෙනවා. ඒ වාගේම මුස්ලිම් අන්තවාදය නියෝජනය කරන යම් පිරිසකුත් සිර භාරයට අරගෙන තිබෙනවා. එහෙම නම් මධ්‍යස්ථ ජනතාව හැටියට; ජාතික සමඟියට වගකිව යුතු පුද්ගලයන් හැටියට මෙතෙක් මේ රට තුළ ආරක්ෂා කරගෙන ආපු ජනවාර්ගික සමඟිය තව දුරටත් පලුදු නොවන ආකාරයට කටයුතු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු මංගල සමරවීර මහතා]

**** සභාමේසය මත තබන ලද ලේඛනය :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று :*
*Statement tabled:*

"Sri Lanka's support for Palestine

Sri Lanka supports the following resolutions that are tabled every year in the General Assembly and the respective Committees of the UN:

· 2nd Committee and General Assembly (annual):
Resolution titled 'Permanent Sovereignty of the Palestinian People on the Occupied Palestinian Territory, including East Jerusalem, and of the Arab population in the occupied Syrian Golan over their natural resources'

· 3rd Committee and General Assembly (annual):
Resolution titled 'The right of the Palestinian people to self-determination'

· 4th Committee and General Assembly (annual):
Resolutions titled

- Palestine refugees' properties and their revenues
- Operations of the united Nations Relief and Works Agency for Palestine Refugees in the Near East
- Assistance to Palestine refugees
- Palestine refugees' properties and their revenues
- Israeli practices affecting the human rights of the Palestinian people in the Occupied Palestinian Territory, including East Jerusalem
- Israeli settlements in the Occupied Palestinian Territory, including East Jerusalem, and the Occupied Syrian Golan
- Applicability of the Geneva Convention relative to the Protection of Civilian Persons in Time of War, of 12 August 1949, to the Occupied Palestinian Territory, including East Jerusalem, and the other occupied Arab Territories.
- Work of the Special Committee to investigate Israeli Practices Affecting the Human Rights of the Palestinian People and other Arabs of the Occupied Territories

· General Assembly (annual):

- Peaceful settlement of the question of Palestine
- Division for Palestinian Rights of the Secretariat
- Special information programme on the question of Palestine of the Department of Public Information of the Secretariat.
- Assistance to the Palestinian people
- Committee on the Exercise of the Inalienable Rights of the Palestinian People

· Additionally, Sri Lanka has supported the following Resolutions related to Palestine in the UN and its agencies

- Resolution granting Palestine non-member Observer Status in the UN -2012.

  Sri Lanka continues to support full membership for Palestine in the UN.
- Palestine-sponsored resolution in the UN in support of non-member Observer States being allowed to raise their flags at the UN Headquarters - September 2015.
- Resolution titled "Human rights violations emanating from Israeli military attacks and incursions in the Occupied Palestinian Territory, particularly in the occupied Gaza strip" at the 6th Special Session of the Human Rights Council in Geneva (Human rights violations emanating from Israeli military attacks and incursions in the Occupied Palestinian)- 2008
- Palestine's full membership in UNESCO - 2011
Sri Lanka has expressed support for Palestine and pledged to vote in support in the event of a vote for the following:
  - Palestine's membership in the World Trade Organization (WTO) in 2016. If the matter fails to be considered this year in the WTO, Sri Lanka has pledged support at any future date/session when the matter would be taken up for consideration.
  - Palestine's membership in INTERPOL in 2016. If the matter fails to be considered this year in INTERPOL, Sri Lanka has pledged support at any future date/session when the matter would be taken up for consideration.

· Sri Lanka chairs the UN Special Committee to Investigate Israeli Practices Affecting the Human Rights of the Palestinian People and Other Arabs of the Occupied Territories. Sri Lanka has been chairing this Committee for over 3 decades since its inception in 1968 and continues to do so."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් අලුවිහාරේ මන්ත්‍රීතුමා.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාට ලිපියක් ඉදිරිපත් කළා. ඒ වාගේම එහි පිටපතක් මා ජනමාධ්‍යටත් ලබා දුන්නා. ඔබතුමාගේ අසුන - කථානායක පුටුව- ගැන -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මා ඒ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. ඒ නිසා මට පොඩ්ඩක් කල් දෙන්න.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
එම ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කළේ කවුද කියලා මට ලිඛිතව දන්වන්න කියන්න. මම පරීක්ෂා කරලා බලන්නම්. හැබැයි, මගේ

පුටුවේ වාඩිවීමේ කාරණය ඔය තරම්ම ප්‍රසිද්ධ වෙන්න දෙයක් නොවෙයි. ඒ ගැන හය වෙන්න ඕනෑ නැහැ. මගේ පුටුව ගැන මටයි වගකීම තිබෙන්නේ. මේ පුටුව ගැන හිතනවාට වඩා මේ රටේ දැවෙන ප්‍රශ්න බොහෝ ගණනක් තිබෙනවා. එම කාරණය ගැන මා පරීක්ෂණයක් කරලා සොයා බලන්නම්.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
"රිවිර" පත්තරේත්, "මව්බිම" පත්තරේත් මාධ්‍යවේදීන්ට තර්ජනය කර තිබෙනවා. එම පරීක්ෂණය සඳහා පිටස්තර කෙනෙක් පත් කරනවා නම් හොඳයි. නිහාල් සෙනෙවිරත්න මහත්මයා පත් කරනවා නම් හොඳයි කියලා මා හිතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුව ඇතුළේ පාලනය මම හොඳ විධියට කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
මා ඔබතුමාට එහෙම යෝජනා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මම ඒක කරන්නම්. මම කියන්නේ මේකයි. මීට වැඩිය රටේ දැවෙන ප්‍රශ්න තිබෙනවා. මේක ලොකු ප්‍රශ්නයක් නොවෙයි. මගේ පුටුව සම්බන්ධයෙන් ඔය කියන කාරණය මට ලොකු ප්‍රශ්නයක් නොවෙයි. මම මේ පුටුව ඕනෑම වෙලාවක දෙන්න ලැහැස්තියි. බොහොම ස්තුතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාගේ පුටුවේ වාඩිවුවා යැයි කියන කාරණාව සම්බන්ධව දැනට චෝදනාවට ලක්ව සිටින පාර්ලිමේන්තුවේ නිලධාරියෙක් ඊයේ දිනයේ "රිවිර" පත්තරයේ සහ "ලක්බිම" පත්තරයේ පාර්ලිමේන්තු වාර්තාකරුවන් දෙදෙනාට තර්ජනය කර තිබෙනවා. ජනමාධ්‍ය මර්දනය කිරීමට මෙවැනි තර්ජනයක් කරන්න පාර්ලිමේන්තුවේ කිසිම නිලධාරියෙකුට අයිතියක් නැහැ. එහෙම නම් කථානායකතුමාට පැමිණිල්ලක් කරලා, කථානායකතුමා කැඳවලා එය කරන ක්‍රමවේදයක් තිබෙනවා. පාර්ලිමේන්තුව ඇතුළේ පාර්ලිමේන්තුවේ විවිධ කරුණු පිළිබඳව වාර්තා කරන ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කරමින් සහ ඔවුන්ට පවරා තිබෙන කටයුතුවලට බාධා කරමින් පාර්ලිමේන්තුවේ නිලධාරින් මෙසේ හැසිරෙනවා නම්, ජනමාධ්‍යවේදීන් හැටියට ඔවුන් ඉතාම භයානක තත්ත්වයකට මුහුණ දෙනවා. ඔබතුමාට මේවා ඔක්කෝම ගැන බලන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට එය වාර්තා කළේ නැහැ. මා පරීක්ෂා කරන්නම්, ඒ ගැන.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා අදම ඒ අය කැඳවා ජනමාධ්‍යවේදීන්ගේ නිදහස මේ දඩබ්බර නිලධාරින්ගෙන් ආරක්ෂා කර දෙන්න.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාට ඔය තිබෙන කැක්කුම ඒ කාලයේත් තිබුණා නම් කොච්චර හොඳද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, විසර්ජන පනත් කෙටුම්පත, 2017. කාරක සභා අවස්ථාව.

## විසර්ජන පනත් කෙටුම්පත, 2017
### ஒதுக்கீட்டுச் சட்டமூலம், 2017
### APPROPRIATION BILL, 2017

**කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-]**
**ප්‍රගතිය: නොවැම්බර් 21]**
**[කථානායකතුමා මූලාසනාරූඪ විය.[**

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி : நவம்பர் 21]
[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]

Considered further in Committee- [Progress: 21st November]
[THE HON. SPEAKER in the Chair.]

**126 වන ශීර්ෂය.- අධ්‍යාපන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන -පුනරාවර්තන වියදම, රු.1 ,525,004,000

**தலைப்பு 126.- கல்வி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 1,525,004,000

HEAD 126.- MINISTER OF EDUCATION
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,525,004,000

**163 වන ශීර්ෂය.- අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 249,063,000

**தலைப்பு 163.- உள்ளக அலுவல்கள், வடமேற்கு அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 249,063,000

HEAD 163.- MINISTER OF INTERNAL AFFAIRS, WAYAMBA DEVELOPMENT AND CULTURAL AFFAIRS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 249,063,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ශීර්ෂ අංක 126, 207, 209, 212, 213 සහ 163, 206, 208, 226, 227 සලකා බැලීම පූර්ව භාග 10.00 සිට 12.30 දක්වාත් අපර භාග 1.00 සිට 6.30 දක්වාත්.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 35ක් තිබෙනවා.

[පූ.භා. 10.18]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු සභාපතිතුමනි, "2017 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින -2016 නොවැම්බර් 22 අඟහරුවාදා- විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 126, 207, 209, 212, 213 සහ 163, 206, 208, 226, 227 දරන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මා යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, 2017 අය වැය විවාදයේ අද දින කාරක සභා අවස්ථාවේ ප්‍රථමයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කරුණු ගණනාවක් ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

එයට හේතුව වන්නේ තනි විෂයක් වශයෙන් ගත්තොත් අපේ රටේ අනාගතයට වැඩිම බලපෑමක් කරන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය වීමයි. ගරු සභාපතිතුමනි, අපේ රටේ මිනිසුන් කෝටියක් තමන්ගේ අනාගතය භාර දීලා තිබෙන්නේ මෙම අමාත්‍යාංශයට; මෙම අමාත්‍යවරයාට. ඔබතුමාත් ඒ ගැන දන්නවා. මොකද, දරුවන් ලක්ෂ 43ක් පාසල්වල අධ්‍යාපනය ලබනවා. ඔවුන්ගේ දෙමව්පියන් ලක්ෂ 65කට ආසන්න ප්‍රමාණයක් සිටිනවා. එතකොට ජනතාවගෙන් කෝටියකට ආසන්න ප්‍රමාණයක් තමන්ගේ දරුවන්ගේ අනාගතය භාර දී තිබෙන්නේ, මෙම අමාත්‍යාංශයටයි. ඒ නිසා මෙම අමාත්‍යාංශයට තිබෙන බලපෑම විශාලයි; ඒ වාගේම වගකීමත් විශාලයි.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය කරන හොඳ දෙය කෙටි කාලීනව පෙනෙන්නේ නැහැ. අධ්‍යාපනය කරන විනාශයත් කෙටි කාලීනව පෙනෙන්නේ නැහැ. සරලව කිව්වොත්, ළිං කැපුවාම වළ පෙනෙනවා. හැබැයි, අධ්‍යාපනයට කරන විනාශයේ ප්‍රතිඵල එහෙම අපට අද පෙනෙන්නේ නැහැ. ඒක පෙනෙන්නේ, අවුරුදු දහයක්, පහළොවක් පසු වෙලායි. අපේ රටේ අධ්‍යාපන ඇමතිවරුන් රාශියක් සිටියා. නමුත් මේ රටේ ජනතාව ගරු කරන, ජනතාවට මතක හිටින අධ්‍යාපන ඇමතිවරුන් දෙදෙනායි සිටියේ. එක්කෙනෙක්, අපි කවුරුත් දන්නා සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා. අනෙක් කෙනා, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා. තව බොහොමයක් අධ්‍යාපන ඇමතිවරු මේ රටේ ඉඳලා තිබෙනවා. ඔවුන් මතක සුළු පිරිසකටයි. මේ රටේ විධායක ජනාධිපතිවරයෙකුත් අධ්‍යාපන අමාත්‍යාංශය දැරුවා. නමුත් කාටවත් මතක නැහැ, අධ්‍යාපනයට කළේ මොනවාද කියා. මම ඒකයි කිව්වේ, ගරු සභාපතිතුමනි.

අධ්‍යාපන ඇමතිවරයාට ආයතන 10,000ක් බලන්න තිබෙනවා. හැම පාසලක්ම ආයතනයක්. හරියාකාරව එම කටයුතු ඉටු කරනවා නම් මේ රටේ වැඩිම ජන ප්‍රජාවක් සම්බන්ධ, සංවිධාන ව්‍යුහයක් තිබෙන, හැම ගමකටම තමන්ගේ සම්බන්ධතාවක් තිබෙන එකම අමාත්‍යාංශය අධ්‍යාපන අමාත්‍යාංශයයි. අධ්‍යාපන ඇමතිවරයාටත්, එම අමාත්‍යාංශයටත් එවැනි සුවිශාල හැකියාවක් තිබුණත්, මා මුලින් සඳහන් කළ අධ්‍යාපන ඇමතිවරුන් දෙදෙනා විතරක් මේ රටේ ජනතාවට මතක තිබෙන්නේ ඇයි? සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපන පනත ගෙනෙනකොට, එතුමා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකු නොවෙයි. එතුමා පසුව තමයි එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකත්වය ගත්තේ. ඇතුලත්මුදලි මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක්. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ විවිධාකාර ප්‍රතිපත්ති පිළිබඳව අපට විශාල විවේචන තිබුණත්, මහපොළ ශිෂ්‍යාධාර ක්‍රමය හඳුන්වා දුන් නිසා එතුමා අගය කිරීමට ලක් වෙනවා. කන්නන්ගර මැතිතුමා ජාතික වීරයෙකු වශයෙන් අපේ රටේ undisputedly පිළිගන්නවා. අපේ රටේ "ජාතියේ පියා" වශයෙන් ඩී.එස්. සේනානායක මැතිතුමා හැඳින්වූවාට, සමහර අය එය පිළිගන්නේ නැහැ.

ඇත්තටම ගැටලු තිබෙනවා. එතුමා නිදහස් අධ්‍යාපනයට විරුද්ධ වෙච්ච අගමැතිවරයෙක්. ඒ වාගේම විවිධ වීරයන් සම්බන්ධ මේ රටේ දේශපාලන විවාද තිබෙනවා. දේශපාලන විවාද නැති, නූතන පරම්පරාවේ ජාතික වීරයෙක් වශයෙන් හඳුන්වන්න පුළුවන් වන්නේ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා විතරයි. දේශපාලන විවාදයක් නැහැ. උතුරේ සිට දකුණ දක්වා දේශපාලන වශයෙන් කිසිම භේදයකින් තොරව එතුමා ජාතික වීරයෙක් වශයෙන් අගය කරනු ලබනවා. ඒ වාගේම ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාටත් එම ගරුත්වය තිබෙනවා. ඒ ඇයි? ගරු සභාපතිතුමනි, මේ දෙදෙනාම පොදු ජනතාවට ප්‍රමාණාත්මකව අධ්‍යාපන අවස්ථා වැඩි කරපු අය; මේ දෙදෙනාම අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කරපු අය; ඒ නිසා තමයි මේ දෙදෙනා ඉතිහාස ගත වෙලා තිබෙන්නේ. අනෙක් අය ඉතිහාස ගත වෙලා තිබෙන්නේ, ධවල පත්‍රිකා ගෙනා අය; අධ්‍යාපනය විකුණන්න හදපු කට්ටිය; විකුණාගෙන කාපු කට්ටිය යනාදී වශයෙනුයි. වර්තමාන අධ්‍යාපන ඇමතිතුමාට මේ පැති දෙකෙන් එකක් තෝරා ගන්න පුළුවන්. ඔබතුමා අධ්‍යාපන අමාත්‍යාංශය බාරගෙන තවමත් අවුරුදු එකහමාරයි වෙන්නේ. ඔබතුමාට අර දෙදෙනාගේ ගොඩට යන්නත් පුළුවන්; නැත්නම් අමතක වෙච්ච ගොඩට එන්නත් පුළුවන්. ඒක තීරණය වෙන්නේ ඔබතුමා අධ්‍යාපන අමාත්‍යාංශය මෙහෙයවන විධියට අනුවයි. ඒ නිසා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් ඔබතුමාට තිබෙන්නේ, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කරන එක, ජනතාවගේ දරුවන්ට අධ්‍යාපන අවස්ථා වැඩි කරන එක, නොමිලේ ලබා දෙන අධ්‍යාපනය පුළුල් කරන එක සහ ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ සුභ සාධනය වැඩි කරන එකයි. මා දකින විධියට අධ්‍යාපන ඇමතිවරයාට කරන්න තිබෙන මූලික කාරණා එච්චරයි.

ප්‍රමාණාත්මකව අධ්‍යාපන අවස්ථා වැඩි කිරීම, අධ්‍යාපනයේ ගුණය වැඩි කිරීම, ගුරුවරුන්ගේ හා සිසුන්ගේ සුභ සාධනය දියුණු කිරීම; මේවා කළොත් රටේ සුභ සාධනයත් ඇති වෙනවා; ඔබතුමාගේ සුභ සාධනයත් ඒ ගමන්ම සිද්ධ වෙනවා. ඒ නිසා අධ්‍යාපනය සම්බන්ධව ඔය කියන කරුණු පදනම් කර ගෙන මම කැමැතියි මේ විෂයට එන්න. ඒ නිසා අධ්‍යාපනය පුද්ගලීකරණය කරපු අය, ධවල පත්‍රිකා ගෙනා අය, විකුණන්න එක එක theories දාපු කට්ටිය ඔක්කොම දේශපාලනික වශයෙනුත් අසාර්ථක වෙලා තිබෙනවා. ජනතාවගේ මනසේ කළු ලප ඇති කරපු කට්ටිය. ඒ නිසා එවැනි අධ්‍යාපන ඇමතිවරු අපට අවශ්‍ය නැහැ. එවැනි ආකාරයේ අධ්‍යාපන අමාත්‍යාංශයක් වැදගත් නැහැ.

ඉතා ඉක්මනින් පොදු කරුණු කිහිපයක් ඔබතුමාට කියන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අය වැය ඇස්තමේන්තු පොත - Budget Estimates - බැලුවොත් එතරම් ව්‍යාපෘති සංඛ්‍යාවක්, එතරම් ඒකක ප්‍රමාණයක් තිබෙන වෙනත් අමාත්‍යාංශයක් නැති තරම්. අධ්‍යාපන අමාත්‍යාංශයේ අවංකව කටයුතු කරන, කැප වී වැඩ කරන නිලධාරි මහත්වරුන්ට, ගුරුවරුන්ට නිසි ගෞරව ඇතිවයි මේ දේ මා කියන්නේ. ගරු ඇමතිතුමනි, මා විශ්වාස කරන ආකාරයට සංවිධානමය වශයෙන් ගත්තොත් ලංකාවේ තිබෙන සුවිශාලම, අසංවිධානාත්මක අමාත්‍යාංශවලින් එකක් තමයි අධ්‍යාපන අමාත්‍යාංශය.

ඔබතුමා බලන්න, කොපමණ ඒකක ප්‍රමාණයක්, කොපමණ ව්‍යාපෘති ප්‍රමාණයක්, කොපමණ වැඩසටහන් ප්‍රමාණයක් මධ්‍යම අමාත්‍යාංශයේ මේ ආකාරයට තිරස්ව තිබෙනවා ද කියලා. ඔබතුමාට කරන්නට තිබෙන්නේ, පොදු ජනතාව තුළ නොමිලේ අධ්‍යාපනය ප්‍රචලිත කිරීම; ගුණාත්මකභාවය වැඩි කිරීම; ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ සුභසාධනය සැලසීම. නමුත්, දැන් ඒක බිම් මට්ටමට යන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. මේ බොහොමයක් ඔබතුමා පටන් ගත්ත දේවල් නොවෙයි. කාලයක් තිස්සේ ප්‍රතිලාභ ලැබෙන්නේ නැති වෙන කොට, ප්‍රශ්න එහෙන් මෙහෙන් එන කොට, එක එක ව්‍යාපෘතිවලින්, එක එක unitsවලින් අර ප්‍රශ්නයට, මේ ප්‍රශ්නයට කියලා දමා තිබෙනවා. සාක්ෂරතාව වැඩි කරන්න වෙනම project එකක් තිබෙනවා; ඉංග්‍රීසි අධ්‍යාපනයට තව එකක් තිබෙනවා; ගණිතයට තව එකක් තිබෙනවා. නමුත්, මේ අය වැය ඇස්තමේන්තු පොතේ ඇතුළත් කරලා තිබෙන්නේ සුළු ප්‍රමාණයයි. මේ අමාත්‍යාංශය කැලයක් වාගේයි තිබෙන්නේ.

ඇත්තටම ගත්තොත්, අවසානයේ මේ හැම දෙයක්ම දරුවන්ට පාසලේදී ලැබෙන්නට ඕනෑ. ඒකයි විය යුත්තේ. ඒක කරන්නට අධ්‍යාපන අමාත්‍යාංශයක් තිබෙනවා; පාසල් පද්ධතියක් තිබෙනවා. නමුත්, සිද්ධ වෙලා තිබෙන දේ තමයි, මේ සුවිශාල අසාර්ථකභාවය නිසා පසු ගිය කාලයේ- ඔබතුමා දන්නවා, දරුවෙක් අවුරුදු එකොළහක් ඉගෙන ගත්තත්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය pass වෙන්නේ සියයට 50යි කියලා. ඒක අකිල විරාජ් ඇමතිතුමාගේ ප්‍රශ්නයක් කියලා මම කියන්නේ නැහැ. ඔබතුමාට ඒ ප්‍රශ්නයට ලබන අවුරුද්දේ ඉඳලා විවේචන එන්න පටන් ගනියි. මොකද, ඔබතුමා මේ තනතුර භාර අරගෙන දැනට අවුරුදු එකහමාරයි නේ. නමුත් අපි කල්පනා කරන්නට ඕනෑ ගරු සභාපතිතුමනි, අවුරුදු එකොළහක් දරුවෙක් ඉස්කෝලේ ගිහිල්ලා, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී එයාට ගණන්වලට ලකුණු තිස්පහක් ගන්න බැරි නම්, ඒක දරුවාගේ වැරැද්දක් වෙන්න බැහැ කියා. අසමත් වෙන්නේ දරුවන්ගෙන් සියයට පහක් නම්, "ඒ සියයට පහක් වූ දරුවන්ගේ සමහර මානසික ව්‍යාකූලතා නිසා එහෙම වෙනවා"ය කියා අපට කියන්නට පුළුවන්.

අපි මොන සැලසුම්, මොන ව්‍යාපෘති, මොන unit හැදුවත්, දරුවන්ගෙන් සියයට 45ක් අසමත් වෙන කොට, "මේක දරුවන්ට ලැබිලා නැහැ" කියලා අවසානයේ ගරු ඇමතිතුමාට පෙනෙනවා. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මම ඉල්ලා සිටිනවා, නොමිලේ ලබා දෙන අධ්‍යාපන ක්‍රමය රැකෙන පරිදි, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය රැකෙන පරිදි මේ අමාත්‍යාංශය කටයුතු කරන්නය කියා. මේක කැලයක් වාගේ අමාත්‍යාංශයක්. විෂයයන් කොහේ තිබෙනවාද කියා ඔබතුමා හොයා ගෙන තිබෙනවාද කියලා මා දන්නේ නැහැ. ඒ නිසා මේවා විධිමත් කරන්න. මොකද, එක එක ව්‍යාපෘතිවලින් පමණක් අධ්‍යාපන ප්‍රතිලාභය පහළට යන්නේ නැහැ.

අද දින අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයේදී ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට මේ කරුණු යොමු කරන්නට කැමැතියි. කෙටි කරුණු දෙක, තුනක් කියනවාය කියා මම ඔබතුමාට කිව්වා. විශේෂයෙන්ම, දරුවන් අතරත්, පොදුවේ රටේත් විද්‍යාත්මක වශයෙන් සනාථ නොකෙරුණු විවිධ මිථ්‍යාවන් සුවිශාල වශයෙන් බෝ කරන, බෝවෙන යුගයක අප ඉන්නේ කියා ඔබතුමා දන්නවා.

ඔබතුමා තමයි විද්‍යාත්මක අධ්‍යාපනයක් ලබා දීම සම්බන්ධව රටේ ඉන්න භාරකරු. දරුවන්ට වෙන වෙන දේවල් ඉගෙන ගන්න අවශ්‍ය නම්, ඔවුන්ට ඒ අයිතිය තිබෙනවා. නමුත් පාසල් පද්ධතිය කියන්නේ මේ රටේ පනතක් මඟින් ක්‍රියාත්මක වන දෙයක්. විද්‍යාත්මක කරුණු මත තමයි ඒ ඉගැන්වීම් කටයුතු කරන්න ඕනෑ. අපේ පෞද්ගලික විශ්වාස, පෞද්ගලික චර්යා, පෞද්ගලික ඇවතුම්-පැවතුම් එයට සම්බන්ධ කර ගැනීමට අපට අයිතියක් නැහැ. නමුත් මම කියනවා, පසු ගිය කාලයේ විභාග කාල සටහන හැදුවේත් රාහු කාලය බලලා. මේ සැරේත් එහෙමද කළේ කියලා කියන්න මම දන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, සමහර පාසල්වල දරුවන් අපොස (සාමාන්‍ය පෙළ), (උසස් පෙළ) admission card එක අත්සන් කරන්නේත් රාහු කාලය බලලා. මොනවාද මේ? රාහු කාලය බලන්න කැමති වැඩිහිටියන්ට ඒ සඳහා අවස්ථාව දෙන්න. අපට ඒක තහනම් කරන්න බැහැ නේ. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය විද්‍යාත්මකව හරි, නීත්‍යනුකූලව හරි 'රාහු කාලය' නිශ්චිත වශයෙන් පිළිගෙන තිබෙනවාද? එහෙම නම් ඒක මොන අච්චු පොතේද තිබෙන්නේ? ගරු ඇමතිතුමනි, අපි මේ කථා කරන්නේ කවුරු ගැනද? 21 වන සියවසේ දශක එකහමාරක් පසු කරලා අනාගතයට එන්න ඉන්න දරුවන් ගැන. 1970, 1980, 1990 ගණන්වල අපේ ඔළුවල තිබුණු මනස්ගාත, විද්‍යාත්මක වශයෙන් සනාථ නොවුණු -බොහෝ විට බොරු බව ඔප්පු වුණු- කරුණු ඔවුන් මත පැටවීමට අපට තිබෙන අයිතිය කුමක්ද? 'කලීල් ජිබ්රාන්' කියා තිබෙනවා, "දරුවන් අපි තුළින් ආවාට, අපි වාගේ නොවෙයි" කියලා. ඒක අපි කවුරුත් දන්නවා. හැම පරම්පරාවක්ම ඊට කලින් පරම්පරාවට වඩා ඉස්සරහින් ඉන්නවා.

ඔබතුමා පෞද්ගලිකව මැදිහත් වෙලා එහෙම කරනවාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. නමුත් දැනුවත්ව මිථ්‍යාව ආයතනගත කරන්න දෙන්න එපා කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගෙවල්වල එහෙම කරනවා නම් ඒ දරුවන්ට ඒක කරන්න දෙන්න. ඒකට ඔබතුමාට කරන්න දෙයක් නැහැ. ඒ වාගේම අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, දරුවන්ට විද්‍යාත්මක අවබෝධය ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය තුළින්ම තවත් කරුණු ගණනාවක් ක්‍රියාත්මක කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, පොදු කරුණක් වශයෙන් මා මේ පිළිබඳව මුලින්ම කියන්න ඕනෑ. ඔබතුමා තමයි මේ රටේ ඉන්න සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලුම දරුවන් භාර අධ්‍යාපන ඇමතිතුමා. අපට ජාතිකත්ව පදනමින් ඇමතිවරු නැති වීම අපි ඉතාම අගය කරනවා. මම මේ පිළිබඳව විවාදයකට පැටලෙන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් ඔබතුමා දන්නවා, මුස්ලිම් විවාහ නීතිය පිළිබඳව මේ රටේ සාකච්ඡාවක් තිබෙන බව. ඒක මුස්ලිම් ජනතාවගේ සංස්කෘතික අයිතියක්. වෙනත් සංස්කෘතික අයිතීන්ට අපි ගරු කරනවා. ගරු ඇමතිතුමනි, නමුත් ඕනෑම දරුවෙක් මුස්ලිම් හෝ දෙමළ හෝ සිංහල වෙන්නේ ඉපදුණාට පසුවයි. ඔබතුමන්ලාගේ අය වැය යෝජනාවලත් අවුරුදු 13ක අනිවාර්ය අධ්‍යාපනයක් ගැන සඳහන් වෙලා තිබෙනවා. අද අපේ රටේ තිබෙන මුස්ලිම් විවාහ නීතිය අවුරුදු ගණනාවක් පරණ එකක්.

අද ඒකට දේශපාලන නායකයෝ මැදිහත්වෙලා, විශේෂයෙන්ම උගත් මුස්ලිම් කාන්තාවන් සුවිශාල ප්‍රමාණයකගේ දායකත්වයෙන් මුස්ලිම් විවාහ නීතිය සංශෝධනය කිරීමට විවිධ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒක තවම සාකච්ඡා මට්ටමේ තිබෙන්නේ. නමුත් දැනට තිබෙන නීතිය අනුව අවුරුදු 12ට වැඩි

[ගරු බිමල් රත්නායක මහතා]

මුස්ලිම් ගැහැනු දරුවන්ට විවාහ වීමට පුළුවන්. ඔබතුමා කාගේත් අධ්‍යාපන ඇමතිවරයා. මුස්ලිම් දරුවන්ගේත් දැරිවියන්ගේත් අධ්‍යාපන ඇමතිවරයා ඔබතුමායි. මේ අවුරුදු 12 නීතිය, සංස්කෘතිකමය වශයෙන් හිමි වෙන්න පුළුවන්. එහෙම හිමි වෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය මට තිබෙනවා. අවුරුදු 18 දක්වා සෑම දරුවකුම දරුවකු ලෙස සලකා ඔවුන්ට අධ්‍යාපනය ලබා දීමේ වගකීම ඔබතුමාට තිබෙනවා. ඒකෙන් බැහැරව කටයුතු කිරීම අපේ රටේ තිබෙන නීතිය අනුව වැරදියි. අද දරුවන් පාසල් නොයැවීම වැරැද්දක්. ඒ නීති සංශෝධනයේදී අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සෑම මුස්ලිම් හෝ දෙමළ හෝ ඕනෑම ජාතිකත්වයක - එදා බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කිව්වා පුත්තලම පැත්තේ ඉන්න කෆී කියන ජන වර්ගය ගැන.- අවුරුදු 18 දක්වා දරුවන් සියලු දෙනාටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය පිළිබඳව නිරීක්ෂණ ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඒක තමයි අංක එක.

ගරු සභාපතිතුමනි, අද මේවා ආගමික ප්‍රශ්න බවටත්, සංස්කෘතික ප්‍රශ්න බවටත් පත් වී තිබෙනවා. අපි තේරුම් ගන්න ඕනෑ, මේ හැම සංස්කෘතියක්ම, හැම ආගමක්ම කාලානුරූපව වෙනස් වෙලා තිබෙන බව. මම අපේ රටේ සිංහල අයට බලපාන නීතිය පිළිබඳව නීතිවේදීන්ගෙන් ඇහුවා. මීට අවුරුදු 100කට කලින් සිංහල කාන්තාවන්ට වයස සීමාව අවුරුදු 17ද කොහේද තිබිලා තිබෙන්නේ. නමුත් අද ඒක වෙනස් වෙලා තිබෙනවා. ඔක්කොම ආර්ථික ප්‍රශ්න, යුද්ධ මැද්දේ ලංකාව මානව සංවර්ධන දර්ශකවලින් ලෝකයේ ඉහළ තැනකට ඇවිල්ලා තිබෙනවා නම් ඒකට ප්‍රධාන හේතුව තමයි නොමිලයේ අධ්‍යාපනය. නොමිලයේ අධ්‍යාපනය දීමෙන් ලැබුණු ලොකුම ප්‍රතිඵලය තමයි අපේ රටේ ගැහැනු ළමයි ඉස්කෝලේ ගිය එක.

ගරු සභාපතිතුමනි, ගැහැනු ළමයි ඉස්කෝලේ යවන එකෙන් දොස්තර නෝනා කෙනෙක් හදන එක; ඉංජිනේරු නෝනා කෙනෙක් හදන එක වාගේ සරල දෙයක් නොවෙයි, උගත් කාන්තාවන්ට පමණයි; උගත් අම්මලාට පමණයි උගත් පුතුන් හදන්න පුළුවන්. දියුණු අම්මලාට විතරයි දියුණු පිරිමි හදන්න; දියුණු පුතුන් හදන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ නිසා අපේ රටේ මුස්ලිම් සමාජය සංස්කෘතික වශයෙන් ඉස්සරහට ගන්නවා නම් ඒ සංස්කෘතිකමය ආරක්ෂාව තිබිය යුතුයි. අද විදේශ කටයුතු ඇමතිවරයා පලස්තීනයේ අල්-අක්සා පල්ලිය සම්බන්ධයෙන් ආණ්ඩුව ඡන්ද නොදුන්නේ ඇයි කියන එක ගැන ආණ්ඩුවේ ස්ථාවරය ප්‍රකාශ කළා. ඒක වැරදියි.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, what is your point of Order?

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධයෙන් දැනට කොමිටියක් පත් කර තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවශ්‍ය නැහැයි කියලා මම හිතනවා. ඒක වෙනස් කරන්න අපි දැනටමත් සාකච්ඡා කර ගෙන යනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හොඳයි, එතුමා ඒකට පිළිතුරු දෙයි. That is not a point of Order.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම මුස්ලිම් මන්ත්‍රීවරුන්ට ඒ ගරුත්වය ලබා දෙමින් තමයි කථා කළේ.

අධ්‍යාපන ඇමතිතුමනි, මම ඉතාමත් වගකීමෙන් මේ කාරණය කියනවා. මේ දරුවන් ප්‍රමුඛ අපි කවුරුත් එක රටකයි ජීවත් වෙන්නේ. ඒ නිසා මේ දැරිවියන්ට අවුරුදු 18 දක්වා ඉගෙන ගන්න අවස්ථාව තිබිය යුතුයි. ඒක වෙනස් කරන්න හොඳ නැහැ. අපි ජාතිකත්වයක් ඉස්සරහට ගන්නවා නම් අනිවාර්යයෙන්ම කළ යුතු වන්නේ ඔවුන්ට අධ්‍යාපනය ලබා දෙන එකයි.

ගරු සභාපතිතුමනි, 1999දී කොෆී අනන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයා විධියට ඉන්න කොට ඉදිරිපත් කරපු පරීක්ෂණ වාර්තාවක් මම ඉදිරිපත් කරන්නම්, ඒ මුස්ලිම් සංස්කෘතියට නිසි ගරුත්වයක් ඇතුව. අපට එහෙම ප්‍රශ්නයක් නැහැ. මම කිව්වේ ඒකයි. පලස්තීන ප්‍රශ්නයත් එක්ක මගේ කථාව සම්බන්ධ කරන්න හැදුවේ ඒකයි.

විදේශ කටයුතු ඇමතිවරයා කිව්වා, අල්-අක්සා පල්ලිය සම්බන්ධ Resolution එකට යුනෙස්කෝ එකේදී සහයෝගය ලබා නොදුන්නු හේතුව. ඒක වැරැදියි, ගරු සභාපතිතුමනි. පලස්තීනයට ඒක අයිතිය කියලා ශ්‍රී ලංකාව පිළිගෙන තිබෙනවා. එතුමාත් කිව්වා, "East Jerusalem" කියන ජෙරුසලමේ නැඟෙනහිර කොටස පලස්තීනයට අයිතියි කියලා ශ්‍රී ලංකා රාජ්‍ය පිළිගෙන තිබෙනවා කියලා. මේ කථා කරන මුස්ලිම් පල්ලිය තිබෙන්නේ එතැනයි. ඒක මුස්ලිම් බැතිමතුන්ගේ වැදගත්ම පල්ලියක්. ඒක තිබෙන්නේ East Jerusalemවල. අද ඊශ්‍රායලය මොකක්ද කරන්නේ? ඔවුන්ගේ නැති වෙච්ච පල්ලියක් හොයන්න ඒ මහා වැදගත් සිද්ධස්ථානය යට උමං 100ක් විතර කැණලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේක සරලව තේරුම් ගන්න මම මේ කාරණය කියන්නම්. දළ දා මාලිගාව බෞද්ධයන්ගේ සිද්ධස්ථානයක්. ඒක යට තවත් සිද්ධස්ථානයක් මීට කලින් තිබුණා කියලා හොයන්න දළ දා මාලිගාව යට උමං මාර්ග හදනවා වාගෙයි මේ සිදුවීමත්. ශ්‍රී ලංකා රජය East Jerusalem පිළිගන්නවා නම් පලස්තීනයේ අගනුවර කියලා, මේ කියන කථාව විහිළුවක්. ගරු සභාපතිතුමනි, මා සතුව දැනට තිබෙනවා, ඒ යුනෙස්කෝ අධ්‍යක්ෂවරයාගේ පක්ෂග්‍රාහී ක්‍රියාකාරිත්වයට විරුද්ධව පලස්තීන විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් නිකුත් කරපු නිවේදනය. එම නිවේදනය මා **සභාගත*** කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපි මේ කාරණය තේරුම් ගන්න ඕනෑ. යුනෙස්කෝ සංවිධානයේ යෝජනාව ජාතීන්ගේ සංගමයේ සිට -එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ කිරීමටත් පෙර සිට- ලෝකයා සම්මත කරපු යෝජනාවක්. මෙවරත් ඒක දින්නා. ඒ නිසා මුස්ලිම් ජනතාවගේ සංස්කෘතික අයිතීන් සම්බන්ධයෙන් අපි ගරු කරනවා. හැබැයි, දරුවන්ගේ අධ්‍යාපන අයිතියටත් අපි ඒ හා සමානව ගරු කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු සභාපතිතුමනි, මා මේ කාරණයත් ඔබතුමාට කියන්නම්. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත් වීමෙන් පාකිස්තානයේ එක්තරා පරීක්ෂණයක් කළා. එකම සමාජ, ආර්ථික මට්ටමක් තිබෙන දැරිවියන් කණ්ඩායම් දෙකක් හොයා ගත්තා. එකම සමාජ, ආර්ථික මට්ටමක් තිබෙන හය වසර දක්වා අධ්‍යාපනය ලබලා පාසල් හැර ගිය දැරිවියන් දාහකගේත්, හත වසර දක්වා අධ්‍යාපනය ලබලා පාසල් හැර ගිය දැරිවියන් දාහකගේත් අනාගත ජීවිතය කුමන ආකාරයෙන්ද කියලා බැලුවා. එක වසරක අධ්‍යාපනයේ වෙනස ජීවිතයට කොපමණ බලපානවාද? කට්ටියක් හය වසරෙන් පාසල හැර ගියා. ඉතුරු කට්ටිය හත වසරෙන් පාසල හැර ගියා. එක්සත් ජාතීන්ගේ සංවිධානය අවුරුදු පහළොවක් තිස්සේ මේ දැරිවියන් දෙදාහ පිළිබඳව පරීක්ෂණ කළා.

ඔවුන් හඳුනාගත්තේ මොකක්ද? ඔවුන් හඳුනාගත් දේ තමයි එක් වසරක අධ්‍යාපනයේ වෙනසෙහි බලපෑමේ තරම. ඒ දැරියන් අම්මලා වුණාට පසුව ඒ අයගේ දරුවන් සම්බන්ධයෙන් වාර්තා වූ ළමා මරණ අනුපාතිකය අනුව හඳුනාගෙන තිබෙනවා, හය වසරින් ඉස්කෝලය හැර දා ගිය දැරියන් අම්මලා වුණාට පසුව වාර්තා වූ ළමා මරණ අනුපාතය හත වසරින් ඉස්කෝලයෙන් එළියට යන්න සිද්ධ වූ දැරියන් අම්මලා වුණාට පසුව වාර්තා වූ ළමා මරණ අනුපාතිකයට වඩා 32කින් වැඩියි කියන එක. එක් වසරක අධ්‍යාපනයේ වෙනසක් නිසා 1,000ක් දෙනා අතර ළමා මරණ අනුපාතිකය 32කින් වැඩි වෙලා. එහෙම නම්, ගෑනු ළමයින්ට උගන්වනවා කියන එක පිරිමින්ට උගන්වනවාට වඩා ගොඩක් වෙනස් දෙයක්.

ගරු සභාපතිතුමනි, අපේ රටේ එන්නත්කරණයෙහි සාර්ථකත්වය මෙතරම් සාක්ෂාත් වෙලා තිබෙන්නේ ඇයි? කැපිලි, කෙටිලි ඔක්කෝම අස්සේ අපේ රට සෞඛ්‍ය අතින් ඉස්සරහට ගිහින් තිබෙන්නේ ඇයි? ඒ, අපේ දැරියන් ඉස්කෝලේ යන නිසායි. මගේ ආත්තම්මා ඉස්කෝලයේ ගිය කෙනෙක්. මගේ අම්මා ඉස්කෝලේ ගිය කෙනෙක්. මගේ දරුවා අද ඉස්කෝලේ යනවා. අපේ රට, පරම්පරා හතරක් නොමිලේ අධ්‍යාපනය ලැබූ රටක්. ඒ නිසායි අප සංස්කෘතික වශයෙන් මේ ප්‍රමාණයට ඉස්සරහට ඇවිත් තිබෙන්නේ. ඒ නිසායි අප කියන්නේ, මුස්ලිම් ජනතාවගේ සංස්කෘතිය ඉහළට ගන්න නම් මුස්ලිම් දැරියන් ඉගෙන ගත යුතුය කියා. එතකොට තමයි උගත් පුතුන් හදන්න පුළුවන්කම ලැබෙන්නේ. ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, ඒ පොදු කරුණු කීපය කෙරෙහි ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවමින් මා දැන් එන්න කැමැතියි, ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයට.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය -ඔබතුමා - යම් යම් අවස්ථාවලදී විවිධ ප්‍රකාශ කරනවා. ඒ අතරින් විශේෂම කරුණ තමයි, O/Level ගණිතය සමත් නැතිව අපොස (උසස් පෙළ) කරන්න දෙනවා කියන එක. ඔබතුමන්ලා එය කරන්නේ කුමන පදනමකින්ද කියන එක අපට පැහැදිලි නැහැ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මෑතකදී කියා තිබුණා, O/Level ගණිතය සමත් නැතිව අ.පො.ස. (උසස් පෙළ) කරන්න දෙනවා; ගණිතය සමත් වීම අවශ්‍ය නැහැ, අ.පො.ස. (උසස් පෙළට) යන්න දෙනවා කියා. ගරු සභාපතිතුමනි, ගණිතය කියන්නේ-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කමක් නැහැ. ඔබතුමා කියන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, මා හිතන විධියට ඔබතුමා එය වැරැදියට තේරුම් අරගෙන. සමහර විෂයයන් තිබෙනවා, අපොස (උසස් පෙළ) කිරීමට ගණිතය අවශ්‍ය. අපි අලුතින් විෂයයන් 24ක් හඳුන්වා දෙනවා, වසර 13ක අඛණ්ඩ අධ්‍යාපනය ලබා දීමට. එහිදී බොහෝ විෂයයන්වලට ගණිතය අවශ්‍ය වන්නේ නැහැ. නමුත් විද්‍යාව, ගණිතය, වාණිජ ආදි ගණිතය විෂයය අත්‍යවශ්‍ය අංශවලට වෙනදා වාගේම ගණිතය ඕනෑ. ළමයින් අධ්‍යාපනයෙන් හැලීමකට ලක් කරන්නේ නැතිව ලබා දෙන වසර 13ක අඛණ්ඩ අධ්‍යාපනය වෙනුවෙන් Robotics හෝ වැඩ ලෝකයට ගැළපෙන පරිදි හඳුන්වා දෙන්න යන අනෙක් විෂයයන්වලට හෝ ගණිතය අවශ්‍ය වන්නේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, ඕක තමයි අපට සුලභව ඇසෙන කාරණය. ගරු බන්දුල ගුණවර්ධන හිටපු අමාත්‍යතුමාගේ කාලයේත් ඔය තර්කය ඉදිරිපත් වුණා. එතුමා දුන් උත්තරයත් ඕකයි. ගරු අමාත්‍යතුමනි, ගණිතය කියන්නේ, විෂයයක් නොවෙයි. Periodsවලට බෙදා ගණිතය ඉස්කෝලේ උගන්වන බව ඇත්ත. හොඳ ව්‍යාපාරිකයකු වන්නත් ගණිතය දැනුම අවශ්‍යයි. හොඳ දොස්තර මහත්මයකු වන්නත් ගණිතය දැනුම අවශ්‍යයි.

ඔබතුමාට මතක ඇති, මේ ළඟදී ජාතියෙන් සමුගත් අමරදේව මැතිතුමා එක්තරා රූපවාහිනී සාකච්ඡාවකදී කිව්වා, සංගීතය හරියට කරන්නත් ගණිත දැනුම අවශ්‍යයි කියා. ඇමතිතුමනි, මම සරලව කියන්නම්, ගණිත දැනුමෙන් තමයි අපට වියුක්ත චින්තනය උගන්වන්නේ. එළදෙනුන් දෙන්නයි, එළදෙනුන් දෙන්නයි එකතු කළාම එළදෙනුන් හතර දෙනායි කියන්න ගණිත දැනුමක් අවශ්‍ය නැහැ. හැබැයි, 2ට 2ක් එකතු කළාම 4යි කියන්න අපට අවශ්‍යයි, වියුක්ත චින්තනය. අතැන එළදෙනුන් පේනවා. එළදෙනුන් දෙන්නයි, එළදෙනුන් දෙන්නයි එකතු කළාම එළදෙනුන් හතරදෙනායි කියන්න විශේෂ තර්ක ඥානයක් අවශ්‍ය නැහැ. 2යි, 2යි කිව්වාම ගණිතයෙන් තමයි අපට ඒක කියන්නේ. නැත්නම් අපි එහෙම දෙයක් දන්නේ නැහැ. ගණිතයෙන් තමයි අපට සංකල්ප දෙන්නේ. මම ගණිතය උගන්වන්න හදනවා නොවෙයි. ඔබතුමාවත්, මමවත් ගණිතඥයෝ නොවෙයි. අපි දේශපාලනය කරන අය. අපි ඔබතුමාට කියන්නේ ගණිත දැනුම නැතිව දරුවෝ ඉහළට ගිහින් වැඩක් නැහැ කියන එකයි. ව්‍යාපාර වෙන්නට පුළුවන්, ක්‍රීඩා වෙන්නට පුළුවන්, Fashion designing වෙන්නට පුළුවන්, ඒ ඕනෑ දෙයක් සම්බන්ධයෙන් හිතන්න බැරි නම් මොනවාද, කරන්න පුළුවන් ගරු ඇමතිතුමනි? දැන් ඒකෙන් වෙන්නේ මොකක්ද? අද පාසල්වල දහයේ පන්තියේ දරුවන්ට කොහොම හෝ ලකුණු 35ක් අරගෙන දෙන්න මහන්සි වෙනවා. මේ දවස්වල ඉස්කෝලවල අවංක ගුරුවරුන් මහන්සි වෙන්නේ, දුර්වල දරුවන්ට ලකුණු 35ක් අරගෙන දීලා "S" Pass එකක් අරගෙන දෙන්නයි. ඒකෙන් තමයි නතර වෙන්නේ. අවුරුදු 11ක් ඉස්කෝලයේ ගිහින් ලකුණු 35කට වඩා ගන්න බැරි දරුවෝ ලක්ෂ දෙකකට ආසන්න සංඛ්‍යාවක් එන එකට උත්තරයක් වෙන්න ඕනෑ, ගණිතය ඉගැන්වීම අනිවාර්ය නොකරන එක නොවෙයි.

කලා උපාධිධාරින් කියන්නේ කවුද? මා දන්නා තරමින් ජනාධිපති ලේකම්තුමා, ඔබතුමන්ලාගේ හමුදා ප්‍රධානීන්, බැංකුවල ප්‍රධානීන් කලා අධ්‍යාපනය හැදෑරූ අය ඉන්නවා. ලෝකයේ රටවලට ගිහින් බලන්න. පෙප්සිකෝ සමාගමේ CEO කවුද? එතුමාට කලා උපාධියක් තිබෙන්නේ. කලා උපාධිය කියන්නේ මොකක්ද? ඒකට තමයි සමාජයේ වැඩි දැනුමක් අවශ්‍ය වන්නේ.

[ගරු බිමල් රත්නායක මහතා]

ඉංජිනේරු අංශයේදී ගණිතමය කරුණු ටිකක් විතරයි; බොහොම යාන්ත්‍රිකයි. මා ගණිතය ගැන විවාද කරන්නේ නැහැ. නමුත් මේ රටේ අධ්‍යාපන මට්ටම රැකිලා තිබෙන්නේ ගණිතයයි, සිංහලයි, දෙමළයි උගන්වන නිසා. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔය දෙය කරන්න එපා කියලා. එය අධ්‍යාපනයට ගහන මරු පහරක්. ඔබතුමා සල්ලි වෙන් කරලා පුහුණුවීම් ඇති කරන්න, කොහොමද දරුවන්ට හොඳට ගණන් උගන්වන්නේ කියා. ඔබතුමා 2020 වෙනතුරු අධ්‍යාපන ඇමති ධුරය දරනවා නම්, එතැනදී පෙන්වන්න "මේ අවුරුද්දේ ගණිතය සමත් අය මෙච්චරයි, මම මේ සංඛ්‍යාව සියයට 60ට,70ට ගෙනාවා "කියා. ඒකයි ජයග්‍රහණය ඇමතිතුමනි. නැතිව මගේ කාලයේදී ගණන් නැතිව Advanced Level දක්වා ඉගැන්නුවා කියා කිව්වාට ඔබතුමාට නිසි උත්තරයක් හම්බ වෙන්නේ නැහැ. අවුරුදු දහයකට පසුව ඔබතුමාට තේරේවි, ඔබතුමා නොදැනුවත්ව හෝ අධ්‍යාපනයට වළක් කපායි තිබෙන්නේ කියන එක. එම නිසා ඔය සමහර ගණිතඥයන් කියන අය දෙන ලණු කන්න එපා. මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයේ ඉන්න ගණිතඥයන් පමණක් නොව ගණිත මහාචාර්යවරුන්ද කැඳවා මේ පිළිබඳව සාකච්ඡා කරන්න කියලා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මේ තීන්දු තීරණ ගනු ලබන්නේ අපි මේ ආවාට ගියාට නොවෙයි. ඒ විෂයන් පිළිබඳ පරිචය තිබෙන පුද්ගලයන් සහ ලෝකයේ දියුණු අධ්‍යාපන ක්‍රම හැම දෙයක්ම සැලකිල්ලට ගෙන තමයි මේ තීන්දු තීරණ ගත්තේ. එම නිසා මා හෝ අපේ අමාත්‍යාංශයේ කිහිප දෙනෙක් එකතුවෙලා තීන්දු තීරණ ගන්නවා නොවෙයි. ඒ පිළිබඳ විශේෂඥයනුත් එක්ක එකතුවෙලා තමයි මේ කටයුතු කරන්නේ කියන එක ගැන ඔබතුමාත් එකඟ වෙනවා ඇති. ඒ අනුවයි මේ තීන්දු තීරණ ගනිමින් යන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ විශේෂඥයන් ගැන කියන්න මා දන්නේ නැහැ. මා කියන්නේ ගණිතය සම්බන්ධව ලෝකය පිළිගත් සිද්ධාන්තය. එම නිසා කරුණාකර ගණිතය නැතිව ඉස්සරහට යවන්න එපා. ක්‍රිකට් ගස්සවන්නවත් යවන්න එපා.

ගරු ඇමතිතුමනි, ඊළඟට මට කියන්න තිබෙන ප්‍රධානම කරුණ තමයි, මේ සුවිශාල මුදල් කප්පාදුව. මේ රටේ අධ්‍යාපනයට මුදල් වෙන් කිරීමේ ප්‍රශ්නය දේශපාලන ප්‍රශ්නයක් වුණා. ඔබතුමා පොරොන්දු වුණා, අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කරනවා කියා. පසු ගිය අය වැයේදී අධ්‍යාපනයට දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 2.72ක් වෙන් කළා. කන්නන්ගර මැතිතුමාගේ කාලයේ සිට තිබුණු buildings වල අගයත් එකතු කර -රුපියල් බිලියන 121 ක් එකතු කර- රවි කරුණානායක මැතිතුමා, අධ්‍යාපන අමාත්‍යාංශයට රුපියල් බිලියන 250ක් ගිය වර වෙන් කළායි කියා ගණන් හැදුවා. නමුත් අපි ඒ රුපියල් බිලියන 121 ගණන් ගත්තේ නැහැ. ඒක බොරුවක්. ඒ බිලියන 121 අයින්කර හැදුවාට පස්සේ පොදුවේ අධ්‍යාපනයට - ඔබතුමාගේ අමාත්‍යාංශයට පමණක් නොවෙයි.- දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.72ක් ගිය වසරේ වෙන් කර තිබෙනවා. නමුත් මේ වසරේ අය වැය වාර්තාවට අනුව ඒ සඳහා වෙන් කරලා තිබෙන්නේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 2.2යි කියලා ඔබතුමා දන්නවා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, buildingsවලට එකතු කරපු රුපියල් බිලියන 121 අයින් කළාම ගිය වසරේ ඔබතුමාට නිශ්චිතව ලැබුණේ රුපියල් බිලියන 129යි කියලා හිතුවොත්, මේ වතාවේ ලැබී තිබෙන්නේ රුපියල් බිලියන 96යි. ඒ රුපියල් බිලියන 96 එන්නේ අය වැය කථාවේදී එකතු කරපු රුපියල් බිලියන 20ත් එකතුවයි. මේ වසරේ වෙන්කර තිබෙන්නේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 2.2යි. මුදල් ඇමතිතුමා අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේදී මෙහෙම කියනවා:

> "...2014 වසරේදී මෙන් තුන් ගුණයක ප්‍රතිපාදන අප 2016 වර්ෂයේදී වෙන් කරනු ලැබුවා. එහෙත්, 2016 වර්ෂයේ තුන්වන කාර්තුව අවසන් වන විට අධ්‍යාපන අමාත්‍යාංශයට භාවිත කිරීමට හැකි වී ඇත්තේ රුපියල් මිලියන 38,850ක් පමණයි. එම නිසා, මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් 2017 වසර සඳහා රුපියල් මිලියන 90,000ක පමණ ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා."

මෙවර අය වැයෙන් වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන අඩු කිරීම සම්බන්ධයෙන් වග කියන්න ඕනෑ කවුද? මුදල් ඇමතිවරයා කෙළින්ම කියනවා, "මේකට වග කියන්න ඕනෑ අධ්‍යාපන ඇමතිවරයා සහ අධ්‍යාපන අමාත්‍යාංශය"යි කියලා. ඒ නිසා අපි අහන ප්‍රශ්නය තමයි -

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු සභාපතිතුමනි, මෙතුමා මෙහෙම කියන නිසා මම කෙටියෙන් පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, මට කියන්න කරුණු රාශියක් තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු සභාපතිතුමනි, 2014 වසරේදී ප්‍රාග්ධන වියදම් වශයෙන් වෙන් කරලා තිබුණේ රුපියල් බිලියන 17යි. 2014 පැවැති ආණ්ඩුවෙන් දීලා තිබෙන්නේ, ඒ රුපියල් බිලියන 17නුත් කොටසක් පමණයි. අපේ ආණ්ඩුව බලයට පත්වුණාම ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ආසන්න වශයෙන් රුපියල් බිලියන 84ක් වෙන් කළා. ගරු මන්ත්‍රීතුමනි, "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ පාසල් හත්දහස් ගණනක ගොඩනැඟිලි හා අත්‍යවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා පළාත් සහා සම්බන්ධ කරගෙන කටයුතු කරලාත් අපට කර ගන්න බැරි වුණා. ඒ යන්ත්‍රණය නිසා දැනටත් විශාල ප්‍රමාණයක් commit වෙලා තිබෙනවා. මේ තිබෙන වටපිටාව තුළ ඒ කටයුතු කරගන්න පුළුවන්කමක් නැහැ. හදන්න පටන් ගත් ගොඩනැඟිලි ලබන අවුරුද්දේත් හැදෙන නිසා, ඒ කටයුතු අවසන් කළාම ඊළඟ අවුරුද්දේ මේ ගොඩනැඟිලිවලට නැවතත් මුදල් වෙන් කරන්න පුළුවන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ තර්කය මා පිළිගන්නේ නැහැ. ඔබතුමාගේ රාජ්‍ය ඇමතිතුමාට නම් මට දැන් වෙලාව දෙන්න බැහැ. ගරු සභාපතිතුමනි, "නුවරඑළිය දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය

සම්බන්ධ මූලික ගැටලු" ඇතුළත් ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ අධ්‍යාපන ගැටලු සම්බන්ධයෙන් මා කරුණු ලබා ගත්තා. ගරු ඇමතිතුමනි, පසුගිය අය වැයෙන් වෙන් කරන ලද මුදල් වියදම් කර ගන්න බැරි වුණාය කියා ඔබතුමා කිව්වා. ඔබතුමා දන්නවා, ගුරුවරුන්ට හිඟ වැටුප් නොගෙවීමේ ප්‍රශ්නය පිළිබඳව පසුගිය දවස්වල පාර්ලිමේන්තුවේදී සාකච්ඡා වුණු බව. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ කොට්ඨාසයේ ගුරු හිඟ වැටුප් ගෙවන්න රුපියල් හත්කෝටියක් අවශ්‍යයි, හඟුරන්කෙත කොට්ඨාසයේ ගුරු හිඟ වැටුප් ගෙවන්න රුපියල් හත්කෝටියක් අවශ්‍යයි, වලපනේ කොට්ඨාසයේ ගුරු හිඟ වැටුප් ගෙවන්න රුපියල් එක්කෝටි තිස්හත්ලක්ෂයක් අවශ්‍යයි, නුවරඑළිය කොට්ඨාසයේ ගුරු හිඟ වැටුප් ගෙවන්න රුපියල් දෙකෝටි පනස්ලක්ෂයක් අවශ්‍යයි. මේ, අද පවතින තත්ත්වයයි. මේ ගුරු හිඟ වැටුප් ගෙවීම සඳහා මුදල් ලැබිලා නැහැ.

අවුරුදු 30කට, 40කට කලිනුත් අපි අහපු ප්‍රශ්නයක් තමයි ඩෙස්ක්, පුටු හිඟය සම්බන්ධ ප්‍රශ්නය. 2016 වසරේදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ පාසල්වල පැවති ඩෙස්ක්, පුටු හිඟය සම්බන්ධයෙන් විස්තර මා ළඟ තිබෙනවා.

සමස්තයක් වශයෙන් ගත්තොත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ පාසල් දරුවන්ට මේස 26,411ක් හා පුටු 23,433ක් අඩුයි කියලා කලාප මට්ටමෙන් මට වාර්තා ලැබී තිබෙනවා. කලාප වශයෙන් ගත්තොත්, නුවරඑළිය, හැටන්, හඟුරන්කෙත, කොත්මලේ කලාපවල හිඟ මේස, පුටු සම්බන්ධයෙන් එකතුව මට කියන්න පුළුවන්. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, එහෙම නම් මට ඔබතුමාගෙන් වෙලාව දෙන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඩෙස්ක්, බංකු ගන්න රුපියල් බිලියන 4ක් වෙන් කරලා, මේ අවුරුද්දේම දැන් procurement අවසන් වෙලා තිබෙනවා. ඩෙස්ක්, බංකු ගන්න ලබන අවුරුද්දටත් රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී මේ ප්‍රශ්නය නිරාකරණය වෙයි කියා මා හිතනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, රුපියල් මිලියන 5,000 කියන්නේ ලොකු ගණනක් බව ඇත්තයි, නමුත් ඔබතුමාට පාසල් 10,000ක් තිබෙනවාය, ළමයින් ලක්ෂ 43ක් ඉන්නවාය කියලා මා ඉතා පැහැදිලිව කියන්න කැමැතියි. එතකොට ඒ මුදල ලොකු නැහැ. අවසානයේදී මොකක්ද වෙලා තිබෙන්නේ? රාජ්‍ය ඇමතිවරයාත් ඒ දිස්ත්‍රික්කයේ සිටියදී, ඔබතුමා අවුරුදු එකහමාරක් අධ්‍යාපන ඇමතිතුමා වශයෙන් කටයුතු කළත්, ඒ අවුරුද්ද ඇතුළත පාසල් සඳහා පුටු ගන්න බැරි වුණාය කියන එකද ඔබතුමා කියන්නේ? ඒ නිසා මා ඉතා පැහැදිලිව කියනවා, ඔබතුමාට "ළඟම පාසල හොඳම පාසල" කරන්න බැහැයි කියලා. අධ්‍යාපනයට වෙන්කරන මුදල් කප්පාදු කරලා "ළඟම පාසල හොඳම පාසල" කරන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට තව විනාඩි හතරක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, ගරු සභාපතිතුමනි.

අපි කියන්නේ, මුදල් නාස්ති කරන්න කියලා නොවෙයි. පාසල්වල ඩෙස්ක්, පුටු නැති එක ඉතාම පැරණි, සුලබ ප්‍රශ්නයක්. අද කථා කරන්නේ ඊට වඩා වෙනස් ප්‍රශ්න පිළිබඳවයි. ඔබතුමාගේ රාජ්‍ය ඇමතිවරයා ඉන්න දිස්ත්‍රික්කයේ තත්ත්වය මෙහෙම නම් යුද්ධයට මුහුණ දුන්නු උතුරු පළාතේ මොන වාගේ තත්ත්වයක් ඇද්ද? ලංකාවේ දුප්පත්ම දිස්ත්‍රික්කය වශයෙන් සලකන මොනරාගල දිස්ත්‍රික්කයේ මොන වාගේ තත්ත්වයක් ඇද්ද? [බාධා කිරීමක්] ගරු ඇමතිතුමියනි, ඔබතුමිය කොළඹ ඉන්න නිසා දන්නේ නැතිව ඇති.

ඔබතුමිය යාපනයට ගිහින් TNA එකේ මන්ත්‍රීතුමන්ලා මුණ ගැහෙන්න. මා ගරු ඇමතිතුමාට කියන්නේ, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයේ අසාර්ථකභාවය නිසා, එහෙම නැත්නම් සංවිධානාත්මක බවක් නැති නිසා ඒ වෙන් කළ මුදල වියදම් කරගන්න බැරි වුණු එක, කොහොමටත් මුදල් කපන්න බලාගෙන ඉන්න මුදල් ඇමතිවරයාට "ඉබ්බා දියේ දමන්නද?" ඇහුවාම "ඇන්නැවේ"යි කියනවා වාගේ" තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. ඒ නිසා අඩු ගණනේ වෙන්කළ මුදල් ටික ප්‍රයෝජනවත් ලෙස වියදම් කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක් හදන්න. මට අද උදේ ඔබතුමා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ව්‍යාපාරිකයන් කණ්ඩායමක් -ඉදිකිරීම් සංගමයේ ප්‍රධානින්- මට කථා කරලා කිව්වා, සල්ලි වැඩි වුණාය කිව්වට, ඒ ගොල්ලන් හදපු buildingsවලට රුපියල් කෝටි 100ක් විතර ගෙවලාත් නැහැයි කියලා.

ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. ඔබතුමාගේ ලොකුම බලවේගය තමයි ගුරුවරු. ඒ ගුරුවරුන්ට අදාළව කථා කරනවා නම්, සුවිශාල වැටුප් විෂමතාවන් පිළිබඳව ඔවුන් සාකච්ඡා කරමින් ඉන්නවා. විවිධ කමිටු පත් කරලා තිබෙනවා. මට ලැබී තිබෙන කාලය ඇතුළතදී, ඒ ගැටලු පිළිබඳවත් මූලික ලේඛන කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. අධ්‍යාපනයේ ප්‍රධාන ගියර් එක වෙන්නේ ගුරුවරුයි. ඒ ගොල්ලන්ගේ දැනුමයි, ඒ ගොල්ලන්ගේ තෘප්තියයි නැතිව ඔබතුමාට මොනවත් කරන්න බැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා උදේ ඉඳන් රෑ වන කල් අධ්‍යාපන අමාත්‍යාංශ වෙනුවෙන් මහන්සි වුණාට, -අපි අහලා තිබෙනවා ඔබතුමා එහෙම කරනවාය කියලා- මේ කණ්ඩායම ශක්තිමත් කරන්නේ නැතිව ඔබතුමාට deliver කරන්නට බැහැ. ඒ වාගේම ඔවුන්ට අනවශ්‍ය සුවිශාල -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාගෙන් මෙතුමාට වෙලාව දෙනවා.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman
කොපමණද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මෙතුමාගේ කථාව අවසන් කරන කල්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කථාව යන විධියට බලමු. මගේ කථාවට ඇමතිතුමා මැදිහත් වෙනවා නේ.

අද ගුරුවරුන්ට forms රාශියක් පුරවන්නට තිබෙනවාය කියන කාරණය සම්බන්ධයෙන්, ඔවුන් ඇමතිතුමාත් සමඟ කරන හැම සාකච්ඡාවකදීම සඳහන් කරනවා. ඒ වාගේම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විවිධාකාර දේවල් බෙදා හැරීමේදී අද එහි ප්‍රධාන වගකීම පැවරී තිබෙන්නේ ගුරුවරුන්ටයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, අද මේ ගුරුවරුන් පාසල්වල අමතර විෂයයන් සුවිශාල ප්‍රමාණයක් උගන්වන බව. වැටුප් විෂමතා තිබියදී, හිඟ මුදල් ගෙවන්න තිබියදී තමයි ඔවුන් මේ සේවාව කරන්නේ.

ඔබතුමා එදා කිව්වා, ගුරුවරුන්ගේ හිඟ මුදල් ගෙවීම සඳහා මධ්‍යම ආණ්ඩුවෙන් පළාත්වලට මුදල් යැව්වාය කියලා. රටට ඉන්නේ එක අධ්‍යාපන ඇමතිවරයායි. පළාත් සභා ඇමතිවරු මේ සභාවට එන්නේ නැහැ නේ. ඔබතුමාගෙන් තමයි අහන්නට වෙන්නේ. ඔබතුමාට වග කීමකුත් තිබෙනවා, ඒ පළාතට සල්ලි යැව්වාට පස්සේ ඒවා අදාළ කලාපවලට ලැබී තිබෙනවාද කියා සොයා බලන්නට. එක පැත්තකින්, වැටුප් හරියාකාරව ලැබෙන්නේත් නැහැ, වැටුප් විෂමතාත් තිබෙනවා.

අනෙක් පැත්තෙන්, ඔවුන්ට අමතර වැඩ රාජකාරි රාශියකුත් තිබෙනවා. එහෙම වන විට අධ්‍යාපනයේ ප්‍රතිලාභ අඩුයි. ඔවුන් දරුවන් වෙනුවෙන් කටයුතු කරන්නේ නැහැ. සමහර ගුරුවරුන් තුළත් අඩු පාඩුකම් නැතුවා නොවෙයි. ඔබතුමාගේ ප්‍රධානම කණ්ඩායම ගුරුවරුන්. ඒ නිසා මේ ගුරුවරුන්ගේ ගැටලු සම්බන්ධව මීට වඩා මැදිහත් වෙන්නය කියා ඉල්ලා සිටින අතර ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු සභාපතිතුමනි, ඒ එක්කම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ගැනත් මා කියන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් කථා කරන්න මා වැඩි කාලයක් ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මේ දෙපාර්තමේන්තු දෙක තිබෙන්නේත් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේයි. ඒ ආයතනවලට කාලයක් තිස්සේම ලැබෙන්නේ කුඩම්මාගේත් කුඩම්මාගේ සැලකිලියි. දැන් මෙවර අය වැයෙන් මොකක්ද කරලා තිබෙන්නේ? 2016දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 1,030ක් වෙන් කරලා තිබුණා. මෙවර රුපියල් මිලියන 923 දක්වා අඩු කරලා, රුපියල් මිලියන 107කින් කපලා තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අපේ රටේ ඉතිහාසයේ සුවිශාල හිස්තැන් පිළිබඳව ගවේෂණය කරමින් පුරාවිද්‍යා පරීක්ෂණ රාශියක් සිදු කරමින් තිබෙනවා. ගරු ඇමතිතුමනි, අප වැනි කුඩා රටකට ලෝකයේ පවතින්න පුළුවන් එකම විධිය සංස්කෘතියට invest කිරීමෙන් විතරයි. අපි රටක් වශයෙන් පවතිනවා නම් අධ්‍යාපනයට, කලා කටයුතුවලට සහ ක්‍රීඩාවට ආයෝජනය කරන්නට ඕනෑ. එහෙම නැත්නම් අපට ලෝකයත් සමඟ පවතින්නට බැහැ. අපට ඇමෙරිකාවේ, චීනයේ, ඉන්දියාවේ ආර්ථිකය සමඟ කවදාවත් හැප්පෙන්නට බැහැ. රටක් වශයෙන් අපේ අනන්‍යතාව ඉතිරි වෙන්නේ සංස්කෘතියෙන්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)!
ගරු සභාපතිතුමනි, මධ්‍යම සංස්කෘතික අරමුදලින් මුදල් කොටසක් පුරාවිද්‍යා අවශ්‍යතාවලට දෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ වේලාවෙන් කාලය ගන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
හොඳයි. මධ්‍යම සංස්කෘතික අරමුදලින් මුදල් කොටසක් පුරාවිද්‍යා අවශ්‍යතාවලට දෙනවා. මට මතක හැටියට මේ වසරේ මධ්‍යම සංස්කෘතිය අරමුදලේ ආදායම රුපියල් මිලියන 7,000කින් වැඩි වෙලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, මධ්‍යම සංස්කෘතික අරමුදල හැම දාමත් තිබුණාය, මධ්‍යම සංස්කෘතික අරමුදල හැම දාමත් මේ කටයුතු කළාය කියලා. එසේ තිබියදී තමයි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන කපලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මට්ටමිනුත් මේ සම්බන්ධයෙන් කල්පනා කරන්න. රටක සංස්කෘතියට -මා කියන්නේ ගල් කණුවලට නොවෙයි- ආයෝජනය කරන එක රටේ අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම සඳහා කරන දෙයක්. ඒක ත්‍රිවිධ හමුදාවට සල්ලි වෙන් කරනවාටත් වඩා වැදගත්. රටක් වශයෙන් අප නැති කරන්න ආයුධවලින්ම ගහන්නට ඕනෑ නැහැ. ඒ නිසා මා කියන්නේ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට මුදල් වෙන් කිරීමත් ඒ වාගේම වැදගත් බවයි.

අද අමාත්‍යාංශයත් ජංජාලයක් කරලා තිබෙනවා. අද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආදායම මේ වසරේ රුපියල් මිලියන 700කින් වැඩි වෙලා තිබෙනවා. ඒ සල්ලි උපරිම විධියට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වෙන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මධ්‍යාම සංස්කෘතික අරමුදල? ඒක තිබෙන්නේ අගමැතිතුමා යටතේයි, ගරු ඇමතිතුමනි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මධ්‍යම සංස්කෘතික අරමුදලත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම ඒ ගැන ලොකු සාකච්ඡාවක් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත්, අද මේ අමාත්‍යාංශයත් දෙකට කඩලා අද

විශාල පටලැවිල්ලක් ඇති කර තිබෙනවා. ඒ නිසා පසු ගිය කාලයේ රාජ්‍ය නාට්‍ය උළෙල කර ගන්නත් බැරි වුණා. මෙවර මුදල් ප්‍රමාණයත් අඩු කර තිබෙන නිසා, විශේෂයෙන්ම සංස්කෘතික අමාත්‍යාංශයේ තිබෙන තිබෙන ගැටලු සම්බන්ධයෙන් මීට වඩා මැදිහත්වීමක් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟට තවත් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. විශේෂයෙන්ම අපේ රටේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදයේදී වැඩිපුර සාකච්ඡා වන්නේ පාසල්වල ගැටලු. ඒවා ගැන අනෙක් මන්ත්‍රීතුමන්ලාත් කථා කරයි කියලා මා හිතනවා. ඒ නිසා මා හිතුවා, මුලින් කියපු කරුණු වාගේම, තවත් කරුණු දෙක තුනක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න.

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා සහ ඔබතුමාගේ අමාත්‍යාංශයේ උදවු නැතිව මේ රටේ ලක්ෂ 75ක් පමණ දෙමව්පියන්ට තමන්ගේ දරුවන් ආරක්ෂා කරගන්න බැහැ. බොහොම කෙටියෙන් කියනවා නම්, ඔබතුමාගේ අමාත්‍යාංශයේ උදව්ව නැතිව අපට අපේ දරුවන් හදාගන්න ගන්න බැහැ. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් මෙන්න මේ කරුණු පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒවා නොකිරීම සම්බන්ධ විවේචනයක් කරනවාට වඩා, මා ඒ ඉල්ලීම කරනවා.

ඉතා ඉක්මනින් ඒ කරුණු දෙක තුනක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මා කැමැතියි. ගරු ඇමතිතුමනි, ළමා අපයෝජනය කියන එක අපේ රටේ තිබෙන සුවිශාල ගැටලුවක් බව ඔබතුමා දන්නවා. අපයෝජනයට ලක් වන සියලුම දරුවන් ඉන්නේ ඔබතුමා ළඟ; ඔබතුමාගේ පාසල්වල. පාසල් තුළත් ඒක සිද්ධ වෙනවා. ගෙදරින් සිද්ධ වෙලා ආවත් ඒක බලපාන්නේ පාසලේදී. ඉතාම කනගාටුදායක කාරණය මේකයි. මෙවර කාන්තා කටයුතු අමාත්‍යාංශයට, කාන්තා හිංසනය සහ ළමා අපයෝජන කටයුතු සඳහා ක්‍රියා කරන්න වෙන් කර තිබෙන මුදල හරියටම සියයට 150කින් කපා හැර තිබෙනවා. මා දන්නේ නැහැ, අපචාර කරන කට්ටියද මේ සල්ලි වෙන් කළේ කියලා. අපි කවුරුත් පිළිගන්නා දේශපාලන නොවන සමාජ සත්‍යයක් තමයි, ලංකාවේ ළමා අපචාර වැඩියි කියන එක. [බාධා කිරීමක්] මොකක්ද, රාජ්‍ය ඇමතිතුමියනි?

**ගරු විජයකලා මහේෂ්වරන් මහත්මිය (ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் - சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran - State Minister of Child Affairs)

ගිය ආණ්ඩුවට වඩා මේ ආණ්ඩුවෙන් ඒ මුදල් වැඩි කරලා තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමිය විද්‍යා සිවලෝගනාදන්ගේ මළ ගෙදර ගියා නේද? ඒ අම්මාට බොරු කිව්වා නේද? මේක වෙළෙන්දන්ට තේරෙන්නේ නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, කරුණාකර ගරු ඇමතිතුමා එක්ක කථා කරන්න මට අවස්ථාව දෙන්න.

ගරු ඇමතිතුමනි, අද මේ ළමා අපයෝජන වැඩි වෙනවා. නමුත් මෙවර කාන්තා කටයුතු අමාත්‍යාංශයට වෙන් කරන මුදල අඩු කර තිබෙනවා. ඔබතුමාගේ පැත්තෙන් බැලුවොත්, අද මේක සුවිශාල ගැටලුවක්. නමුත්, මේක ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැඩි අවධානයට ලක් නොවන අංශයක්. ගරු ඇමතිතුමනි, මඟ පෙන්වීම සහ උපදේශනයට මෙවර වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 4යි. අපයෝජනයට ලක් වන දරුවන් සඳහා පමණක් නොවෙයි, මෙවැනි විවිධාකර ප්‍රශ්නවලට මුහුණ දෙන ලංකාවේම දරුවන්ගේ ඒ counselling කටයුතු සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 4යි. මීට කලින් එච්චර වෙන් වෙලා තිබුණාද, නැද්ද කියලා මා දන්නේ නැහැ. නමුත්, මේක සුවිශාල ගැටලුවක්. මේ ප්‍රශ්නයට මුහුණ දෙන දරුවන් ප්‍රමාණය ඉන්නේ ඔබතුමා ළඟ. මේ රටේ දෙමව්පියන් පර්චස් දහයක ඉඩමක් අරගෙන, ගෙයක් හදාගෙන, ඒක වටේ තාප්පයක් දමාගත්තාට දරුවන් හදාගන්න බැහැ; දරුවන් ආරක්ෂා කරගන්න බැහැ, ඔබතුමාගේ අමාත්‍යාංශය උදවු කරන්නේ නැත්නම්. දරුවන්ට උගන්වන එක වාගේම, මේ දරුවන් ටික පරිස්සම් කරලා හදලා දීමේ වගකීමත් ඔබතුමාගේ අමාත්‍යාංශයට තිබෙනවා. ඒ නිසා මා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ උපදේශනය සම්බන්ධව දිස්ත්‍රික් මට්ටමින් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. මේ විෂයය සම්බන්ධව ඉතාම දක්ෂ අධ්‍යක්ෂවරියන් ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න බව මා දන්නවා. ශ්‍රී ලංකා සුමිත්‍රයෝ සංවිධානයේ වැඩසටහනකදී ඒ මහත්මියක් කථා කරනවා මා දැක්කා. දිස්ත්‍රික් මට්ටමින් එවැනි වැඩ පිළිවෙළවල් හදන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ රටේ අධ්‍යාපනය හදලා දියුණු කරයි කියලා අපි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මා ඔබතුමාගෙන් බලාපොරොත්තු වන්නේ, අඩු ගණනේ මේ සිද්ධ වන විනාශය වළක්වාගන්න මේ අවුරුදු දෙක තුනේදී මොනවා හෝ උත්තරයක් හොයලා දෙන්න කියන එකයි. මා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, annual survey of school-based child abuse ආරම්භ කරන්න කියලා. මම ගිය වරත් ඔබතුමාට මේ ගැන කිව්වා. ඒක, විද්‍යා සිවලෝගනාදන් දැරියගේ අපයෝජන සිද්ධියේදී මේ රටේ මතුවුණු ප්‍රධාන අවශ්‍යතාවක්. පාසල් මට්ටමින් මේ වැඩසටහන කරන්න ඔබතුමාට පුළුවන්. ඒක රහසිගතව කරන්න පුළුවන්. ඔබතුමා මේ සඳහා මගේ නොවෙයි, විද්වතුන්ගේ උදවු ගන්න. ඔබතුමා - අපි හිතනවාට වඩා සුවිශාල ඛේදවාචකයක් මේක.

ළමා අපයෝජන සම්බන්ධව දිස්ත්‍රික් මට්ටමින් උපදෙස් දෙන උපදේශක අංශයක් හදලා, එම කටයුතු වාර්ෂිකව අධීක්ෂණය කරන්න. ඒක ඇමෙරිකාවේත් කරනවා. ඇමෙරිකා එක්සත් ජනපදය කියන්නේ ඔබතුමන්ලා ගොඩක් ගුරුහරුකම් ගන්නා රටක් නේ. මෙහෙම abuse කොයි තරම් වෙනවාද කියලා බලන්න ඇමෙරිකා එක්සත් ජනපදය වාර්ෂිකව සෑම පාසලකම රහසිගතව සමීක්ෂණයක් කරනවා.

ගරු ඇමතිතුමනි, ඒ මත පදනම් වෙලා ඔබතුමාට පුළුවන් ඊ ළඟ ක්‍රියාමාර්ගවලට යන්න.

ගරු ඇමතිතුමනි, මම මේ කරුණ කියන්නේ තාත්තා කෙනෙකු වශයෙන්. අපේ දරුවෝ හදාගන්න බැහැ, ඔබතුමාගේ අමාත්‍යාංශයේ උදව් නැතිව. ඒක වග කීමෙන් යුතුවයි මම කියන්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් දරුවන්ට Tabs දෙන්න යනවා. මේ Tabs දෙන්න හදනකොටම සමහරු ඒ ගැන සෘණාත්මක තර්කයක් ඉදිරිපත් කරනවා, මේකෙන් ළමයි තව තවත් අසභ්‍ය චිත්‍රපටි බලන්න පුරුදු වෙයි කියලා. ඒකට ඔබතුමා Tabs දෙන්න ඕනෑ නැහැ. ඔබතුමා Tabs නුදුන්නත්, ඔක්කොම කට්ටිය දැන් ඒවා බලලා ඉවරයි. දැන් ළමයෙක් අවුරුදු 11 වනකොට මේ ඔක්කෝම බලලා ඉවරයි. ගරු ඇමතිතුමනි, අපි Tabs දෙන එකට පක්ෂපාතී පැත්තේ ඉන්නේ. ඒ Tabs දෙන්න. නමුත්, Tabs දෙනවාට වඩා වැදගත් වන්නේ මොකක්ද? දැන් දරුවෝ වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික පන්තියෙන් එළියට යනකොට ගෙදරදී හරි,

[ගරු බිමල් රත්නායක මහතා]

ඉස්කෝලයේදී හරි blue films බලලා තිබෙන්නේ. ඒක අපි පිළිගන්න ඕනෑ. නිකම් බොරුවට "අපේ දරුවෝ නම් එහෙම නැහැ" කියලා අපි හිතාගෙන ඉන්නවා. නමුත්, ඒක එහෙම නැහැ. දැන් ඒක වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, අපි අපේ රටේ හැම දෙයක්ම හංගා ගෙන ඉන්න නිසා මේ ඇත්ත ප්‍රශ්නයට උත්තර හොයන්නේ නැහැ. අපි ශක්තිමත් ජාතියක් හදනවා නම් මොකක්ද කරන්න ඕනෑ? අපි ඒ virus එකට ඔරොත්තු දෙන විධිය උගන්වන්න ඕනෑ. "මේ virus එක නැහැ, නැහැ" කියලා වැඩක් නැහැ. අද මේ phonography කියන virus එක තිබෙනවා. ඒකට අපේ දරුවෝ ලක් වෙලා ඉන්නවා; වැඩිහිටියෝත් ලක් වෙලා ඉන්නවා. කුඩා දරුවෝ -අවුරුදු 18 වුණත් කුඩා දරුවෝ නේ- නිල් චිත්‍රපටි -blue films- වැනි දේවල්වලට ඇබ්බැහි වීමෙන්, ඒවා බලන්න පෙලඹවීමෙන් දරුවන්ට වන හානිය නැති කරන්න අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ඔබතුමන්ලා කුමක්ද කරන්න යන්නේ? අධ්‍යාපන අමාත්‍යාංශය කියන්නේ නැණ වාගේම ගුණත් ඇති කරන්න බලයක් තිබෙන අමාත්‍යාංශයක්. කොහොමද මේවායෙන් දරුවන්ට වන හානිය නිවැරදි කරන්න ඔබතුමා බලාපොරොත්තු වන්නේ? ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ ගැන අවධානය යොමු කරන්න කියලා.

ලෝකයේ රටවල් රාශියක් මේ ගැටලු විසඳන්න විවිධාකාර ක්‍රමවේද හදලා තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ තත්ත්වය පාලනය කිරීම පමණක් නොවෙයි. මොකද, දැන් මේ තත්ත්වය සම්පූර්ණයෙන් පාලනය කරන්න බැරි නිසා. සමහර විට නීති දමලා තරමක් දුරට පාලනය කරන්න පුළුවන්.

ගරු සභාපතිතුමාගේ අවසර ඇතුව එක්සත් රාජධානියේත්, එක්සත් ජනපදයේත් මේ සම්බන්ධව කරන ලද පර්යේෂණ වාර්තාවල තොරතුරු ප්‍රමාණයක් මම මීට කලින් ඉදිරිපත් කළා. මම ඇමතිතුමාට කියන්නේ ඒ වාර්තා දෙනෙන්ම අවශ්‍ය තොරතුරු ඒ සඳහා ගන්න එපා, ආසියාවේ තිබෙන තොරතුරු ගන්න කියලායි. මේ ගැටලුවට තිබෙන එක විසඳුමක් තමයි, මේ ක්‍රියා නතර කරන එක. නැත්නම් පුළුවන් තරම් පාලනය කරන එක. අනෙක් විසඳුම තමයි, මේ blue filmsවල පෙන්නුම් කරන දේවල් බොරු කියන එක දරුවන්ට තේරුම් කරලා දෙන එක.

ලිංගික අධ්‍යාපනය සම්බන්ධ ප්‍රශ්නයත් මේ එක්ක ගැට ගැහෙනවා, ගරු සභාපතිතුමනි. අධ්‍යාපන අමාත්‍යාංශය පසු ගිය කාලයේ ලිංගික අධ්‍යාපනය කියන විෂයය පිළිබඳව යම් තාක් දුරට සාකච්ඡා කළා. ඒ විෂයය පිළිබඳව වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි මහතා පොතක් ලියා තිබෙනවා. මේ විෂයය සම්බන්ධයෙන් එතුමා වැනි තවත් විද්වතුන් ඉන්න පුළුවන්. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමත කරපු එවැනි පොත් තිබෙනවා. මම හිතනවා, අධ්‍යාපන අමාත්‍යාංශයට මේ පොත සුදුසුයි කියලා. මම මේ පොත **සභාගත*** කරනවා.

ගරු ඇමතිතුමනි, මම මේ පොත ඔබතුමාට ලබා දෙනවා. මේ පිළිබඳව ඔබතුමා සොයා බලන්න.

ගරු ඇමතිතුමනි, දරුවන්ට උගන්වන්න කලින් ගුරුවරුන්ට මේ විෂයය සම්බන්ධයෙන් කියලා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ලිංගික අධ්‍යාපනය ලබා දෙන්නේ කොහොමද කියලා ගුරුවරුන් පුහුණු කරන වැඩසටහනක් හදන්න. මොකද, අද අපචාරයට ලක් වූ දරුවන්ගෙන්, මේ කටයුතුවලට ඇබ්බැහි වුණු දරුවන්ගෙන් රටට වන හානිය අවම කර ගන්න නම්, අනිවාර්යයෙන්ම අපි දරුවන්ට මේ විෂයය සම්බන්ධයෙන් යම් අවබෝධයක් ලබා දිය යුතුයි. ඒක ඇමෙරිකාවේ ක්‍රමයට කරන්න අවශ්‍ය නැහැ. ඒක ආසියාවේ ක්‍රමයට කරන්න. එහෙම නොකර, අපි මේවා හංගා ගෙන සිටියොත් අපට කවදාවත් මේ ප්‍රශ්නය විසඳන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මුලින්ම ඒ ගැන දරුවන්ට උගන්වන්න කියලා නොවෙයි. ලිංගික කරුණු පිළිබඳව දරුවන්ට අවබෝධයක් ලබා දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් මුලින්ම ගුරුවරුන්ට යම් කිසි අධ්‍යාපනයක් ලබා දෙන වැඩසටහනක් ආරම්භ කරන්න කියලායි අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ. දැනටත් මේ විෂයය සම්බන්ධයෙන් අපි ගොඩක් ප්‍රමාද වෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා මේ Tabs හඳුන්වා දෙනවා. මේ Tabs එක්ක ලෝකයේ තිබෙන එක ප්‍රශ්නයක් තමයි, smart phone addiction කියන එක. මේ කරුණ මම ඉදිරිපත් කරන්නේ ඔබතුමාගේ අවධානය ඒ කෙරෙහිත් යොමු කරන්න කියලා ඉල්ලමින්. මේවාට සම්බන්ධ ගැන අවබෝධයකින් තොරව Tabs හඳුන්වා දීමෙන් අපේ රටට ඇතිවන විශේෂ හොඳක් නැහැ, නරකක් මිසක්.

ආණ්ඩුව අධ්‍යාපනයට වෙන් කරන මුදල ගිය වසරට වඩා රුපියල් බිලියන 33කින් කප්පාදු කරලා, රටේ පොදු ජනතාවගේ දරුවන්ට අධ්‍යාපනය ලැබීමට තිබෙන අයිතිය අහිමි කරන බවක් අපට පෙනෙනවා, විශේෂයෙන්ම උසස් අධ්‍යාපනය පැත්තෙන්. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ හෙට අපි විවාදයට ගන්න බලාපොරොත්තු වනවා. උසස් අධ්‍යාපනය පෞද්ගලීකරණය කරමින් යන ගමන ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි හෙළා දකින ගමන්, අධ්‍යාපනය පැත්තෙන් දරුවන් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අපි ඉදිරිපත් කරපු යෝජනා ටිකවත් සැලකිල්ලට අරගෙන ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අමතරව විනාඩි කීපයකුත් අරගෙන තිබෙනවා.

මී ළඟට, ගරු රාධක්‍රිෂ්නන් රාජ්‍ය ඇමතිතුමා.

ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[மு.ப. 11.05]

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் கல்வி அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்திலே கலந்துகொண்டு அரச தரப்பிலிருந்து ஆரம்ப உரை நிகழ்த்துவதில் மிகவும் மகிழ்ச்சியடைகின்றேன். இன்று கல்வி அமைச்சுக்கு ஒதுக்கப்பட்ட நிதி பற்றி பேசப்பட்டது. விசேடமாக 2016ஆம் ஆண்டுக்கெனக் கல்வி அமைச்சுக்கு கிட்டத்தட்ட 63 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு, அதிலே 10 பில்லியன் ரூபாய் உபகரணங்கள் வாங்குவதற்கும் 53 பில்லியன் ரூபாய் நிர்மாண வேலைகள்- கட்டிடங்கள் - மேற்கொள்வதற்கும் பயன்படுத்தப்பட்டது. இன்று இந்த நாட்டிலே அமுலில் இருக்கின்ற "அருகிலுள்ள பாடசாலை நல்ல பாடசாலை" திட்டத்தின்கீழ் கிட்டத்தட்ட 16,593 திட்டங்கள் நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றன. இந்தப் பாடசாலைகளில் அதிகமான கட்டிட வேலைகள் முடிவடை யாத நிலையிலே இருப்பதன் காரணமாக குறித்த வேலைத் திட்டத்தைத் தொடர்ந்து மேற்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்பட்டு வருகின்றது. அந்த வகையில் இந்தப் பாடசாலைகள் A, B, C, D என்று நான்கு வகையாகப் பிரிக்கப்பட்டு அவற்றின் அபிவிருத்தி வேலைகள் மூன்று - நான்கு வருடங்களுக்குத் தொடர்ந்து நடைபெறவிருக்கின்றன என்பதை இந்தச் சபைக்குத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இந்த வரவு செலவுத் திட்டத்தில் கல்வி அமைச்சுக்கு ஒதுக்கப்பட்ட நிதி குறைவாக இருக்கின்றது என்று கூறப் பட்டது. இருந்தாலும், 2016ஆம் ஆண்டுக்காக ஒதுக்கப்பட்ட நிதியிலிருந்து அதிகமான பணத்தைச் செலவழிக்க வேண்டிய சூழ்நிலை ஏற்பட்டிருந்தது. எனவே, விசேடமாக கல்வி அபிவிருத்தித் திட்டங்களைப் பற்றிச் சற்றுச் சிந்தித்துப் பார்க்க வேண்டும். அந்த வகையில் ஆசிரியர்களுக்கான கல்வி வசதிகளை வழங்குதலுக்கு 1,000 மில்லியன் ரூபாயும் அதேபோல கிராமிய மற்றும் கஷ்டப் பாடசாலைகளில் ஆசிரியர் இல்லம், ஆசிரியர் ஓய்வறைகள் போன்றவை நிர்மாணிப்பதற்கு 2,000 மில்லியன் ரூபாயும் அத்தியாவசியத் தேவையான நீர் மற்றும் சுத்திகரிப்பு வசதிகளை அதிகரிப் பதற்கும் மின்சார வசதியை வழங்குவதற்கும் கிட்டத்தட்ட 6,000 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டுள்ளது. அத்துடன் 3,577 ஆரம்பப் பாடசாலைகளின் அடிப்படை வசதிகளை விருத்தி செய்வதற்கு 10,000 மில்லியன் ரூபாய், இடைநிலைப் பாடசாலைகளின் வசதிகளை விருத்தி செய்வதற்கு 15,000 மில்லியன் ரூபாய், எதுவிதத் திட்டங்களுக்கும் சமகாலத்தில் உள்ளடக்கப்படாத க.பொ.த. சாதாரண தரம் கொண்ட 1,360 பாடசாலைகளை அபிவிருத்தி செய்வதற்கு 30 ஆயிரம் மில்லியன் ரூபாய், 25 தோட்டப் பாடசாலைகளை இடைநிலை மட்டத்துக்குத் தரமுயர்த்துவதற்கு 250 மில்லியன் ரூபாய், விஞ்ஞான ஆய்வுகூடம் மற்றும் 3,000 இடைநிலைப் பாடசாலைகளுக்கு நடமாடும் விஞ்ஞான ஆய்வுகூடத் தொகுதிகள் வழங்குவதற்கு 450 மில்லியன் ரூபாய், பாடசாலைப் பற் சுகாதாரப் பிரிவினை விருத்தி செய்வதற்கு 250 மில்லியன் ரூபாய் என்று பல்வேறு நிதி ஏற்பாடுகள் மேற்கொள்ளப்பட்டு பாடசாலைகள் அபிவிருத்தி செய்யப்படு கின்றன.

இன்று விசேடமாக, கல்வி அமைச்சின் கீழ் இராஜாங்க அமைச்சொன்று உருவாக்கப்பட்டிருப்பதால், தமிழ்மொழி மூலமான பாடசாலைகளை அபிவிருத்தி செய்வதற்கு கல்வி இராஜாங்க அமைச்சு மூலமாக நடவடிக்கை எடுக்கப்பட்டு வருவதை நான் இந்த நேரத்திலே சந்தோஷத்துடன் கூறிக்கொள்ள விரும்புகின்றேன். இன்று இந்த நாட்டிலே இருக்கின்ற 10,044 பாடசாலைகளில் 3,500 பாடசாலைகள் தமிழ்ப் பாடசாலைகளாக இருக்கின்றன. அதாவது, வடக்கு, கிழக்குப் பாடசாலைகள், நாட்டிலே ஏனைய பகுதிகளில் இருக்கின்ற தமிழ்ப் பாடசாலைகள், மற்றும் பெருந்தோட்டப் பகுதியிலே இருக்கின்ற பாடசாலைகள் என்று எல்லா வற்றையும் ஒன்றுசேர்த்தால் நாட்டிலுள்ள பாடசாலைகளின் எண்ணிக்கையில் மூன்றில் ஒரு பகுதி தமிழ்ப் பாடசாலைகளாக இருப்பதை அவதானிக்கலாம். இன்று இந்தத் தமிழ்ப் பாடசாலைகளின் பொதுவான அபிவிருத்தி வேலைகள் கல்வி அமைச்சர் கௌரவ அக்கில விராஜ் காரியவசம் அவர்களினதும் செயலாளர் திரு. சுனில் ஹெட்டியாராச்சி அவர்களினதும் மற்றும் அமைச்சின் ஊழியர்கள் எல்லோ ரினதும் உதவியோடு இடம்பெற்று வருகின்றன என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

கௌரவ அமைச்சர் அவர்களே! உங்களுக்கு இன்னும் இரண்டு நிமிடங்கள் இருக்கின்றன.

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

இப்பொழுது வடக்கு, கிழக்குப் பாராளுமன்ற உறுப்பினர்கள் நேரில் வந்து எங்களுடன் பேசித் தங்களுடைய பிரச்சினைகளைத் தீர்த்துக்கொள்ளக்கூடிய ஒரு சந்தர்ப்பம் உருவாக்கப்பட்டுள்ளது.

கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் பேசியபோது, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற நுவரெலியா மாவட்டத்திலிருக் கின்ற பாடசாலைகளின் குறைபாடுகளை இங்கு சுட்டிக் காட்டினார்; அது மிகவும் வரவேற்கத்தக்கது. என்னுடைய பிரதேசத்தின் குறைகளை அவர் சுட்டிக்காட்டியது மிகவும் சந்தோஷமளிக்கின்றது. இந்தக் குறைகளை நிவர்த்தி செய்வதற்கான நடவடிக்கைகள் இப்பொழுது எடுக்கப்பட்டு வருகின்றன. பெருந்தோட்டப் பாடசாலைகளின் அபிவிருத்திக் கான ஒதுக்கீடு 2016ஆம் ஆண்டுக்கு 250 மில்லியனும் 2017ஆம் ஆண்டுக்கு 250 மில்லியனுமாக மொத்தம் 500 மில்லியன் ரூபாயாகும். அதன்மூலம் மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களுடைய ஆலோசனைக்கிணங்க அந்தப் பாடசாலைகளின் கணித, விஞ்ஞான பகுதிகளைத் தரமுயர்த்து வதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன.

அதேபோல, வடக்கு, கிழக்கில் இருக்கின்ற volunteer teachers - தொண்டர் ஆசிரியர்களுக்கு ஆசிரிய நியமனங்கள் வழங்குவதற்கு நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன. இப்பொழுது அதற்கான அமைச்சரவைப் பத்திரம் தாக்கல் செய்யப்பட்டிருக்கின்றது. இன்னும் 2 - 3 மாதங்களில் நிச்சய மாக அவர்களை நியமிப்பதற்கான நடவடிக்கை எடுக்கப்படும் என்பதையும் தெரிவித்துக்கொள்கின்றேன்.

அதேபோல, மலையகப் பகுதிகளிலே ஆசிரிய உதவியாளர் களாக இருப்பவர்களுக்கு-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, உங்களது உரையை முடித்துக்கொள்ள வேண்டும்.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
எனக்கு இன்னும் 2 நிமிடங்கள் தாருங்கள்! எனக்கு 6 நிமிடங்கள் ஒதுக்கப்பட்டது.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
இல்லை. உங்களுக்கு 4 நிமிடங்கள்! இப்போது அந்த நேரம் முடிந்துவிட்டது.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
எதிர்காலத்திலே ஒட்டுமொத்தமாகத் தமிழ்ப் பாடசாலைகளுக்கு என்னென்ன உதவிகள் செய்ய முடியுமோ, அவை நிச்சயமாக எமது இராஜாங்க அமைச்சின் மூலமாக எங்களுடைய அமைச்சர் அவர்களின் உதவியுடனும் மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களின் உதவியுடனும் செய்ய முடியுமென்பதை இச்சந்தர்ப்பத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

எனக்குத் தரப்பட்ட 4 நிமிடங்களில் எதைப் பேசுவதென்று எனக்குத் தெரியவில்லை. கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நீங்களும் ஓர் உறுப்பினர் என்ற வகையில் உங்களுக்கு 4 நிமிடங்கள் கொடுத்தால் அந்த நிலைமை எப்படியிருக்கும் என்பதைச் சிந்தித்து எங்களுக்கு நேரம் ஒதுக்கும்படி கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය සභාපතිතුමා
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, நாங்கள் நேரம் ஒதுக்குவதில்லை. அரசாங்கக் கட்சியினால்தான் ஒதுக்கப்படுகிறது. அதற்கு நாங்கள் பொறுப்பல்ல.

அடுத்து, கௌரவ துரைரெட்ணசிங்கம் அவர்கள்.

[மு.ப. 11.12]

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு மற்றும் கல்வி அமைச்சு ஆகியவற்றின் நிதியொதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு சில கருத்துகளைக் கூறுவதற்கு வாய்ப்பளித்தமைக்கு முதலில் நன்றி தெரிவித்துக்கொள்கின்றேன்.

இந்த வரவு செலவுத் திட்டத்தைப் பொறுத்தமட்டிலே, இலங்கைப் பாராளுமன்ற வரலாற்றில் இதனை முக்கியமான ஒரு வரவு செலவுத் திட்டமாக நான் கருதுகின்றேன். ஏனெனில், எதிர்க்கட்சித் தலைவர் ஒருவர் வரவு செலவுத் திட்டத்தினை அங்கீகரித்து வாக்களித்திருப்பது இந்த நாட்டில் மிகவும் முன்னோடியான ஒரு செயற்பாடாகும். அரசியல் கைதிகளின் விடுதலை, காணாமற்போனோருடைய விடயங்கள், மீள்குடியேற்றம், வாழ்வாதாரம், வடக்கு, கிழக்கின் அபிவிருத்தி விடயங்கள், இளைஞர், யுவதிகளுக்கான வேலைவாய்ப்பு விடயங்கள் என இவ்வாறு பலவிதமான பிரச்சினைகள் இருந்தாலும்கூட, இந்த வரவு செலவுத் திட்டத்திற்கு எதிர்க்கட்சித் தலைவர் அவர்களுடன் இணைந்து நாங்களும் ஆதரவாக வாக்களித்திருந்தோம். அந்த வகையில், 2/3 பெரும்பான்மையுடன் இதன் இரண்டாம் வாசிப்பு நிறைவேறியிருக்கின்றது.

இன்று கல்வி அமைச்சின் குழுநிலை விவாதம் நடைபெறுகின்ற வேளையிலே ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, 5ஆவது, 6ஆவது பாராளுமன்றங்களிலே கௌரவ கல்வி அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்களுடன் நானும் ஒன்றாக இருந்தவன். அந்தப் பாராளுமன்ற அமர்வுகளில் அவர் அடிக்கடி கல்வியைப் பற்றி மிகவும் துடிப்போடு பேசுவார். கல்விப் புலத்திலிருந்து வந்தவன் என்ற ரீதியிலே அவருடைய பேச்சை நான் மிகவும் நுணுக்கமாகச் செவிமடுத்திருக்கிறேன். அவர் கல்வியிலே காட்டிய அக்கறையின் காரணமாக இந்த 8ஆவது பாராளுமன்றத்திலே கல்வி அமைச்சராகத் தெரிவு செய்யப்பட்டிருப்பது எங்களுக்கு மகிழ்ச்சியளிக்கின்றது. அதேபோன்று அவருக்கு உதவியாக, அவரோடு இணைந்து இந்தப் பாரிய பொறுப்பை ஏற்று நடத்தக்கூடிய, அனுபவ முதிர்ச்சியுடைய கல்வி இராஜாங்க அமைச்சர் ஒருவர் தெரிவு செய்யப்பட்டிருப்பதும் எங்களுக்கு மிக்க மகிழ்ச்சியைத் தருகின்றது.

நாட்டில் எந்த அபிவிருத்தியை எடுத்துக்கொண்டாலும், முக்கியமாகக் கல்வியிலே இந்த நாட்டின் எதிர்காலம் தங்கியிருக்கின்றது என்பதை எவரும் மறுக்க முடியாது. இதற்காக இந்த வரவு செலவுத் திட்டத்தில் ரூபாய் 90,000 மில்லியன் ஒதுக்கப்பட்டிருக்கின்றது. இந்த நாடு பாரிய கடன் சுமையில், - எங்களையும் எங்களுடைய சந்ததிகளையும் வேதனையில் ஆழ்த்தி வைத்திருக்கின்ற கடன் சுமையில் - இருக்கும்பொழுதும் கல்விக்காக ஒதுக்கப்பட்டிருக்கும் 90,000 மில்லியன் ரூபாயை நாங்கள் ஒரு பெரிய நிதியாகத்தான் பார்க்கவேண்டும். ஆனாலும், இந்த நிதி செலவிடப்படுகின்ற தன்மையிலேதான் கல்வியின் முன்னேற்றமோ அல்லது முன்னேற்றமின்மையோ தங்கியிருக்கின்றது. வளங்கள் எப்பொழுதும் சமமாக விருத்தியடைய வேண்டும். நாங்கள் தனியே பௌதிக வளத்தை - கட்டிடங்கள், உபகரணங்களை - கொண்டு கல்வி வளர்ச்சி அடைந்துள்ளது என்று கருதமுடியாது. கல்வியில் மனித வளம் முக்கிய இடம் பிடிக்கின்றது. குறிப்பாக, ஆசிரியர் வளம் மிகமுக்கிய இடத்தைப் பிடிக்கின்றது. அதேபோல, கல்விக் கூடங்களிலுள்ள ஏனைய கல்விசாரா ஊழியர் வளமும் முக்கிய இடம் பிடிக்கின்றது. நாங்கள் இந்த இரண்டு வளங்ளையும் சமமாகப் பேணிக்கொண்டு சென்றால்தான், கல்வியிலே ஒரு காத்திரமான வளர்ச்சியை அடையமுடியும். தனியே கட்டிடங்களை அமைத்து, பௌதிக வளங்களை விருத்திசெய்து அழகு பார்ப்பதில் எந்தவிதமான அர்த்தமுமில்லை. அந்த வளங்களோடு ஆளணி வளமும் - மனித வளமும் - சமமாக வளர்க்கப்படல்வேண்டும்.

அதைவிட, இப்பொழுது நாங்கள் பார்க்கின்ற ஒரு பாரிய குறைபாடு என்னவென்றால், பௌதிக வளங்கள், ஆளணி வளங்கள் இருந்தாலும், கல்விக் கூடங்களில் ஆசிரியர்கள் மனநிறைவோடு கற்பிக்கக்கூடிய ஒரு சூழலோ, மாணவர்கள் மனநிறைவோடு கற்கக்கூடிய சூழ்நிலையோ - கவின் நிலையோ - இல்லாமல், பல பாடசாலைகள் இயங்குவதாகும். ஏனென்றால், நாங்கள் ஆளணி, பௌதிக வளங்களை விருத்தி செய்வதற்குப் பணத்தை ஒதுக்கினாலும், பாடசாலையில் இருக்கின்ற கவின் நிலை மிகவும் முக்கியம். கல்விக் கூடங்களில் ஆசிரியர்கள் வேதனையோடு கடமை புரிவது, மாணவர்கள் விரக்தி மனப்பான்மையில் வேண்டாவெறுப்

போடு பாடசாலைக்கு வந்து கல்வியைத் தொடர்வது என்பன வெல்லாம் நாட்டின் கல்வி நிலையில் பாரிய பின்னடைவையே ஏற்படுத்தும். இதனை நாங்கள் மிகமுக்கிய விடயமாகக் கருத்தில் கொள்ளவேண்டும்.

இங்கு ஆசிரியர்களுடைய சம்பளம் பற்றிப் பேசப்பட்டது. இது முக்கியமானது. ஏனென்றால், இது மனதினாலே செய்யப் படவேண்டிய வேலை. ஏனைய கூலித் தொழிலாளிகளிடம் வேலை வாங்குவதுபோல், நாங்கள் ஆசிரியர்களிடம் வேலை வாங்க முடியாது. ஆசிரியர்கள் மனதினால் உணர்ந்து கற்பிக்கின்ற நேரத்தில்தான், உண்மையான கல்வியினைப் பிள்ளைகள் பெறக்கூடிய நிலைமை ஏற்படும். எனவே, ஆசிரியர்களின் மனதைத் திருப்திப்படுத்தக்கூடிய வகையில், அவர்களுடைய மனக்குறைகள் - சம்பளம், கிராமப் புறப் பாடசாலைகளிலே ஆசிரியர் விடுதிகள், பாடசாலைக்கு வேண்டிய மலசலகூட, நீர், மின்சார வசதிகள் எல்லாம் - பூர்த்தி செய்யப்பட்டு, ஆசிரியர்கள் மனநிறைவோடு கடமையாற்றக் கூடிய ஒரு சூழலை ஏற்படுத்தவேண்டியது மிக முக்கியம். அதேபோன்று மாணவர்கள் பாடசாலைக்கு வந்து, தங்களுடைய ஏனைய விடயங்களை மறந்து பாடசாலையில் இருந்து தங்களுடைய கல்வி நடவடிக்கைகளைப் பூரணமாக மேற்கொள்வதற்கு உரிய சூழலை ஏற்படுத்துவதில் கல்வி அமைச்சு கூடிய கவனத்தைச் செலுத்தவேண்டுமென்று நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இந்த வரவு செலவுத் திட்டத்தில் குறிப்பிடப்பட்டுள்ள 13 வருட கட்டாய பாடசாலைக் கல்விக் கொள்கையானது வரவேற்கக்கூடியது. இப்பொழுது, எல்லாப் பாடசாலை களிலும் மாணவர் இடைவிலகல் இருக்கின்றது. நகரத்திலுள்ள சில முன்னோடியான பாடசாலைகளைத் தவிர, கிராமப் புறங்களிலுள்ள பாடசாலைகளில் நாளாந்தம் இடைவிலகல் நடைபெற்றுக்கொண்டிருக்கின்றது. இது தொடர்பில் நாங்கள் மாணவர்களிடம் விசாரித்தால், அவர்களுடைய வறுமைநிலை இதற்கு முக்கிய காரணமாக இருப்பதை அவதானிக்க முடிகின்றது. எத்தனையோ ஏழை மாணவர்கள் பொருளாதார வசதிகள் இல்லாமையால் தங்களுடைய இடத்திலிருந்து பாடசாலைக்குச் செல்வதற்கு ஒரு துவிச்சக்கரவண்டிகூட இல்லாமல் இருக்கின்றார்கள். ஆகவே, கல்வி அமைச்சானது, இவ்வாறு மாணவர் இடைவிலகலை நிறுத்துவதற்கான உத்திகளைக் கையாண்டு ஒரு காத்திரமான செயல்திட்டத்தை வகுத்து, 13ஆம் ஆண்டுவரையும் பிள்ளைகள் படிக்கக்கூடிய ஒரு சூழ்நிலையை ஏற்படுத்தவேண்டும்.

சில பாடசாலைகளில் மாணவர்கள் பாடசாலைக்கு வந்தாலும், அந்த நாளைப் பிரயோசனமான முறையில் பயன் படுத்த முடியாத - கற்பித்தல் இல்லாத - சூழ்நிலையும் இருக்கின்றது. ஒரு பாடசாலையில் கணித, விஞ்ஞான, ஆங்கில பாடங்களைக் கற்பிப்பதற்குரிய ஆசிரியர்கள் இல்லாவிட்டால் மாணவர்கள் அங்கு செல்வதில் எந்தவிதமான பிரயோசன முமில்லை. இவ்வாறான சூழ்நிலைகளாலும் பாடசாலைகளில் இடைவிலகல்கள் நடைபெறுகின்றன. ஆகவே, 13ஆம் தரம் வரையும் கட்டாயக் கல்வி என்றொரு சட்டத்தை அமுல்படுத்துவதானது மாணவர்களுக்குத் தண்டனை வழங்குவதாகவும் அமையக்கூடாது. ஆனபடியால், இந்தக் கட்டாயக் கல்வியை நாங்கள் நடைமுறைப்படுத்த விழைகின்ற வேளையிலே, அந்த மாணவனுடைய கஷ்ட நஷ்டங்களை, அதாவது மாணவர்களுடைய வீட்டுச் சூழ்நிலைகள், பெற்றோர், பாதுகாவலர்கள் போன்றோரின் கஷ்டங்கள் போன்றவற்றைப் புரிந்துகொண்டு, அவர்கள் கற்பதற்குரிய ஒரு சூழ்நிலையை ஏற்படுத்தவேண்டியது மிக முக்கியமென நான் கருதுகின்றேன்.

அடுத்து "அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" அதாவது, "ළඟම පාසල - හොඳම පාසල" என்ற திட்டம் மிகவும் வரவேற்கக்கூடியது. நான் இம்முறை இந்த எட்டாவது பாராளுமன்றத்திற்குத் தெரிவாகி வந்தபோது, என்னுடைய முதலாவது உரையிலே முன்னோடிப் பாடசாலை களில் மாணவர்களுக்கான அனுமதியைப் பெறுவதில் உள்ள கஷ்டங்கள் தொடர்பாகப் பேசியிருந்தேன். அவை தொடர்பில் நடவடிக்கை எடுக்குமாறு நான் இங்கே ஓர் உருக்கமான வேண்டுகோளையும் விடுத்திருந்தேன். அதன் பிற்பாடு "அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" என்றொரு திட்டத்தைக் கொண்டுவந்தபோது நான் சந்தோசப்பட்டேன். அந்தவகையில், பாராளுமன்றத்திலே நான் ஆற்றிய உரையைக் கல்வியமைச்சர் அவர்கள் செவிமடுத்ததும் இதற்கொரு காரணமாக இருக்கலாமென்று கருதினேன். எப்படியோ, அந்தத் திட்டம் நடைமுறைப்படுத்தப்பட்டிருக் கின்றது. இது தொடர்பான ஆரம்பக் கூட்டத்திற்கு எங்களை யெல்லாம் அழைத்து அந்தந்தப் பகுதிகளிலே தெரிவுசெய்யப் பட்ட பாடசாலைகளின் விபரங்கள் எங்களுக்குக் கூறப்பட்டு அவை தொடர்பில் எங்களுடைய அபிப்பிராயங்கள் கேட்கப்பட்டன. ஆனால், அதன் பிற்பாடு தற்போது பல செயற்றிட்டங்கள் நடைபெறுகின்றன. அவற்றைப்பற்றி எங்களுக்கு ஒன்றும் விளங்காதிருக்கின்றது.

பாடசாலைகள் 5 - 6 தரங்களாக வகுக்கப்பட்டு, "அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" என்ற திட்டத்தின்கீழ் கொண்டுவரப்படுவதை நாங்கள் வரவேற் கின்றோம்; அதையிட்டுச் சந்தோசப்படுகின்றோம். அது மிகவும் முக்கியமானது. ஏனென்றால், பாடசாலைகளுடைய ஏற்றத்தாழ்வுகளினால்தான் இன்று சில மாணவர்கள் அவற்றில் அனுமதியைப் பெறுவதில் கஷ்டப்படுகின்ற ஒரு நிலைமை காணப்படுகிறது. இது ஒரு பாரிய பிரச்சினை. சின்னப் பிள்ளைகளைப் பொறுத்தமட்டில், அவர்கள் சிறியவர்களாக இருந்தாலும் முதலாம் தரம், இரண்டாம் தரம் படிக்கும்போதே தாம் ஐந்தாம் தரம் சித்தியடைந்ததன் பிற்பாடு ஒரு குறிப்பிட்ட முன்னோடிப் பாடசாலையிலே சேர்ந்து படிக்கவேண்டும்; அந்தப் பாடசாலையில் படித்து நல்ல பெறுபேறுகளைப் பெறவேண்டும்; தாம் ஓர் உயர்ந்த நிலைக்கு வரவேண்டும் என்றெல்லாம் கனவு காண்கின்றார்கள். அந்த அனுமதி மறுக்கப்படுகின்றபோது அந்தப் பிஞ்சு உள்ளங்கள் மிகவும் பாதிக்கப்படுகின்ற ஒரு நிலைமை இருக்கின்றது.

நான் நேற்று முன்தினம் ஒரு பிரச்சினையை அறிந்தேன். அதாவது, மட்டக்களப்பிலுள்ள ஒரு தொழில்நுட்ப உத்தியோகத்தர் ஓர் உயர்தரக் கல்லூரியிலே தன்னுடைய இரண்டு பிள்ளைகளையும் சேர்த்துக் கற்பித்துக் கொண்டிருந்தார். அவருக்குத் திடீரெனத் திருகோணமலைக்கு இடமாற்ற உத்தரவு வந்தது. எனவே, அவர் அங்கு சென்றதனால் அவருடைய பிள்ளைகள் திருகோணமலைப் பாடசாலையொன்றில் இரண்டு வருடங்கள் படித்தார்கள். அதன் பிற்பாடு இந்த வருடம் அவருக்கு மீண்டும் மட்டக்களப்பிற்கு இடமாற்றம் கிடைத்திருக்கின்றது. எனவே, அவர் மீண்டும் தான் தரம் ஒன்றிலிருந்து பிள்ளைகளைக் கற்பித்த அந்தக் கல்லூரிக்கு வந்து தன்னுடைய பிள்ளைகளைச் சேர்த்துக்கொள்ள வேண்டுமென்று கேட்டபோது ஒரு பிள்ளைக்கு அனுமதி கிடைத்திருக்கின்றது. ஆனால், தரம் ஐந்தில் கற்கின்ற பிள்ளைக்கு அனுமதி மறுக்கப் பட்டிருக்கின்றது. அரசாங்கம் இடமாற்றம் கொடுப்பது அந்தப் பிள்ளையினுடைய குற்றமல்ல. அந்தப் பிள்ளை தான் படித்த ஒரு பள்ளிக்கூடம், தான் அறிந்த அதிபர், தான் அறிந்த ஆசிரியர் குழாம் என்ற ரீதியிலே அங்கு வருகின்றபோது, சட்டதிட்டங்களை விதித்து அவருடைய அனுமதியை மறுப்பது

[ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා]

எவ்வளவு நியாயமானதென்று எனக்குத் தெரியவில்லை. எனவே, நாங்கள் முக்கியமாக இளம் மாணவர்களின் உள்ளங்களைக் கருத்திற்கொள்ள வேண்டும். சிறுவயதில் அவர்களுடைய உள்ளத்தில் இந்த விடயங்கள் பதிவதன்மூலம் அது அவர்களுக்கு நீண்டகாலத்திற்குப் பாதிப்பை ஏற்படுத்தி, வேறுவிதமான பிரச்சினைகளைக் கொண்டுவரக்கூடும். "அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" என்ற திட்டம் வெற்றிகரமாக நடைமுறைப்படுத்தப்படும் வரையும் இந்தப் பாடசாலைகளுக்கான அனுமதி விடயத்திலே சில கஷ்டங்கள் இருக்கத்தான் செய்யும். ஆகவே, பிள்ளைகளைப் பாதிக்காத வகையில் திட்டங்களை வகுத்து, அந்தப் பாடசாலைகளிலே மாணவர்களை அனுமதிப்பதற்கான செயற்பாடுகளைச் செய்யவேண்டுமென்று நான் இந்த இடத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

மேலும், இம்முறை கல்வி தொடர்பான விடயங்களிலே "ஆயிரம் பாடசாலைத் திட்டம்", "அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" திட்டம் போன்ற பல திட்டங்களின்மூலம் இலங்கையிலுள்ள பாடசாலைகள் அபிவிருத்தி செய்யப்படு கின்றன. இது ஒரு நல்ல விடயம். ஆனால், இவ்வாறான எந்தத் திட்டத்திலும் சேர்த்துக்கொள்ளப்படாத கிட்டத்தட்ட 1,200 பாடசாலைகள் இனங்காணப்பட்டு, அவற்றையும் அபிவிருத்தி செய்வதற்கு எடுக்கின்ற முயற்சிகளை நாங்கள் மிகவும் வரவேற்கின்றோம்; அதையிட்டுச் சந்தோசப்படுகின்றோம்.

தோட்டப் பாடசாலைகளைப் பொறுத்தளவிலே, அவற்றை இடைநிலைப் பாடசாலையாக தரமுயர்த்துவதற்கும் இடை நிலைப் பாடசாலைகளை உயர்தரப் பாடசாலைகளாகத் தரமுயர்த்துவதற்கும் எடுத்த முயற்சிகளை நாங்கள் வெகுவாக வரவேற்கின்றோம். அது முக்கியமான ஒன்றாகும். ஏனென்றால், மலையகம் கல்வியிலே பின்தங்கியிருக்கின்றது. அதைப் பாராளுமன்ற உறுப்பினர்களும் அந்தப் பிரதேச மக்களும் குறிப்பிடுவது நாங்கள் அறிந்த விடயமாகும். ஆகவே, அந்த மலையக மக்களுடைய கல்வியிலே காத்திரமான சில முடிவுகளை எடுத்திருப்பது வரவேற்கக்கூடியது. அதற்காக நாங்கள் கல்வி அமைச்சருக்கு நன்றியைக் கூறிக் கொள்கின்றோம்.

ஆரம்பக் கல்வி, விஞ்ஞானம், கணிதம், தொழில்நுட்பம் ஆகிய விடயங்களிலே சில செயற்றிட்டங்களை வகுத்து அந்த கல்வியை வளர்ப்பதற்காகப் பல முயற்சிகளை எடுத்திருப்பது சந்தோசத்திற்குரியது. அதேபோன்று விளையாட்டுத்துறை, தகவல் தொழில்நுட்பம் போன்ற இன்னோரன்ன விடயங் களையும் கல்வியிலே சேர்த்து அதை வளர்ப்பதற்கு எடுத்திருக்கும் முயற்சிகளும் நல்ல முயற்சிகளாகும்.

மேலும், கல்வி கற்கின்ற மாணவர்கள் அரசின் பாடத்திட் டங்களூடாக - curriculum - பெற்றுக்கொள்ளும் அறிவைவிட, பாடத்திட்டத்திற்கு மேலாக நாளாந்தம் வேறு எத்தனையோ பல விடயங்களையும் அறிந்துகொள்ள வேண்டிய தேவை இருக்கின்றது. அவற்றை அறியாவிட்டால் இந்த உலகத்திலே வாழ முடியாது. மிக வேகமாக மாறி வருகின்ற இந்த உலகத்திற்கு முகங்கொடுக்கக்கூடிய விதத்திலே மாணவர்கள் வளர்க்கப்பட வேண்டியது மிக முக்கியமாகும். அந்த விடயத் திலும் கவனம் எடுக்க வேண்டும். இப்பொழுது நாங்கள் பாடசாலைகளிலே பாடரீதியாக ஒரு விடயத்தை அவதானிக் கின்றோம். அதாவது, காலையிலே ஆசிரியர்கள் பாடமெடுக்க ஆரம்பிக்கிறார்கள். ஒரு நாளைக்கு கிட்டத்தட்ட எட்டு பாட நேரங்கள் அவர்களுக்கு இருக்கின்றன. பாட ஆசிரியர்கள் அந்தப் பாடத்திட்டத்தை முடிக்கும் விடயத்திலும், அவற்றை மாணவர்களுக்குச் சரியாகப் புரியவைக்கின்ற விடயங்களிலும் மிகவும் அக்கறையோடு செயற்படுகின்றார்கள். அது வரவேற்கக்கூடியது. ஆனால், பொதுவாக சன்மார்க்கம், மனித விழுமியங்கள், பண்பாடுகள், கலை, கலாசாரம் என்பன பற்றி மாணவர்கள் அறிந்துகொள்ளக்கூடிய சந்தர்ப்பங்கள் மிகக் குறைவாக இருக்கின்றன. அந்த வகையில் அவற்றுக்கெனவும் சில செயற்றிட்டங்களை வகுத்து அவற்றைப் பாடசாலைகளில் போதிக்க வேண்டும்.

இப்பொழுது மாணவர்களாக இருக்கின்றவர்கள்தான் எதிர்காலத்தில் எங்களுடைய நாட்டிலே பொறுப்புள்ள பெரிய வர்களாக, அரசியல்வாதிகளாக, துறைசார் நிபுணர்களாக வரப்போகிறார்கள். இவர்களுக்கு மத்தியில் பாடசாலை மட்டத்திலிருந்தே இன ஒற்றுமை வளர்க்கப்பட வேண்டும். எல்லாச் சமயங்களையும் சமமாக மதித்தல், மற்றவர்களது மொழிகளையும் மதிக்கின்ற தன்மை, சகோதரத்துவ மனப்பான்மை, புரிந்துணர்வு போன்ற தன்மைகளோடு வாழக் கூடிய நிலைப்பாட்டை ஏற்படுத்தக்கூடிய பொருத்தமான ஓரிடம் பாடசாலையாகும். எனவே, அதற்கான எதிர்காலத் திட்டத்தை மிகக் கவனமாகக் கருத்திலேகொண்டு அந்த விடயத்திலும் கல்வி அமைச்சு கூடுதலாகக் கவனமெடுக்க வேண்டும். அப்போதுதான் எங்களுடைய நாட்டின் எதிர்காலம் சிறப்பாகும். அப்படியான ஒரு நிலையிலே எங்களுடைய முன்னோர்கள் எங்களை வளர்க்காததும் இன்று நாங்கள் அனுபவிக்கும் துன்ப துயரங்களுக்கு ஒரு காரணமாக இருக்கலாம்!

அண்மையிலே தேசிய இளைஞர் சேவைகள் மன்றத் தினுடைய இளைஞர் பாராளுமன்ற அமர்வைப் பார்க்கக்கூடிய ஒரு சந்தர்ப்பம் எனக்கு ஏற்பட்டது. அன்று அந்த அமர்விலே நான் 2-3 மணித்தியாலங்கள் அவர்களோடு உட்கார்ந் திருந்தேன். அப்போது சில விடயங்களை அவதானிக்கக் கூடியதாக இருந்தது. இளைஞர்களாக இருந்தாலும் அந்த இளைஞர் பாராளுமன்றத்திலே அவர்கள் நடந்துகொண்ட விதம், மற்றவர்களுடைய கருத்துக்களுக்குப் பதில் உரைத்த விதம் என்பன என்னைக் கவர்ந்தன. மிகவும் புரிந்துணர்வோடு அவர்கள் இருப்பதைப் பார்த்து மிகவும் சந்தோசப்பட்டேன். எதிர்கால அரசியல் தலைவர்களாக மிகவும் செம்மையான முறையிலே அவர்கள் வளர்க்கப்படுகின்ற முறைமை மிகவும் சிறப்பாகும். அதற்காக அந்த நிறுவனத்தினுடைய பணிப்பாளர் நாயகம் அவர்களுக்கும் ஏனைய உத்தியோகத்தர்களுக்கும் மற்றும் அதைச் சார்ந்த அமைச்சுக்குப் பொறுப்பாயிருக்கின்ற மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களுக்கும் அதற்கு உறுதுணையாக இருக்கின்ற ஜனாதிபதி அவர்களுக்கும் நாங்கள் நன்றி பாராட்ட வேண்டும். தேசிய இளைஞர் சேவைகள் மன்றத்தை ஊக்குவித்து, அங்கு என்னென்ன குறைபாடுகள் இருக்கின்றன என்பதை அறிந்து அதற்குத் தேவையான நிதியையும் கொடுக்க வேண்டும். அந்த ரீதியிலே இலங்கையின் சுபிட்சத்துக்கு உண்மையாகத் தேவைப்படுகின்ற இன ஒற்றுமையை, கலை, கலாசாரத்தை வளர்த்தெடுப்பதிலும் மற்றும் ஏனைய அபிவிருத்திகளைப் பற்றியும் கவனமெடுக்க வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

இன்று ஆசிரிய வளத்திலே கணிதம், விஞ்ஞானம், ஆங்கிலம் ஆகிய மூன்று பாடங்களுக்குமான ஆசிரியர்களின் தேவை மிகவும் அதிகமாக இருக்கிறது. ஆனால், அனேகமான பாடசாலைகளில் அவற்றுக்குப் பற்றாக்குறை நிலவுகின்றது. சாதாரணமாக GCE (O/L) வரை வகுப்புகள் நடைபெறுகின்ற பல பாடசாலைகளில்கூட கணித, விஞ்ஞான ஆசிரியர்கள்

இல்லை. இப்படியாக வருடக்கணக்கில் இயங்குகின்ற பாடசாலைகள் இருக்கின்றன. பரீட்சைகளைப் பொறுத் தளவிலே, அந்தப் பாடங்களுக்கு ஆசிரியர்கள் இல்லா விட்டாலும் எல்லா மாணவர்களுக்கும் அவை ஒன்றாகத்தான் நடைபெறுகின்றன. ஆகவே, அந்த மாணவர்களுடைய நிலைமையைப் பற்றியும் நாங்கள் சிந்திக்க வேண்டும். அவர்களின் பெற்றோர் படுகின்ற மனக்கஷ்டங்களையும் புரிந்துகொள்ள வேண்டும்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஐந்து நிமிடங்கள் இருக்கின்றன.

**ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා**
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)

அந்த வகையில், கணித மற்றும் விஞ்ஞான ஆசிரியர்களை நியமிக்கின்ற விடயத்திலே சில செயற்றிட்டங்களை கல்வி அமைச்சு முன்னெடுத்திருப்பதையிட்டு சந்தோசப்படுகின்றேன். ஆங்கில ஆசிரியர்களை நியமிப்பதிலே சில கஷ்டங்கள் இருப்பதை நாங்கள் உணர்கிறோம். இப்பொழுது ஆங்கில மொழியில் HNDE கல்விநெறியினைப் பூர்த்தி செய்த பலர் இருக்கின்றார்கள். அதாவது, உயர்தொழில் நிறுவனங்களில் பயின்ற அவர்கள் வெளியிலே இருக்கின்றார்கள். அவர்களைப் பிரயோசனப்படுத்தலாம்! அதற்காக ஒரு நீண்டகாலத் திட்டத்தை வகுத்துக்கொண்டு செயற்பட வேண்டும். ஆங்கில ஆசிரியர்கள் இல்லாததனால் மாணவர்கள் அந்தப் பாட நேரத்தை வெறுமனே கழிப்பதைத் தொடரவிடாமல் துரிதமாக ஒரு திட்டத்தை வகுக்க வேண்டும். இன்று எங்களுக்கிருக்கின்ற மனித வளத்தைப் பிரயோசனப்படுத்தி, ஆங்கில, கணித, விஞ்ஞான ஆசிரியர்களை உடனடியாக நியமிப்பதற்குரிய வேலைகளைச் செய்யவேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன்.

ஐந்தாம் தர புலமைப்பரிசில் பரீட்சையைப் பொறுத் தளவிலே, அது வறிய பிள்ளைகள் தங்களது உயர் கல்வியைத் தொடர்வதற்கான ஒரு பரீட்சையாகும். ஆனால், அதனுடைய நோக்கம் இன்று மாறுபட்டுக் காணப்படுகின்றது. வசதி கூடிய பெற்றோரும் பிரசித்தி பெற்ற பாடசாலைகளில் அனுமதியைப் பெறுவதற்காகத் தங்களுடைய பிள்ளைகள் அந்தப் பரீட்சைக்குத் தோற்ற வேண்டுமென்று விரும்புகின்றார்கள்; பாடசாலைகளும் அதனை அனுமதிக்கின்றன. இதன் காரணமாக இன்று அந்தப் பரீட்சை வேறொரு கோணத்தில் இருக்கின்றது. ஒவ்வொரு பெற்றோரும் தங்களுடைய பிள்ளை மாவட்டத்திலே அதிக புள்ளிகளைப் பெறவேண்டும், அகில இலங்கையிலே கூடுதலான புள்ளிகளைப் பெறவேண்டுமென்ற நோக்கத்தோடு செயற்படுவதை நாங்கள் காண்கின்றோம். அதேபோல் பாடசாலை அதிபர், ஆசிரியர்களும் அந்தப் பரீட்சையிலே தங்களுடைய பாடசாலை அந்த மாவட்டத்திலே, அகில இலங்கையிலே சிறந்த பாடசாலையாகக் கணிக்கப்பட வேண்டுமென்று விரும்புகின்ற ஒரு நிலைமை காணப்படு கின்றது. இதனால் உண்மையில் வசதி குறைந்த மாணவர்கள் அந்தப் பரீட்சையில் தோற்றி உயர் கல்வியைத் தொடர்வதற்குரிய சந்தர்ப்பங்கள் இல்லாமற்போவதாக நான் உணர்கின்றேன். ஆகவே, இந்தப் பரீட்சை தொடர்பாக ஒரு மீளாய்வு செய்யப்பட வேண்டும்.

ஆனால், இந்தப் பரீட்சை தொடர்பாகப் பலவிதமான கருத்துகள் நிலவுவதையும் அவதானிக்கக்கூடியதாக இருக் கின்றது. 5ஆம் தர புலமைப்பரிசில் பரீட்சைக்குத் தோற்று கின்ற மாணவர்களைப் பொறுத்தவரையிலே, அவர்க ளுடைய வயது, சக்தி, மற்றும் அவர்களுடைய விருப்பு வெறுப்புகளைக் கவனத்திற்கொண்டு இந்தப் பரீட்சைக்கு அவர்கள் பயிற்றப்படுவதில்லை. அவர்கள் பெற்றோர்களாலும் ஆசிரியர்களாலும் மிகவும் கஷ்டப்படுத்தப்பட்டு வழிநடத்தப் படுகிறார்கள். இந்தப் பரீட்சையைக் கண்டு பயந்த மாணவர்களும் இருக்கிறார்கள். 1990ஆம் ஆண்டு நான் தேசிய கல்வி நிறுவகத்திலே இருந்தபோது முல்லேரியா வைத்திய சாலைக்குச் சென்று 5ஆம் தர புலமைப்பரிசில் பரீட்சைக்குத் தோற்றிய சில மாணவர்களைப் பார்க்கக்கூடிய சந்தர்ப்பம் கிடைத்தமை எனக்கு நன்றாக ஞாபகமிருக்கிறது. அவர்களின் அந்த நிலைமைக்கு காரணம், அவர்களுக்குக் கொடுக்கப்பட்ட மேலதிக அழுத்தங்களும் வேலைப்பளுவும்தான் என நான் கருதுகின்றேன். ஆகையால், இந்தப் பரீட்சைக்கு வழிகாட்டும்போது - அவர்களைத் தயார்ப்படுத்தும்போது அந்தப் பிஞ்சு உள்ளங்களுடைய மனோநிலை, விருப்பு வெறுப்புகள், அவர்களுடைய இயலுமை ஆகியவற்றைக் கருத்திற்கொண்டு வழிநடத்த வேண்டுமென்றும் அதற்கான ஒரு திட்டத்தைக் கொண்டுவர வேண்டுமென்றும் இச்சந்தர்ப் பத்திலே வலியுறுத்திக் கூறவிரும்புகின்றேன்.

எங்களுடைய நாட்டிலே கல்விக்குச் சேவையாற்றிய அமைச்சர்கள் இருவருடைய பெயர்களைக் கௌரவ உறுப்பினர் பிமல் ரத்நாயக்க அவர்கள் குறிப்பிட்டார். அதுபோல், ஏனைய கல்வி அமைச்சர்களும் எங்களுடைய மனங்களிலே இருக்கிறார்கள். தற்போதுள்ள கல்வி அமைச்சர் அவர்கள் ஓர் இளைஞனாக இருக்கின்றார். அவரிடம் இருக்கின்ற ஆற்றல்களை அவர் முழுமையாகப் பிரயோசனப் படுத்த வேண்டும். அவருக்கு உதவியாக இராஜாங்க அமைச்சர் அவர்கள் இருக்கிறார். எனவே, இருவரும் சேர்ந்து இந்த நாட்டிலே கல்வியில் ஒரு புரட்சிகரமான மாற்றத்தை ஏற்படுத்து வதன் மூலமாக மாறிவருகின்ற உலகத்துக்கு எங்களுடைய பிள்ளைகள் சகலரும் முகங்கொடுக்கக்கூடிய நிலையை ஏற்படுத்த வேண்டும். அதன்மூலமாக எமது கௌரவ அமைச்சர் அவர்களும் இந்த நாட்டிலே ஒரு சிறந்த கல்வி அமைச்சர் என்ற இடத்தைப் பிடிக்கவேண்டுமென்று வேண்டிக்கொண்டு, அவரை வாழ்த்தி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

The next speaker is the Hon. Bandula Gunawardane. You have 25 minutes.

[පූ.භා. 11.34]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ලක්ෂ සංඛ්‍යාත දරුවන්ගේ ජීවිත ඉරණම තීරණය කිරීම සඳහා අතිශයින් වැදගත් කාර්ය භාරයක් ඉටු කරන අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මම හිටපු අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් අදහස් කිහිපයක් දක්වන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍ය ධුරය ඉතාම අභියෝගාත්මක, නිතර විවේචන, විචාර, ගැරහුම් යනාදියට ලක් වන අමාත්‍ය ධුරයක්. සාමාන්‍යයෙන් අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් කටයුතු කරන කාලයේ ඔහු ජනප්‍රිය වුණොත්, හොඳ වුණොත්, හැමෝම ප්‍රශස්ති කිව්වොත්, මුරුංගා අත්තේ තිබ්බොත් ඔහු මිය ගියාට පස්සේ ශාප ලබන කෙනකු බවට පත් වෙනවා.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

හැබැයි, ඉන්න කාලයේ හොඳට බැණුම් අසමින් අධ්‍යාපනය වෙනුවෙන් වැඩ කටයුතු කළොත් ඔහු මළාට පස්සේ ඉතිහාසයේ සදාකාලිකව සමරනවා. එහෙම කෙනෙක් තමයි ජාතික අධ්‍යාපනයේ පියා වන අනගාරික ධර්මපාලතුමා. අනගාරික ධර්මපාලතුමා තමයි බ්‍රිතාන්‍යයේ යටත් විජිත යුගයෙන් පස්සේ ලංකාවට අධ්‍යාපන දර්ශනය දුන්නේ.

ඒ විතරක් නොවෙයි, එතුමා තමයි කිව්වේ, විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය අවජාතක අධ්‍යාපන ක්‍රමයක්, ඒ වෙනුවට ගුණ, නැණ, බල, සුව සපිරි, විශ්වයට සම්පතක් විය හැකි නිපුණතා සංවර්ධන අධ්‍යාපනයක් ඇති වෙන්න ඕනෑ කියලායි. එතුමා පාසල් 122ක් හැදුවා; බෞද්ධ අධ්‍යාපන අරමුදල පිහිටෙව්වා; කොළඹ ආනන්ද විද්‍යාලය, ගාල්ල මහින්ද විද්‍යාලය, මහනුවර ධර්මරාජ විද්‍යාලය කියන මේ සියලු බෞද්ධ පාසල් හැදුවේ අනගාරික ධර්මපාලතුමායි. එතුමා ඉන්නතුරුම දේශපාලනික වශයෙන් ගහලා පන්නන්න හැදුවා. අවසානයේ ඉන්දියාවට ගිහිල්ලායි මැරුණේ. හැබැයි, අද ජනාධිපතිතුමාත් අනෙක් සියලුම අයත් කියනවා, අනගාරික ධර්මපාලතුමාගේ ආදර්ශය ගන්නය කියලා. අද එතුමාගේ පිළිරූ ඉදි කරලා තිබෙනවා. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපනය ගෙනාවා. එතුමාටත් ඉන්න තුරු දේශපාලනික වශයෙන් ගැහුවා. අවසානයේ එතුමා බොහොම අසරණ ලෙස පානදුර රෝහලේදී මිය ගියා. ඒ නිසා ඉන්න කාලයේ විතරක් නොවෙයි, ඊට පස්සේත් ජීවත් වෙන අධ්‍යාපන ඇමතිවරයෙක් වෙන්න ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමාට අවස්ථාව ලැබේවා!යි කියලා මා ප්‍රාර්ථනා කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍ය ධුරයේ කටයුතු කරන කොට පාසල්වලට දරුවන් දමන්න නිතරම ඉල්ලීම් එනවා. එලෙස ඉල්ලීම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කියනවා; පළාත් සභා මන්ත්‍රීවරු කියනවා; ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් කියනවා. පාසල්වලට දරුවන් දමන්න ඇමතිවරයා මැදිහත් වුණේ නැත්නම් අම්මා මෝ නැතිව බැණුම් අහන්න වෙනවා. දුෂ්කර පළාතකට පත්වීම දීපු ගුරුවරයාගේ මාරුවීමට වගේම, තමන්ගේ ඥාති හිත මිත්‍රාදී ළමයා අවශ්‍ය පළාතකට මාරු කරලා දුන්නේ නැත්නම් ඒකටත් අධ්‍යාපන ඇමතිවරයාට අම්මා මෝ නැතිව බැණුම් අහන්න සිද්ධ වෙනවා. ඉල්ලන සම්පත් ලබා දෙන්න බැරි වුණාම ඒකටත් අධ්‍යාපන ඇමතිවරයා බැණුම් අහන්න වෙනවා.

මා කියන්න යන්නේ අධ්‍යාපන ඇමතිවරයාගේ ප්‍රශ්නයක් නොවෙයි. මේ රජය බලයට පත් වෙන්න කලින් හදා ගත්ත දේශපාලන සටන් පාඨයක් නිසා ඉතාම විශාල අභියෝගයකට, අර්බුදයකට හා අපහාසයකට අද දවසේ අධ්‍යාපන අමාත්‍යාංශය ලක් වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි මැතිවරණයට කලින් කිව්වා, අපේ කාලයේ වාගේ නැතුව, "අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කළ යුතුයි" කියලා. ටීෂර්ට් වල පිටුපස සියයට 6 ගැහුවා, පාද යාත්‍රා ගියා, පයින් ගමන් කළා, පෙළපාළි ගියා, උද්ඝෝෂණ කළා. ඒ ගියේ නිකම් අය නොවෙයි. "යහ පාලනය සඳහා", "සාධාරණ සමාජයක් සඳහා" කියමින් විද්වතුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, මහාචාර්යවරුන් සියලු දෙනා පෙළපාළි ගියා. ආණ්ඩුවට රාජ්‍ය බලය ලබා ගැනීම අවශ්‍ය වුණා. "බුදු හාමුදුරුවන් පල්ලා! අපි ආපු ගමන් අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරනවා" කියලා කිව්වා. කවුරුවත් හදලා බැලුවේ නැහැ, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් කියන්නේ කීයද කියලා. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රුපියල් බිලියන 800ක්. අද දවසේ ජාතියේ නිෂ්පාදනය අනුව අධ්‍යාපනයට රුපියල් බිලියන 800ක් වෙන් කරන්න ඕනෑ, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් වෙන්න නම්. සෞඛ්‍යයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3යි කිව්වා. එහෙනම් රුපියල් බිලියන 400ක් වෙන් කරන්න ඕනෑ. අධ්‍යාපනයටයි, සෞඛ්‍යයටයි විතරක් රුපියල් බිලියන 1,200ක් වෙන් කළාම මුළු බදු ආදායම මේකෙන් ඉවර වෙලා යනවා.

VAT ඇතුළු සියලු බර ජනතාව මත පටවලා ගන්න මුදල් සියල්ල ඉවර වෙනවා. ඒ නිසා මේක මහ පොළොවේ යථාර්ථයක් නොවෙයි. දැන ගත යුතු දේ මේකයි. හැම දාම මෙවැනි ඉල්ලීම් ඉතිහාසය පුරාම මේ ගරු සභාවල කථා වෙලා තිබෙනවා. ලංකාවේ අධ්‍යාපන අමාත්‍යවරයෙක් වුත්, මේ ප්‍රශ්න ඉතා ප්‍රබුද්ධව, බුද්ධිමත්ව දැකපු අයෙකු වුත් දිවංගත ගරු ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා -මහපොළ නිර්මාතෘතුමා- මේ ගරු සභාවට 1990 දෙසැම්බර් 06 වැනි දා කියා තිබෙන දේ එදින හැන්සාඩ් වාර්තාවේ 855 තීරුවේ සඳහන් වෙනවා.

දිවංගත ආචාර්ය කමල් කරුණානායක මහතා එහි මෙසේ කියනවා:

"මම හිතන්නෙ මේ පිළිබඳව විවාදයක් නැහැ කියලයි ඇමතිතුමනි."

ඊට පිළිතුරු වශයෙන් ගරු ලලිත් ඇතුලත් මුදලි මහතා අධ්‍යාපනයට වෙන් කළ මුදල ගැන මෙසේ කියනවා:

"හොඳයි, මම කියන්නම් සංඛ්‍යාලේඛන.

1960 දී 4.26යි, 1963 දී 4.41යි, 1965 දී 4.54යි, 1968 දී 3.74යි, 1971දී 4.27යි. 1974 දී 2.64යි,

1977 දී 2.62යි, 1980 දී 2.75යි, 1983 දී 2.43යි, 1986 දී 2.86යි, 1988 දී 2.58යි, 1989 දී 2.96යි, 1991 දී 2.99යි. දැන් යාන්තම් තුන ළඟට ඇවිල්ලා තිබෙනවා. ඒක නිසා අපට පෙනෙනවා නොයෙක් ආණ්ඩු යටතේ ඒක වැඩිවෙලා තිබෙනවා, අඩුවෙලත් තිබෙනවා. ඒක නිසා මේ ආණ්ඩුව මේක කළා කියා නිකම් ප්‍රයෝජනයක් නැති කතාවල අපි දැන් යෙදෙන්නට ඕනෑ නැහැ. අපි ඔක්කොම එකතු වෙලා මේක තව ටිකක් වැඩි කර ගන්නට උත්සාහ ගනිමු."

මෙලෙස ගරු ලලිත් ඇතුලත් මුදලි මහතා බුද්ධිමතෙක් ලෙස, වියතෙක් ලෙස, ජාත්‍යන්තරව පිළිගත් විද්වතෙක් ලෙස, මහපොළ නිර්මාතෘ ලෙස 1990 දෙසැම්බර් 06වෙනි දා මේ ගරු සභාවේදී ලංකාවේ විශ්වවිද්‍යාලවල විද්වතුන්ටත් ඉගෙන ගන්න - මහපොළවේ පැළ වෙන්නේ නැති යථාර්ථයක් නොවන සටන්පාඨ ඉදිරිපත් කරන්න එපාය කියන එක පිළිබඳව - එතුමා පැහැදිලි ප්‍රකාශයක් කරලා තිබෙනවා.

මුදල් අමාත්‍යවරයා ගිය වර්ෂයේදී තමුන්නාන්සේයි, අගමැතිතුමායි, ජනාධිපතිතුමායි, පාර්ලිමේන්තුවයි, ගරු කථානායකතුමායි මේ සියලු දෙනාම රවට්ටලා අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පුම්බලා පෙන්නුවා. කොහොමද පිම්බුවේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අය වැය ඇස්තමේන්තුව (කෙටුම්පත) 2016 ලේඛනයේ 2වන වෙළුමෙහි අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් සඳහන්ව ඇති 217 වෙනි පිටුව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ ලේඛනය ලංකාවේ ව්‍යවස්ථාදායකයට ඉතා වැදගත් වනවා. 2016 අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය, සේවා යටතේ, රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යාමේ පිරිවැය ඉඩම් හා ගොඩනැඟිලි සඳහා වෙන් කරන ලද මුදල - පුනරාවර්තන වියදම- රුපියල් මිලියන 121,352,000යි.

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහවැලි ගඟ උතුරට හරවන්න ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට වැය වුණේ රුපියල් කෝටි 5,000යි. මේ මුදල රුපියල් කෝටි 12,100ක්! මහවැලි ගඟ උතුරට හරවන්න වැය කළ මුදලට වඩා දෙගුණයකටත් වඩා වැඩිමුදලක් අධ්‍යාපන අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම කියලා අච්චු ගහලා මේ ගරු සභාවට පිළිගැන්නුවා. මේ මන්ත්‍රීවරු 225ම බබ්බු කියලා හිතලා මෙය ඉදිරිපත් කළා.

මම මේ කාරණය ඉතා පැහැදිලිව ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කිව්වා. ඒකාබද්ධ විපක්ෂයේ නායකතුමා වන ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, මම සහ මන්ත්‍රී කණ්ඩායම ගරු කථානායක කරු ජයසූරිය මැතිතුමාගේ කාමරයට ගියා. ගිහිල්ලා, පැමිණිල්ලක් කළා. මුදල් පිළිබඳ සම්පූර්ණ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට ඒ නිසා මෙහෙම බොරුවක් කරන්න එපා, මේ අධ්‍යාපන ඇමතිවරයාට පසු දවසක උත්තර දෙන්න බැරි වෙනවා, කරන්නේ නැති වියදමක් තමයි මේ ව්‍යාජයක් ලෙස දක්වා තිබෙන්නේ කියලා කිව්වා. ගරු කථානායකතුමා විභාගයක් සඳහා කැඳෙව්වා. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ගියා, මම ගියා, ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා ගියා, රවි කරුණානායක මුදල් ඇමතිවරයා ආවා, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආවා, මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් ආවා. මම මේ කාරණය පෙන්වා දුන්නාම එතුමා කිව්වා, "මේක අලුත් accounting system එකක්, මේ ක්‍රමයට ලංකාවේ සියලුම පාසල්වල වත්කම් ගණනය කරනවා, සෞඛ්‍ය අමාත්‍යාංශයෙත් කරනවා, අපි අමාත්‍යාංශ දෙකකින් පටන් ගත්තේ, ඒ අධ්‍යාපනය හා සෞඛ්‍ය, අනික් ඒවාට ඊළඟ අවුරුද්දේ එනවා. මට පුදුමයි, බන්දුල ගුණවර්ධන වාගේ කෙනෙකුටත් මේක තේරෙන්නේ නැති එක" කියලා. එතුමා අපි බබාලාට අන්දලා අපට තේරෙන්නේ නැහැ කිව්වා. රුපියල් බිලියන 121ක්! විපක්ෂයට මේ පිළිබඳව ඇත්ත වුවමනාවක් තිබුණා නම් අය වැය ලේඛනය සම්මත කරන එක එදා නිවැරදි කරන්න තිබුණා. නමුත් කරන්න බැරි වුණා.

මෙන්න බලන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම ලේඛනයේ සඳහන් වන අන්දම:

රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යාමේ පිරිවැය - ඉඩම් හා ගොඩනැඟිලි 2016 රුපියල් බිලියන 121.3යි. 2017 පුරෝකථනය රුපියල් බිලියන 121.3යි. 2018 පුරෝකථනය රුපියල් බිලියන 121.3යි. 2015-2018 එකතුව රුපියල් බිලියන 364යි. මුද්‍රණය කරලා මේ ගරු සභාවට පිළිගන්වපු එක. හරි නම් මේකට තේරීම් කාරක සභාවක් දාන්න ඕනෑ.

මෙන්න බලන්න, මෙවර ඇස්තමේන්තුව. මෙවර 2017 අය වැය ඇස්තමේන්තුවේ රාජ්‍ය ආයෝජන වියදම් පවත්වාගෙන යාමේ පිරිවැය - ඉඩම් හා ගොඩනැඟිලි සඳහා 2016දී රුපියල් බිලියන 121.3යි; 2017 ශතයක්වත් නැහැ; 2018 ශතයක්වත් නැහ; 2019 ශතයක්වත් නැහැ. 2016-2019 එකතුව රුපියල් බිලියන 121.3යි කියලා කියනවා. මේ අච්චු ගහලා පාර්ලිමේන්තුවට කියන බොරු. මමත් 1989 සිට මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට මේ පාර්ලිමේන්තුවේ හිටපු කිසිම මුදල් ඇමතිවරයෙක් පාර්ලිමේන්තුව මෙලෙසින් නොමඟ යවලා නැහැ.

අවාසනාවට මේ කරුමෙට කර දුන්නේ, අධ්‍යාපන ඇමතිතුමා. එදා අධ්‍යාපන ඇමතිතුමා, ජනාධිපතිතුමා ඇතුළු සියලුදෙනාම කිව්වා, "ලංකා ඉතිහාසයේ වැඩිම මුදලක් අධ්‍යාපනයට වෙන් කළේ, 2015 වර්ෂයේ"යි කියලා. මේ කාරණය කිව්වාට පස්සේ, රුපියල් බිලියන 250ක් වෙන් කළා. ඇත්තටම මොකක්ද වුණේ? ඇත්ත කථාව මා කියන්නම්.

2014 අධ්‍යාපන අමාත්‍යාංශයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම සියයට 43.5යි. අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ වියදම සියයට 8.3යි. එකතුව සියයට 51.8යි. එතකොට 2014 සමස්ත අධ්‍යාපනයේ වියදම රුපියල් බිලියන 52යි. 2015 මොකද වුණේ? අධ්‍යාපන අමාත්‍යාංශයේ වියදම සියයට 47.6යි. අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ වියදම සියයට 7.8යි. එකතුව සියයට 55.4යි. 2014ට වඩා 2015දී සත්‍ය වශයෙන් අධ්‍යාපනයට වියදම වැඩි වෙලා තිබෙන්නේ, රුපියල් බිලියන 3.6යි. රුපියල් බිලියන 3.6 වැඩි වුණු ආකාරය පිළිබඳව දැක්වෙන රාජ්‍ය අය වැය දෙපාර්තමේන්තුවේ සියලු සංඛ්‍යා දත්ත සටහන් මා ගෙනැවිත් තිබෙනවා.

2015දී අධ්‍යාපනය වෙනුවෙන් ඇත්තටම කරපු වියදම කීයද කියා දැන ගන්න රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවෙන්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ ලේකම් වෙත එවන ලද ලිපිය ගරු සභාවේ දැන ගැනීම සඳහා මා **සභාගත*** කරනවා.

රුපියල් බිලියන 3.6කින් වියදම වැඩි වුණේ ඇයි? රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළා. තුන්ලක්ෂයකට ආසන්න ගුරුවරු පිරිසක් රටේ ඉන්නවා. ඔවුන්ගේ වැටුප් වැඩිවීම තමයි වියදම. ඒ නිසා 2015 වර්ෂයේදී අධ්‍යාපනයට කරන ප්‍රාග්ධන වියදම අඩු වුණා. ප්‍රාග්ධන වියදම අඩු වීම පිළිබඳ ප්‍රස්තාර සටහන අය වැය ඇස්තමේන්තුවේ වෙනම මුද්‍රණය කර තිබෙනවා. මා ඒ ප්‍රස්තාර සටහන **සභාගත*** කරනවා.

එහි අමාත්‍යාංශයේ අපේක්ෂිත ප්‍රතිඵලය යටතේ, ගුණාත්මක අධ්‍යාපනයක් උදෙසා පාසල් විෂය නිර්දේශය තුළින් ගුණගරුකභාවය පෞරුෂත්වය හා යහ පැවැත්ම යනාදියෙන් පරිපූර්ණ මානව සම්පත් බිහි කිරීම කියා විස්තර කරලා තිබෙනවා. ඊට පස්සේ සම්පත් වෙන් කිරීම යටතේ ප්‍රාග්ධන වියදම් බෙදෙන ආකාරය දක්වා තිබෙනවා. ඊට අමතරව පුනරාවර්තන වියදම සහ ප්‍රාග්ධන වියදම දක්වා තිබෙනවා. ප්‍රාග්ධන වියදම රතු පාටින් දක්වා තිබෙනවා. 2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේ ප්‍රාග්ධන වියදම අඩු වුණු හැටි 2017 වර්ෂයේ අය වැය ඇස්තමේන්තුව 2 වන වෙළුම පොතේ 216වන පිටුවේ බොහොම පැහැදිලිව දක්වා තිබෙනවා. එතකොට අපි එක නිගමනයකට එනවා, 2014 වර්ෂයේ අධ්‍යාපනයේ වියදම අනුව බලන විට 2015 වර්ෂයේ අධ්‍යාපනයට දරන වියදම කපා හැරුණාය; මුදල් ඇමතිවරයා විසින් වියදම කපා හැරියාය කියලා. ඒ සඳහා අදාළ ප්‍රස්තාර සටහන මා **සභාගත*** කරනවා.

ඊළඟට, 2016 වර්ෂයට එනවා. පසු ගිය අවුරුද්දේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය රුපියල් බිලියන 250යි. මෙවර විසර්ජන පනත් කෙටුම්පතෙන් රුපියල් බිලියන 175ක් කැපුවා. රුපියල් බිලියන 175ක් කියන්නේ, රුපියල් කෝටි 17,500ක්. අන්න දැන් බොරුව පුපුරලා ගියා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අය වැය යෝජනා ටික මා වෙනම ඉල්លුවා. ඒ යෝජනා ටික මේ වතාවේත් දැම්මා. ඒ යෝජනා මෙසේයි:

Ministry of Education - Budget Proposal No. 306 - Capacity building of teacher educators and administrators in education sector through NIE සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 1,000යි. නමුත් වියදම් කර තිබෙන්නේ - actual expenditure - රුපියල් මිලියන 35යි. Progress එක සියයට 30යි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

Ministry of Education - Budget Proposal No. 307 - Infrastructure for rural and regional schools - Teacher quarters, teacher rest rooms et cetera සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 2,000යි. Progress එක සියයට 15යි.

Ministry of Education - Budget Proposal No. 308 - Sanitary and water facilities in all schools සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 4,000යි. නමුත් වියදම් කර තිබෙන්නේ, රුපියල් මිලියන 717යි. Progress එක සියයට 30යි.

Ministry of Education - Budget Proposal No. 309 - Electricity for all schools සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 2,000යි. නමුත් වියදම් කර තිබෙන්නේ, රුපියල් මිලියන 520යි. Progress එක සියයට 20යි.

Ministry of Education - Budget Proposal No. 310 - Develop basic facilities of 3,577 primary schools within the medium-term budgetary framework 2016-2018 සඳහා වෙන් කර තිබෙන්නේ, රුපියල් මිලියන 10,000යි. නමුත් වියදම් කර තිබෙන්නේ, රුපියල් මිලියන 798යි. ප්‍රගතිය සියයට 20යි.

Ministry of Education - Budget Proposal No. 311 - Facilities to 1000 secondary schools සඳහා වෙන් කර තිබෙන්නේ, රුපියල් මිලියන 15,000යි. නමුත් වියදම් කර තිබෙන්නේ, සියයට 10යි.

Ministry of Education - Budget Proposal No. 312 - Improve facilities of 1,360 schools . වෙන් කර තිබෙන්නේ, රුපියල් මිලියන 30,000යි. නමුත් වියදම් කර තිබෙන්නේ, රුපියල් මිලියන 1,725යි. Progress එක සියයට 10යි.

ගිය අවුරුද්දේ අය වැය යෝජනා අංක 313 - Upgrade plantation schools to secondary level - සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කරලා තිබෙනවා. නමුත් වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 41යි.

ඊළඟට, අය වැය යෝජනා අංක 314 - Provision of mobile science kits to 3,000 schools which have no permanent labs - සඳහා කිසිම මුදලක් වියදම් කරලා නැහැ. නමුත් රුපියල් මිලියන 450ක් වෙන්කරලා තිබෙනවා.

අය වැය යෝජනා අංක 315 - Dental health facilities in schools - සඳහා රුපියල් මිලියන 250ක් වෙන්කර තිබෙනවා. Progress එක සියයට 4.8යි. මේ, කාරක සභාවට ලබාදුන් වාර්තාව. සම්පූර්ණ වාර්තාවක් වශයෙන් මා මෙය,-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Yes, Hon. Minister?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අධ්‍යාපන අමාත්‍යවරයකු වශයෙන් කටයුතු කර තිබෙන නිසා ඔබතුමා දන්නවා, ඔබතුමාගේ කාලයේ ප්‍රාග්ධන වියදම් වශයෙන් රුපියල් බිලියන 17යි වෙන්කරලා තිබුණේ කියලා. අපි ප්‍රාග්ධන වියදම් වශයෙන් රුපියල් බිලියන 63කට එහා වියදම් කළා. ඒ වාගේම පාසල් හත්දහස් ගණනක් පුරා හැම තැනකටම විශාල ව්‍යාපෘති ගෙන ගියා. කොටින්ම කියනවා නම්, පළාත් සභාව හරහාවත් කර ගන්න අපට තිබුණු යන්ත්‍රණය ප්‍රමාණවත් නැහැ. දැන් ඔබතුමා කිව්වා, පාසල්වලට විදුලිය ලබාදීම සම්බන්ධයෙන්. මේ වන විට මේ රටේ පාසල්වලින් සියයට 95කටම විදුලිය දීලා අවසන් කරලා තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, this is very unfair. ඇමතිතුමාට එතුමාගේ කථාවේදී,-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කාරක සභා අවස්ථාව නිසායි, මා ඔබතුමාට පැහැදිලි කිරීමක් කළේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
කාරක සභා අවස්ථාව නිසායි, මමත් කියන්නේ. මුදල් පිළිබඳ කාරක සභාවේදී අප විසින් ප්‍රශ්න කරලා මුදල් අමාත්‍යාංශයෙන් ගෙන්වාගත්, මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලද දත්ත පිළිබඳව ඔබතුමා ඉතා දැඩි අවධානයක් යොමු කර බලලා, මුදල් අමාත්‍යාංශය ඔබතුමාට මොකක්ද කරලා තිබෙන්නේ කියන එක තේරුම් ගන්න කියලායි මා මේ කියන්නේ. ඔබතුමාට දෝෂයක් කියනවා නොවෙයි. මා මුදල් අමාත්‍යාංශය ගැන දන්නවා.

ඒ විතරක් නොවෙයි, මෙවර මොකක්ද කරලා තිබෙන්නේ? මෙවර මුදල් වෙන් කරන කොට තමුන්නාන්සේලා අත්පුඩි ගැහුවා. ප්‍රාථමික පාසල් 3,577ක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 10,000යි. නමුත් අය වැය ඇස්තමේන්තු පොතේ සඳහන් වෙලා තිබෙනවා, පාසල් 500ක් සඳහා 2017 ප්‍රතිපාදන රුපියල් මිලියන 6,500යි කියලා. ප්‍රාථමික පාසල් 3,577ක් කියලා ඔබතුමා හිතාගෙන හිටියාට, 2017 වර්ෂයේදී ඔබතුමාට මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙන්නේ පාසල් 500ක් සඳහා පමණයි. ඒක අච්චු ගහලා පාර්ලිමේන්තුවට දීලා තිබෙනවා.

ඊළඟට, අධ්‍යාපන අංශයේ සංවර්ධන වැඩසටහන සඳහා මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 6,275යි. 2017 වර්ෂයේ ප්‍රතිපාදන වශයෙන් ඔබතුමාට ලබාදෙන්නේ රුපියල් මිලියන 2,000යි. පාසල් 50ක් සඳහා පමණයි ඒ මුදල් ලබාදෙන්නේ. ද්විතීයික පාසල් 1,000ක් සංවර්ධනය කරනවාය කියලා කිව්වා. ඒ සඳහා මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 15,000යි. නමුත් 2017 වර්ෂයේදී ලබාදෙන්නේ රුපියල් මිලියන 7,170යි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, you have five more minutes.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යාපනය ප්‍රදේශය ගැනත් කියන නිසා මට ඔබතුමා ගානේ තව පොඩි වෙලාවක් දෙන්න.

2017 වර්ෂයේ ද්විතීයික පාසල් සංවර්ධනය කිරීමේ ඉලක්කය පාසල් 250යි. මෑත කාලීන ව්‍යාපෘතිවලට ඇතුළත් නොවූ පාසල් 1,360ක පහසුකම් දියුණු කිරීම සඳහා මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 30,000යි. නමුත් පාසල් 200ක් සඳහා 2017 වර්ෂයේ ප්‍රතිපාදන වශයෙන් ලබා දෙන්නේ රුපියල් මිලියන 9,980යි. මා මෙම ලේඛනය **සභාගත*** කරනවා. මෙය තිබෙන්නේ, 2017 අයවැය ඇස්තමේන්තුව 2 වන වෙළුම පොතේ 216වන පිටුවේයි.

මුදල් අමාත්‍යාංශයේ හිටපු කෙනෙක් ලෙස අත් දැකීමෙන් සහ පළපුරුද්දෙන් මා දන්නවා, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා අය වැය යෝජනා කියවනවා මිසක්, කිසිම මන්ත්‍රීවරයෙක් අය වැය ඇස්තමේන්තුව ඇතුළේ තිබෙන වැය ශීර්ෂ පිළිබඳව එකින් එක සොයන්නේ නැහැයි කියලා. ඒ නිසා අය වැය සම්මත කිරීම සඳහා අය වැය යෝජනා ටික පමණක් කියවලා, අය වැය ඇස්තමේන්තුව ඇතුළේ තාක්ෂණික සටහන්වල විස්තර සඳහන් කරනවා. ඒ නිසා ඇමතිතුමාත් අමාරුවේ, අමාත්‍යාංශයේ නිලධාරිනුත් අමාරුවේ. මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් මේ මුදල් වෙන් කරන ආකාරය හා වියදම් කරන ආකාරය පිළිබඳව පාර්ලිමේන්තුවට වැරැදි ඉලක්කම් සැපයීම සම්බන්ධයෙන් සොයා බලන්න විශේෂ කාරක සභාවක් පත් කරන්නය කියලා මා ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, මා මේ කාරණයත් සඳහන් කරනවා. 2014 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ මොකක්ද කිව්වේ? එහි මේ විධියට සඳහන් වෙනවා.

"අධ්‍යාපන සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වසර තුළ දී අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සවිමත් කරන ලදී. 'අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන' ආරම්භ කෙරුණි. 2013 වසරේ දී විශේෂ පාර්ලිමේන්තු කමිටුවක් විසින් 'නව අධ්‍යාපන ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ යෝජනා' නම් වූ වාර්තාවක් සකස් කිරීමෙන් අනතුරුව, ශ්‍රම වෙළෙඳ පොළේ අවශ්‍යතාවන්වලට ගැළපෙන අධ්‍යාපනයක් ලබා දීමේ අරමුණින් විස්තීර්ණ අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන්ගෙන් සැදුම්ලත් නිල කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී.

මේ අතර අධ්‍යයන කටයුතුවල අන්තර්ගතය, පෘථුල බව, කාල ප්‍රමාණය හා දැඩි බව සුදුසු මට්ටමක පවතින බව සහතික කිරීමට සහ එක් එක් මට්ටම්වලදී අවශ්‍ය වන අවම දැනුම හිමි වන බව සහතික කිරීමට මෙන්ම ප්‍රතිඵල පාදක කරගත් අධ්‍යාපනය හා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම දිරි ගැන්වීම සඳහා 2012 වසරේදී ප්‍රකාශයට පත් කළ, 'ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව' එහි කෙටුම්පත්, ප්‍රමිති හා ක්‍රියාවලි ඇතුළත් කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් අඛණ්ඩව සමාලෝචනය කරන ලදී."

මේ ඉවර කරපු කටයුත්තක්. ඒ කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා; කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා ආණ්ඩු වෙනස් වෙනකොට වෙනස් වෙන්නේ නැති ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති මෙයට අදාළව සකස් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, මේ විධියට සඳහන් වනවා :

"විශේෂයෙන්ම, අලුතින් හඳුන්වා දුන් තාක්ෂණවේදය විෂය ධාරාව සම්බන්ධයෙන් ඇති වූ ගුරු අවශ්‍යතාවට පිළියමක් ලෙස 2014 වසරේදී රජය විසින් ගුරුවරුන් 5,441ක් බඳවා ගන්නා ලදී."

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ වාගේම, "ඒ අනුව ද්විතීයික පාසල් දහසක් සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ පාසල් 948ක තාක්ෂණික විද්‍යාගාර ඉදි කරන ලදී. අ.පො.ස උසස් පෙළ සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව ඉගැන්වීම සිදු කරන පාසල් නවයක මහින්දෝදය තාක්ෂණික පීඨ ඉදි කිරීමේ කටයුතු අවසන් කළ අතර, 2014 වසර අවසානය වන විට තවත් පීඨ 242ක් ඉදි කෙරෙමින් පැවතුණි. උතුරු පළාතේ ද්විතීයික පාසල් 100ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, පාසල් 17ක කටයුතු නිම කෙරිණි." යනුවෙන් ද සඳහන් වෙනවා.

මහ බැංකු වාර්තාවේ අධ්‍යාපනය පිළිබ සඳහන් කොටස ඇතුළත් පිටුව මගේ කථාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

තමුන්නාන්සේලා බලයට පැමිණි පසු, මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමින් මුදල් අමාත්‍යවරයා කියා තිබෙන්නේ මෙහෙමයි :

"නිල ඇඳුම් සඳහා වවුචර්පත් ලබා දීමේ ක්‍රමවේදය 2015 වසරේ සිට ආරම්භ කළ අතර, ඒ වෙනුවෙන් රුපියල් මිලියන 2,260ක් වියදම් කර ඇත. මෙය 2014 වසරේ දරන ලද රුපියල් මිලියන 3,574 හා සැසඳීමේදී රුපියල් මිලියන 1,134ක සැලකිය යුතු ඉතිරියක් වේ.

සම්පත් බෙදී යෑමේ විෂමතාව අවම කිරීමට හා අධ්‍යාපනය සඳහා සම අවස්ථා ලබා දීම තහවුරු කිරීමට 2012 වසරේදී ද්විතීයික පාසල් 1,000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. ඒ අනුව, 2015 වසර තුළ තාක්ෂණික විද්‍යාගාර 46ක ඉදිකිරීම් අවසන් කර ඇති අතර, විද්‍යාගාර 12ක ඉදිකිරීම් වැඩ කටයුතු සියයට 75ක් පමණ අවසන් කර, මුළු එකතුව 982ක් වූ විද්‍යාගාර ප්‍රමාණයක වැඩ නිම කර ඇත.

2013 වසරේ සිට අ.පො.ස. උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව යටතේ අධ්‍යාපනය හැදෑරූ ශිෂ්‍යයින් ප්‍රථම වරට -ලංකා ඉතිහාසයේ- 2015 වසරේ අගෝස්තු මාසයේදී විභාගයට පෙනී සිටීමෙන් අධ්‍යාපන අංශයේ විප්ලවීය සන්ධිස්ථානයක් අත්කර ගෙන ඇත."

මුදල් ඇමතිතුමා මෙහෙම කියන්නේ, මුදල් අමාත්‍යාංශය මඟින් 2015 වර්ෂයට අදාළව නිකුත් කළ වාර්ෂික වාර්තාවේ. ඒ වාර්තාවේ තව දුරටත් මෙහෙම කියනවා :

"ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාව යටතේ හා ජෛව පද්ධති තාක්ෂණ විෂය ධාරාව යටතේ පිළිවෙළින් අයදුම්කරුවන් 7,882ක් හා 4,815ක් අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි අතර, ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාව යටතේ සියයට 50ක් වූ අයදුම්කරුවන් සංඛ්‍යාවක් හා ජීව පද්ධති තාක්ෂණ විෂය ධාරාව යටතේ සියයට 60ක් වූ අයදුම්කරුවන් සංඛ්‍යාවක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇත. සමස්තයක් ලෙස අ.පො.ස උ.පෙළ විභාගය සඳහා පෙනී සිටි 255,191ක් වූ මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් සියයට 61ක් 2016 වසරේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇත."

මම මේ කොටස ඇතුළත් පිටුවත් **සභාගත*** කරනවා. ඒ අනුව අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ විශ්වවිද්‍යාලවලට -

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
බොහොම ස්තුතියි.

අපි තාක්ෂණ විෂය ධාරාව සඳහා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයෙන් මසකට රුපියල් 10,000ක් දීලා ගුරුවරුන් ලබා ගත්තා. අද ඒ වැඩසටහන නතර වෙලා තිබෙනවා. වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර එය නැවත ආරම්භ කළ යුතු වනවා. මොකද, අද මේ අංශයෙන් නව නිපැයුම්කරුවන් බිහි වෙන නිසා. ඊයේ පෙරේදා මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ දරුවෙක් ලෝකයේ දරුවන් අතරින් වඩාම විශිෂ්ට නිර්මාණය කළ දරුවාට හිමි රන් පදක්කම ඉන්දුනීසියාවේදී ලබා ගත්තා. ඔහු ලංකාවට ඒ රන් පදක්කම ගෙනාවා. අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් ඔබතුමා මෙවැනි දරුවන්ගේ දක්ෂතා, කුසලතා අගයන්න, ඔවුන්ව දිරි ගන්වන්න, එයින් රටට ආදර්ශයක් දෙන්න කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු දේ කරන්න අපි කටයුතු කරනවා. විශේෂ නිපැයුම් කරන, විශේෂ සොයා ගැනීම් කරන ළමයින් 1,000කට "සුහග" ශිෂ්‍යත්ව වැඩසටහන මඟින් ශිෂ්‍යත්ව ප්‍රදානයක් ලබා දීමට කටයුතු කරනවා. ඒ අනුව, ලබන වසරේ සිට එවැනි හැකියා ඇති හයවන වසරින් ඉහළ ශිෂ්‍යයන් සඳහා එක් ශිෂ්‍යයෙකුට මසකට රුපියල් 2,500 බැගින් වන ශිෂ්‍යත්ව මුදලක් ලබා දීමට අපි මුදල් ප්‍රතිපාදන අනුමත කර ගත්තා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳයි, හොඳයි. එහෙම කරන්න. ඊළඟට, මම ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ වාර්තාවක් **සභාගත*** කරනවා.

අපි තාක්ෂණ විෂය ධාරාව ආරම්භ කළා. මම කොරියාවට ගිහිල්ලා, කොරියාවේ අධ්‍යාපන ඇමතිතුමා හමු වෙලා, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් හමු වෙලා, "කොයිකා" ආයතනයත් එක්ක සාකච්ඡා කරලා හෝමාගම ප්‍රදේශයේ තාක්ෂණ විද්‍යා පීඨය ඉදි කරන්න කිව්වා. ඒ ප්‍රදේශයේ තමයි නැනෝ තාක්ෂණික විශ්වවිද්‍යාලය තිබෙන්නේ. ඒ ප්‍රදේශයේ තමයි මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය තිබෙන්නේ. එතැන තමයි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම තව විනාඩියකින් කථාව අවසන් කරනවා.

ඒ සියල්ල තිබෙන ස්ථානයේ මේ තාක්ෂණ පීඨයත් ඉදිකරන්න කියපු එකට අදාළ ලිපි ලේඛන -තාක්ෂණ පීඨය පිළිබඳව කොරියාව සමඟ සාකච්ඡා කරපු ලේඛන- සියල්ල මා **සභාගත*** කරනවා.

ඊට අතිරේකව මම ගරු ඇමතිතුමාගේ දැනගැනීම පිණිස කියනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියලා, 1961 අධ්‍යාපන උපකෘත පාඨශාලා පනතේ 27වැනි වගන්තිය ඉවත් කිරීම සඳහා තමුන්නාන්සේ නොදැනුවත්වම නිලධාරින් පිරිසක් විසින් මහා පරිමාණ වැඩ පිළිවෙළක් ගෙන යන බව. ඒක කළොත්, ඒක අධ්‍යාපන ධවල පත්‍රිකාවට සමාන වෙනවා. අධ්‍යාපන ධවල පත්‍රිකාව හුඟ දෙනෙක් ළඟ නැති නිසා මම අධ්‍යාපන ධවල පත්‍රිකාවත් **සභාගත*** කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. Member, please wind up now.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ නිසා, නිදහස් අධ්‍යාපනය සුරක්ෂිත කිරීම සඳහා ඒ පනතේ 27වැනි වගන්තිය ඉවත් කරන්න ඔබතුමා එකඟ වෙන්න එපා කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Thank you very much. The next speaker is the Hon. Palitha Tewarapperuma. You have six minutes.

[අ.භා. 12.01]

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித தெவரப்பெரும - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන මේ වෙලාවේ, අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මට ලබාදී තිබෙන කාලය ඉතාම සීමිතයි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සංස්කෘතික අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න බොහෝ දේවල් තිබෙනවා. මොකද, සංස්කෘතිය කියන එක අපේ ජීවිතයට බැඳුණු දෙයක් නිසා. නමුත් මට වෙනත් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම දේශපාලනය පටන් ගත්තේ 2002 වර්ෂයේදී. මේ යහ පාලන ආණ්ඩුව යටතේ මම සංස්කෘතික අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා විධියට වැඩ භාර ගත් දවසේ, විපක්ෂයේ එක්තරා මන්ත්‍රීවරයෙක් මා ගැන ප්‍රකාශයක් කරලා තිබුණා. ඒ මන්ත්‍රීවරයා කියලා තිබුණා, "තමුන්ගේ සංස්කෘතියවත් හදා ගන්න බැරි අයෙකුට තමයි සංස්කෘතික අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිකම ලබා දුන්නේ" කියලා.

මේ ප්‍රකාශය කරපු අය 1988-89 භීෂණ කාලයේ එක්සත් ජාතික පක්ෂයෙන් දේශපාලනය කරපු වරදට අපේ එක්සත් ජාතික පක්ෂයේ 11,000ක් මරලා දැම්මා. ඒ දේවල් කළේ මගේ සංස්කෘතිය ගැන කථා කරන අයයි. මගේ දිස්ත්‍රික්කයේ හිටපු මහා ගුණවත්, නැණවත් ස්වාමීන් වහන්සේ නමක් තමයි පොහොද්දරමුල්ලේ හාමුදුරුවෝ. උන්වහන්සේ ලෙඩ වෙලා ලණු ඇඳේ සිටියදී බඩට වෙඩි තියලා මරලා දැම්මා. එතුමන්ලා එහෙම තමයි සංස්කෘතිය ආරක්ෂා කළේ. ඒ වාගේම, විජය කුමාරණතුංග කියන මේ රටේ හිටපු මහා කලාකරුවා දේශපාලනය කරන අතරේදී මරා දමපු හැටි අපි දැක්කා. ඒ වාගේම, අපේ රටේ ඉතා අහිංසක විධියට ජීවත් වෙන වතු ජනතාව සේවය කරපු වටිනා කර්මාන්තශාලා විනාශ කළා.

මොහොම්මදි වතුයාය කියලා කර්මාන්තශාලාවක් අපේ දිස්ත්‍රික්කයේ තිබුණා. ඒ කර්මාන්තශාලාවේ මිල නියම කරන්න බැහැ. ඒ කර්මාන්තශාලාව ඇතුළු මේ රටේ තිබුණු මහා විශාල කර්මාන්තශාලා ගිනි තියලා, අද වන විට ඒ වතුවල ජනතාවගේ ආර්ථිකය එහෙම පිටින්ම බිමට ඇදලා දැම්මේ අපේ සංස්කෘතිය ගැන කථා කරපු ඒ විරුද්ධ පක්ෂයේ අය. ප්‍රවාහන ව්‍යාපාරයට අත් වුණේත් ඒ තත්ත්වයමයි. අද වන විට ප්‍රවාහන ව්‍යාපාරය උස්සන්න බැරි තත්ත්වයකට වැටිලා තිබෙන්නේ, 1988-89 භීෂණ කාලයේ මේ රටේ දහස් ගණන් බස් රථ මහ පාරවල්වල ගිනි තියලා දමපු ප්‍රතිඵලයක් විධියටයි. ඒවායේ ප්‍රතිඵල තමයි අද අපි භුක්ති විඳින්නේ. ඒ වාගේම, පාසල් ගිනි තියලා දැම්මා.

මාතර ප්‍රදේශයේ එක්තරා පොලිස් නිලධාරියෙක් තමුන්ගේ රාජකාරිය අවසන් කරලා ගෙදර එන වෙලාවේ, මේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කරපු වරදට, වෙලක් මැද්දේදී වෙඩි තියලා මරලා, ඒ නිලධාරියාගේ කලවා කපලා ඔහුගේ අම්මටයි, තාත්තටයි කන්න දීපු අය තමයි අද මගේ සංස්කෘතිය ගැන කථා කරන්නේ. ඒ ගැන මම දන්නවා. මම හිතනවා, තමුන්නාන්සේලාත් දන්නවා ඇති කියලා. ඒ අම්මයි, තාත්තයි මානසික ලෙඩ්ඩු බවට පත් වෙලා මැරිලා ගියා. එදා එහෙම යුගයක් තමයි තිබුණේ. ඒ කාලයේ උසාවි ගිනි තියලා දැම්මා; ට්‍රාන්ස්ෆෝමර්වලට ගිනි තිබ්බා. මේ රටේ ආර්ථිකය එහෙම් පිටින්ම විනාශ කරලා දාපු අය තමයි මගේ සංස්කෘතිය ගැන කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේකට උත්තරයක් දෙන්න ඕනෑ. මම දේශපාලනය පටන් ගත්තේ, 2002 වර්ෂයේදී මතුගම ප්‍රාදේශීය සභාවෙන්. ප්‍රාදේශීය සභාවෙන් කියලා මම ඇල්වතුර වීදුරුවක්වත් බීපු පුද්ගලයෙක් නොවෙයි. මම අවුරුදු දෙකක් ප්‍රාදේශීය සභාවේ සේවය කළා. මතුගම ප්‍රාදේශීය සභාවට විතරක් නොවෙයි, කළුතර දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය සභාවලට විශාල සේවයක් කරලා, ඊට අවුරුදු දෙකකට පස්සේ කළුතර දිස්ත්‍රික්කයෙන් දෙවැනි ස්ථානය ලබා ගෙන පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට පත් වුණා. එතැනිනුත් මම දේශපාලන වශයෙන් කිසි දෙයක් ගත්ත පුද්ගලයෙක් නොවෙයි.

තමුන්නාන්සේ දන්නවා, මා පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට සිටි කාලයේ අපේ දිස්ත්‍රික්කයේ හිටපු අපේ පක්ෂයේ නායකයෝ, මානව හිමිකම් ප්‍රබලයෝ වැනි විවිධ අය අපේ පාක්ෂිකයන්ට පස්ස පෙන්නලා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඔඩොක්කුවට ගියා. ඒ වෙලාවේ කළුතර දිස්ත්‍රික්කයේ නායකයා විධියට පක්ෂයෙන් කවුරුවත් නොසිටි වෙලාවක පළාත් සභාවෙන් ඉවත් වෙලා, නැවත ප්‍රාදේශීය සභාවට තරග කරලා එක්සත් ජාතික පක්ෂයේ ගරුත්වය මම ආරක්ෂා කළා.

අපේ ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමා පොදු අපේක්ෂකයා විධියට ඉදිරිපත් වුණු වෙලාවේ සිදු වුණු සිද්ධියක් නිසා පැමිණිලිකාරයා වුණු මාව දින 400ක් සිරගත කළා. ඒ දින 400 ඇතුළත මම සිරගේ තුළ ඉඳගෙනයි පාර්ලිමේන්තු මැතිවරණයට තරග කළේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම මේ රටේ සංස්කෘතිය ආරක්ෂා කළ නිසා; එවැන්නකට ඉදිරිපත් වුණු නිසා; පරිසරය ආරක්ෂා කළ නිසා; මිනිස්සුන්ගේ මහ ජන පීඩාව වෙනුවෙන් ඉදිරිපත් වුණු නිසා තමයි පසු ගිය පාර්ලිමේන්තු මැතිවරණයේ දී හිරගෙදර ඉඳලාත් කළුතර දිස්ත්‍රික්කයෙන් පළමුවැනි ස්ථානය ලැබුණේ. මම මුදල් හම්බ කළ පුද්ගලයෙක් නොවෙයි. සත විසිපහක්වත් අතේ නැතිවයි මම දේශපාලනය කළේ. නමුත් මුස්ලිම් ජනතාව වෙනුවෙන්, ද්‍රවිඩ ජනතාව වෙනුවෙන්, සිංහල ජනතාවගේ අයිතීන් වෙනුවෙන් ඉදිරිපත් වුණු නිසා, කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව මා වෙනුවෙන් ඡන්ද එක්ලක්ෂ දහඅටදහසක් ලබා දීලා, එම දිස්ත්‍රික්කයෙන් තුන්වැනියා බවට මාව පත් කළා. එහෙමයි මම දේශපාලනය පටන් ගත්තේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම නියෝජ්‍ය ඇමති ධුරයට පත් වුණාම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman )

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)

අමාත්‍යාංශයෙන් ලබා දුන් ලක්ෂ ගණනක් වටිනා සංග්‍රහ මේසයවත් ගත්තේ නැති පුද්ගලයෙක්, ගරු නියෝජ්‍ය සභාතිතුමනි. ඒ වාගේම, අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් මට ලබා දුන් වාහනයත් කලාකරුවන්ගේ යහපත වෙනුවෙන් වෙන් කළ පුද්ගලයෙක්. මම, මගේ ගෙවලුත් විකුණා ගත් පුද්ගලයෙක්. ඊයේ -පෙරේදා මම චීනයට ගියා. මගේ වියදමින් රුපියල් ලක්ෂයක් සංස්කෘතික අමාත්‍යාංශයේ ක්‍රිකට් කණ්ඩායමට ඉන්දියාවේ සංචාරය සඳහා යන්න ලබා දුන් පුද්ගලයෙක්. මම එවැනි ආකාරයට කටයුතු කරපු පුද්ගලයෙක්. ඒ නිසා, අපේ ඉතිහාසය ගැන නිවැරැදි අවබෝධයක් නැතිව එහෙම කථා කරන එක වැරදියි. තමන් සංස්කෘතියක් ආරක්ෂා කළා නම්, තමන් මේ රටේ සදාචාරයක් ආරක්ෂා කළා නම්, තමන් මේ රටේ ආගමික නායකයෙක් හැටියට කටයුතු කළා නම්, තමන් මේ රටේ මහ ජන දේපොළ ආරක්ෂා කළා නම්, තමන්ට එහෙම කථා කරන්න අයිතියක් තිබෙනවා. එහෙම අයිතියක් නැති අය තමයි අද ඒ විධියට කථා කරන්නේ. ඒ කාලයේ කරපු අපරාධවල ප්‍රතිඵල තමයි අද රටේ ජනතාවට විඳින්න සිදු වෙලා තිබෙන්නේ. අප එහෙම පුද්ගලයන් නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman )

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශය ගැන කථාවක් මා සතුව තිබෙනවා. සංස්කෘතිය වෙනුවෙන් අප කළ ප්‍රගතිය මෙහි තිබෙනවා; අප විසින් කරන ලද ව්‍යාපෘති ගැන විස්තර තිබෙනවා. මම මේ ලේඛන **සභාගත*** කරනවා. සියලු දෙනාටම ස්තුතියි.

[பி.ப. 12.08]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, 2017ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின் குழு நிலை விவாதத்தில் கலந்துகொண்டு கல்வி அமைச்சு, உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு ஆகிய அமைச்சுக்கள் தொடர்பான எனது கருத்துக்களை முன்வைக்க விரும்புகின்றேன்.

நமது நாட்டைப் பொறுத்தவரையில் இலவசக் கல்வியானது எமது நாட்டுக்குப் பெருமை சேர்க்கும் வகையில் அமைந்திருப்பது குறிப்பிடத்தக்கது. எனினும் தற்போது இந்த இலவசக் கல்வியானது வியாபார மயமாக்கப்பட்டுள்ளதாகக் கூறி, கடந்த 20ஆம் திகதி நுவரெலியா, ஹற்றன், நானுஓயா ஆகிய பகுதிகளில் மாணவர்கள் ஆர்ப்பாட்டங்களில் ஈடுபட்டனர். அடுத்த ஆண்டுக்கான கல்வி அமைச்சின் நிதி ஒதுக்கீடானது கடந்த ஆண்டைவிட குறைக்கப்பட்டுள்ள நிலையிலும், தனியார்துறைக் கல்விக்கு இந்த வரவு செலவுத் திட்டத்தில் வழங்கப்பட்டுள்ள சலுகைகளைப் பார்க்கின்ற போது நம் நாட்டில் இலவசக் கல்வியானது இல்லாமலாக் கப்பட்டுவிடுமோ என்ற சந்தேசம் எமது மக்களிடையே ஏற்பட்டுள்ளதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அடுத்ததாக வடக்கு, கிழக்கு மாகாணங்களின் கல்வி நிலையை எடுத்துக்கொண்டால், தற்போதைய நிலையில் அது மிகவும் வீழ்ச்சியடைந்த போக்கினையே காட்டுவதாக பெறுபேற்றுப் பகுப்பாய்வுகள் சுட்டிக்காட்டுகின்றன. குறிப்பாக, 2015ஆம் ஆண்டு கல்விப் பொதுத் தராதர சாதாரண தரப் பரீட்சையில் சித்தியடைந்து உயர்தரம் கற்கத் தகுதிபெற்ற மாணவர்களின் நிலையை வைத்துப் பார்க்கும் பொழுது இந்த நிலைமை தெளிவாகப் புலனாகின்றது. இந்த வகையில் பார்க்கும்பொழுது, 2013ஆம் வருடம் 8 ஆவது இடத்திலிருந்த யாழ். மாவட்டமானது 2014இல் 20ஆவது இடத்துக்கும், 2015இல் 21ஆவது இடத்துக்கும் பின்தள்ளப்பட்டிருக்கின்றது. அதேநேரம் 2014இல் 2ஆவது இடத்திலிருந்த மன்னார் மாவட்டம் 2015ஆம் ஆண்டில் 10ஆவது இடத்துக்கும், 2014இல் 7ஆவது இடத்திலிருந்த வவுனியா மாவட்டம் 2015ஆம் ஆண்டில் 16ஆவது இடத்துக்கும், 2014ஆம் ஆண்டில் 15ஆவது இடத்திலிருந்த மட்டக்களப்பு மாவட்டம் 2015ஆம் ஆண்டில் 17ஆவது இடத்துக்கும், 2014ஆம் ஆண்டில் 21ஆவது இடத்திலிருந்த திருகோணமலை மாவட்டம் 2015இல் 23ஆவது இடத்துக்கும் தள்ளப்பட்டுள்ளது. அம்பாறை, முல்லைத்தீவு, கிளிநொச்சி ஆகிய மாவட்டங்கள் 2015ஆம் ஆண்டில் முறையே 16ஆம், 24ஆம், 25ஆம் இடங்களுக்குத் தேசிய ரீதியில் பின்தள்ளப் பட்டிருந்தமை குறிப்பிடத்தக்கது.

அத்துடன், கிளிநொச்சி மற்றும் முல்லைத்தீவு ஆகிய மாவட்டங்கள் தொடர்ந்தும் பல வருடங்களாகக் கல்வி நிலையில், தேசிய ரீதியில் பார்க்கும்பொழுது, இறுதி இடங் களையே வகித்து வருகின்றன. முல்லைத்தீவு மாவட்டத்தைப் பொறுத்தமட்டில், முல்லைத்தீவு மற்றும் துணுக்காய் கல்வி வலயங்களின் கீழ் 27,970 மாணவர்கள் 126 பாடசாலைகளில் கல்வி கற்று வருகின்றபோதிலும், இந்த 126 பாடசாலை களிலும் வளப் பற்றாக்குறைகள் காணப்படுவதாகத் தெரியவரு கின்றன. அந்த வகையில் பார்க்கின்றபொழுது, கல்வி நிலையில் பாரிய பின்னடைவைக் கண்டுவருகின்ற வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களின் கல்வி நிலை தொடர்பில் மாகாண சபைகள் மிகுந்த பொறுப்புடன் செயற்படவேண்டும் என நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், கடந்த யுத்த காலப் பகுதியில் மிகுந்த சிரமங்கள் மற்றும் அடிப்படை வசதிகள் போதியளவு இல்லாத நிலை யிலும் கடமை நிறைவேற்று அதிபர்களாகவும் கடமை நிறை வேற்று உதவிக் கல்விப் பணிப்பாளர்களாகவும் கடமை யாற்றி, இன்னும் தங்களது பணிகளை நீடித்துக்கொண்டு இருப்பவர்கள் தொடர்பில் உரிய அவதானம் செலுத்தப்பட வேண்டும். வடக்கு, கிழக்கு மற்றும் பல்வேறு பகுதிகளிலும் காணப்படுகின்ற கணித, விஞ்ஞான, ஆங்கில மற்றும் தொழில்நுட்ப பாடங்களுக்கான ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்கு உகந்த நடவடிக்கை தேவை எடுக்கப் படுவதுடன், தொண்டர் ஆசிரியர்களாகப் பணியாற்றி வருவோருக்கு அவர்களது தகைமைகளுக்கு ஏற்ற நிரந்தர நியமனங்கள் வழங்க நடவடிக்கை எடுக்கப்படவேண்டும்.

"அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" என்னும் திட்டத்தின்கீழ் உள்வாங்கப்பட்டுள்ள வடக்கு மாகாணப் பாடசாலைகளுக்கு நிதி ஒதுக்கீடுகள் மேற் கொள்ளப்பட்டு, அவற்றின் அபிவிருத்தி முன்னெடுக்கப் படவேண்டும். அதுபோல், வடக்கு மாகாணத்தில் செயல்படுகின்ற 12 வலயக் கல்விப் பணிமனைகளிலும் காணப்படுகின்ற ஆளணி வெற்றிடங்களை நிரப்புதவற்கும் நடவடிக்கை எடுக்கப்படவேண்டும். மேலும், அனைத்து இடைநிலைப் பாடசாலைகளுக்கும் ஆகக்குறைந்தது நவீன விஞ்ஞானகூடம் ஒன்றினையேனும் வழங்கவும், உயர் தரத்தில் தொழில்நுட்பப் பாடங்கள் போதிக்கப்படுகின்ற அனைத்துப் பாடசாலைகளுக்கும் தொழில்நுட்ப பீடக் கட்டடத் தொகுதிகளை வழங்கவும் நடவடிக்கை எடுக்கவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

அதேநேரம், மலையகம் மற்றும் நாட்டின் ஏனைய மாவட்டங்களிலும் தமிழ் மொழிமூலக் கல்வித்துறையில் பாரிய வீழ்ச்சி நிலை ஏற்பட்டுள்ளதாகப் புள்ளிவிபரங்களிலிருந்து அறியமுடிகிறது. மலையகத்தைப் பொறுத்தவரையில், 5 வீதமான மாணவர்கள் பல்கலைக்கழகம் செல்லக்கூடிய வாய்ப்பு இருந்தும், ஆசிரியர்கள் உட்பட உரிய வளப் பற்றாக்குறை காரணமாகத் தற்போது 0.2 வீதமானவர்களே பல்கலைக்கழகம் செல்லக்கூடிய நிலை இருப்பதாக அறிய முடிகின்றது. இவற்றுக்கு அடிப்படைக் காரணங்கள் பல இருப்பினும், குறிப்பாக, முறையற்ற ஆசிரியர் நியமனங்கள், முறையற்ற வகையிலான அதிகாரிகளின் இடமாற்றங்கள், கல்வித்துறையில் அநாவசிய அரசியல் தலையீகள், வெளியாரின் தலையீடுகள், கல்வி அதிகாரிகளினதும் பாடசாலை அதிபர்களினதும் ஆசிரியர்களினதும் சுயமான சிந்தனைக்கு ஏற்படுத்தப்படுகின்ற முட்டுக்கட்டைகள் என்பன பிரதான காரணங்களாக அமைவதாகக் கூறப்படுகின்றது. எனவே, இது தொடர்பில் கௌரவ கல்வி அமைச்சர் அவர்கள் தனது அவதானத்தைச் செலுத்துவார் என நம்புகின்றேன்.

கொழும்பு மாவட்டத்தைப் பொறுத்தவரையில், தமிழ்ப் பாடசாலைகளுக்குரிய வளங்கள் பறிக்கப்படுகின்ற ஒரு

நிலைமையே காணப்படுவதாக அறியமுடிகின்றது. குறிப்பாக, தெமட்டகொடை, விபுலானந்த தமிழ் மகா வித்தியாலயத் துக்குரிய 320 பேர்ச்சஸ் காணியில் சுமார் 200 பேர்ச்சஸ் காணி வெளியாரால் பறிக்கப்பட்டுள்ளதாகவும், தெஹிவளை தமிழ் மகா வித்தியாலயத்துக்குரிய 60 பேர்ச்சஸ் காணியில் 20 பேர்ச்சஸ் காணி வெளியாரால் பறிக்கப்பட்டுள்ளதாகவும் தெரியவருகின்றது. அதேநேரம், நாராஹேன்பிட்டியில் சுமார் 80 வருடங்களாக இயங்கிவந்த மஹவத்த, அரசினர் தமிழ்ப் பாடசாலை மூடப்பட்டதன் காரணமாக நாராஹேன்பிட்டி, நாவல, கிருல, டொரிங்டன் ஆகிய பகுதிகளில் வாழும் தமிழ் மாணவர்களுக்குத் தமிழ் மொழிமூலக் கல்வியை மேற்கொள்ள இயலாதநிலை தோற்றுவிக்கப்பட்டுள்ளதாகவும் தெரியவரு கின்றது. அதைவிட, பாமன்கடை, இராமகிருஷ்ணன் மகா வித்தியாலயக் காணி, மற்றும் இரத்மலானை இந்துக் கல்லூரி காணி சம்பந்தமாகவும் பல பிரச்சினைகள் இருப்பதாகச் சொல்லப்படுகின்றது. கிருலப்பனையில் தமிழ்ப் பாடசாலை ஒன்று ஏற்படுத்தப்பட்டதன் விளைவாக, நுகேகொட தமிழ் மகா வித்தியாலயத்துக்கும் பாமன்கடை இராமகிருஷ்ண மிஷன் மகா வித்தியாலயத்துக்கும் வருகைதரும் மாணவர் களின் எண்ணிக்கையில் வீழ்ச்சி நிலை ஏற்பட்டுள்ளதாகத் தெரிவிக்கப்படுகின்றது.

சப்ரகமுவ மாகாணத் தமிழ்ப் பாடசாலைகளினதும் கல்வித் தரமும் பாரிய வீழ்ச்சி நிலையிலே காணப்படுகின்றது. அதேபோன்று தென் மற்றும் வட மேல் மாகாணங்களிலுள்ள தமிழ்ப் பாடசாலைகளின் நிலையும் இதேபோன்றதாகத்தான் இருக்கின்றது. எனவே இவ்விடயங்கள் தொடர்பில் கல்வி அமைச்சர் அவர்கள் தனது உடனடி அவதானத்தைச் செலுத்த வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

வடக்கு, கிழக்கு, மலையகம், கொழும்பு தவிர்ந்த, தமிழ் மக்கள் பரவலாக வாழ்ந்து வரும் ஏனைய மாவட்டங்களில் தமிழ் அரசியல்வாதிகள் தமக்கான பிரதிநிதித்துவத்தைப் பெற இயலாது என எண்ணும் நிலையில், ஏனைய விடயங்களைப் போன்றே கல்வியிலும் இப்பகுதிகள் தமிழ் அரசியல்வாதி களால் புறக்கணிக்கப்பட்டு வருவதாகப் பொதுவான ஓர் அபிப்பிராயம் இம்மாவட்டங்களிலுள்ள மக்கள் மத்தியில் ஏற்பட்டிருக்கின்றது. இது நியாயமானதாகும். எனவே, இந்த நிலைப்பாட்டினைப் போக்கக்கூடிய ஏற்பாடுகளைக் கல்வி அமைச்சு முன்னெடுக்க முன்வர வேண்டும் என்று வலியுறுத்த விரும்புகின்றேன். இது தொடர்பில் நான் ஏற்கனவே இந்தச் சபையில் கேள்வி எழுப்பியிருந்தேன். அப்போது இவ்விடயம் தொடர்பில் அவதானம் செலுத்தப்படும் எனக் கூறப்பட்ட பொழுதிலும் இன்னும் அவதானம் செலுத்தப்படாத நிலையே காணப்படுகின்றது.

நாடளாவிய ரீதியில் முன்பள்ளிகளில் ஆசிரியர் பணியில் ஈடுபடுபவர்களது வாழ்க்கை நிலைமைகளை அவதானத்தில் கொண்டும் அவர்களை ஊக்குவிக்கும் வகையிலும் ஒரு திட்டத்தை நாம் முன்னெடுக்க வேண்டியுள்ளது. சிறார்களைக் கல்வியின்பால் ஈர்க்கின்ற அதிமுக்கியத்துவம்வாய்ந்த பணியில் ஈடுபட்டுள்ள இந்த முன்பள்ளி ஆசிரியைகள் பலர் பொருளாதார ரீதியில் மிகவும் பின்தங்கிய நிலையிலேயே வாழ்ந்து வருகின்றனர். எனவே, இவர்களுக்கெனப் போதுமானவளவு ஓர் ஊதியத் தொகை நிர்ணயிக்கப்பட்டு வழங்கப்படுவது அவசியமாகும். அதேநேரம் வடக்கு மாகாணத் தைப் பொறுத்தவரையில், மாகாண சபையின் நிர்வாகத்தின் கீழ் வராத சில முன்பள்ளி ஆசிரியர்களுக்கு மாத ஊதியமாக முப்பதாயிரம் ரூபாய் வழங்கப்படுகின்றது என்பதையும் நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அடுத்து, தமிழ் மொழிமூல வரலாற்றுப் பாடங்களில் இலங்கைத் தமிழ் மக்களதும் தமிழ் மன்னர்களதும் வரலாறுகள் திரிபுபடுத்தப்பட்டுள்ளதாகவும் மறைக்கப்பட்டுள்ளதாகவும் நான் ஏற்கனவே தெரிவித்திருந்தேன். அதற்குக் கல்வி அமைச்சர் சார்பில் பதிலளித்திருந்த கல்வி இராஜாங்க அமைச்சர் அவர்கள், அப்படி இல்லை எனவும் தமிழர்களது வரலாறுகள் பாடநூல்களில் உள்வாங்கப்பட்டுள்ளதாகவும் தெரிவித்திருந்தார். எனினும் உண்மை அதுவல்ல என்ற விடயத்தை இங்கு நான் மீண்டும் முன்வைக்க விரும்புகின்றேன். அந்த வகையில் 6ஆம் தரம் முதற்கொண்டு 11ஆம் தரம் வரையிலான தமிழ் மொழிமூலமான வரலாற்றுப் பாடநூல்களைப் பார்க்கின்றபொழுது இந்த உண்மையைக் கண்டுகொள்ள முடியும். கல்வி இராஜாங்க அமைச்சர் கௌரவ இராதாகிருஷ்ணன் அவர்கள் இதனை உணர்ந்து கொள்வார் என நான் நம்புகின்றேன். அதை நிரூபிக்கின்ற வகையில் அந்த வரலாற்றுப் பாடப் புத்தகங்களையும் இங்கு நான் கொண்டு வந்திருக்கின்றேன். கௌரவ இராஜாங்க அமைச்சர் இது குறித்து ஓர் உயர்மட்டக் கலந்துரையாடல் ஒன்றை ஏற்படுத்தித் தருவதாகக் குறிப்பிட்டிருக்கின்றார். அந்த வகையில் இந்த வரவு செலவுத் திட்ட விவாதங்கள் முடிவடைவதற்குள் அற்கான நேரத்தை அவர் ஒதுக்கித் தருவாராக இருந்தால் அது எங்களுக்கு உதவியாக இருக்கும் என்று நான் கூறிக் கொள்கின்றேன்.

குறிப்பாக, இந்த வரலாற்றுப் பாட நூல்களில் இலங்கை மன்னர்கள் எனப் பலரைப் பற்றிக் கூறப்படுகின்றபோதிலும் அவற்றில் ஒரு தமிழ் மன்னரைப் பற்றிக்கூட தனியான விளக்கங்கள் கொடுக்கப்படவில்லை. 7 ஆம் தரப் பாடநூலில் யாழ்ப்பாண இராஜ்ஜியம் பற்றிய ஒரு சிறு குறிப்பு வேண்டாவெறுப்புடன் பிரசுரிக்கப்பட்டிருப்பது போன்று இடம்பெற்றிருப்பதையே காணக்கூடியதாக இருக்கின்றது. இந்த நூல்களில் துட்டகைமுனு மன்னர் பற்றிப் பலமுறை குறிப்பிடப்பட்டிருக்கின்ற நிலையில், எல்லாள மன்னர் தொடர்பில் தனிப்பட்ட வாழ்க்கை வரலாறுகள் குறிப்பிடப் படவில்லை என்பதை நான் இங்கு கவலையோடு சுட்டிக்காட்ட விரும்புகின்றேன். 10ஆம் தரத் தமிழ்மொழிமூல வரலாற்றுப் பாடநூலில் துட்டகைமுனு பற்றிய பகுதியில் எல்லாளன் மன்னனைப் பற்றிக் குறிப்பிடும்போது, ஒரு மிகச் சிறிய குறிப்பில் "துட்டகைமுனு மன்னன் தோல்வியுற்ற தனது எதிராளியின் கல்லறைக்கு உரியமுறையில் மரியாதை செலுத்தும்படி ஆணையிட்டான். இதன்மூலம் தனது இராஜ தந்திரச் செயற்பாட்டை வெளிப்படுத்தினான்" எனக் குறிப்பிடப்பட்டுள்ளது. எனவே, இந்த வரலாற்று நூல்களைக் கற்கின்ற எமது மாணவர்கள் மத்தியில் அவர்களுக்கான வரலாறுகள் எதுவும் இங்கு காணப்படாத நிலையில், இந்த நாடு தொடர்பில் ஒருவித அந்நிய மனப்பான்மையே ஏற்படுகின்றது.

பாடசாலை மாணவர்களுக்கு வரலாற்றுப் பாடங்கள் புகட்டப்படுவதாயின் இலங்கையின் உண்மையான வரலாற்றை உள்ளபடி புகட்டவேண்டும். இவ்வாறு ஒருசாராரின் வரலாற்றை மறைத்து அல்லது திரிபுபடுத்தி இன்னொரு சாராரின் வரலாற்றை மாத்திரம் புகட்டுவதனால் இந்த நாட்டின் அடித்தளத்திலிருந்து தமிழ் பேசும் மக்களிடையே தேசிய நல்லிணக்கம் ஏற்படுமென்பது பகற்கனவாகவே அமையும் என்பதையும் நான் இங்கு வலியுறுத்திக் கூற விரும்புகின்றேன். எனவே, தமிழ் மொழி மூலமான வரலாற்றுப் பாடத்திட்டங்களை வகுப்பதற்குத் தமிழ் மொழிமூலமான வரலாற்றுப் பேராசிரியர்களைக் கொண்ட ஒரு குழுவை ஏற்படுத்துங்கள்! அந்தக் குழுவிற்குப் பூரண சுதந்திரத்தை வழங்குங்கள்! வெறும் எழுத்துப் பிழைகளை மாத்திரம் திருத்துகின்றவர்களாகவும் மொழிபெயர்ப் பாளர் களாகவும் தமிழ் வரலாற்றுப் பேராசிரியர்களை இந்தப்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

பாடநூல் தயாரிப்பு விடயத்தில் பயன்படுத்திக் கொள்வதைத் தவிர்த்துக்கொள்ளுங்கள்! என்றும நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதேநேரம், பாடசாலைகளில் மாணவர்களிடமிருந்து நிதி வசூலிக்கின்ற நடவடிக்கைகளை நிறுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்போவதாகக் கல்வியமைச்சர் அண்மையில் தெரிவித் திருந்தார். இது நல்லதொரு விடயம். இன்றுகூட நாட்டில் பல பகுதிகளில் செயற்பட்டு வருகின்ற பாடசாலைகளில் பல்வேறு காரணங்கள் கூறப்பட்டு நிதி வசூலிப்பு நடவடிக்கைகள் தொடர்ந்தும் மேற்கொள்ளப்பட்டு வருகின்றன. எனவே, இந்தச் செயற்பாடுகளை நிறுத்துவதற்குக் கடுமையான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும் என்பதையும் நான் இங்கு வலியுறுத்திக் கூற விரும்புகின்றேன்.

அதேநேரம், நாட்டில் பல பகுதிகளில் வாழ்ந்துவருகின்ற மாணவர்கள் பலர் குடும்பப் பொருளாதார நெருக்கடி நிலைமை காரணமாகப் பாதணிகள்கூட இன்றிய நிலையிலேயே பாடசாலை செல்கின்ற நிலைமை காணப்படுகின்றது. இதனால் தனிப்பட்ட சில முகநூல்கள் வழியாக இம்மாணவர் களுக்கான பாதணிகளைச் சேகரித்து வழங்கும் நிலையும் உருவாகியுள்ளது என்ற விடயத்தையும் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் 3 நிமிடங்கள் இருக்கின்றன.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
மேலும், உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு தொடர்பாகவும் நான் எனது கருத்துக்களைப் பதிவுசெய்ய விரும்புகின்றேன். தமிழ் மொழிமூலமான கலை இலக்கிய நிகழ்வுகளுக்கு முக்கியத்துவம் கொடுத்து, கௌரவ உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் எஸ்.பி. நாவின்ன அவர்கள் பல்வேறு நிகழ்வுகளை நடத்திவருவதை யிட்டு அவருக்கு எமது மக்கள் சார்பாக எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அதேநேரம், யுத்தம் காரணமாக இலங்கையிலிருந்து இடம்பெயர்ந்து தமிழ் நாட்டிலே அகதி முகாம்களில் அகதிகளாக இருந்துவரும் இலங்கைத் தமிழ் மக்களை இலங்கைக்குத் திருப்பியழைக்கும் வகையில் உள்ளக அலுவல்கள் அமைச்சு ஏற்பாடுகளைச் செய்யவேண்டுமெனை நான் ஏற்கனவே கோரியிருந்த நிலையில் அதற்கமைவாகச் சில ஏற்பாடுகள் இடம்பெற்றிருப்பது மகிழ்ச்சிக்குரிய விடயமாகும். எனினும், தற்போது நாடு திரும்புகின்ற அந்த மக்களுக்கான அடிப்படை வசதிகள் முதல் ஏற்கனவே உறுதியளித்திருந்த எந்தவொரு வாக்குறுதிகளையும் நிறைவேற்றாதிருப்பதனை நான் இந்தச் சந்தர்ப்பத்தில் நினைவுகூர விரும்புகின்றேன்.

அதேநேரம், கடந்த கால யுத்த அனர்த்தங்கள் காரணமாக நலிவடைந்துள்ள வடக்கு, கிழக்கு மாகாணங்களைச் சேர்ந்த கலைஞர்களையும் இலக்கியவாதிகளையும் கௌரவிக்கும் ஒரு விசேட ஏற்பாடாக அவர்களுக்கான ஓர் ஓய்வூதியத் திட்டத் தைச் செயற்படுத்தவும் ஏற்கனவே சில இடங்களில் அமைக்கப்பட்டதுபோல் அனைத்துப் பிரதேச செயலகங்கள் தோறும் கலாசார நிலையங்கள் அமைத்து, அதற்குரிய ஆளணி வசதிகளை ஏற்படுத்தவும் பாரம்பரிய கலைகளை மேம் படுத்தவும் பாரம்பரிய கலைஞர்களைக் கௌரவித்து ஊக்குவிக்கவும் கௌரவ அமைச்சர் எஸ்.பி. நாவின்ன அவர்கள் நடவடிக்கை எடுக்கவேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, இந்த நாட்டில் அநுராதபுர இராஜதானியை சுமார் 44 ஆண்டுகளாக ஒழுக்க விழுமியங்களோடு ஆட்சி புரிந்த எல்லாளன் மன்னனுக்கு உரிய மரியாதை செலுத்து முகமாகத் துட்டகைமுனு மன்னனால் கட்டப்பட்ட சமாதியை இனங்கண்டு மீளப் புனரமைத்து அதனை மரியாதைக்குரிய இடமாகப் பிரகடனப்படுத்தும்படி நான் ஏற்கனவே கோரிக்கை விடுத்திருந்தேன். ஆனால், அதற்குரிய செயற்பாடுகள் எதுவும் இன்னும் முன்னெடுக்கப்படவில்லை என்பதையும் இங்கே கவலையோடு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். ஏனெனில், எல்லாளன் - துட்டகைமுனு யுத்தம் என்பது ஓர் இராஜதானிக்காக இரு மன்னர்களுக்கிடையில் ஏற்பட்ட யுத்தமல்ல என்றும் இது தமிழர்களுக்கெதிராக மேற்கொள்ளப் பட்ட யுத்தம் என்றும் இனவாதப் போக்காளர்கள் சிலரால் சுட்டிக்காட்டப்படுகின்றது. எனவே, இந்த நிலைமையை மாற்றி அந்தச் சமாதிக்குத் துட்டகைமுனு மன்னன் எதிர்பார்த்த மரியாதையைச் செலுத்துமுகமாக நான் மேற்கூறிய ஏற்பாட்டினைச் செய்வதற்கு நடவடிக்கை எடுக்குமாறு கேட்டுக்கொள்கின்றேன்.

இந்த நாட்டில் தேசிய நல்லிணக்கத்தை வலுவுள்ளதாக எல்லாத் தரப்பினர் மத்தியிலும் கட்டியெழுப்ப வேண்டுமாயின் இவ்வாறான ஏற்பாடுகளைச் செய்தாகவேண்டிய கடமைப் பாடு இருக்கின்றதென்பதையும் இனங்களுக் கிடையில் ஐக்கியத்தை விரும்புகின்ற அனைவரும் இதனை ஏற்றுக் கொள்வார்கள் என்பதையும் எதிர்பார்த்து, எனது உரையை முடித்துக்கொள் கின்றேன். நன்றி.

[අ.භා. 12.26]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප රටේ අනාගතය රඳා පවතින අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම තාරුණ්‍ය ගත්තොත්, අපේ රටේ අනාගතය තාරුණ්‍යයයි. ඒ තාරුණ්‍ය අපේ රටේ නායකත්වය, ආර්ථිකය මෙන්ම සමාජය භාර ගැනීම සඳහා යොමු කිරීමේදී අධ්‍යාපන ක්‍රමය තුළින් විශේෂ කාර්ය භාරයක් කරන්නට අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වන රටක් හැටියට අපේ තරුණ තරුණියන්ට හරි හැටි අධ්‍යාපනය ලබා දීමට රජයේ මැදිහත් වීමක් අවශ්‍ය වෙනවා. ඒ නිසා අපි අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමාටත්, රාජ්‍ය අමාත්‍යතුමාටත් විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, මේ නිදහස් අධ්‍යාපන ක්‍රමයේ අර්ථය අපේ තරුණ තරුණියන් වෙත ලබා දීම සඳහා විශේෂ ක්‍රමයක් ඇති කිරීම සහ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම ගැන. නමුත් අපට ගැටලුවක් තිබෙන්නේ, අපේ මධ්‍යම ආණ්ඩුවෙන් අධ්‍යාපනය ගැන කොතරම් සැලසුම් හැදුවත් ඒවා පළාත් සභාවලින් ක්‍රියාත්මක වීමයි. පළාත් සභා තුළින් පාලනය වන

පාසල්වල අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේදී සමහර පළාත් සභා පැරණි ක්‍රමවේදයම ඉදිරියටත් ක්‍රියාත්මක කරන්න හදන බව අපි දැක්කා.

පාසල්වල ගුරු හිඟය ගත්තත් එහෙමයි. පාසල්වලට ගුරුවරු යොමු කිරීමේදී දේශපාලන හේතු මත සමහර පාසල් වට්ටන්න කටයුතු කළ ආකාරය ඉතිහාසයේ අප දැක්කා. ඒ වාගේම විදුහල්පතිවරු ගත්තාම, වැඩ බලන විදුහල්පතිවරු දමා ගෙන පාසල්වල ප්‍රමිතිය අඩු කරලා, ඒ පාසල් තමන්ගේ දේශපාලන වේදිකාව කර ගන්නට කටයුතු කළ අවස්ථාත් අප දැක්කා. මේ දේශපාලන ක්‍රමයේදී පාසල්වල ඉන්න සිසුන් වාගේම දෙමව්පියන් සහ ගුරුවරුන් පාසල් භූමිය තුළට එක්රැස් කරලා එතැන තමන්ගේ දේශපාලන කථා පවත්වන වේදිකාවක් බවට පත් කර ගෙන, නිදහස් අධ්‍යාපනය විනාශ කරලා; නිදහස් අධ්‍යාපනය කඩා දමලා ඒ දරුවන්ගේ අනාගතය විනාශ කරන්නට කටයුතු කළ කාලයක් තිබුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යම්කිසි ප්‍රමිතියකින් යුත් ගුරුවරු සහ විදුහල්පතිවරු පාසල්වලට ලබා දිය යුතුය කියන කාරණය මේ අවස්ථාවේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට විශේෂයෙන් මතක් කරනවා. විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය තමයි පාසල්වල විනය, ප්‍රමිතිය රැක ගැනීම සඳහා ප්‍රධාන කාර්ය භාරයක් කරන්නේ. පසුගිය කාලයේ විදුහල්පතිවරු පත් කිරීමේදී කිසිම ක්‍රමවේදයක් තිබුණේ නැහැ. විභාග තිබුණේ නැහැ. මේ දවස්වල ඒ සඳහා විභාග තිබ්බත්, පළාත් සභාවලින් පාලනය වන පාසල් විශාල සංඛ්‍යාවක තවමත් ඉන්නේ වැඩ බලන විදුහල්පතිවරුයි. ඒ නිසා මම මේ අවස්ථාවේදී මතක් කරනවා, විශේෂයෙන්ම විදුහල්පතිවරුන්ගේ ප්‍රමිතියත්, ගුරුවරුන්ගේ ප්‍රමිතියත් හොඳ තත්ත්වයෙන් පවත්වා ගෙන යන්නට අප කටයුතු කරන්න ඕනෑය කියා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Hon. State Minister, please wind up.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
Okay.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි තරුණ අසහන කිහිපයකට මුහුණ දුන්න රටක්. අපේ අධ්‍යාපන ක්‍රමය තුළින් දරුවන්ට හරිහැටි අධ්‍යාපනය කාවැද්දුවේ නැත්නම්, දරුවන් තුළ විනය ඇති කළේ නැත්නම් අපට අනාගතයක් නැහැ. ඒ නිසා ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Thank you very much. The Sitting is suspended till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி. ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
The Hon. Prasanna Ranatunga please.

[අ.භා. 1.00]

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටේ අනාගතයට ඉතාමත්ම වැදගත් විෂයක් වන අධ්‍යාපන විෂය පිළිබඳව වචන කිහිපයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

දරුවෙකුට ලබා දෙන අධ්‍යාපනය රටේ වැදගත් අනාගත ආයෝජනයක් වශයෙන් තමයි හඳුන්වන්නේ. යමක් පරිහරණය කරලා එයින් ප්‍රතිඵල ලබා ගන්නවා වාගේ මේ කරන ආයෝජනය තුළින් අධ්‍යාපනයේ ප්‍රතිඵල ලබා ගන්නට බැහැ. දරුවෙකුට දෙන අධ්‍යාපනයේ ප්‍රතිඵල ලබා ගැනීමට සමහරවිට අවුරුදු 10ක්, අවුරුදු 15ක්, අවුරුදු 20ක් ගත වෙන්න පුළුවන්. මේ නිසා අධ්‍යාපනය සම්බන්ධයෙන් රජයකට වගකීමක් තිබෙන අතර, මේ සඳහා රජයේ නියාමනය අත්‍යවශ්‍ය කාරණාවක් බව මෙහිදී සඳහන් කරන්නට ඕනෑ. බස්නාහිර පළාතේ හිටපු ප්‍රධාන ඇමතිවරයා හැටියට මා යටතේ අධ්‍යාපන විෂය තිබුණු නිසා, අධ්‍යාපනවේදීන් එක්ක මේ සම්බන්ධව කටයුතු කරද්දී මට අත්දැකීම් රාශියක් ලබා ගන්නට පුළුවන් වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2017 වසරේ අය වැය ගැන කථා කරන කොට, රටේ මේ තරම් වැදගත් අමාත්‍යාංශයකට මුදල් අඩු කිරීම පිළිබඳව පොඩි කනගාටුවක් ඇති වනවා. 2016 වසරේදී රුපියල් බිලියන 185.97ක් අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දීමට කටයුතු කර තිබුණා. නමුත්, 2017 වසර වෙන කොට ඒ මුදල රුපියල් බිලියන 76.94 දක්වා අඩු කර තිබෙනවා. ඒ විධියට අඩු වුණු මුදල් ප්‍රමාණය, ආසන්න වශයෙන් රුපියල් බිලියන 108ක් වෙනවා.

පසුගිය කාලයේ, මේ රජය බලයට පත් කරන්න ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහත්මයා වාගේ උදවිය, මහාචාර්යවරු මහ පාරවල් දිගේ 'පිකටිං' කළා, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් අධ්‍යාපනයට ලබා දිය යුතුයි කියලා. එදා විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන් ඒකට සම්බන්ධ වෙලා මාධ්‍ය ඉදිරියේ ප්‍රකාශ කළා, එක්සත් ජාතික පක්ෂ රජයක් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් අධ්‍යාපනයට ලබා දෙනවා කියලා.

2015 ජනවාරි 08 වන දාට ඉස්සර වෙලා වේදිකාවල ඒ ගැන කථා වුණා. නමුත් අද වන විට අධ්‍යාපනයට ලබා දෙන මුදල් ක්‍රමානුකූලව කප්පාදුවක් සිද්ධ වෙනවා. ඒ සම්බන්ධව ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහත්මයා මුහුණු පොතේ සටහනක් දමලා තිබෙනවා, "මෙවර අය වැය නිසා දිවි නසා ගන්නේ නැහැ. දිවි නසා ගන්න මීට වඩා හොඳ අවස්ථාවක් ඉදිරියේදී උදා වෙයි" කියලා. ඒ එතුමා එතුමාගේ වචනවලින් මුහුණු පොතේ දමපු සටහනක්. "මේ අය වැය නිසා දිවි නසා ගන්නේ නැහැ, ඊට වඩා භයානක තත්ත්වයක් අනාගතයේදී ඇති වෙයි, ඒ වෙලාවට මම සිය දිවි නසා ගන්නවා" කියලා තමයි ඒ කියා තිබෙන්නේ කියලායි මට නම් හැඟන්නේ. ඒ නිසා මේ යහ පාලන ආණ්ඩුවට සහයෝගය දීපු ඒ අයට අද සිය දිවි නසා ගන්න තමයි වෙලා තිබෙන්නේ. නමුත් ඒකෙන් රටට යහපතක් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අපේ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ '2017 අය වැය ලේඛනයේ' 18 වන පිටුවේ 87 වන කරුණ යටතේ මෙසේ සඳහන් වී තිබෙනවා:

"...2016 වර්ෂයේ තුන්වන කාර්තුව අවසන් වන විට අධ්‍යාපන අමාත්‍යාංශයට භාවිතා කිරීමට හැකි වී ඇත්තේ රුපියල් මිලියන 38,850ක්

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

පමණයි. එම නිසා මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින් 2017 වසර සඳහා රුපියල් මිලියන 90,000ක් පමණ ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා."

ලබන වසර සඳහා මුදල් අඩු කිරීමට හේතුව, පසු ගිය වර්ෂයේ වෙන් කළ මුදල් වියදම් කිරීමට නොහැකි වීම කියන එක තමයි මුදල් ඇමතිතුමා කියා තිබෙන්නේ. එය අධ්‍යාපන අමාත්‍යාංශයේ නොහැකියාවද, දුර්වලකමද කියන කාරණාව සම්බන්ධයෙන් අපට ගැටලුවක් මතු වෙනවා, පාසල්වල මෙතරම් අවශ්‍යතාවන් තිබෙද්දී අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කළ මුදල් පාවිච්චියට නොගෙන අවිච්ඡේද වෙන්න හැරීම නිසා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපනයට මුදල් වෙන් කරද්දී ප්‍රමුඛතාව, අවශ්‍යතාව කාලෝචිතව බලලා, අවශ්‍යතාව හඳුනාගෙන, ප්‍රමුඛතාව අනුව මුදල් වෙන් කිරීම අවශ්‍යයි.

මෙවර අය වැයෙන් 2017 වසරේදී උසස් පෙළ පන්තිවලට ඇතුළත් වන ශිෂ්‍යයින් 175,000කට හා 28,000ක් ගුරුවරුන්ට Tab එකක් බැගින් ලබා දෙන්න කටයුතු කරනවාය කියලා කියා තිබෙනවා. ඒක ඉතාම හොඳ දෙයක්. 2017 අය වැය ලේඛනයේ 19 වන පිටුවේ 92 වන කාරණාව යටතේ සඳහන් වෙලා තිබෙනවා, සිසුන් 175,000කට හා ගුරුවරු 28,000කට -ලක්ෂ දෙකකට වැඩි ප්‍රමාණයකට- Tab යන්ත්‍ර ලබා දෙන්න කටයුතු කරන බව. නමුත් ඒ සඳහා වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 5,000යි. ඒ මුදල ගුරුවරුන් හා ශිෂ්‍යයින් සංඛ්‍යාවෙන් බෙදුවාම, Tab යන්ත්‍රයකට රුපියල් 2,500ක් වැනි මුදලක් තමයි වැය කරන්න වෙන්නේ. සමහර විට ඒ වාගේ මුදලකට මිලදී ගන්නා Tab යන්ත්‍රයක් දරුවෙකුට ප්‍රමාණවත්ද කියන එක පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා. නමුත් මහා පරිමාණයෙන් ගන්නා නිසා ඒ මුදලට ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. කෙසේ වුවත් දරුවන්ට Tab යන්ත්‍රයක් ලබා දීම අපි අගය කරනවා. නමුත් එතැනදී අපේ අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රායෝගික ගැටලු කිහිපයකට මුහුණ දෙන්න සිදු වෙයි. මේ අය වැය යෝජනා අනුව ඒ Tab යන්ත්‍රය ලබා ගත්තාට පසුව Wi-Fi connection එක ගන්න රුපියල් 2,000ක පමණ මුදලක් ආණ්ඩුවට ගෙවන්නත් ඒ අයට සිදු වෙනවා. ඒ වාගේම ඒකට සියයට 15ක 'වැට්' එකත්-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, අපි ගණන් හදලා බැලුවා. සාමාන්‍යයෙන් Tab යන්ත්‍රයක් සඳහා රුපියල් විසිපන්දහස් ගණනක් වෙන් වෙනවා. වැඩි සංඛ්‍යාවක් ගන්න නිසා ඒ සියල්ලටම සල්ලි තිබෙනවා. බය වෙන්න එපා. Wi-Fi connection එකත් දීලා, නියමෙට වැඩේ කරන්නම්.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

මම ඒක විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, ඒකයි මම කිව්වේ ඒක ඉතාම වැදගත් කියලා. ඒක විය යුතු දෙයක්. හැබැයි ගණන් හදලා බැලුවාම Tab යන්ත්‍රයක් වෙන්නේ රුපියල් 2,500ක් වැනි මුදලක්. ඒ මුදල ප්‍රමාණවත්ද කියන කාරණාවයි බලන්න ඕනෑ. ඔබතුමා ගණන් හදලා බලන්න. උසස් පෙළ පන්තිවලට ඇතුළත් වන දරුවන් 175,000කට සහ ගුරුවරු 28,000කට -ලක්ෂ දෙකකට- Tab යන්ත්‍ර ලබා දීම සඳහා රුපියල් මිලියන 5,000යි වෙන් කරලා තිබෙන්නේ. මිලියන පන්දාහ, ලක්ෂ දෙකෙන් බෙදුවාම එන මුදල් ප්‍රමාණය බලන්න. මට වැරදීමක් සිදු වෙන්න පුළුවන්. ඔබතුමා කියපු කාරණයත් එක්ක මටත් මේකේ ගැටලුවක් ආවා. සමහර විට ගණනය කිරීමේ ගැටලුවක් වෙන්න පුළුවන්. නමුත් මෙතැනදී වෙනත් කාරණාවක් සිදු වෙනවා. ඒකට connection feesවලට අමතරව Wi-Fi පාවිච්චි කරද්දී සියයට 15ක 'වැට්' එකක් හා dataවලට සියයට 25ක් ගෙවන්න වෙනවා. මේ අය වැයෙන් dataවලට සියයට 25ක බද්දක් දාලා තිබෙනවා. එතකොට සියයට 40ක් ගෙවන්න වෙනවා. රුපියල් දාහක Wi-Fi පාවිච්චි කළොත් මේ දරුවෙකුට රුපියල් 400ක් වෙනමම දරන්න සිදු වෙනවා. මේවා සඳහා, අධ්‍යාපන අමාත්‍යාංශයෙන්ද මුදල් වෙන් කරන්නේ, එහෙම නැත්නම් ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන්ද මුදල් වෙන් කරන්නේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

මුදල් ඇමතිතුමාගේ අය වැය ලේඛන පොතේ විදුලිය හා වැසිකිළි සඳහා රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා තිබෙනවා. පාසල් දහදාහක් වාගේ සංඛ්‍යාවකින් මේ මුදල බෙදුවොත් රුපියල් 20,000ක් වාගේ මුදලක් තමයි එක පාසලකට වෙන් වන්නේ. ඒ නිසා මේ පාසල් හඳුනා ගැනීමේදී සියලු පාසල්වලට ඒ මුදල ලබා දෙන්න බැරි නම් ප්‍රමුඛතාව හඳුනාගෙන මේ මුදල් බෙදා දීම සිදු වෙන්න ඕනෑය කියන එකයි අපි විශ්වාස කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පළාත් සභාවේදී අධ්‍යාපන විෂය භාර ඇමතිවරයා විධියට කටයුතු කරද්දී අපි මුහුණ දීපු ගැටලු තිබෙනවා. මේ අය වැයේදී පාසල් දරුවන්ට ලක්ෂ දෙකක රක්ෂණයක් ලබා දෙන්න කටයුතු කරනවා. ඒක ඉතාම වැදගත් කාරණයක්. අද රජයේ රෝහලකට ගිහිල්ලා වෛද්‍යවරයා මුණ ගැහෙන එක විතරයි සාමාන්‍ය කෙනෙකුට කරන්න පුළුවන් වන්නේ. බෙහෙත් හේත් ගන්න වෙන්නේ ෆාමසියෙන්. බෙහෙත් හේත්වලට විශාල මුදලක් දරන්න සිදු වෙනවා. සාමාන්‍ය දුප්පත් පවුලක අයට මේක දරා ගන්න බැරි තත්ත්වයක්. ඒක නිසා මේ රක්ෂණ ක්‍රමය හොඳයි. මොකද මේ රක්ෂණ ක්‍රමය හරහා ඒ සහනය ලැබෙන නිසා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. අපි බස්නාහිර පළාතේ සියලු ගුරුවරුන්ට රක්ෂණ ක්‍රමයක් හඳුන්වලා දුන්නා. රජයේ අග්‍රහාර රක්ෂණ ක්‍රමය තිබෙනවා, ඒකට මුදල් කැපෙනවා. නමුත් ඒ මුදල් ලබා ගන්න පුළුවන් වන්නේ, ඉස්පිරිතාලගත වෙලා මාස ගණනකට පස්සේයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඔබතුමා කිව්වා, එක Tab එකක් සඳහා රුපියල් 2,500ක් යනවා කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ඒක 25,000ද වෙන්න ඕනෑ?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

රුපියල් 25,000ක් වෙන් වෙනවා, එක Tab එකකට.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ඒක මම ඔබතුමාට ගණනය කරලා කියන්නම්. ඒකයි මම ඔබතුමාට කිව්වේ වරදින්න පුළුවන් කියලා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මිලියන 5,000යි කියලා කියන්නේ කෝටි 500 නේ.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ලක්ෂ දෙකක් ඉන්නවා නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කෝටි 500ක් ලක්ෂ දෙකකින් බෙදෙන්න ඕනෑ. එතකොට එක Tab එකකට රුපියල් 25,000ක් එනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
හරි. රුපියල් 25,000කට ලබා ගන්න පුළුවන් වෙනවා නම් ඒක වැදගත් වෙනවා. මම ඒකයි කිව්වේ, ඒ ගණන් සම්බන්ධයෙන් මට වැරදෙන්න පුළුවන් කියලා.

ගරු ඇමතිතුමනි, අපි රක්ෂණ සංස්ථාවත් එක්ක එකතු වෙලා බස්නාහිර පළාතේ සෑම ගුරුවරයෙකු සඳහාම රක්ෂණ ක්‍රමයක් හඳුන්වලා දුන්නා. රක්ෂණ සංස්ථාවෙන් ප්‍රධාන රෝග 25කට විතර හඳුනා ගත්තු ගමන්ම ලක්ෂ පහක් ගුරුවරයාට ගෙව්වා. අපි උදාහරණයකට ගනිමු, cancer එකක් තිබෙනවා කියලා. Cancer එක diagnose කරපු ගමන්ම ලක්ෂ පහක් දෙනවා. ගුරුවරයා ඒ cancer එකෙන් මිය ගියොත් තව ලක්ෂ පහක් ගෙවනවා. ඒ වාගේ විශාල ගුරුවරු සංඛ්‍යාවකට මේ මුදල් ලබා දෙන්න අපි කටයුතු කළා. මේකට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මට විනාඩි 15ක් තිබෙනවා කියලායි ඔබතුමා කිව්වේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
ඔව්. දැන් විනාඩි 10ක කාලයක් අවසන්.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
වාරිකය රුපියල් 800යි. රුපියල් 400ක් ගුරුවරයෙකුගෙන් ගත්තා. රුපියල් 400ක් පළාත් සභාවෙන් දාලා මේ ක්‍රමය ක්‍රියාත්මක කළා. ඒ නිසා දරුවන්ට වාගේම රක්ෂණ සංස්ථාවත් එක්ක කථා කරලා ගුරුවරුන්ටත් මේ සහනය ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අධ්‍යාපන ගැන කථා කරන කොට දෙපැත්තක් තිබෙනවා. එකක් යටිතල පහසුකම් ලබා දීම, අනෙක් එක මානව සම්පත. යටිතල පහසුකම් ලබා දෙන්න අද ඔබතුමන්ලා කටයුතු කරනවා.

අපි හැමෝම කියනවා, පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමේදී සල්ලි ගන්න එපා කියලා. පාසල්වල මුදල් එකතු කිරීම තහනම් කරලා තිබෙනවා. බස්නාහිර පළාතේ සියලුම පාසල් සඳහා, වර්ග කිරීමකින් තොරව, රුපියල් 75,000ත් 150,000ත් අතර මුදලක් නඩත්තු මුදල් වශයෙන් වාර්ෂිකව ගෙව්වා. ඒ වාගේ වැඩ පිළිවෙළක් මේ පාසල්වලට දෙන්න ඕනෑ. දුප්පත් පාසල්වලට රුපියල් 50,000ක් ලැබුණාම පොඩි පොඩි නඩත්තු වියදම් ඒ අයට දරා ගන්න පුළුවන්කම ලැබෙනවා. එක පාසල් කොට්ඨාසයක් තෝරාගෙන ඒවා නඩත්තු කරනවා. අනෙක් පාසල් වැහෙන තත්ත්වයට පත් වෙනවා. ඒ නිසා යටිතල පහසුකම් ලබා දෙන කොට වැසිකිළි - කැසිකිළි පහසුකම්, විද්‍යාගාර පහසුකම් ඇතුළු සියලුම දේවල් ඒ පාසල්වලට ලැබෙන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කියනවා, ශිෂ්‍යත්ව විභාගය සමත් ළමයින්ට මීත් පස්සේ ජනප්‍රිය පාසල් ලැබෙන්නේ නැහැයි කියලා. මා ඒකට පෞද්ගලිකව විරුද්ධයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)
Yes, Hon. Minister?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මගේ වෙලාව-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයේදී අපට මේවා ගැන සාකච්ඡා කරන්න පුළුවන්. ඔබතුමා කියපු ඒ කාරණයත් වැරැදියි, ගරු මන්ත්‍රීතුමනි. එහෙම එකක් කියලා නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
පුවත් පතක තිබුණු දෙයක් තමයි, මා ඔබතුමාට කිව්වේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අප කියා තිබෙන්නේ මෙහෙමයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාම දන්නවා, අද ශිෂ්‍යත්ව විභාගය අම්මාවරුන්ගේ විභාගයක් බවට පත් වෙලා තිබෙනවාය කියා. අපි මේ දවස්වල ඒ ගැන සාකච්ඡා කරමින් යනවා. ඒ ශිෂ්‍යත්ව විභාගය පවත්වාගෙන යන්නේ, ශිෂ්‍යාධාරය සඳහා පමණක්ද, එහෙම නැත්නම් ඇතුළත් වීමේ විභාගයක් පවත්වා, එක දරුවෙකුට අවස්ථා තුනක් දීලා, ජනප්‍රිය පාසල් පවා ඉල්ලන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් හදනවාද යනාදී කරුණු සම්බන්ධයෙන් අපි මේ දවස්වල සාකච්ඡා කරමින් යනවා. අපි "හොඳම පාසල ළඟම පාසල" කියන ව්‍යාපෘතිය ගෙනෙන්නේ හැම පාසලකටම සමානව භෞතික හා මානව සම්පත් දීලා ඒවා දියුණු කරන්නයි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මා කිව්වේ, පුවත් පතක පළ වූ කාරණාවක්. ගම්බද දරුවකුට කොළඹ හොඳ පාසලකට ඇවිල්ලා ජනප්‍රිය පාසලක අධ්‍යාපනය

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

ලබන්න අවස්ථාවක් ලැබෙන්නේ ශිෂ්‍යත්ව විභාගය සමත් වීම හරහා පමණයි. ඒ නිසා මේ ශිෂ්‍යත්වය ලබා දෙන කොට මේ කාරණය ගැන සලකා බලන්න. දරුවන්ට ඒ අවස්ථාව -ශිෂ්‍යත්වය හා ජනප්‍රිය පාසල්- ලැබෙන පරිදි කටයුතු කරන්න.

ගරු අමාත්‍යතුමනි, ළඟම පාසල හොඳම පාසල කරන වැඩසටහන ඉතාමත් හොඳයි. උදාහරණයක් වශයෙන් මීනුවන්ගොඩ ආසනය ගනිමු. මීනුවන්ගොඩ ආසනයට ජාතික පාසල් දෙකක් තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, දරුවන් හැම දෙනාටම ඉංජිනේරුවන්, වෛද්‍යවරුන් වෙන්න බැහැ. ඒ දරුවන්ගේ සහජ කුසලතා තිබෙනවා. ඒවා හඳුනා ගැනීම පාසලේ විදුහල්පතිතුමාගේ සහ ආචාර්ය මණ්ඩලයේ වග කීමක්. එතකොට ඒ දරුවන් නිසි මාර්ගයට යොමු කරලා ඒ දරුවන්ගේ අනාගතය සාර්ථක කර ගැනීම පාසල් අධ්‍යාපන මට්ටමින් කරන්න පුළුවන් වෙනවා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කියා තිබුණා, පාසලේ එක් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 35 දක්වා අඩු කරනවාය කියා. ඒක විය යුතුම දෙයක්, ගරු අමාත්‍යතුමනි. ඒක වෙන්නම ඕනෑ දෙයක්. මොකද, අද ගුරුවරුන්ගේ මානසික ආතතියට හේතුව වෙලා තිබෙන්නේත් ඔය කාරණාවමයි. ඒ නිසා එය කඩිනමින් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න. එසේ කරන්න කියා අප කිව්වාට, මේ වන කල් -තවම- එය වෙලා නැහැ. මේ සම්බන්ධයෙන් උසාවි නියෝගයකුත් තිබෙනවා. ගුරුවරුන්ට පාසලේ පන්ති කාමරය තුළ හොඳ මානසිකත්වයකින් යුතුව දරුවන්ට උගන්වන්න පුළුවන් පසු බිමක් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව සීමා කිරීම හරහා නිර්මාණය කර ගන්න පුළුවන් වෙනවා.

ඒ විතරක් නොවෙයි. ගුරුවරුන්ට විෂයානුබද්ධ පුහුණුව ලබා දීමත් ඉතාම වැදගත්. අද අධ්‍යාපන ප්‍රතිඵල අඩු වන්නත්, පාසල් දරුවන් ටියුෂන් ගුරුවරුන් ළඟට යන්නත් හේතුව පාසලේ ගුරුවරුන්ට විෂය දැනුම නොමැතිකමයි. ඒ නිසා ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කරන වැඩ පිළිවෙළක් ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වන්න ඕනෑ. පළාත් සභාවලට ඒ පුහුණුවීම් කරන්න බැහැ. ගරු අමාත්‍යතුමනි, විෂය භාර ඇමතිවරයා හැටියට ඔබතුමා පළාත් නවයෙහිම අධ්‍යාපන ඇමතිවරුන් එක්ක සාකච්ඡා කරලා එකම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න. පළාත් සභාවේ සිටියදී මමත් බලාපොරොත්තු වුණා, පළාත් අධ්‍යාපන ඇමතිවරුන් -අපව- කැඳවා වැඩ පිළිවෙළ මොකක්ද කියා අපට කියයි කියලා. මෙයට දේශපාලන පක්ෂ පාට භේදයක් නැහැ. දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබා දෙන්න නම්, අධ්‍යාපන අමාත්‍යතුමාත්, පළාත් අධ්‍යාපන අමාත්‍යවරුත් එකතු වෙලා එක වැඩ පිළිවෙළක් සහයෝගයෙන් කරගෙන යන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, ගුරු පුහුණුව ඉතාම වැදගත්. සමහර පරණ ගුරුවරු කැමැති නැහැ, පුහුණුවීම් කරන්න එනවාට. ඔවුන් වෘත්තීය ක්‍රියාමාර්ග ගනීවි. ඒ වාගේ දේවලට අපි මුහුණ දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித்தவிசாளர்அவர்கள்)
(The Hon. Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන්කර තිබෙන කාලය අවසානයි.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු අමාත්‍යතුමනි, මා ඔබතුමාගෙන් තවත් ඉල්ලීමක් කරනවා. දැන් පළාත් සභා පාසල්වල ගුරුවරුන් අවුරුදු පහෙන් පහට මාරු කරනවා. නමුත් ජාතික පාසල්වල අවුරුදු ගණන් එක තැන පල්වුණු ගුරුවරු ඉන්නවා. ඔබතුමා දැන් ඒ අය මාරු කරන්න ගියත්, එය කරන්න අමාරු වෙනවා. අවුරුදු 10ක්, අවුරුදු 15ක්, අවුරුදු 20ක් එකම පාසලේ සිටින ගුරුවරු ඉන්නවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහාත් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත්කර තිබෙනවා. අපි ගිය සතියේ සියලුම පළාත් සභා ඇමතිවරුන්, අධ්‍යක්ෂවරුන් ගෙන්වා සාකච්ඡා කළා. ඉදිරි කාලයේදී ඒ කටයුතු සියල්ලම කරන්නයි කටයුතු කරන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
බොහොම හොඳයි, ගරු අමාත්‍යතුමනි. මා මෙය කියන්නේ ඔබතුමාට උදව්වක් හැටියටයි. මේ කටයුතුවලදී අපි ඔබතුමාට සහයෝගය දෙනවා.

ගුරුවරුන් පුහුණු කරන බව කියනවා වාගේම ගුරුවරුන් පුහුණු කිරීම සඳහා මුදල් වෙන් කරන්නත් මෙහිදී කටයුතු කරන්න ඕනෑ. පළාත් සභා සම්බන්ධ කරගෙන මේ පුහුණු කිරීම් ක්‍රියාත්මක වන්න ඕනෑ. එවිට තමයි එහි ප්‍රතිඵල ළඟා කර ගන්න පුළුවන් වන්නේ. ගරු අමාත්‍යතුමනි, ජාතික පාසල් පරිපාලනය කලාප මට්ටමට භාර දෙන්න. කලාප මට්ටමේ ගුරු මාරුවීම්වලට ඉඩ දෙන්න. එහෙම නැත්නම් වෙන්නේ මොකක්ද? ජාතික පාසල් අධ්‍යක්ෂවරයා මාරුවීම් කරන්න යනවා. නමුත් පළාත් පාසල්වල මාරුවීම් කෙරෙන කොට ජාතික පාසල්වල කෙරෙන්නේ නැහැ.

මීනුවන්ගොඩ ජාතික පාසල් දෙකේම ප්‍රතිඵල අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මීනුවන්ගොඩ ආසනයේ තිබෙන ජාතික පාසල් දෙක -මීනුවන්ගොඩ නාලන්දා පිරිමි විද්‍යාලය සහ උඩුගම්පොළ සෙනරත් පරණවිතාණ විද්‍යාලය- සංවර්ධනය කරන්න, ඒවායෙහි අධ්‍යාපන ප්‍රතිඵල නඟා සිටුවන්න, ශිෂ්‍යත්ව ප්‍රතිඵලවලින් දරුවන් ඇතුළත් කරගෙන ඒ පාසල් දෙක නඟා සිටුවන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.16]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින විවාදයට ගැනෙන අධ්‍යාපන අමාත්‍යාංශයත්, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයත් ඉතාම වැදගත් අමාත්‍යාංශ දෙකක්.

විශේෂයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කථා කරන විට, ඊරියගොල්ල අධ්‍යාපන ඇමතිතුමාගෙන් පස්සේ, වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට පත්වීම ගැන මා ඉතාමත් සතුටු වෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙනස් කම් ගණනාවක් සිදු කිරීම තුළින් එතුමා අද අපේ රටට ගැළපෙන, ලෝකයට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් ඇති කරන්න ගෙනයන වැඩ පිළිවෙළ ගැන අපේ සතුට ප්‍රකාශ කරනවා.

අධ්‍යාපනය ගැන කථා කරනකොට එක්සත් ජාතික පක්ෂයේ හිටපු අධ්‍යාපන අමාත්‍යවරයෙක් වූ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා අමතක කරන්න බැහැ. එසේම ලලිත්

ඇතුලත්මුදලි මැතිතුමාත් අධ්‍යාපනය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉෂ්ට කළ අමාත්‍යවරයෙක්. අපි එයත් සිහිපත් කරන්නට ඕනෑ. එදා ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මහපොළ ශිෂ්‍යත්ව වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා වාගේම රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් අධ්‍යාපන ඇමතිවරයා හැටියට සිටියදී විශාල කාර්ය භාරයක් ඉටු කළ නායකයෙක්. අපි ඒ ගැනත් සිහිපත් කරනවා. මොකද, එතුමා තමයි විද්‍යාපීඨ ඇති කළේ. විද්‍යාපීඨවලින් එළියට එන ගුරු මහත්ම මහත්මීන් තමයි අද පාසල්වල ඉන්න පුහුණුව ලත් හොඳම ගුරුවරුන් බවට පත් වී තිබෙන්නේ. ඒ අයගේ සේවය අද අපට ලබාගන්නට අවස්ථාව උදා කර දුන්නේ, අධ්‍යාපන ඇමතිවරයෙක් හැටියට කටයුතු කළ රනිල් වික්‍රමසිංහ මැතිතුමායි. ඒ වාගේම විදුහල්පතිවරුන් සඳහා විශේෂ පුහුණුවක් එතුමා ලබා දුන්නා. ඒ විදුහල්පතිවරුන් තමයි අද ප්‍රධාන පාසල්වල විදුහල්පතිවරුන් හැටියට කටයුතු කරන්නේ. එයත් අපි සිහිපත් කරන්නට ඕනෑ. අධ්‍යාපන අමාත්‍යවරයෙක් හැටියට සිටියදී එතුමාත් විශාල කාර්ය භාරයක් ඉටු කළා.

වර්තමාන අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කථා කරනකොට අප සතුටු වන්නට ඕනෑ. විශේෂයෙන්ම "හොඳම පාසල ළඟම පාසල" වැඩසටහන අපි අගය කරන්නට ඕනෑ. මොකද, පාසල් යන දරුවාට ඇත්තටම ළඟම පාසල තමයි හොඳම පාසල වෙන්න ඕනෑ. එම ක්‍රමවේදය තුළ විශේෂයෙන් අපේ ප්‍රදේශයේත් මේ ව්‍යාපෘතිය යටතේ පාසල් ගණනාවක අත්‍යාවශ්‍ය කාරණා ගණනාවකට මුදල් වෙන් කරලා පසු ගිය වසරේත් ඒ කටයුතු ක්‍රියාත්මක කළා. මේ අය වැය යෝජනා අනුව ලබන වර්ෂයේත් එම ව්‍යාපෘති ඉදිරියට ගෙන යෑම අපේ රටේ අධ්‍යාපනයේ තිබෙන ගැටලු ගණනාවක් විසඳා ගන්නට හොඳ අවස්ථාවක් වෙනවා. විශේෂයෙන්ම මෙම අය වැය යෝජනා තුළ තිබෙන පාසල් දරුවන්ගේ රක්ෂණ ක්‍රමය අපි අගය කරන්නට ඕනෑ. ඒ වාගේම උසස් පෙළ දරුවන්ට පරිගණක යන්ත්‍ර ලබා දීමේ යෝජනාවත් අපි ඉහළින්ම අගය කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වේලාව ප්‍රමාණවත් නොවුණත්, මා මේ කාරණයත් කියන්න ඕනෑ. අධ්‍යාපනයේ දියුණුව සඳහා ගරු අධ්‍යාපන අමාත්‍යවරයා දරන උත්සාහය, විශේෂයෙන්ම ලෝකයේ දියුණු රටවල් සමඟ එකතුවෙලා අපේ රටේ අනාගතය වෙනුවෙන් කරන මේ ආයෝජනය අපි ඉතාමත් අගය කරනවා. විශේෂයෙන්ම අපේ රජය සහ අපේ අධ්‍යාපන අමාත්‍යතුමා ගෙනයන මේ වැඩ පිළිවෙළ අපි ඉතාමත් අගය කරනවා.

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වයඹ සංවර්ධනය ගැනත් කෙටියෙන් හෝ වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට ඕනෑ. ගරු එස්. බී . නාවින්න ඇමතිතුමා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා හැටියට අපේ වයඹ පළාතේ සෑම ආසනයකටම විශේෂයෙන් අප නියෝජනය කරන ආසනවල ජනතාවගේ සංවර්ධන වැඩ කටයුතු සඳහා රුපියල් ලක්ෂ 2500ක් ලබා දීම ගැන ස්තුතිවන්ත වන අතර, ලබන වර්ෂයේත් ඒ කාර්යය කරන්නට එතුමාට ශක්තිය ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොමත් ස්තුතියි.

[பி.ப. 1.20]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் கல்வி அமைச்சுத் தொடர்பான குழுநிலை விவாதத்திலே நான் சார்ந்திருக்கின்ற வன்னித் தேர்தல் மாவட்டத்தில், குறிப்பாக வவுனியா, மன்னார், முல்லைத்தீவு ஆகிய இந்த மூன்று மாவட்டங்களிலுமிருக்கின்ற மாகாண, மற்றும் தேசியப் பாடசாலைகளின் முக்கியமான சில தேவைகள் குறித்துக் கௌரவ அமைச்சர் அவர்களுடைய கவனத்துக்குக் கொண்டு வரலாமென நினைக்கின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

Order, please! The Hon. Kanaka Herath will now take the Chair.

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திினின்று அகலவே, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. KANAKA HERATH *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, carry on, please.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி தொடர்பாக ஒரு சமச்சீர் நிலை ஏற்படுத்தப்பட வேண்டும். அதற்கு புதிய கல்விக் கொள்கையொன்று அவசியமாகின்றது. எதிர்காலச் சந்ததியினரை வளம் மிக்கவர்களாகவும் திறமை மிக்கவர்களாகவும் சவால்களுக்கு முகங்கொடுக்கக்கூடிய வர்களாகவும் மாற்றியமைக்க வேண்டிய தேவையுள்ளது. இதற்குப் பாடசாலைகளில் நிலவும் ஏற்றத்தாழ்வுகள் அகற்றப்பட வேண்டும். யுத்தத்தால் பெரிதும் பாதிக்கப்பட்ட வன்னித் தேர்தல் மாவட்டத்தில் பாடசாலைகளுக்கிடையில் காணப்படும் வேற்றுமைகள், உதாரணமாக, ஆசிரிய வளப்பங்கீட்டில் காணப்படும் பாரபட்சம் நீக்கப்பட வேண்டும். வருங்காலச் சந்ததியினரே எதிர்காலச் சிற்பிகள். ஆகவே, அவர்களது எதிர்காலத்தை முன்னேற்றப் பாதையிலே கொண்டுசெல்வதற்கு இவை பெரும் இடையூறுகளாக இருக்கின்றன. வன்னி வாழ் மக்களில் பெருமளவானோர் வறுமைக்கோட்டின்கீழ் வாழ்கின்றவர்களாக சடுதியிலே மாற்றப்பட்டுள்ளார்கள். அவர்கள் குறுகிய காலத்தில் தமது குடும்பத்தின் பௌதிக வளங்களையும் மனித வளங்களையும் இழந்து தவிக்கின்றார்கள். அவர்களது வாழ்வை மீட்டெடுப் பதற்கு எல்லா மாணவர்களுக்கும் சமத்துவமான கல்வி வழங்குவதொன்றே தற்போதைய சூழலில் மிகச் சிறந்த தொன்றாக இருக்குமென்று கௌரவ கல்வி அமைச்சர் அவர்களுக்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், இந்த ஆட்சி மாற்றத்திற்கு மிக முக்கிய பங்குதாரர் களாக வடக்கு, கிழக்கைச் சேர்ந்த தமிழ்பேசும் மக்கள் இருந்தார்கள். குறிப்பாக, நாங்கள் ஒரு முக்கிய காரணகர்த்தா வாக இருந்தோம். ஆனால் இந்த வரவு செலவுத் திட்டத்தில் கல்வி அமைச்சு மற்றும் ஏனைய அமைச்சுகள் தொடர்பாக, வடக்கு, கிழக்கின் அபிவிருத்திக்கும், மீள்குடியேற்றத்துக்கும், மற்றும் விடயங்களுக்கும் ஒதுக்கப்பட்டுள்ள நிதி என்பது மிகக் குறைவாகவேயுள்ளது. கல்வியென்பது மிக முக்கியமான தொன்றாகும். அந்த வகையில் சில விடங்களை அமைச்சர் அவர்களின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன்.

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

முக்கியமாக எங்களுடைய மாவட்டத்திலே, குறிப்பாக மாகாண சபைக்குக் கீழான பாடசாலைகளில் புதிய கட்டி டங்கள், விஞ்ஞான ஆய்வுகூடம், கணினிக் கற்கை மையம், நூலகம், அதிபர், ஆசிரியர்களுக்கான விடுதி வசதிகள், மலசல கூடங்கள், கேட்போர்கூடங்கள் போன்றவை முக்கியமான தேவைகளாக இருக்கின்றன. இதற்கு மேலதிகமாக வவுனியா வில் இருக்கின்ற நான்கு தேசியப் பாடசாலைகளிலும் முக்கிய மான சில தேவைகள் இருக்கின்றன. குறிப்பாக, வவுனியா இறம்பைக்குளம் மகளிர் கல்லூரியின் விளையாட்டு மைதானம் நீண்டகாலமாக வவுனியா விமானப் படையினரின் கட்டுப் பாட்டுக்குள் இருந்து வருகின்றது. அண்மையிலே அந்த மைதானம் விடுவிக்கப்பட்டதாக விமானப்படையூடாக எழுத்து மூலமாக வவுனியா அரசாங்க அதிபர் அவர்களுக்குத் தெரிவிக் கப்பட்டதற்குப் பிற்பாடு, அந்த விளையாட்டு மைதானத்தைப் புனரமைப்புச் செய்வதற்காக அங்கு அளவீடு செய்யச் சென்ற அதிகாரிகள் விமானப் படையினரால் திருப்பி அனுப்பப் பட்டிருக்கிறார்கள். ஆகவே, தயவுசெய்து 3,000க்கும் மேற்பட்ட மாணவர்களைக் கொண்ட வவுனியா இறம்பைக்குளம் மகளிர் கல்லூரியினுடைய அந்த விளையாட்டு மைதானத்தை விமானப் படையினரிடமிருந்து விடுவித்து, அந்த மாணவர் களின் பயன்பாட்டுக்கு அனுமதிக்க வேண்டுமென்ற ஒரு கோரிக்கையை இந்த இடத்தில் முன்வைக்கின்றேன்.

அதேபோல, வடக்கு மாகாணத்தில் பலாலி ஆசிரியர் பயிற்சிக் கலாசாலையை விடுவிக்க வேண்டியுள்ளது. வடக்கு மாகாணத்திலே மிக நீண்ட காலமாக ஆசிரியர்களுக்குப் பயிற்சி வழங்கிய பெயரும் புகழும் மிக்க ஒரு கலாசாலையாக அது இருந்தது. ஆனால் இன்று யுத்தம் முடிவடைந்து 7 வருடங்கள் கடந்திருந்தும்கூட அதனை இராணுவத்தினர் இன்னமும் தமது கட்டுப்பாட்டுக்குள்தான் வைத்திருக் கிறார்கள். ஆகவே அதை விடுவித்து அங்கு ஆசிரியர்களுக் கான பயிற்சியை வழங்குவதற்கு அனுமதிக்க வேண்டும்.

அடுத்து, முக்கியமாக வவுனியா மாவட்டத்திலே இருக்கின்ற விபுலானந்தாக் கல்லூரி கிட்டத்தட்ட 2,300 மாணவர்களைக் கொண்டது. அங்கு நடைபெற்ற முக்கியமான வொரு நிகழ்வில் அமைச்சர் அவர்களும் கலந்து கொண்டிருந்தார். அவ்வேளையில் அமைச்சர் அவர்களிடமும் அந்தக் கோரிக்கையை அவர்கள் முன்வைத்திருக்கிறார்கள். 2,300 மாணவர்கள் கல்வி கற்கின்ற அந்த விபுலானந்த கல்லூரிக்கு இதுவரை ஒரு விளையாட்டு மைதானம் இல்லாதது பெரும் குறைபாடாக இருக்கின்றது. அங்கு செல்கின்ற அமைச்சர்கள் மற்றும் பாராளுமன்ற, மாகாண சபை உறுப்பினர்களிடம் அவர்கள் தொடர்ச்சியாக அந்தக் கோரிக்கையை விடுத்து வருகிறார்கள். இதற்கப்பால், அங்கே நடைபெறுகின்ற அபிவிருத்தி இணைப்புக் குழுக் கூட்டங் களிலும் தொடர்ச்சியாக அந்தக் கோரிக்கை முன்வைக்கப் படுகின்றது. இருந்தாலும் அது நிராகரிக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. அந்தப் பாடசாலைக்கு அருகாமையில் 30 பரப்புக்கொண்ட தனியார் காணியொன்று இருக்கின்றது. அந்தக் காணியை விலை கொடுத்து வாங்குவதற்கு 21 மில்லியன் ரூபாய் பணம் தேவைப்படுவதாக அவர்கள் தெரிவிக்கிறார்கள். அந்த வகையில், நீண்டகாலமாக எல்லோரிடமும் முன்வைக்கப்படுகின்ற அந்த கோரிக்கையை கௌரவ அமைச்சர் அவர்கள் நிறைவேற்றித் தரும் வகையில் 30 பரப்புக் காணியை 2,300 மாணவர்கள் கல்வி கற்கின்ற விபுலானந்த கல்லூரிக்குப் பெற்றுக்கொடுக்க வேண்டும். இது நீண்ட காலமாக அந்த மக்களால் முன்வைக்கப்படுகின்ற கோரிக்கையாகும். அந்த வகையில், அதை நிறைவேற்றித்தர வேண்டும்.

அதேபோல் வவுனியா மாவட்டத்தின் முதுகெலும்பாக இருக்கின்ற பாடசாலைதான் வவுனியா தேசிய மகா வித்தியாலயம்! இந்த மகா வித்தியாலயத்தில் கிட்டத்தட்ட 3,100 மாணவர்கள் கல்வி கற்கின்றார்கள். இந்தப் பாடசாலைக்கு ஒரு கேட்போர்கூடம் இல்லை. சிறு மழை பெய்தால்கூட அங்குள்ள மைதானத்திலே மாணவர்களால் விளையாட முடியாத நிலைமை இருக்கின்றது. கணிணி வசதியும் பற்றாக்குறையாக இருக்கின்றது. மேலும், 31 சிற்றூழியர்கள் இருக்கவேண்டிய அந்த தேசிய பாடசாலையில் 12 பேர்தான் சிற்றூழியர்களாகக் கடமையாற்றுகின்றார்கள். அத்துடன் அங்கே இன்னும் பல்வேறுபட்ட தேவைகள் இருக்கின்றன. எனவே, அதிகளவான மாணவர்கள் கல்வி கற்கின்ற அந்தத் தேசிய பாடசாலையிலிருக்கின்ற முக்கிய மான பிரச்சினைகள் பற்றியும் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்தவேண்டுமென்று இந்த நேரத்திலே கேட்டுக் கொள்கின்றேன்.

அடுத்தபடியாக, "அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" என்ற கருத்திட்டம் உங்கள் அமைச்சினூடாகச் செயற்படுத்தப்பட்டுக் கொண்டிருக்கின்றது. இந்தப் பாடசாலைகளைத் தெரிவுசெய்யும்போது மாகாண கல்வி அமைச்சு மற்றும் பாராளுமன்ற உறுப்பினர்களுடைய ஆலோசனைகளையும் பெற்று அதைச் செயற்படுத்தினால் நன்றாக இருக்குமென்று நினைக்கின்றேன். மின்சாரத் தேவைகளுக்காக 15 இலட்சம் ரூபாய் பாடசாலைகளுக் கென்று ஒதுக்கப்பட்டிருக்கிறது. இருவர் அல்லது மூவர் கல்வி கற்கின்ற சில பாடசாலைகளும் இந்த நாட்டில் இருப்பது எங்களுக்குத் தெரியும். அத்தகைய பாடசாலைகளுக்குக்கூட இந்த 15 இலட்சம் ரூபாய் நிதி ஒதுக்கப்படுகின்றது. ஆனால், நூற்றுக்கணக்கான மாணவர்கள் கல்வி கற்கின்ற சில பாடசாலைகளில் மலசலகூட வசதிகள் இல்லாத, ஆசிரியர் மற்றும் அதிபர்களுக்கான விடுதி வசதிகள் இல்லாத நிலைமை இருக்கின்றது. அந்த வகையில், 'அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை' என்ற கருத்திட்டத்தைச் செயல்படுத்தும் விடயத்தில் எங்களோடும், மாகாணக் கல்வி அமைச்சோடும் கலந்தாலோசித்து செயற்பாட்டால் சரியான முறையிலே உரிய பாடசாலைகளுக்கு பணம் வழங்க முடியுமென்பதுதான் எங்களுடைய அவாவாகும். ஆகவே, இப்படியான விடயங் களை எங்களோடு கலந்தாலோசித்து செய்யவேண்டுமென்று மீண்டும் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය අපි තෝරා ගනු ලැබුවේ සියලුම පළාත් අධ්‍යක්ෂවරු, කලාප අධ්‍යක්ෂවරු, ඒ වාගේම කලාපවල හිටපු සහකාර සැලසුම් අධ්‍යක්ෂවරු මාර්ගයෙන් ඔවුන්ගේ නිර්ණායක මතයි. එහෙම නැතිව, වෙනත් පදනමක් මත නොවෙයි තෝරා ගත්තේ. පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් 225 දෙනාමත් කැඳවලා, මම මුලින් සඳහන් කළ නිලධාරීන් සියලු දෙනාත් කැඳවලා, එහි අඩු පාඩු තිබෙනවා නම් ඒවා ගැනත් සාකච්ඡා කරන්න අවස්ථාව දීලා තමයි අපි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේ.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ அமைச்சர் அவர்களே, நான் என்ன சொல்கின்றேன் என்றால், உதாரணத்துக்கு மூவர் - நால்வர்

கொண்ட ஒரு பாடசாலைக்கு 15 இலட்சம் ரூபாய் நிதி மின்சார வேலைக்காக ஒதுக்கப்பட்டிருக்கின்றது. அதேநேரத்தில் அதற்கு அருகாமையில் இருக்கக்கூடிய பாடசாலைகளை எடுத்துக்கொண்டால், அங்கு நூற்றுக்கணக்கானவர்கள் இருக்கின்றார்கள். அந்தப் பாடசாலைகளில் குடிநீர் வசதி இல்லை, மலசலகூட வசதி இல்லை, ஆசிரியர்களுக்கான விடுதிகள் இல்லை. ஆகவே, நீங்கள் முன்னுரிமைப்படுத்தி சிலவற்றைச் செய்யவேண்டும் என்பதுதான் என்னுடைய கோரிக்கையாக இருக்கின்றது. ஆகவே, நீங்கள் இதற்கான தெரிவுகளைச் செய்யும்போது, அதுதொடர்பில் எங்களோடும் அல்லது மாகாண சபை உறுப்பினர்களோடும் கலந்தாலோசித்துச் செய்யவேண்டும் என்பதையே நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோன்று, கல்வி நிர்வாக சேவைக்கு ஆட்சேர்ப்புச் செய்யும்போது, தமிழ் மொழி மூலம் இருக்கக்கூடிய வெற்றிடங்களுக்கு - அதாவது, வடக்கு மாகாணத்திலும் சரி, கிழக்கு மாகாணத்திலும் சரி, - நீங்கள் இன ரீதியாக ஆட்களைச் சேர்ப்பதன்மூலம் எங்களுடைய பிரதேசத்தில் இருக்கக்கூடிய பிரச்சினைகளைச் சுமுகமாகத் தீர்க்கக்கூடியதாயிருக்கும். ஏனென்று சொன்னால், சில மாவட்டங்களில் கல்வி வலயங்களுக்கு வலயக் கல்விப் பணிப்பாளர்களை நியமிக்கமுடியாத ஒரு நிலைமை இருக்கின்றது. ஆகவே, நீங்கள் இதனைக் கவனத்தில் கொள்ளவேண்டும்.

அதேபோன்று, போர்க் காலத்திலே ஆசிரியர் பற்றாக்குறை, போக்குவரத்துப் பிரச்சினைகள் உட்பட பல்வேறு நெருக்கடிகளுக்கு மத்தியில் நீண்டகாலமாக - கிட்டத்தட்ட 15 வருடங்களுக்கு மேலாக - தொண்டர் ஆசிரியர்களாகப் பணியாற்றிவர்களுக்கு நிரந்தர நியமனங்கள் வழங்கப் படவேண்டும்.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, උතුරු නැඟෙනහිර ස්වේච්ඡා ගුරුවරුන්ගේ ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙනුත් දැන් කැබිනට් පත්‍රිකාවක් සකස් කර තිබෙනවා.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

*நன்றி! கௌரவ அமைச்சர் அவர்களே!*

அதேபோன்று, நாட்டின் எதிர்காலத்துக்கு முன்பள்ளி மாணவர்கள் என்பது முக்கியமானவர்கள். அந்த வகையில் முன்பள்ளிச் சிறார்களுக்கான கல்வி என்பது மிகமிக முக்கிய மானது. இன்று வடக்கிலும் கிழக்கிலும் உள்ள முன்பள்ளிச் சிறார்களுக்குக் கல்வி கற்பிக்கின்ற ஆசிரியர்கள் மிகக் குறைந்த ஊதியத்தையே பெறுகின்றார்கள். ஆகவே, இவர்களுக்கென நிரந்தமான ஒரு திட்டத்தை வகுக்கவேண்டியிருக்கின்றது. ஏனென்றால், இந்த முன்பள்ளி ஆசிரியர்கள் போக்குவரத்து வசதிகள் இல்லாமல் - சைக்கிள் வசதிகள்கூட இல்லாமல் - கஷ்டப்படுகின்ற நேரத்தில், அவர்களுக்கென அரசாங்கம் ஒரு நிரந்தர சம்பள அளவுத்திட்டத்தை வகுக்கவேண்டுமென்று நான் இந்த நேரத்திலே கேட்டுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, you have only two more minutes.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

அடுத்தபடியாக, கல்வி நிர்வாக சேவை தரம் IIIக்கு சேவை மூப்பின் அடிப்படையில், பதவிகள் வழங்கப்பட வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். இந்தப் பரீட்சையிலே சித்திபெற்ற தரம் I அதிபர்களுக்கு நியமனம் வழங்குவதற்கான ஏற்பாடுகள் நடைபெறுகின்றன. இதன்மூலம் கடமை நிறைவேற்று உத்தியோகத்தர்களாகக் கடமையாற்றும் கோட்டக் கல்விப் பணிப்பாளர்கள், உதவிக் கல்விப் பணிப் பாளர்களுக்கு முன்னுரிமை அல்லது சலுகை வழங்கவேண்டும் என்று நான் இந்த நேரத்திலே கேட்டுக்கொள்கின்றேன்.

இன்னும் சில விடயங்கள் பற்றிக் குறிப்பிட வேண்டியிருந்தும் எனக்கு நேரம் போதாத காரணத்தினால் அவற்றை இப்போது எடுத்துக்கூற முடியவில்லை. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, நான் இங்கு குறிப்பிட்ட முக்கியமான சில விடயங்களை - பண்டாரிகுளம் விபுலானந்த கல்லூரியின் மைதானம் பற்றிய விடயம், அதேபோன்று விமானப் படையின் கட்டுப்பாட்டின்கீழ் இருக்கின்ற இறம்பைக்குளம் மகளிர் கல்லூரியின் மைதானத்தை விடுவித்தல், பலாலி ஆசிரியர் கலாசாலையை இராணுவத்திடமிருந்து விடுவித்தல் போன்றவற்றை - நீங்கள் செய்துகொடுப்பதன் ஊடாகத்தான் வடக்கு மாகாணத்திலே கல்வியைச் சீராகக் கொண்டுசெல்ல முடியும் என்று கூறிக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி!

[අ.භා. 1.33]

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා**
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ වැදගත්ම විෂයක අය වැය කාරක සභා අවස්ථාවේ දී කථා කරන මේ මොහොතේ විනාඩි 4ක් හෝ 5ක් වුණත් කථා කළ යුතුය කියන අදහසින් තමයි මම ඉදිරිපත් වුණේ. විශේෂයෙන්ම යහපාලන රජය තුළින් පත් වුණු අපේ අධ්‍යාපන ඇමතිතුමා, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ උපදෙස් මත මේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන්, අවුරුදු සිය දහසකට ගැළපෙන විධියට අධ්‍යාපනය වෙනුවෙන් යම්කිසි ආරම්භයක් කර තිබෙනවා. එයට දායකත්වයක් දෙන කෙනෙක් හැටියට ඒ ගැන යම්කිසි කැමැත්තක් තිබෙන නිසා තමයි මම කථා කරන්නේ. එහෙම නැතිව සංඛ්‍යා ලේඛන අනුව කථා කරන්න ගියොත් කාලය මදි වෙනවා. කොයි හැටි වෙතත් අය වැය පොතේ තිබෙන, අධ්‍යාපනය වෙනුවෙන් දෙන දේවල්, කරන දේවල් ගැන බොහෝ දෙනෙක් කථා කළා. මට තිබෙන කාලය අඩු නිසා මා ඒ ගැන විස්තර කරන්නට යන්නේ නැහැ. ඒ සියල්ල ඉතා වැදගත් දේවල් හැටියට මා මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ළඟම පාසල හොඳම පාසල" වැඩ පිළිවෙළ යටතේ පළාත් සහා හෝ ජාතික පාසල්ය කියා වෙන් කිරීමක් නැතිව මේ වනකොට එම පාසල්වල කටයුතු කෙරෙමින් පවතිනවා. අපේ මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ සෑම පාසලකටම ගරු ඇමතිතුමා විසින් මධ්‍යම රජය විසින් විවිධ කාර්යන් සඳහා ලබා දෙන මුදල් සියල්ලක්ම ලබා දී තිබෙන නිසා බොහෝ පාසල්වල ඉදි කිරීම් සහ භෞතික සම්පත්වල කටයුතු දැන් ආරම්භ වෙලා තිබෙනවා. අප මෙතෙක් කල් අධ්‍යාපනය ගැන කථා කළත්, කාගෙත් ඇඟට වදින විධියට අධ්‍යාපනය වෙනුවෙන් යම් කිසි දෙයක් කරන්නට මේ අය වැයෙන් මුදල් වෙන් වෙලා තිබෙනවා. වෙනදාට අධ්‍යාපනය ගැන කථා කළේ එක්තරා පිරිසක් විතරයි. අද මේ වන විට බොහෝ පිරිසක් අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කර තිබෙනවා.

[ගරු එඩ්වඩ් ගුණසේකර මහතා]

මන්ත්‍රීවරයෙකුට විනාඩි 4 බැගින් වෙන් වුණෙත් බොහෝ අය කථා කරන්න වෙලාව ඉල්ලපු නිසයි. ඒ තරමට මේ රටට, ලෝකයට ගැළපෙන විෂයක් තමයි අධ්‍යාපනය කියන්නේ. සෑම මහජන නියෝජිතයකුම අද එය තේරුම් ගෙන තිබෙනවා. එම නිසා මේ රටේ දෙමවුපියන්, දෙකෝටියක් වෙච්ච මේ රටේ මහජනතාව සියලු දෙනාම සූදානම් වෙන්න වෙනවා, මේක අමාත්‍යාංශයකට, රටකට , ආණ්ඩුවකට භාර නොදී මේක හරි හැටියට ඉදිරියට අරගෙන යන්න. මොකද, මේ රට ප්‍රපාතකයට වැටිලා තිබෙන මොහොතකදී අපේ රට ගොඩනඟා ගන්න පුළුවන් වෙන්නේ, මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කළොත් විතරයි. ඒ නිසා රජයක් හැටියට ගරු ඇමතිතුමා මේ වෙනුවෙන් කර තිබෙන කැප කිරීම, අපේ රටේ නායකයින් දෙදෙනා කර තිබෙන කැප වීමේ ප්‍රතිඵලයේ අස්වැන්න නෙළා ගන්න පුළුවන් වෙන්නේ මේ රටේ දෙමව්පියන් සහ දූවා දරුවන් සියලු දෙනාම එකතු වුණොත් විතරයි. එහෙම නැතිව විවිධ දේශපාලන කෝණවලින් බලමින්, විවිධ අවශ්‍යතාවන්වලට අනුව පාසල්වල කඩා කප්පල්කාරී වැඩවල නොයෙදිය යුතුයි. අද වනකොටත් බොහෝ පාසල් වල තවමත් කල්ලි වාද තිබෙනවා.

ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමා - බස්නාහිර පළාතේ හිටපු මහ ඇමතිතුමා - මට කලින් කථා කළා. ඇත්තම කියනවා නම් මීනුවන්ගොඩ කලාපයේ ජාතික පාසල් දෙකක් තිබෙනවා. ඒවායේ අධ්‍යාපන මට්ටම පිළිබඳව බැලුවොත්, ප්‍රතිඵල ඉතාම පහළ මට්ටමකයි තිබෙන්නේ. අප ඒ ප්‍රදේශවල මන්ත්‍රීවරුන් වශයෙන් කටයුතු කරද්දි අපට ඒ සම්බන්ධයෙන් ලොකු අපහාසයක්, අපවාදයක් විඳින්නට සිදු වෙනවා. නමුත් අපි පාසල්වල උගන්වන අය නොවෙයි. අපට තිබෙන්නේ ඒවා ගැන සොයා බලන එකයි. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමා මේ කරන කැප කිරීම, මුදල් වෙන් කිරීම, පරිත්‍යාගය සහ ඔබතුමාගේ දර්ශනය තුළින් ලොකු ප්‍රතිඵලයක් ගන්න නම් පාසල් තුළ කෙරෙන වැරදි ක්‍රියා ගැනත් සොයා බැලිය යුතු වනවා. අද ඔබතුමාට පමණක් නොවෙයි මේක ඇහෙන්නේ. අද අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන් පිරිසක් මේ ගැලරියේ නිලධාරි කුටියට පැමිණ සිටිනවා. මා ඉගෙන ගත්තේ මීනුවන්ගොඩ ප්‍රදේශයේ පාසල්වලයි. ඒ නිසා මට රටම හදන්න බැරි වුණත් අප ජීවත් වෙන ප්‍රදේශයේවත් පාසල්වල තත්ත්වය දියුණු කර එහි ප්‍රතිඵල ගත්තොත් -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා**
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
හොඳයි, බොහොම ස්තුතියි.

අපට ඒ කැප කිරීම කරන්නට සිදු වනවා. එතැනින් එහාට ඔබතුමාට අදාළ නැතත් තවත් කරුණක් ගැන කියන්නට ඕනෑ. පිරිවෙන් අධ්‍යාපනයට මුදල් වෙන් කර තිබෙනවා. සියලු දේවල් කැප කරලා කෝටියක් සීලය ආරක්ෂා කරන්න ආපු ස්වාමීන් වහන්සේලා විශ්ව විද්‍යාලවලට යවනවාට වඩා පිරිවෙන්වලම යැවීම වැඩි කර ගත්තොත් අපේ බෞද්ධාගම ආරක්ෂා කර ගන්න පුළුවන් වේවි කියලා මා හිතනවා. විශ්වවිද්‍යාලවලට ගිය හාමුදුරුවරුන් ගොඩගහගෙන, ලිප්ටන් වට රවුමෙයි, කොටුවේ ස්ටේෂන් එක ළඟයි සිවුරු පැත්තක දමලා කරන උද්ඝෝෂණ අප දැකලා තිබෙනවා. එවැනි දේවලින් හාමුදුරුවන්ට තිබෙන තත්ත්වය නැති වෙලා තිබෙනවා. බෞද්ධයන් හැටියට අපට එයින් ලොකු අපහාසයක්, අපවාදයක් මුළු ලෝකයෙන්ම ලැබෙනවා. ඒක නැති කරන්න වැඩ පිළිවෙළක් යොදා ගන්නවා නම් ඉතා හොඳයි.

අවසාන වශයෙන්, මේ කාරණය ගැනත් මා කියන්න ඕනෑ. පාසල් ශිෂ්‍යයන්ට Tab පරිගණක දෙන එක ඉතා හොඳයි. ලෝකයේ දියුණුවත් එක්ක අපි ඉස්සරහට යන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමෙක් කිව්වා, අපි අද Tab උපකරණය block කළත්, අතේ තිබෙන දුරකථනයෙන් දරුවො ඕනෑ තරම් අනවශ්‍ය දේවල් දකිනවාය කියා. ඒ නිසා අප එයින් එහාට ඒ ගැනත් කල්පනා කළ යුතුව තිබෙනවා. පසුගිය කාලයේ ජනාධිපතිතුමාගේ වෙබ් අඩවියට පාසල් ශිෂ්‍යයකු ඇතුළු වෙලා තිබුණා. දක්ෂකම් තිබුණත් අනවශ්‍ය විධියට ඒවා පාවිච්චි කරන දරුවන් පාලනය කරන්නත් ක්‍රමයක් අපි හදා ගන්න ඕනෑය කියන එකත් විශේෂයෙන් මතක් කරනවා. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබුණත්, මට මේ වචන ටික හරි කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තිතුවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමා දරන වෙහෙස මම ඉතාම අගය කොට සලකනවා. මේ රටේ අධ්‍යාපනය ආරම්භ කළ කාලයේ සිට මෙතෙක් කල් කියැවුණු, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා වැනි අය අතරට වර්තමාන අධ්‍යාපන ඇමැති අකිල විරාජ් කාරියවසම් කියන නමත් තව අවුරුදු පහමාරක් පමණ ගත වන විට ඇතුළත් කර ගන්නය කියන විශේෂ ඉල්ලීම කරමින්, ඔබතුමාට සුබ පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි.

මීළඟට, ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.39]

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට, මේ සමාජයට, මේ දේශයට බලපාන ඉතා වැදගත් විෂයක් වන, "අධ්‍යාපනය" පිළිබඳ කාරක සභා අවස්ථාවේදී අදහස් කිහිපයක් එකතු කරන්න ලැබීම ගැන මා සතුටු වනවා. විශේෂයෙන්ම, ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා අධ්‍යාපනය පිළිබඳව වටිනා අදහස් හා යෝජනා රාශියක් ඉදිරිපත් කළා. කොහොම වුණත්, අධ්‍යාපනය දියුණු වන තරමට, අධ්‍යාපනයට වැඩි වැඩියෙන් ආයෝජනය කරන තරමට, අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි වැඩියෙන්ම අවධානය යොමු කරන තරමට තමයි රටක අනාගතය, රටක සංවර්ධනය, රටක දියුණුව අපට බලාපොරොත්තු වෙන්න පුළුවන්කම ලැබෙන්නේ කියලා අපි දන්නවා. පසු ගිය කාලයේ, -දැනට අවුරුදු දෙකකට විතර කලින්- අධ්‍යාපනය සඳහා වෙන් කළ මුදල ප්‍රමාණවත් නැහැ, ඒ නිසා මේ රටේ සංවර්ධනය වෙනුවෙන්, අනාගතය වෙනුවෙන්, අනාගත ආයෝජනය වෙනුවෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6 දක්වා ප්‍රමාණයක් වෙන් කරන්න කියලා සමාජයේ කතිකාවතක් නිර්මාණය වෙලා තිබුණා. මේ සංවාදය මතුවීමේදී අප රටේ ප්‍රජාව

-විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන්, සිවිල් ජනතාව, රාජ්‍ය නොවන සංවිධාන - ඉදිරියෙන් හිටියා. හැබැයි, යහ පාලන ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් විධියට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක මුදලක් වෙන් කරලා එකඟතාව පළ කළා. නමුත්, 2016 අය වැයෙන් අධ්‍යාපනය සඳහා මුදල් වෙන් කිරීමේදී රුපියල් බිලියන 250ක් වෙන් කළා කියලා කිව්වාට, එම ගණන් හදලා තිබෙන්නේ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාගේ යුගයේ ඉඳලා ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීමට වෙන් වූ මුදලුත් එක්කයි කියලා අපි හොඳාකාරවම දැක්කා.

කෙසේ නමුත්, පසු ගිය වසරේ රුපියල් බිලියන 185.97ක් අධ්‍යාපනය සඳහා වෙන් කළත්, ආසන්න වශයෙන් වියදම් කිරීමට හැකි වෙලා තිබෙන්නේ රුපියල් බිලියන 40කට ආසන්න මුදල් ප්‍රමාණයක් කියලා සඳහන් වනවා. කොහොම නමුත්, මුදල් ඇමතිතුමා අය වැය කථාව ආරම්භයේදීම අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කළා. අධ්‍යාපනය සඳහා පසු ගිය අය වැයෙන් මේ වසරට වෙන් කරපු සම්පූර්ණ මුදල භාවිතයට නොගත්ත නිසා, 2017 වසරට අධ්‍යාපනය සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 90,000යි වෙන් කර තිබෙන්නේ. ඒ අනුව, 2016 වසරට සාපේක්ෂව, 2017 වසරට අඩුවෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. හැබැයි, එතුමා සඳහන් කළා රුපියල් මිලියන 17,480ක් අතිරේක මුදල් ප්‍රමාණයක් වෙන් කරනවා කියලා. මේ රටේ අනාගතය වෙනුවෙන්, මේ රටේ දරුවන් වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යතුමාට විශාල කාර්යභාරයක් කරන්න තිබෙනවා. මොකද, 2016 වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කරපු මුදල් වියදම් කරන්න එතුමා අසමත් වෙලා තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව සම්පූර්ණයෙන්ම වැරදියි. මම ඔබතුමාගේ කථාවට බාධා කරන්නේ නැහැ. අපි මොකක්ද කළේ, මොකක්ද කරන්න යන්නේ කියලා මම මගේ කථාවේදී පැහැදිලි විස්තරයක් කරන්නම්.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

බොහොම හොඳයි. තමුන්නාන්සේගේ කථාවේදී ඒක ඉදිරිපත් කරන්න.

අපි දන්නවා අධ්‍යාපනය සඳහා රේඛීය අමාත්‍යාංශය වාගේම පළාත් අමාත්‍යාංශ 9ක් තිබෙන බව. අධ්‍යාපන අමාත්‍යතුමාට අමතරව පළාත් අධ්‍යාපන ඇමතිවරුන් 9 දෙනෙකු සිටිනවා. ඒ වාගේම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්, -රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා හැරුණාම- පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, විෂයයන් සම්බන්ධ විෂය ප්‍රධාන සහකාර අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශක මහත්වරුන් සහ ලක්ෂ 2කට වැඩි ප්‍රමාණයක් ගුරුවරුන් ඉන්නවා. ඒ අනුව මේ ක්ෂේත්‍රයේ විශාල සම්පත් ප්‍රමාණයක් තිබෙනවා, විශාල සම්පත් දායකයින් පිරිසක් ඉන්නවා. සැලසුම් සහගතව, ඉලක්ක සහගතව ලැබෙන ප්‍රතිපාදන වියදම් කරලා අධ්‍යාපනය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කරන්නට ඔබතුමාට හැකි වෙන්නට ඕනෑ.

කෙසේ වෙතත්, සමහර කරුණු කාරණාවලදී ඔබතුමා එඩිතරව යම් යම් තීන්දු තීරණ අරගෙන තිබෙනවා. ස්ථාන මාරුවීම් ලැබ එන වෛද්‍යවරුන්ගේ දරුවන් පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමේදී සුපිරි විදුහල්වලට ඇතුළත් කිරීමට අවස්ථාව දෙන ලෙස කරන ලද ඉල්ලීම හරි හෝ වැරදි වුණත් තමුන්නාන්සේ ඒ ප්‍රශ්නයේදී එඩිතරව යම් තීන්දුවක සිටියා. අපි එය අගය කරනවා. අධ්‍යාපනය සම්බන්ධයෙන් මතු වන ගැටලුවලදී, ප්‍රශ්නවලදී, අභියෝගවලදී ඒ විධියට ඍජුව සිටීම වැදගත් කියන කාරණය මම මේ වෙලාවේදී සිහිපත් කරනවා.

අපි දන්නවා, පාසලක් කියලා කියන්නේ සමාජ ප්‍රගමනයේ කේන්ද්‍රස්ථානය බව. අධ්‍යාපනය කියන්නේ දැනුම විතරක් නොවෙයි. දැනුමට අමතරව සාරධර්ම, සදාචාරාත්මක ඇවතුම් පැවතුම්, ආකල්ප පරිවර්තනයන් වාගේම ක්‍රියාශීලී හැකියාවන් කියන මේ සියල්ලම අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇතුළත් වෙලා තිබෙනවා. නමුත් අද සමාජය ගමන් කරන්නේ, දෙමවුපියන් අපේක්ෂා කරන්නේ, බොහෝ වෙලාවට පාසල වැඩි අවධානය යොමු කරන්නේ දැනුම ලබා දෙන්නයි. දැනුම ලබාදීම වැදගත්. දැනුම අවශ්‍යයි. නමුත් දරුවන් මතකය වර්ධනය කරගෙන හෝ කට පාඩම් කරගෙන විභාගය සමත්වීමට තමයි උත්සාහ ගන්නේ. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමත් වෙලා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබලා ඉහළ රැකියා ලබා ගැනීම දරුවන්ගේ අපේක්ෂාව වුණත්, අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ විෂය කරුණු මත පදනම් වුණු දැනුම පමණක් නොවෙයි, ආකල්ප පරිවර්තනය සහ ක්‍රියාශීලී, නිර්මාණශීලී චින්තනයක් සහිත දරුවන් බිහි කිරීමයි. එම නිසා අධ්‍යාපනයේ බොහෝ වෙනස්වීම් සිදු විය යුතු වෙනවා. විශේෂයෙන්ම ලෝක රටාව අනුව දරුවන්ගේ දැනුම අලුත් වෙන්නට ඕනෑ, දැනුම වෙනස් වෙන්නට ඕනෑ. ජාත්‍යන්තර ප්‍රවණතා, අනාගත ලෝකයේදී ඇති වන අභියෝග පිළිබඳව අවධානයකින් සහ අවබෝධයකින් ඒවාට විසඳුම් සපයන්නට පුළුවන් අධ්‍යාපන ක්‍රමයක් අපි සකස් කළ යුතුව තිබෙනවා.

සන්නිවේදනයේ සහ පරිගණක තාක්ෂණයේ උච්චතම අවස්ථාවට, ඉහළම අවස්ථාවට වර්තමාන ලෝකය පත් වෙලා තිබෙනවා. එම නිසා දරුවන්ට සජීවී පන්ති කාමරය තුළ අත් දැකීම් ලබන්නට නම්, නිරීක්ෂණ, පරීක්ෂණ, නිගමන තුළින්, තමන්ගේ අත් හදා බැලීම් තුළින් දැනුම උකහා ගන්නට නම් නවීන තාක්ෂණ මෙවලම්, උපකරණ පිළිබඳව දැනුම අවබෝධය වාගේම පරිහරණය පිළිබඳව අවබෝධය තිබිය යුතුයි.

ඒ අනුව බලන විට, මෙවර අය වැයෙන් දරුවන්ට සහ ගුරුවරුන්ට Tabs ලබාදීම සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීම බොහොම වැදගත් යෝජනාවක් විධියට අපි දකිනවා. නමුත් එයින් අහිතකර ප්‍රතිවිපාක මතු වෙන්නත් පුළුවන්. දරුවන්ව දැනුවත් කිරීම හරහා අවබෝධයකින් යුතුව අධ්‍යාපනයේ ප්‍රයෝජනය සඳහා මේවා භාවිත කිරීමට උපදෙස් දීම වැදගත් වෙනවා.

අපේ ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමා සඳහන් කළ විධියට දරුවන්ට Tabs ලබා දීම විතරක් ප්‍රමාණවත් නැහැ, ඊට අමතරව ඒ අයට අන්තර්ජාල පහසුකම් ලබා දිය යුතු වෙනවා. පෞද්ගලික අංශයට හෝ වෙනත් සේවා සපයන්නන්ට ඒ සඳහා ආරාධනා කළාට ඒ අය නොමිලයේ අන්තර්ජාල පහසුකම් ලබා දෙයි කියා අපට හිතන්නට අමාරුයි. ඒ සඳහා රජයේ අවධානය යොමු කළ යුතුයි. අන්තර්ජාල පහසුකම් සඳහා බදු සියයට 25 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම "වැට්" බදුත් වැඩි වුණා. මීට පෙර සඳහන් කළ විධියට බදු සියයට 40කින් වැඩි වුණොත් දරුවන්ට මේ උපකරණවලින් ප්‍රයෝජන ලබා ගැනීමට තිබෙන අවකාශය සීමා වෙන්නට ඉඩ කඩ තිබෙනවා.

ඒ එක්කම අපි දරුවන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්නට ඕනෑ. මොකද, අධ්‍යාපනය කියන්නේ දැනුම පදනම් කර ගැනීම විතරක් නොවෙයි, ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළ ඒවා අත්හදා බැලීම් සිදු කරන්නටත් අවශ්‍ය වෙනවා.

[ගරු විජිත බේරුගොඩ මහතා]

අද ලෝකයේ සාක්ෂරතාව අතින් ලංකාව ඉන්නේ බොහොම ඉහළම තැනකයි. ඒ අතින් අපට සතුටු වෙන්න පුළුවන්. අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දරුවන් හතළිස් ලක්ෂයකට අධික ප්‍රමාණයක් ඉන්නවා. ගුරුවරු දෙලක්ෂයකට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. මේ ගුරුවරුන්ගෙන් ලබාගන්න පුළුවන් සේවය තව තවත් ඉහළින් ලබාගැනීම අවශ්‍යයි. ගුරු වෘත්තියට ගෞරවනීය තත්ත්වයක් ලබාදෙන්න ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරලා, ශ්‍රේණි ක්‍රමයක් ආරම්භ කරලා, ගුරුවරුන්ට වැටුප් ක්‍රමයක් සකස් කළේ 1994න් පසුවයි. අප අද ඒ ගැන සතුටු වෙනවා. ගුරුවරුන්ගේ වැටුප් විෂමතා තිබෙනවා නම් ඒවා ඉවත් කරලා, ඒ අයගේ වෘත්තියට, වෘත්තියේ වටිනාකමට ගැළපෙන විධියේ වැටුප් ක්‍රමයක් සකස් කරන්න කියා යෝජනා කරන්න අප බලාපොරොත්තු වෙනවා. මොකද, ගුරුවරයාගේ ගෞරවය හා සමාජ වටිනාකම් වැඩි වුණොත් තමයි, ඔහුට තෘප්තිමත්ව තමන්ගේ අධ්‍යාපනය, තමන්ගේ මහ පෙන්වීම දරුවන්ට ලබාදෙන්න පුළුවන්කම ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විභාග ප්‍රතිඵල දිහා බැලුවාම දැනටමත් ඒ ගුරුවරු කැපවීමකින් සහ ඕනෑකමින් වැඩ කරන බව අපට පේනවා. එක්දහස්නවසිය අනූ ගණන්වල සියයට 20ක් වාගේ ප්‍රමාණයක් තමයි අපොස (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වුණේ. මේ වන විට පළාත් මට්ටමින්, කලාප මට්ටමින්, පාසල් මට්ටමින් සියයට 60, 65, 70 දක්වා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල ඉහළ නැංවිලා තිබෙනවා. අනාගතයේදී මේ ප්‍රතිඵල තව තවත් -සියයට සියය දක්වා වුණත්- ඉහළ නංවන්න ගුරුවරුන්ට හැකියාව ලැබෙයි. අපොස (උසස් පෙළ) විභාග ප්‍රතිඵල දිහා බැලුවාමත් අපට පෙනෙනවා සියයට 50කට ආසන්න ප්‍රමාණයක් එම විභාගය සමත් වන බව. හැබැයි, විශ්වවිද්‍යාලවලට ගැනීම නම් සීමා වෙනවා. 25,000ක් පමණ තමයි වර්ෂයකට විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගන්නේ. නමුත්, ද්විතීයික සහ ප්‍රාථමික අධ්‍යාපනය පුළුල් වන තරමට උසස් අධ්‍යාපනය -විශ්වවිද්‍යාල අධ්‍යාපනය- පුළුල් වීම බොහොම වැදගත් වෙනවා. ඒ වාගේම, අධ්‍යාපනය තුළින් සහතික ලබාගැනීම විතරක් ප්‍රමාණවත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සාමාන්‍ය පෙළ, උසස් පෙළ විභාග සහතික, උසස් අධ්‍යාපනය තුළින් උපාධි සහතික ලබාගැනීම විතරක් සෑහෙන්නේ නැහැ. ඒ ලබා ගන්නා දැනුම ප්‍රායෝගික දැනුමක් වෙන්න ඕනෑ. කට පාඩම් කිරීම මත, දැනුම සොයාගෙන ටියුෂන් පන්ති ගණනේ රස්තියාදු වෙලා ඒ දැනුම කෙසේ හෝ ලබාගෙන විභාග සමත් වෙලා ප්‍රතිඵල ලබා ගත්තත් ඒක ප්‍රායෝගික වෙන්න ඕනෑ. න්‍යාය විතරක් ඉගෙන ගත්තාට ප්‍රයෝජනයක් වන්නේ නැහැ, රටක් සංවර්ධනය වෙන කොට, ඉස්සරහට යන කොට ප්‍රායෝගික දැනුම හා න්‍යායාත්මක දැනුම කියන කාරණා දෙකම සම්පූර්ණ වෙන්න ඕනෑය කියන කාරණය අප සිහිපත් කරනවා.

හැම වර්ෂයකම අය වැයෙන් අධ්‍යාපනයට මුදල් වෙන් කරනවා. විශේෂයෙන්ම භෞතික සම්පත්, යටිතල පහසුකම් ලබාදෙන්න මුදල් වෙන් කරනවා. ඒ වාගේම ගුරුවරුන්ගේ පුහුණුව සඳහා මුදල් වෙන් කරනවා. මේ විධියට දරුවන්ගේ අධ්‍යාපනය සඳහා විවිධාකාරයෙන් මුදල් වෙන් කළත්, මේ මුදල්වලින් සැබෑ විධියටම ප්‍රයෝජනයක් ගන්නවාද කියන එක ගැන අපට ගැටලුවක් තිබෙනවා. දෙමව්පියන් තම දරුවන් වෙනුවෙන් පෞද්ගලික උපකාරක පන්ති ගණනේ රස්තියාදු වෙන කොට, ඒ සඳහා කාලය, මුදල් වැය කරන කොට පාසල මොකක්ද කරන්නේ? "පාසල ඉගැන්වීමේ කාර්යය හැරුණාම අනික් සියලුම දේවල් කරනවා" කියා පුවත් පතක සඳහන් වෙලා තිබෙනවා මා දැක්කා. එහෙම කියා තිබෙන්නේ මේ විධියට පෞද්ගලික පන්තිවලට, ටියුෂන් පන්තිවලට ඒ තරම් ප්‍රමාණයකට ළමයි ඇදෙන නිසායි. ටියුෂන් පන්තිවලට ළමයි ඇදෙන එක අපට වළක්වා ගන්න අමාරුයි. දෙමව්පියන්ගේ අපේක්ෂාව පාසලෙන් ලබා ගන්න බැරි දැනුම, අවබෝධය පෞද්ගලික උපකාරක පන්තිවලින් හෝ ලබා ගෙන තමන්ගේ දරුවාට තමන්ට වඩා හොඳ අධ්‍යාපනයක් ලබාදීමයි. ඒක දෙමව්පියන්ගේ සැබෑ ප්‍රාර්ථනාවයි. නමුත්, අධ්‍යාපනය සර්ව සම්පූර්ණයෙන්ම පාසලින් ලබාදෙන්න අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කරන්න රජයක් විධියට ඔබතුමන්ලා විශේෂයෙන්ම කල්පනා කළ යුතු වෙනවා; ඒ සඳහා වැඩ කළ යුතු වෙනවා.

පසුගිය වසරේ පුහුණු වැඩසටහන්වලට රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබුණා. [බාධා කිරීමක්] ගුරුවරුන් සඳහා වන නිපුණතා වැඩසටහන්වලට රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබුණා. ගුරුවරුන් පුහුණු කිරීම වාගේම, ඔවුන්ගේ සමාජ වටිනාකම වැඩිදියුණු කරලා, ඒ අයගේ උපරිම කැපවීම පාසල තුළට යොමු කරවන්න ඕනෑ. ඒ වාගේම රජය පැත්තෙන් - අධ්‍යාපන අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු මට්ටමින්- අධීක්ෂණ කටයුතු පුළුල් කරලා, පන්ති කාමරයේ ඉගෙන ගන්නා ශිෂ්‍යයාට ශිෂ්‍ය කේන්ද්‍රීයව අධ්‍යාපනය ලබන්න පුළුවන් විධියට ඒ සියලු දේවල් කළමනාකරණය කරලා, ශිෂ්‍යයා අරමුණු කරගෙන දැවැන්ත මෙහෙයුමක් දියත් කළ යුතුය කියන කාරණයත් සිහිපත් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[1.54p.m.]

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி - தேசிய ஒருமைப்பாடு மற்றும் நல்லிணக்க இராஜாங்க அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - State Minister of National Integration and Reconciliation)
Mr. Presiding Member, it is my privilege today to participate in the Committee Stage Discussion on the Votes of the Ministry of Education. I am happy to note that the Hon. Minister of Finance has allocated in the Budget almost three times the allocation made in 2014, but this allocation of Rs. 90,000 million for 2017 reflects a reduction of the sum allocated in 2016. As the Hon. Minister says, the reason is that the Ministry of Education had underspent the full amount allocated last year. But the response of the Hon. Minister of Education was that the Treasury had failed to release the total amount of money on the due date. In view of this, I think the Ministry of Education should not be penalized since in the overall situation it will be tantamount to punishing school-going children. I would propose that the Hon. Minister of Finance move a Supplementary Estimate with a view to allocating the full amount requested by the Minister of Education.

I am happy to note that Rs. 5,000 million has been allocated to provide basic facilities to 1,000 schools in the country. What about the rest of the schools? They might feel discriminated. Therefore, please extend such basic facilities to all the schools irrespective of linguistic differences.

The allocation of Rs. 5,000 million to rent a maximum of 50 computers each to strengthen IT facilities in 3,500 schools is also commendable as much as providing Tabs to Advanced Level students and teachers.

The existence of 100 private schools including international schools will help boost education among 150,000 students. Although this would help lessen the burden that the Government has to shoulder in the field of education, I must also emphasize that charging of exorbitant fees from students by these international schools must be monitored and regulated.

I observe that Rs.250 million has been allocated to upgrade 25 schools in the plantation sector, but there must be a rationale adopted to upgrade all other estate schools as well so that they too would enjoy the benefits. The concept of this is that education facilities must be provided equally to all school-going children.

As a senior Member of this House representing the Colombo District for nearly 23 years, I would now like to turn my attention to the educational facilities provided to schools in the Colombo District. While pointing out the shortcomings in the facilities for education in all schools in Colombo District, I would particularly pinpoint the shortcomings prevailing in Muslim schools.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! The Hon. Shehan Semasinghe will now take the Chair.

***අනතුරුව ගරු කනක හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. KANAKA HERATH *left the Chair, and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, you may continue.

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
As per the recent surveys conducted by All Ceylon Muslim Educational Conference, All Ceylon Federation of Muslim League Youth Fronts and other educational bodies, the standard of education and facilities provided to Muslim Schools in Colombo leave much to be desired. As a result, the educational attainment of children in these Muslim schools falls far below the standard achieved by students in other schools in the Province.

Nevertheless, philanthropists like Al Haj Z.A.M. Refai, Chairman of Zam Gems, Haji Elyas Kareem, Chairman of EAM Maliban Textile (Pvt) Ltd and Dr. Fazli Nizar of All Ceylon Moors' Association, the World Memon Organization and the Serendib School Development Foundation have from time to time come forward to help Government to ease its burden by providing school buildings, laboratories, libraries et cetera for a few selected schools.

Schools which have served the community for 50 or 100 years, like the Muslim Ladies' College, Fathima Girls' College, Khairiya Muslim Girls' College, Hameed Al-Husseini College and Al-Hidaya Maha Vidyalaya have been beneficiaries of such benevolence in the recent past.

The Darus Salam Muslim Maha Vidyalaya which was originally named as "Denham School" is located in the highly populated Maligawatta area. As one who began the political career as a Member of Maligawatta Ward representing the Colombo Municipal Council, I am committed to provide every facility to this important educational institution as it would help the poor and the underprivileged in the area to keep abreast with the educational facilities enjoyed by the rest of the children in Colombo.

With this laudable objective in view, I took great pain to mobilize the well-to-do in the community to raise the standard of educational and curricular activities of this school. The response had been very encouraging. The World Memon Organization and the Serendib School Development Foundation have agreed to donate Rs. 250 million for the development of this school. We have drawn up a master plan with the approval of the Ministry of Education of the Western Provincial Council. The whole project is programmed in keeping with the requirements of the regional engineers, the School Development Society as well as the Old Boys' Association. I too have allocated a sum of Rs. 1 million from my personal funds to make this project a reality. I put up a four-storeyed building in Muslim Ladies' College at my expense.

These two organizations have helped the College by spending Rs. 14 million for a new building with a computer training centre, a fully-fledged teachers' resting room and with the payment of monthly allowances to seven voluntary teachers. Apart from these, conducting of extra classes to help the Ordinary and Advanced Level students and providing facilities for the development of sports activities were also included in this project.

I speak at this moment with a heavy heart, deep sorrow and with emotion. Should someone sabotage our well-intended project? I was born and bred in this place. I have a duty by the people of this area. I have a passion to provide the best facilities to the poor children of Maligawatta and raise the standard of education so that they would be equal to any other students coming out of more advanced schools in the capital city. I could not develop this school due to underworld interference in the

[ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා]

school. Even the building that was constructed by me and former MP, Mr. M.M. Zuhair was not even officially opened by us. Now, I have got the chance of bringing this school to a very high standard with the help of the World Memon Association and the Serendib School Development Foundation.

When the above project was to be executed, a certain politician in order to gain undue popularity had suddenly descended in the area to sabotage my scheme of work. Attempts have been made to suddenly bring this school under the new scheme "*Langama Pasala, Hondama Pasala*". I strongly objected to this move. There are various other schools like Al-Hidaya Maha Vidyalaya which could be brought and improved under the "*Langama Pasala, Hondama Pasala*" Concept. Hon. Minister, I brought this to your notice and you could not help me because of the pressure brought upon you by your Party member. So, I do not blame you.

I raise this important matter and appeal to you to reconsider your decision and spend that money to a school like, Al-Hidaya Maha Vidyalaya, so that the girls in Colombo Central will have a fully-fledged first class school. I sincerely hope that the Minister of Education would take serious note of this problem and allow us to implement our proposals for the welfare of Darus Salam Muslim Maha Vidyalaya, Maligawatta. We are prepared to even deposit in advance a sum of Rs. 100 million with the Department of Education in the Western Province to be spent for this project.

I must also point out at this stage of the existing vacancies for Moulavi teachers throughout the island. This matter is greatly agitating the Muslim community. Without proper religious guidance, no community could attain educational standard. There are a large number of Moulavis and Moulavias in the country who are waiting to fill these vacancies. From the time our Government came into power, we have been requesting the Minister of Education to fill these vacancies.

Sir, an ugly situation was created recently as a result of some misguided elements accusing that Madrasas and Quranic schools are spreading extremism.

This is completely a twist of the real situation that deliberately intended to spread hatred and misunderstanding among our sister communities. Like Pirivenas, Dhamma Schools, these Quranic Schools and Madrasas teach the Muslim children nothing but pure Islam based on the Holy Quran and the Sunnahs of the Holy Prophet. I know for certain that learned men from abroad have been invited from time to time to lecture at these institutions and nowhere it is recorded that they are propagandists of extremism. At a time when our "*Yahapalayanaya*" is making a steady progress in the path of reconciliation to build up a strong society based on goodwill and brotherhood, I strongly condemn the most irresponsible statement by these quarters who are definitely trying to sabotage the well-intended governance of this administration.

Therefore, I urge the Government to take firm action to put a stop to propaganda made by these anti-social elements and dispel the fears that are currently engulfing the Muslim community in various parts of the country.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon.Gnanamuthu Srineshan. You have 19 minutes.

[பி.ப. 2.05]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி அமைச்சுக்குரிய நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகின்றேன். எமது நாட்டின் கல்வித்துறையைப் பற்றிப் பார்க்கின்றபோது, அது முன்பள்ளி சார்ந்த கல்வி, ஆரம்பக் கல்வி, இடைநிலைக் கல்வி என்றும் இடைநிலைக் கல்வியில் கனிஷ்ட இடைநிலை, சிரேஷ்ட இடைநிலை என்றும் வகைப்படுத்தப்பட்டிருப்பதைக் காணலாம். எமது அரசியலமைப்பில் கொண்டுவரப்பட்ட 13வது திருத்தத்தின் பிரகாரம் மாகாணப் பாடசாலைகள், தேசியப் பாடசாலைகள் என்ற வகைப்படுத்தலும் காணப்படுகின்றது. அதேவேளை, அரிஸ்ரோட்டில் என்பவர், "புரட்சிக்குக் காரணம் சமத்துவமின்மை" என்றொரு கருத்தைக் கூறியிருக்கின்றார். அதாவது, கல்வியிலோ, பொருளாதாரத்திலோ, அரசியலிலோ, வேறு வாய்ப்புக்களிலோ சமத்துவம் அற்றுப்போகின்றபோதுதான் நாட்டில் புரட்சி ஏற்படுகின்றது என்பது அவருடைய கருத்தாகும். அதேவேளை நெல்சன் மண்டேலா அவர்கள், "சமூகத்தை மாற்றியமைப்பதற்கான வலிமையான ஓர் ஆயுதம் கல்வியாகத்தான் இருக்க முடியும்" என்றொரு கருத்தினைக் கூறியிருக்கின்றார்.

இன்றைய நிலையில் இந்த வரவு செலவுத் திட்ட ஒதுக்கீட்டினைப் பார்க்கின்றபோது, அண்ணளவாகக் குறிப்பிடுவதாக இருந்தால் சென்றமுறை கல்விக்காக 187 ஆயிரம் மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருந்தது; இம்முறை அண்ணளவாக 77 ஆயிரம் மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. எனவே, சென்ற முறையைவிட இம்முறை ஒதுக்கிய தொகை அண்ணளவாக இரண்டரை மடங்கால் குறைக்கப்பட்டிருக்கின்றது. நாங்கள் ஒன்றை விளங்கிக்கொள்ள வேண்டும். கல்வி என்பது உண்மையில் மனித வள அபிவிருத்தியை அடிப்படையாகக் கொண்டது. மனிதனை உச்சமான, பெறுமதியுள்ள ஒரு வளமாக மாற்றுவதற்குக் கல்வி முக்கியமான பங்காற்றுகின்றது. அதேபோன்றுதான் சுகாதாரமும் பங்காற்றுகின்றது. எனவே, ஒரு நாட்டில் மனிதனைச் செழுமைப்படுத்தி எடுப்பதற்கு, அவனை உச்சமான பயனுள்ள மனிதனாக்குவதற்குக் கல்வி முக்கியமாக இருக்கின்றபடியால் கல்விக்கான நிதி ஒதுக்கீட்டில் கைவைப்பது என்பது மனித வள அபிவிருத்தியைக் குறைப்பது போன்ற ஒரு முயற்சியாகத்தான் அமைய முடியும். எனவே, கல்விக்காக ஒதுக்கப்படுகின்ற நிதியைக் குறைக்கின்ற ஒரு போக்கு மனித வள அபிவிருத்தியைக் குறைக்கின்ற ஒரு போக்காகத்தான் இருக்கும். மனித வள அபிவிருத்தியைக் குறைக்கின்றபோது உச்சமான ஓர் அபிவிருத்தியை அடைய முடியாது.

ஒரு நாட்டில் பல்வேறுபட்ட வளங்கள் இருக்கின்றன. அதாவது, மனித வளம், பௌதிக வளம், நிதி வளம், கால

வளம், தகவல் வளம் என்று எல்லாம் வளங்களை நாங்கள் வகைப்படுத்துகின்றோம். இந்த வளங்களில் முக்கியமான வளமான மனித வளத்தினை விருத்தி செய்வதற்குக் கல்விக் கான நிதி ஒதுக்கீடு அதிகரிக்கப்பட வேண்டும். ஆனால், சென்றமுறை ஒதுக்கப்பட்ட நிதியைவிட இரண்டரை மடங்கு குறைக்கப்பட்டிருப்பதுபோன்று இம்முறை இந்த நிதி ஒதுக்கீடு அமைந்திருக்கின்றது. இதனை என்னால் ஏற்றுக்கொள்ள முடியாமல் இருக்கின்றது. அதேவேளை கல்வியில் ஒரு சமத்துவமான அபிவிருத்தியை, சமச்சீரான அபிவிருத்தியை ஏற்படுத்த வேண்டுமாக இருந்தால் அபிவிருத்தியடைந்த பாடசாலைகளுக்குக் கொடுக்கப்படுகின்ற நிதி வளத்தைவிட அபிவிருத்தியடையாத நிலையில் காணப்படுகின்ற பாடசாலை களுக்கு ஒதுக்கப்படுகின்ற நிதி வளத்தினை அதிகரித்துக் கொள்ள வேண்டும். அதாவது மேடாக இருக்கின்ற இடத்தில் மென்மேலும் கொட்டி மேடாக்கிக் கொள்வதைவிட பள்ளங்களாக இருக்கின்ற இடங்களில்தான் மென்மேலும் கொட்டிப் பள்ளங்களைச் சமப்படுத்திக்கொள்ள வேண்டும்.

இன்றைய நிலையில் பாடசாலைகளை நகரை மையமாகக் கொண்ட பாடசாலை, அபிவிருத்தியடைந்த கிராமங்களை மையமாகக் கொண்ட பாடசாலை, கஷ்ட, அதிகஷ்டப் பிரதேசப் பாடசாலை என்று வகைப்படுத்திக்கொண்டு செல்லலாம். இன்று கஷ்ட, அதிகஷ்டப் பாடசாலைகளின் அபிவிருத்தியில் கல்வி அமைச்சு கூடுதலான கவனத்தினைச் செலுத்த வேண்டியிருக்கின்றது. நான் மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்றவன் என்ற வகையில் மட்டக்களப்புப் பிராந்தியம் இரண்டு வகையாகத் துண்டிக்கப்பட்டிருப்பது எனக்குத் தெரியும். ஒன்று, வாவிக்குக் கிழக்குப்புறமாக இருக்கின்ற பிரதேசம்; மற்றையது வாவிக்கு மேற்குப் புறமாக இருக்கின்ற பிரதேசம். வாவிக்கு மேற்குப் புறமாக இருக்கின்ற பிரதேசங்கள் பெரும்பாலும் கஷ்ட, அதிகஷ்டப் பிரதேசப் பாடசாலைகளைக் கொண்டிருக்கின்றன. அதேபோன்று வாகரைப் பிரதேசத்தை எடுத்துக்கொண்டாலும் அங்கும் கஷ்ட, அதிகஷ்டப் பிரதேசப் பாடசாலைகள் காணப்படுகின்றன. கஷ்ட, அதிகஷ்டப் பிரதேசப் பாடசாலை களில் மாற்றங்களை ஏற்படுத்தாமல், வளர்ச்சியை ஏற்படுத் தாமல் நாங்கள் கல்வியில் அபிவிருத்தியைக் காண முடியாது. காயப்பட்ட இடங்களுக்குத்தான் மருந்து தடவவேண்டுமே யொழிய, காயமில்லாத இடங்களில் மருந்துகளைத் தடவுவதால் நாங்கள் அந்தக் காயங்களைக் குணப்படுத்த முடியாது. தற்போது இங்கு எமக்கருகில் கிழக்கு மாகாண முன்னாள் கல்வியமைச்சர் கௌரவ விமலவீர திசாநாயக்க அவர்கள் அமர்ந்திருக்கின்றார். அவர் அங்கு கல்வியமைச்சராக இருந்தபோது கணிசமானளவு அபிவிருத்தியை ஏற்படுத்தியவர் என்பதை நாங்கள் மறக்கவில்லை; மறுக்கவில்லை. அதேநேரத்தில், இந்த யுத்தத்திற்குப் பிற்பட்ட காலத்தில் வடக்கு, கிழக்கு மாகாணங்களின் கல்வி அபிவிருத்தியானது மிகவும் பின்தங்கிய நிலையில் இருப்பதை அறியக்கூடியதாக இருக்கின்றது. எனவே, கல்வியை வளர்த்தெடுப்பதாக இருந்தால் இந்தக் கஷ்ட, அதிகஷ்டப் பிரதேசப் பாடசாலை களை விசேட செயற்றிட்டங்கள் மூலமாக நாங்கள் அபிவிருத்தி செய்யவேண்டிய தேவையிருக்கின்றது.

அத்துடன், நான் இங்கு இன்னுமொரு விடயத்தைக் கூறவேண்டும். அதாவது முன்பள்ளிகள் என்ற விடயமானது மாகாண சபைகளுக்குப் பொறுப்பாக இருந்தாலும் அதிலும் ஒரு பாரபட்சமான நிலைமை காணப்படுகின்றது. நகரத்தை மையமாகக் கொண்ட முன்பள்ளி மாணவர்கள் வசதிவாய்ப்புக் களோடு கற்றுக்கொள்கின்ற ஒரு நிலைமையையும் இந்தக் கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்களில் பெயரளவில் முன்பள்ளிகள் என்று இருக்கின்ற அல்லது முன்பள்ளிகள் இல்லாத நிலையில் மாணவர்கள் கல்வி கற்கின்ற அல்லது கற்காத ஒரு நிலைமையையும் பார்க்கக்கூடியதாக இருக்கின்றது. எனவே, தேசிய கல்விக் கொள்கையினை வகுக்கின்றபோது முன்பள்ளி என்ற விடயத்தையும் பலப்படுத்தக்கூடிய விதத்தில் கொள்கை களை வகுத்துக்கொள்ள வேண்டும். ஏனென்றால், குழந்தைப் பருவத்தில் முன்பள்ளிக் கல்வி ஆரம்பிக்கின்றது. இந்தப் பருவத்தில் உளவியல் ரீதியாக அந்த மாணவர்களை அணுகிச் சரியாக வழிப்படுத்தாது விட்டால், அவர்கள் ஆரம்பக் கல்விக்குப் பொருத்தமற்றவர்களாகக்கூடிய ஒரு நிலைமை காணப்படுகின்றது. எனவே, முன்பள்ளி ஆசிரியர்களுக்கு நிரந்தர நியமனம் கொடுக்கக்கூடிய விதத்திலும் நிலையான சம்பளத்தைக் கொடுக்கக்கூடிய விதத்திலும் கவனம் செலுத்தி, மாகாண சபைகளை மத்திய அரசு ஆற்றுப்படுத்தவேண்டிய தேவையிருக்கின்றது.

அதேவேளை, ஆரம்பக் கல்வியில் பெருமளவில் ஆசிரியர் தட்டுப்பாடு நிலவுகின்றது. இன்று மட்டக்களப்பு, திருகோண மலை மாவட்டங்களிலும் மற்றும் மலையகப் பிரதேசங்களிலும் ஆசிரியர் தட்டுப்பாடு காணப்படுகின்றது. அதேபோல், தென்பகுதியில் சில இடங்களிலும் இப்படியான நிலைமை இருக்குமோ என நான் சந்தேகிக்கின்றேன். ஆகவே, இந்த ஆசிரியர் தட்டுப்பாட்டைச் சரியான நியமனங்கள் மூலமாகப் பூர்த்தி செய்யவேண்டியிருக்கின்றது. அண்மையில் தேசியக் கல்வியியல் கல்லூரியில் படிப்பை முடித்துவந்தவர்களுக்கு ஆசிரியர்களுக்கான நியமனங்கள் வழங்கப்பட்டிருந்தன. மட்டக்களப்பில் கூடுதலான வெற்றிடங்கள் இருந்தும்கூட அந்தப் பிரதேசத்தைச் சார்ந்த ஆசிரியர்கள் வெவ்வேறு மாவட்டங்களுக்கு அனுப்பப்பட்டிருந்தார்கள். இதனால், இன்றும் பல பாடசாலைகள் வெற்றிடங்களோடு இயங்கிக் கொண்டிருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது.

இன்னுமொரு விடயத்தையும் நான் சுட்டிக்காட்ட வேண்டும். க.பொ.த. சாதாரண தரப் - G.C.E. Ordinary Level - பரீட்சை எழுத இருக்கின்றவர்களுக்கு கணித பாடம் மிக முக்கியமாகும். ஆனால், கணித, விஞ்ஞான, ஆங்கில, தொழில்நுட்பப் பாடங்களைக் கற்பிப்பதற்குப் போதுமானளவு ஆசிரியர்கள் இல்லை. குறிப்பாக, கணித பாடம் கற்பிக்கின்ற ஆசிரியரே இல்லாத நிலையில் சில மாணவர்கள் G.C.E. Ordinary Level பரீட்சைக்குத் தோற்றுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமை அவதானிக்கப்பட்டுள்ளது. எனவே, கல்வியமைச்சர் அவர்கள் கணித, விஞ்ஞான, ஆங்கில, தொழில்நுட்பப் பாடங்களுக்குரிய போதுமான ஆசிரியர்களை கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்களுக்கு நியமனம் செய்வதில் கவனம் செலுத்தவேண்டும்.

அதேநேரத்தில், ஐந்தாம் தரப் புலமைப்பரிசில் பரீட்சை தொடர்பில் நான் சில கருத்துக்களைக் கூறவேண்டும். இந்தப் பரீட்சை மாணவர்களுக்கு ஒரு விஷப் பரீட்சையாக உள்ள தெனவும் அதேவேளை பெற்றோர்களுக்கு ஒரு கௌரவப் பரீட்சையாக உள்ளதெனவும் கல்வியாளர்கள் அல்லது புத்திஜீவிகள் கூறுகின்றார்கள். குறிப்பாக, இந்த scholarships பரீட்சைக்காக நகரப் பகுதிகளில் இருக்கின்ற பெற்றோர் தங்களிடமிருக்கின்ற வசதிவாய்ப்புக்கள் அனைத்தையும் பயன்படுத்தி நூற்றுக்கு நூறு வீதம் அல்லது 80 -90 வீதம் பிள்ளைகளைப் பயிற்றுவித்து, அதற்குரிய வெட்டுப்புள்ளியை அதிகரிப்பதற்குப் பாடுபடுகிறார்கள். அதேவேளை, கஷ்டப் பிரதேசத்திலிருக்கின்ற மாணவர்களுக்குச் சாதாரணமாகக் கற்பிப்பதற்குக்கூட ஆசிரியர்கள் இல்லாத நிலையில் அவர்கள் இந்தப் பரீட்சைக்குத் தோற்றுகின்றார்கள். இதனைப் பற்றி ஒரு கல்வியாளர் குறிப்பிடுகையில், "10 வீதமான பிள்ளை களை வெற்றிபெறச் செய்யவேண்டும் என்பதற்காக 90

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

வீதமான பிள்ளைகளைத் தோற்கடிக்கின்ற ஒரு பரீட்சையாக, ஒரு விஷமத்தனமான பரீட்சையாக இது அமைந்திருக்கின்றது" என்று தெரிவித்தார். இன்னும் சொல்லப்போனால், மாணவர்களுக்குத் தாங்க முடியாத சுமையினை அல்லது அழுத்தங்களைப் பிரயோகிக்கின்ற ஒரு பரீட்சையாகக்கூட இது அமைந்துவிடுகின்றது. குறிப்பாக, பெற்றோர்கள் ஒருபக்கமாகவும் ஆசிரியர்கள் மற்றும் பிரத்தியேக வகுப்பு எடுப்பவர்கள் இன்னொரு பக்கமாகவும் மாணவர்களை மிகவும் அழுத்தத்திற்கு உள்ளாக்குகின்றார்கள். முடிவு என்னவென்றால், 10 சதவீதமான மாணவர்கள் வெற்றி பெறுகின்றார்கள்; 90 சதவீதமான மாணவர்கள் தோல்வி அடைகின்றார்கள். இளம் பருவத்திலேயே அவர்கள்மீது உளவியல் ரீதியாகப் பாரிய தாக்கத்தை ஏற்படுத்தி, தாங்கள் இயலாதவர்கள் என்று எண்ணக்கூடிய அளவுக்கு இது ஒரு தோல்வி மனப்பாங்கை ஏற்படுத்துகின்றது. இவ்வாறு இந்தப் பரீட்சை அவர்களுக்கு ஒரு தாக்கத்தை ஏற்படுத்துவதனால் அது பற்றி மீளாய்வு செய்யவேண்டிய தேவை இருக்கின்றது.

உண்மையில் இந்தப் புலமைப்பரிசில் பரீட்சை ஏற்படுத்தப்பட்டது எதற்கென்றால், வறிய மாணவர்கள் இந்தப் பரீட்சையில் சித்தியடைந்து அதன்மூலமாகக் கிடைக்கின்ற நிதியினைக் கொண்டு தங்களுடைய கல்வியினை மேலும் விருத்திசெய்து கொள்வதற்காகத்தான். இன்று படித்த பெற்றோர் அல்லது மத்திய தர, உயர்தர வர்க்கத்தைச் சேர்ந்த பெற்றோர் தங்களுடைய பிள்ளைகள் கூடுதலான புள்ளிகளைப் பெறக்கூடிய விதத்தில் பிரத்தியேகமான வகுப்புக்களையும், தனிப்பட்ட வகுப்புக்களையும் வைத்து அந்தந்த மாவட்டங்களில் வெட்டுப்புள்ளிகளை உயர்த்தி விடுகின்றார்கள். இதனால் தொலைவிலுள்ள மாணவர்களுக்கு அந்த வெட்டுப்புள்ளியை எட்டுவது சாத்தியமற்றதாகி விடுகின்றது. ஏழைப் பிள்ளைகளுக்காக உருவாக்கப்பட்ட இந்த scholarships பரீட்சையானது இப்போது அவர்களுக்கு எட்டாக்கனியாக மாறிக் கொண்டிருக்கின்றது.

மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு பாவற்கொடிச்சேனை, தன்சேனை, இருநூறுவில், நாற்பது வட்டை போன்ற இடங்களில் சில பாடசாலைகள் காணப்படுகின்றன. அந்தப் பாடசாலைகளுக்குச் செல்வதற்குச் சரியான வழிகூட இல்லாத ஒரு நிலைமை காணப்படுகின்றது. வெள்ளம் ஏற்படுகின்றபோது அந்த வெள்ளத்தில் நீச்சலடித்துத்தான் ஆசிரியர்கள் செல்லவேண்டிய நிலைமை இருக்கின்றது. இந்தப் பாடசாலைகளில் படிக்கின்ற பிள்ளைகளும் பொதுவாக தேசிய மட்டத்தில் நடத்தப்படுகின்ற பரீட்சைகளுக்குத்தான் தோற்றுகின்றார்கள். அதேவேளை மட்டக்களப்பிலிருக்கும் வின்சன்ட் தேசிய பாடசாலை, புனித மைக்கல் பாடசாலை போன்ற வளர்ச்சியடைந்த, வசதியான பாடசாலைகளுக்கு வகுக்கப்படுகின்ற அதே வெட்டுப்புள்ளிதான் இந்த அதிகஷ்ட பிரதேசத்தில், அவர்களுக்குரிய ஆசிரியர்களும் இல்லாது வசதிவாய்ப்புக்களும் இல்லாது கற்கின்ற மாணவர்களுக்கும் வகுக்கப்படுகின்றது. அதனால் அங்கு நடத்தப்படும் இந்தப் பரீட்சையானது அவர்களுக்குப் பாரபட்சத்தை ஏற்படுத்து கின்ற, விஷமத்தனமான பரீட்சையாகும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු ෂෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SHEHAN SEMASINGHE *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Member, you may continue.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

எனவே, தரம் 5 புலமைப்பரிசில் பரீட்சை எந்த நோக்கத்திற்காகக் கொண்டுவரப்பட்டதோ, அந்த நோக்கம் நிறைவேற்றப்பட வேண்டும். அந்த வகையில் வறிய மாணவர்கள் அப்பரீட்சையின் மூலமாகப் பயன்பெறக்கூடிய விதத்தில் மாவட்ட ரீதியான வெட்டுப்புள்ளிகளைத் தவிர்த்து கஷ்ட, அதிகஷ்ட பிரதேசங்களிலுள்ள பிரதேச செயலக மட்டங்களுக்கமைய வெட்டுப்புள்ளிகளை மாற்றியமைக்க வேண்டும். அப்போதுதான் வறிய மாணவர்கள் புலமைப்பரிசில் பரீட்சை மூலமாகப் பயனடையக்கூடிய வாய்ப்பு ஏற்படும். அதுதான் யதார்த்தமானது என்பதை நான் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அதேவேளை, எங்களுடைய கிராமப்புறங்களை எடுத்துக் கொண்டால், அங்கு உயர்தர வகுப்பில் விஞ்ஞானத்தை, கணிதத்தை கற்கக்கூடிய வகையில் 1AB தரப் பாடசாலைகள் இல்லாத ஒரு நிலைமை காணப்படுகின்றது. இதனால் பெரும்பாலான மாணவர்கள் நகரப் பாடசாலைகளை நோக்கிப் படையெடுக்கின்றார்கள். அதேவேளை, வசதி குறைந்த ஏழை மாணவர்கள் நகரப் புறத்திலிருக்கின்ற பிரசித்தி பெற்ற பாடசாலைகளில் கற்கும் வாய்ப்பை இழக்கிறார்கள். அதனால், எதிர்காலத்தில் டாக்டராக, பொறியியலாளராக வரவேண்டிய அந்த ஏழை மாணவர்கள் சாதாரண கலைத்துறைப் பட்டதாரிகளாகவே வரவேண்டிய ஒரு நிலை ஏற்படுகின்றது. எனவே, கிராமிய மட்டத்தில் காணப்படுகின்ற 1AB பாடசாலைகளின் பற்றாக்குறையை நிவர்த்தி செய்கின்ற அதேவேளை, விஞ்ஞான, பௌதிக பட்டதாரி ஆசிரியர்களின் வெற்றிடங்களையும் பூர்த்தி செய்யவேண்டும். அந்த வகையில், பின்தங்கிக் காணப்படுகின்ற கல்வி வலயங்களில் குறைந்தது ஓரிரண்டு பாடசாலைகளையாவது வசதிகளோடு கூடிய 1AB பாடசாலைகளாக உருவாக்க வேண்டும். உங்களுடைய 1000 பாடசாலைத் திட்டத்தில்கூட இந்தத் திட்டம் இருக்கின்றது. ஆனால், இந்தத் திட்டம் இன்னமும் அந்தப் பகுதிகளுக்குச் சென்றடையவில்லை. குறிப்பாக, நான் மட்டக்களப்பு மேற்கு கல்வி வலயத்தில் ஒரு பிரதிக் கல்விப் பணிப்பாளராக இருந்தவன் என்ற வகையில், அந்த பிரதேசங்களில் இன்னமும் 1AB பாடசாலைகள் உருவாக்கப்படவில்லை என்பதை என்னால் கூறமுடியும். மலையகத்தில்கூட இந்த நிலைமைதான் காணப்படுகின்றது.

"அனைவருக்கும் கல்வி - Education for All"- என்று சொல்லுகின்றோம்; "எல்லோருக்கும் இலவசக் கல்வி, எல்லோருக்கும் தரமான கல்வி" என்று சொல்லுகின்றோம். ஆனால், இவை கோட்பாட்டு ரீதியாக இருக்கின்றனவே தவிர, இன்னும் செயற்பாட்டு வடிவம் பெறவில்லை. ஏனென்றால்,

கிராமங்களில் கஷ்ட, அதிகஷ்டப் பிரதேச மாணவர்களுக்கு இந்த வாய்ப்புகள் என்பது எட்டாக்கனியாகத்தான் இன்றும் இருந்துகொண்டிருக்கின்றன என்பதை இங்கு நான் வெளிப் படுத்த விரும்புகின்றேன்.

அதேவேளை, கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்களில் நீண்ட காலமாகத் தொண்டராசிரியராகப் பணியாற்றிக் கொண்டிருக் கின்ற ஆசிரியர்கள் நிரந்தர நியமனம் கோரிப் பல போராட் டங்களை நடத்தியிருக்கிறார்கள். அண்மையில் கல்முனை யிலிருந்து தொண்டராசிரியர் சங்கத் தலைவர், செயலாளர் ஆகியோர் வந்து எதிர்க்கட்சித் தலைவர் அவர்களையும் கௌரவ கல்வி அமைச்சரான உங்களையும் சந்தித்திருந் தார்கள். அச்சந்திப்பில் நானும் கலந்துகொண்டேன். அப்பொழுது, இன்னும் இரண்டு கிழமைக்குள் இந்தத் தொண்ட ராசிரியர்கள் தொடர்பான விடயத்தினைக் கையாண்டு அவர்களுக்குரிய நியமனங்களை வழங்குவது பற்றிக் குறிப்பிட்டிருந்தீர்கள். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தை ஞாபகத்திற்கொண்டு தயவுசெய்து அதனைத் தீர்த்து வைப்பதற்குரிய நடவடிக்கையைத் துரிதமாக எடுக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்கிறேன்.

மேலும், கடமை நிறைவேற்று அதிபர்கள் - performing principals பற்றிய விடயம் தொடர்பாகவும் சுட்டிக்காட்ட விரும்புகின்றேன். இவர்கள் நீண்டகாலமாகக் கடமை நிறைவேற்று அதிபர்களாகப் பணியாற்றி வருகிறார்கள். யுத்த காலத்தின்போதும் பணியாற்றி வந்த அவர்கள், இன்று கையறு நிலையில் காணப்படுகிறார்கள். இந்தப் பதவியில் தொடர்ந்தும் இருப்பதா? அல்லது மீண்டும் ஆசிரியர்களாகச் சென்று பாடசாலையில் கல்வி கற்பிப்பதா? என்ற தெளிவற்ற நிலைமை காணப்படுகின்றது. எனவே, இந்த கடமை நிறைவேற்று அதிபர்களுக்கும் சரியான பதில் கிடைக்கக்கூடிய விதத்தில் தங்களது செயற்பாடுகள் அமைய வேண்டுமென் பதையும் நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

குறிப்பாக, இந்த "Type 2 பாடசாலைகள்" என்று சொல்லப் படுகின்ற க.பொ.த. சாதாரண தரம் மற்றும் தரம் 9 வரையுள்ள பாடசாலைகளில் கணித, விஞ்ஞான ஆசிரியர்கள் மிகவும் பற்றாக்குறையாக இருக்கிறார்கள் என்பதை நான் மீண்டும் மீண்டும் வலியுத்திக் கூறுகிறேன். இந்தப் பாடங்களை அந்தப் பாடத்துறை சாராத ஆசிரியர்கள்மூலம் கற்பிக்கின்றபோது அதன் சரியான எண்ணக்கருவையும் விளக்கங்களையும் அவர்களுக்குக் கொடுக்கக்கூடிய வாய்ப்புகள் இல்லாத நிலைமை காணப்படுகின்றது. எனவே, இந்த விடயத்திலும் நீங்கள் கவனம் செலுத்த வேண்டும். கிராமப்புறங்களில், கஷ்ட, அதிகஷ்ட பிரதேசங்களில் கடமையாற்றுகின்ற ஆசிரியர் களுக்குச் சலுகைகளை வழங்கியாவது அந்த வெற்றிடங்களை நிரப்ப வேண்டும். குறிப்பாக, பிரதேச செயலாளர் மட்டத்தில் கஷ்ட, அதிகஷ்டப் பிரதேசங்களில் இருக்கின்ற GCE உயர்தரப் பரீட்சையில் சித்தியடைந்தவர்களுக்கு உரிய வசதி வாய்ப்புகளை வழங்கி, அவர்களுக்கு நியமனங்களை வழங்குகின்றபோது அந்தப் பிரதேசங்களில் காணப்படுகின்ற வெற்றிடங்களை நிரப்பிக்கொள்வதற்கு வாய்ப்பிருக்கின்றது.

அண்மையில் பல்வேறுபட்ட சிற்றூழியர் நியமனங்கள் வழங்கப்பட்டன. இவ்வாறான நியமனங்கள் வழங்குகின்ற போது அவை யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்களி லுள்ளவர்களுக்கும் வறுமையால் பாதிக்கப்பட்ட பிரதேசங்களி லுள்ளவர்களுக்கும் பரவலாக்கப்பட வேண்டுமென்ற ஒரு வேண்டுகோளை உங்களிடம் விடுக்கின்றோம். இந்த நியமனங்கள் உண்மையில் யுத்தத்தால் பாதிக்கப்பட்ட, யுத்தத் தால் வஞ்சிக்கப்பட்ட, பெற்றோர்களை இழந்திருக்கின்ற, விதவைகள் தலைமைதாங்குகின்ற குடும்பங்களில் உள்ளவர் களுக்கு வழங்கப்பட வேண்டும். நீங்கள் ஏற்கெனவே இதுசம்பந்தமாக உத்தரவாதமளித்திருக்கிறீர்கள்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Please, wind up.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

எனவே, தயவுசெய்து இந்த ஆண்டிலாவது பல்வேறுபட்ட நெருக்குவாரங்களுக்கு உட்பட்டிருக்கின்ற நசுக்கப்பட்ட மக்கள் மத்தியில் உள்ளவர்களுக்கு இந்த நியமனங்களை வழங்கி அவர்களுடைய வாழ்வாதாரத்தை ஓரளவுக்கேனும் உயர்த்து வதற்கு உங்களுடைய அமைச்சுக்கூடாக நடவடிக் கைகளை எடுப்பீர்களென்று நாங்கள் நம்புகின்றோம்.

தொழில்வாய்ப்பு விடயத்தில் எங்களுடைய பிரதேசங்கள் கூடுதலாகப் புறக்கணிக்கப்பட்டிருக்கின்றன. இந்த விடயத் தில் பல்வேறுபட்ட அமைச்சுகளில் - நான் உங்களுடைய அமைச்சைச் சொல்லவில்லை - இடைத்தரகர்கள் சிலர் இருந்துகொண்டு, வறுமைப்பட்ட அல்லது பொருளாதாரத்தில் தாழ்ந்த நிலையில் வாடிக்கொண்டிருக்கின்ற மக்கள் மத்தியில் சில விசமத்தனமான செயல்களில் ஈடுபடுகின்ற போக்குகளும் காணப்படுகின்றன. எனவே, இந்த நல்லாட்சியில் நியாயமான அடிப்படையில் தொழில் நியமனங்களை வழங்க வேண்டும். அதற்கேற்ற விதத்தில் உங்களுடைய செயற்பாடுகளை முன் னெடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இறுதியாக, இந்த வரவு செலவுத் திட்டத்தின்மூலமாக கல்வியில் ஒரு மாற்றத்தை ஏற்படுத்த வேண்டும். ஆனால், இதில் கல்விக்காக ஒதுக்கப்பட்ட நிதி போதாத நிலைமை யொன்று காணப்படுகின்றது. ஆயினும், ஒதுக்கப்பட்ட இந்த நிதியினைக்கொண்டு மனிதவள அபிவிருத்தியை ஏற்படுத்தக் கூடிய விதத்தில் உங்களுடைய துரிதமான செயற்பாட்டினை எதிர்பார்க்கின்றோம். குறிப்பாக, பாதிக்கப்பட்ட பிரதேசங் களுக்குக் கூடுதலான வசதி வாய்ப்புகளை வழங்குவதற்கு விசேட செயற்றிட்டங்களை நடைமுறைப்படுத்துமாறு கேட்டு, அமைகின்றேன். நன்றி.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! I wish to announce that this House cordially welcomes the Parliamentary Delegation from the People's Republic of China led by Mr. Mu Xinhai, Director General, Department of Foreign and Overseas Chinese Affairs of Sichuan Provincial People's Government, now present at the Speaker's Gallery.

[பி.ப. 2.25]

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා (ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன் - கிராமிய பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ameer Ali Shihabdeen - Deputy Minister of Rural Economic Affairs)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

[ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා]

கௌரவ தவிசாளர் அவர்களே, இன்று நடைபெறுகின்ற கல்வி அமைச்சின் நிதி ஒதுக்கீடு சம்பந்தமான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்கு எனக்கு நான்கு நிமிடங்கள் மாத்திரம் ஒதுக்கியிருப்பது கவலைக்குரிய விடயமாக இருக்கின்றது. என்றாலும், இந்த வரவு செலவுத் திட்டத்திலே கௌரவ நிதி அமைச்சர் அவர்கள் கல்வி விடயத்தில் அதிகளவு நாட்டத்தைக் காட்டியிருக்கிறார். அந்த வகையில், கல்வி பற்றி அதிகம் பேசுகின்ற ஓர் அரசியல்வாதி என்ற ரீதியில் கல்வி அமைச்சருக்கும் நிதி அமைச்சருக்கும் இந்த நாட்டின் பிரதமர் அவர்களுக்கும் ஜனாதிபதி அவர்களுக்கும் முதலிலே என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

பாடசாலை மாணவர்களுக்கு மடிக் கணினி கொடுப்பது என்பதும் ஓரிரு புள்ளிகளால் பல்கலைக்கழக அனுமதி தவறிப் போன 15,000 மாணவர்களுக்குப் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவினால் அங்கீகரிக்கப்பட்ட பட்டப்படிப்பினை வழங்கும் நிறுவனங்களில் கற்கைநெறிகளைப் பின்பற்றுவதற்காக எட்டு இலட்சம் ரூபாய் வட்டியில்லாக் கடன் கொடுப்பது என்பதும் ஆரம்பப் பிரிவு மாணவர்களை ஒவ்வொரு பாடசாலைத் தவணையிலும் - மூன்று மாதத்துக்கு ஒருமுறை - மருத்துவப் பரிசோதனைக்கு உட்படுத்துவது என்பதும் உண்மையிலே பாராட்டப்பட வேண்டிய முன்மொழிவுகளாகும். ஒரு தகப்பன்கூட செய்யாத ஒரு விடயத்தை இந்த அரசாங்கம் செய்திருக்கிறது. நாங்கள் யாருமே எங்களுடைய பிள்ளைகளை மூன்று மாதத்துக்கு ஒரு தடவை மருத்துவப் பரிசோதனைக்கு உட்படுத்துவது கிடையாது. ஏதாவது, ஒரு நோய் வந்தால் மாத்திரமே, நாங்கள் வைத்தியசாலைக்குக் கொண்டு ஓடுகின்ற நிலைமை காணப்படுகின்றது. இவ்வாறான நிலைமையில், மூன்று மாதங்களுக்கு ஒரு தடவை சின்னஞ்சிறிசுகளை - ஆரம்பப் பிரிவு மாணவர்களை - அரசாங்கம் மருத்துவப் பரிசோதனைக்கு உட்படுத்துவது என்பது, உண்மையிலே இந்த நாட்டில் கஷ்டப்படுகின்ற மக்களுக்கு ஒரு வரப்பிரசாதமாகும். அதிலும் குறிப்பாக, வடக்கு, கிழக்கிலே பாதிக்கப்பட்டிருக்கின்ற மக்களுக்குக் கிடைத்த பெரிய வரப்பிரசாதம் என்பது என்னுடைய கருத்தாகும். அந்த வகையிலே, நான் இந்தச் சபையிலே கௌரவ அக்கில விராஜ் காரியவசம் அவர்களுக்கு நன்றி கூறக் கடமைப்பட்டவனாக இருக்கின்றேன்.

அண்மைக்காலமாக கல்வி இராஜாங்க அமைச்சர் கௌரவ இராதாகிருஷ்ணன் அவர்கள், வடக்கு, கிழக்கிலே இருக்கின்ற மூலைமுடுக்குகளுக்கெல்லாம் விஜயம்செய்து அங்குள்ள பாடசாலைகளில் நிலவும் குறைபாடுகளைக் கண்டறிந்து, அவற்றைச் சாதி, மத, பேதம் பாராமல் நிவர்த்தி செய்து கொடுக்கின்ற ஒருவராக இருக்கின்றார். அவருடைய இந்தப் பண்பைப் பற்றி நான் இந்தச் சபையிலே ஞாபகமூட்ட வேண்டும்.

அதுபோன்று கிழக்கு மாகாணத்தின் முன்னாள் கல்வி அமைச்சரும் நண்பருமான கௌரவ விமலவீர திசாநாயக்க அவர்கள் இந்தச் சபையிலே இருக்கின்றார். அவர் அந்த நாட்களில் சிறந்த முறையில் பணி செய்தமைக்காக நான் அவருக்கு இந்த இடத்திலே நன்றிகூறக் கடமைப் பட்டிருக்கிறேன். அவர், அந்த நாட்களில் ஒரு நேர்மையான அரசியல்வாதியாக இருந்தார்.

மட்டக்களப்பு மாவட்டத்தில் 10 தேசிய பாடசாலைகள் இருக்கின்றன. அந்தப் பாடசாலைகளுக்கு கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் அவர்கள் வருகைதந்து பார்வையிட்டார். அவை எல்லாவற்றிலும் குறைபாடுகள் இருக்கத்தான் செய்கிறது. அவற்றைப் படிப்படியாக நிவர்த்திசெய்து தருவதாக இராஜாங்க அமைச்சர் அவர்களும் கல்வி அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்களும் எங்களுக்கு நம்பிக்கையூட்டி இருப்பது என்பது, இந்த நல்லாட்சியிலே ஒரு சிறந்த முன்னுதாரணமாகும். மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற 10 தேசியப் பாடசாலைகளில் குறைந்தது ஐந்து பாடசாலைகளையாவது, எல்லா வசதி வாய்ப்புகளும் கொண்ட பாடசாலைகளாக உருவாக்கித் தரவேண்டும் என்ற கோரிக்கையை நாங்கள் உங்களிடத்திலே முன்வைக்கின்றோம். அத்துடன், மட்டக்களப்பு மாவட்டத்திலுள்ள தேசியப் பாடசாலைகளில் காணப்படுகின்ற பிரச்சினைகளையும் கௌரவ கல்வி அமைச்சர் அவர்கள் தீர்த்துத் தரவேண்டுமென்றும் கேட்டுக்கொள்கிறேன்.

என்னுடைய பிரதேசத்திலே இருக்கிற ஓட்டமாவடி தேசியப் பாடசாலை வருகின்ற மார்ச் மாதம் அதனது நூற்றாண்டு விழாவைக் கொண்டாடுகிறது. இதற்கு நிதி ஒதுக்கீடு செய்துதந்த கௌரவ கல்வி அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்களுக்கும் கௌரவ இராஜாங்க அமைச்சர் இராதாகிருஷ்ணன் அவர்களுக்கும் நான் இந்த இடத்திலே நன்றி கூறக் கடமைப்பட்டவனாக இருக்கிறேன். அதுபோன்று, வாழைச்சேனை அந்நூர் தேசியப் பாடசாலையும் 2023ஆம் ஆண்டு அதனது நூற்றாண்டு விழாவைக் கொண்டாடவிருக்கின்றது.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay, thank you. You have to wind up now.

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
Please, allow me one more minute.

இறுதியாக, கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களுக்கும் கல்வி அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்களுக்கும் தங்களுடைய பணிகளைச் சிறப்பாகச் செய்து கொண்டிருக்கின்ற அவர்களுடைய செயலாளர் உட்பட அமைச்சின் அனைத்து அதிகாரிகளுக்கும் මේ අවස්ථාවේදී මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමින් මා නිහඬ වනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මන්ත්‍රීතුමා. You have 14 minutes. ඊට ප්‍රථම, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මූලාසනය ගන්නවා ඇති.

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* ***ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

[අ.භා. 2.30]

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය යනු රටක වැදගත්ම ආයෝජනයයි; ක්‍රියා පද්ධතියයි. එම විෂය ගැන කථා

කරන්න අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාට හම්බ වුණේ විනාඩි 4ක කාලයක්. ඒ ගැන අපි කනගාටු වනවා. [බාධා කිරීමක්] දුකයි. අපට වෙන් කළ කාලයෙන්ද කථා කරන්න හදන්නේ? මම ලෙඩක් ඇද්දා නොවෙයි. පොඩි මතක් කිරීමකුයි කළේ.

අධ්‍යාපනය යනු කුමක්ද, කියන කාරණයේ දී අපි මේ ගරු සභාවේ වැඩියෙන්ම කාලය වැය කරන්නේ අධ්‍යාපනයේ භෞතික පදනම පිළිබඳවයි. අධ්‍යාපනය යනු, ජීවත් වීමට ඉගෙනීමයි. නිදහස් අධ්‍යාපනයේ පියා වන සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා එදා -1944දී- නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් කරන වෙලාවේ දී කිව්වේ, "අධ්‍යාපනය එක් පන්තියක වරප්‍රසාදිත උපකරණයක් වනවා වෙනුවට, සමස්ත ජාතියක මානව අයිතියක් විය යුතුයි" කියලා. හැබැයි, අද මේ අය වැය ලේඛනයේ තිබෙන සමහර යෝජනා දිහා බැලුවාම, ඒ උත්තුංග මනුස්සයාගේ යහපත් අරමුණ ඉෂ්ට වනවාද කියන ප්‍රශ්නයක් තිබෙනවා.

මෙතැන කථා කරපු ආණ්ඩු පක්ෂයේ කීප දෙනෙක්ම උත්සාහ කළා, නිදහස් අධ්‍යාපන පනතත් එක්සත් ජාතික පක්ෂයේ කර ගන්න. නිදහස් අධ්‍යාපන පනත රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ, ඉදිරිපත් කරන වෙලාවේදී එක්සත් ජාතික පක්ෂය පිහිටුවලා තිබුණෙත් නැහැ. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් කළාට පස්සේ, 1947 මැතිවරණයේ දී එතුමාව පරාජයට පත් කළා. ඒ විතරක් නොවෙයි. එතුමා නැවත ජයග්‍රහණය කළාම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව එතුමාට අධ්‍යාපන ඇමතිකම ආපහු දුන්නෙත් නැහැ. ඒ නිසා එතුමාගේ අයිතිය, නිදහස් අධ්‍යාපන පනතේ අයිතිය එක්සත් ජාතික පක්ෂයට ගන්න පුළුවන්කමක් නැහැ.

මම ඇතුළු මෙතැන ඉන්න බොහෝ දෙනෙක් නිදහස් අධ්‍යාපනයේ දරුවෝ. හෝටල්වල පිඟන් හෝදපු, උසස් පෙළ විභාගයට රුපියල් 80 බඳින්න කුලියට ගොයම් කපපු මිනිහෙක් මම. මම වාගේ මිනිහෙකුට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේත්, කොළඹ විශ්වවිද්‍යාලයේත් උපාධි දෙකක් ගන්න පුළුවන් තරමට මේ රටේ නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරපු ඒ උත්තුංග මනුස්සයාට, නිදහස් අධ්‍යාපනයේ පියාට මම මේ ගෞරවනීය සභාවේ ඉඳලා හිස නමා ආචාර කරනවා. හැබැයි, අද මේ ගරු සභාව අනවශ්‍ය තරමට මූල්‍යමය කාරණා පිළිබඳව, භෞතික කාරණා පිළිබඳව කථා කරනවා. ඒ වුණත් මට පෙනෙන විධියට මේ උත්තරීතර සභාවේත්, මේ උත්තරීතර සභාවෙන් පිටතත් හැම කෙනෙක්ම කථා කරන්නේ අධ්‍යාපනය ලබා දීමට වඩා, ගොඩනැඟිලි හදන්නේ කොහොමද, Tabs දෙන්නේ කොහොමද, ඩෙස් පුටු දෙන්නේ කොහොමද කියලායි. හැබැයි, අධ්‍යාපනයට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ කාරණය තමයි අවධාරණයට ගන්නේම නැති කාරණය. අපි ඔක්කෝම හිතේ තබා ගෙන ඉන්නේ ගොඩනැඟිලි හැදුවාම, ඩෙස් පුටු දුන්නාම, computers දුන්නාම, laboratory එකක් හැදුවාම අධ්‍යාපනයත් ලැබුණා කියලායි.

මම මීට කලිනුත් මේ සභාවේ බක්මීටියාව විද්‍යාලය පිළිබඳව කියලා තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කයේ කැලය මැද්දේ පිහිටි ගමක් ඇතුළේ තිබෙන විද්‍යාලයක් තමයි බක්මීටියාව විද්‍යාලය. ඊයේත් මම ඒ විද්‍යාලයේ සිටියා. ඒ විද්‍යාලයේ සිට රාජකීය විද්‍යාලය දක්වා මේ රටේ කිසිම විද්‍යාලයක අද අධ්‍යාපනයක් නැහැ. අතිශයින් බිහිසුණු, නරුම, පසු කැහුතු කොන්ක්‍රීට් කරන විභාග තරගයක් පමණයි ඒවායේ තිබෙන්නේ. ඒකෙන් මේ රටේ දරුවෝ ගලවා ගන්න; අධ්‍යාපනය ගලවා ගන්න මෙවර අය වැයේ තිබෙන යෝජනාව මොකක්ද? මට නම්, එහෙම අදහසක්වත් තිබෙනවා කියලා පෙනෙන්නේ නැහැ. මේක ගිය ආණ්ඩුවට තිබුණේත් නැහැ; ඊට කලින් ආණ්ඩුවට තිබුණේත් නැහැ; මේ ආණ්ඩුවටත් නැහැ. ඒක පැහැදිලිව මම කියන්න ඕනෑ. කිසිම ආණ්ඩුවකට මේ ගැන නිවැරදි දර්ශනයක් තිබුණේ නැහැ.

මේ වනකොට අපේ රටේ පාසල් 32ක් වසා තිබෙනවා. පසු ගිය මාස 22 තුළ බාර් 52ක් විවෘත කරලා තිබෙනවා. උසස් පෙළ සමත් ශිෂ්‍යයෙකුට රුපියල් ලක්ෂ අටක ණය මුදලක් දීලා පෞද්ගලික විශ්වවිද්‍යාලයකින් උපාධියක් ගන්න වැඩ පිළිවෙළක් යොදනවා කියලා අය වැය යෝජනාවක් තිබෙනවා. හැබැයි, මොන විශ්වවිද්‍යාලයෙන්ද මේ රුපියල් ලක්ෂ අට ගෙවා උපාධිය ගන්නේ කියලා මම අහන්න කැමැතියි. මේ ආණ්ඩුව එහෙම ස්ථාන හදන්න බලාපොරොත්තු වනවා. ඒ අනුව අධ්‍යාපනය පෞද්ගලීකරණය කරන්න ආණ්ඩුවේ දර්ශනයක් තිබෙනවා. මේක අධ්‍යාපන ඇමතිතුමාගේ පෞද්ගලික වුවමනාව නොවෙන්න පුළුවන්. උදාහරණයක් විධියට ගත්තාම අධ්‍යාපනවේදී උපාධිය ගන්න ණය මුදලක් දෙනවා කියලා මේ ආණ්ඩුව කියනවා. පෞද්ගලිකව මුදල් ගෙවා ඒ උපාධිය ගන්නේ කොහෙන්ද? අද ලංකාවේ අධ්‍යාපනවේදී උපාධිය සඳහා අභ්‍යන්තර උපාධියක් කරන්න පුළුවන් විශ්වවිද්‍යාලයකට තිබෙන්නේ කොළඹ විශ්වවිද්‍යාලය පමණයි. ඒ අනුව මේ උපාධිය දෙන්නේ කොහෙන්ද? ඒ සඳහා එක්කෝ අලුතෙන් විශ්වවිද්‍යාල හදන්න ඕනෑ. එහෙම නැත්නම්, කොළඹ විශ්වවිද්‍යාලයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකින් මුදලට මේ උපාධිය දෙන්න සූදානම් කරන්න ඕනෑ. අද උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් එළියේ ඉන්නවා. ඒ අයට පුහුණුවක් දෙන්න ආණ්ඩුවට පුළුවන්කම තිබෙනවා. දහස් ගණනක් උපාධිධාරී දරුවෝ මහ පාරේ උද්ඝෝෂණ කරනවා. ඔවුන්ගේ උපාධිය පදනම් කර ගෙන හෝ පුහුණුවක් ලබා දීලා ඒ අය ගුරු සේවයට ගන්න මේ ආණ්ඩුවට පුළුවන්. එහෙම වැඩ පිළිවෙළක් හදන්නේ නැතිව පෞද්ගලික අංශයට අධ්‍යාපනය විකුණන්න හදනවා. මේ තුළින් නිදහස් අධ්‍යාපනයේ පියාගේ උතුම් අරමුණ විනාශයට පත් කරන්නයි මේ උත්සාහ දරන්නේ.

ඇමතිතුමා පසු ගිය කාලයේ ප්‍රකාශයක් කරලා තිබුණා, පහ වසරේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත මේ රටේ ප්‍රධාන විද්‍යාලවලට ඇතුළු වන්න ඉඩ තබන්නේ නැහැයි කියලා. මම හිතනවා, ඒක හොඳ යෝජනාවක් කියලා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ඇමතිතුමා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, ඒක පත්තරයේ වැරදියට පළ වෙලා තිබුණේ. මම ඉස්සෙල්ලාත් ඔය ප්‍රශ්නයට උත්තරය දුන්නා. ඒ සඳහා අලුත් ක්‍රමවේදයක් අපි හදනවා. පහ වසර ශිෂ්‍යත්වය නිසා දරුවන්ට තිබෙන පීඩනයත් වළක්වන අලුත් ක්‍රමවේදයක් අපි හදනවා.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ඇමතිතුමනි, ඒ ගැන මගේ විරුද්ධත්වයක් නැහැ. මේ අනවශ්‍ය, බිහිසුණු, නරුම තරගය උදෙසා දෙමව්පියන් ඔවුන්ගේ පටු පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා මේ දරුවෝ බිල්ලට දෙනවා. මේ තරගකාරී, අනවශ්‍ය, පීඩාකාරී විභාගයෙන් දරුවෝ

[ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා]

මුදා ගන්න තමුන්නාන්සේ ධෛර්යයක් ඇති කර ගන්න; අධිෂ්ඨානයක් ඇති කර ගන්න. තමුන්නාන්සේ ඒ ප්‍රකාශය කෙරුවාට මගේ විරුද්ධත්වයක් නැහැ. මම මේ රටේ හිටපු පළාත් අධ්‍යාපන ඇමතිවරයෙකු විදියටයි එය කියන්නේ. ඒ සඳහා මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. හැබැයි, දරුවාගේ ළමා කාලය උදුරා ගන්නා, දරුවාගේ මොළය මරණ මේ විභාගය කවුරු හරි නතර කරන්න ඕනෑ.

ලංකාවේ සුප්‍රසිද්ධ ළමා චිත්‍ර ශිල්පිනියක් වුණු සිබිල් වෙත්තසිංහ මැතිනිය මේ ළඟදී ප්‍රකාශයක් කළා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ ඒක ඇහුවාද දන්නේ නැහැ. මේ සභාවේ සිටින අනෙක් මන්ත්‍රීවරු ඒක ඇහුවාද දන්නේත් නැහැ. අද ඉන්න දරුවන්ට ඉර බලන්න වෙලාවක් නැහැ; සඳ බලන්න වෙලාවක් නැහැ; තරු බැබළෙනවා බලන්න වෙලාවක් නැහැ; සමනලයෝ පස්සේ යන්න වෙලාවක් නැහැ; වෙල් එළියේ සෙල්ලම් කරන්න වෙලාවක් නැහැ. මෙහෙම කියන්නේ කවුද? මේ රටේ සුප්‍රසිද්ධ ළමා චිත්‍ර ශිල්පිනියක් වුණු; ළමා පොත් කර්තෘවරියක් වුණු සිබිල් වෙත්තසිංහ මැතිනියයි මෙහෙම කියන්නේ. මේක තමයි ඇත්ත කථාව.

කුසට දරුවෙකු ආ දවසේ සිටත්, ඒ දරුවාට අවුරුදු දෙකේදීත්, තුනේදීත්, හයේදීත්, හතේදීත් කල්පනා කරන්නේ ඒ දරුවා පහ වසර ශිෂ්‍යත්වය සමත් කරවන්නේ කොහොමද කියලායි. එහෙම කරලා කොළඹ විශාකා විද්‍යාලයට ගියත්, රාජකීය විද්‍යාලයට ගියත්, ආනන්ද විද්‍යාලයට ගියත්, නාලන්ද විද්‍යාලයට ගියත් ඒ ළමයින් යන්නේ ටියුෂන් කඩවලට කියලා මතක තබාගන්න. කොළඹ ආනන්දයට ආවාම, රාජකීයයට ආවාම කොළඹ ටියුෂන් යන්න පුළුවන්. අම්පාරේ ඉගෙන ගත්තාම අම්පාරේ ටියුෂන් යන්න පුළුවන්. එහෙම නම්, මේ ලොකු විද්‍යාලවලින් හොඳ අධ්‍යාපනයක් ලබා දෙනවා නම්, මොන කෙංගෙඩියටද ටියුෂන් යන්නේ? මේ ටියුෂන් මාෆියාව නිසා අධ්‍යාපනය පාසලෙන් බැහැරට ගිහිල්ලා තිබෙනවා.

මම තවත් දෙයක් අහන්න කැමැතියි. අධ්‍යාපන ඇමතිතුමා මේකට උත්තරයක් දෙන්න. ඉරිදා දහම් පාසල් පැවැත්වෙන වේලාවේදී ටියුෂන් කරන්න ඉඩ දෙන්නේ නැහැයි කියලා හැම ආණ්ඩුවක්ම කිව්වා. මේ ආණ්ඩුවේ අයත් කිව්වා. තමුන්නාන්සේ ඒකට ගන්නා තීන්දුව මොකක්ද?

මට වෙන් වූ කාලය තමයි තමුන්නාන්සේ උත්තර දෙන්න ගන්නේ. කමක් නැහැ, උත්තර දෙන්න කෝ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ සිටම ගුරු හිඟය විශාල වශයෙන් දරුණු වෙලා තිබෙනවා නේ. දැන් මොන දේවාලයට හරි ගිහින් දෙමව්පියන් තමන්ගේ දරුවන්ට උගන්වනවා. එහෙම නැත්නම් සිසුන් ගිහිල්ලා ඉගෙන ගන්නවා. අපි ඉස්සෙල්ලාම මේ අවුරුදු දෙක තුන ඇතුළත මේ රටේ තිබෙන ගුරු හිඟය පුරවලා අවසන් කරනවා. ඊට පසුව ඔය කාරණය සම්බන්ධව අපි තීරණයක් ගනිමු.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

තව අවුරුදු කීයක්ද ඇමතිතුමා?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

පසුගිය දශක ගණනාවක් තිස්සේ මේ කටයුතු කරලා නැහැ නේ. මේ වසරේ ඉඳලා ගුරුවරු බඳවා ගැනීම වැඩි කරලා තිබෙනවා. විද්‍යාපීඨවලටත් ගුරුවරුන් බඳවා ගැනීම 1,500කින් වැඩි කළා. හෙට අනිද්දා ක්‍රීඩා ගුරුවරු 3,500ක් ගන්නවා. ඒ සඳහා කැබිනට් පත්‍රිකාව හදලා තිබෙන්නේ. ඒ අනුව මුළු රටේම පවතින ක්‍රීඩා ගුරු හිඟය පියවනවා. ඒ වාගේම ඒ ඒ විෂයයන් අනුව ඉතිරි ගුරු හිඟය පිරවීමට අවශ්‍ය ගුරුවරු පිරිස අපි බඳවා ගන්නවා.

**ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

හොඳයි. මම බලාගෙන ඉන්නවා, තමුන්නාන්සේ ලබන අය වැයටත් ඇවිල්ලා ඔය උත්තරයම දෙන්න එපා. මේ උත්තරීතර සභාවේ ඉන්න හැමෝටම, සියලුම පක්ෂවල අයට යහපත් රටක්, යහපත් සමාජයක් හදන්න ඕනෑකම තිබෙන්න පුළුවන්. හැබැයි, මේ උත්තුංග අරමුණ ඉෂ්ට කර ගැනීමට නම් අන්තවාදී, ආගම්වාදී, වර්ගවාදී මානසික රෝගීන් හැදෙන එක වළක්වන්න ඕනෑ. ඒ සඳහා අධ්‍යාපනයේ අධ්‍යාත්මය හදන්න ඕනෑ. ඒකට අපි විප්ලවීය වෙනසකට යන්න ඕනෑ. හැමෝම හිතේ තියාගෙන ඉන්නේ ගොඩනැඟිලි හදලා ඒක කරන්න පුළුවන්; ගුරුවරු වැඩි කරලා ඒක කරන්න පුළුවන් කියලායි. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කළාය කියලා, වැය කළාය කියලා කිසි දවසක මේ උත්තුංග අරමුණට ළඟා වෙන්න පුළුවන්කමක් නැහැ.

මම කියන්න කැමැතියි, පසු ගිය අවුරුදු 25 තුළ මෙරට උසාවි ගණන වැඩි වුණා; පොලිසි ගණන වැඩි වුණා; හිරගෙවල් ගණන වැඩි වුණා. අද හැම තැනම චිකාගෝ ක්‍රමයට මිනී මරනවා. අවුරුදු 20ක ළමයෙක් අවුරුදු 76ක් වූ පෙර පාසල් ගුරුවරියව දූෂණය කළා. අද ප්‍රසිද්ධ මතයක් තිබෙනවා. අම්මා නම් බලු කූඩුවට; තාත්තා නම් කුකුල් කූඩුවට කියලා. එක තාත්තා කෙනෙක් දුවගෙන් අහනවාලු, "දුවේ මම වයසට ගියාම උඹ මාව කුකුල් කූඩුවට දානවාද" කියලා; අම්මා පුතාගෙන් අහනවාලු, "පුතේ මාව බලු කූඩුවට දානවාද" කියලා. ඒ නිසා මේ විද්‍යාල ගණන වැඩි කරලා, ශිෂ්‍යයන් ගණන වැඩි කරලා, "ටැබ්" එකක් අතට දීලා කවදාවත් යහපත් උත්තුංග රටක් හදන්න බැහැ. පුංචි කාලයේ "රෝස මලේ නටුවේ කටු" ගීතය කියපු දරුවා එහෙම නැත්නම් "හා හා හරි හාවා" කවිය කියූ දරුවා අද musical show එකට අරක්කු භාගයක් සාක්කුවේ දාගෙන ගිහිල්ලා, දැළි පිහියක් සාක්කුවේ දාගෙන ගිහිල්ලා ඉස්සෙල්ලාම කරන්නේ ඇඳගෙන ඉන්න කමිසය ගලවා විසි කරන එකයි. ඊට පස්සේ බැනියම ගලවනවා; ඊට පස්සේ කෑ ගහනවා; උඩ පනිනවා. කිසි කෙනෙක් ගීත රස විඳින්නේ නැහැ නේ. මේ රටේ රසික ජනතාව දිහා බලන්න. අලුත් ගීත මොනවාද තිබෙන්නේ? Love lettersවලටත් තනු දාලා ගායනා කරනවා. ගද්‍ය කණ්ඩ. රසවිඳීම පවා වෙනස් වෙලා. වෘත්තීය පුහුණු ආයතන බවට පාසල් පත් කරන්න එපා; පාසල් කම්හල් බවට පත් කරන්න එපා. පන්සල් කම්හල් බවට පත් කරලායි තිබෙන්නේ. කරාටේ පන්තියත් පන්සල ඇතුළේ; ටයිපින් පන්තියත් පන්සල ඇතුළේ; ටියුෂන් පන්තියත් පන්සල ඇතුළේ. ඒ නිසා පන්සල් කම්හල් කෙරුවා වාගේ පාසල් කම්හල් කරන්න ලැහැස්ති වෙන්න එපා. මේ දරුවන්ට හිතන්න ඉඩ දෙන්න. මේ රටේ ඉන්නවා, three wheeler රථ රියදුරන් දස ලක්ෂයක්. අධ්‍යාපනයේ අවසාන අරමුණ three wheeler රථ රියදුරන් හදන එකද? මේක මේ ආණ්ඩුවට විතරක් නගන චෝදනාවක් නොවෙයි, අපි ඔක්කෝම වගකියන්න ඕනෑ. ඒ නිසා මේක නිවැරදි දිශාවට කවුරුහරි අරගෙන යන්න ඕනෑ. Three

wheeler රථ රියදුරන් හැටියට three wheelers දස ලක්ෂයක් ඇතුළේ ලක්ෂ සංඛ්‍යාත තරුණ ශ්‍රමය කොටු කරපු මේ අධ්‍යාපන ක්‍රමය අපි වෙනස් කරන්නේ නැද්ද කියලා මම මේ ගරු සභාවෙන් අහන්න කැමැතියි. Three wheeler රථ රියදුරෙක් වෙන්න නිර්මාණශීලිත්වයක් ඕනෑ නැහැ; බුද්ධිමහිමයක් ඕනෑ නැහැ; ප්‍රඥාසම්පන්න බවක් ඕනෑ නැහැ. ඒ නිසා මේ "A" - 3, "A"- 9 එහෙම නැත්නම් ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵලවලින් මේ රට හදන්න පුළුවන්කමක් නැහැ.

මීට අවුරුදු එකහමාරකට දෙකකට විතර ඉස්සෙල්ලා, 2014 අප්‍රේල් මාසයේ 22 උදේ 8.30ට මගේ නංගී කොළඹ මහ රෝහලේ 30 වාට්ටුවේදී මගේ ඉස්සරහා අවසන් සුසුම්පොද හෙළුවා. ඇය අවසන් මොහොතේ "අයියේ මාව බේරාගන්න පුළුවන්ද" කියලා ඇහුවා. මට දෙන්න උත්තරයක් තිබුණේ නැහැ. කලින් දවසේ රාත්‍රියේ ඉඳලා එළිවෙනතුරු ඇයගේ තුවාලයකින් ලේ ගියා. වාට්ටු භාර වෛද්‍යවරිය ඇයට ලේ දුන්නෙත් නැහැ; ලේ නතර කෙරුවෙත් නැහැ. මම උදේ ගිහින් කෑ ගැහුවාම තමයි ලේ ටිකක් ගෙනැත් දුන්නේ. ලේ ටික භාගෙට දෙනකොට නංගී මගේ ඉස්සරහ මිය ගියා. ඒ නිසා "A" තුනේ Bioscience සත්තු හදන, "A" තුනේ රොබෝවරුන් හදන, හිතන්න බැරි, නිර්මාණශීලිත්වය මොට කරන, පාසල් පන්ති කාමරය ඇතුළේ දරුවාගෙ මොළේ මරන, මේ අධ්‍යාපනය වෙනස් කරන්නේ නැතිව ගොඩනැඟිලි හදලා, කොන්ක්‍රීට්වලින්, ලී දඬුවලින් මේ රට හදන්න බැහැ කියලා මම කෑ ගහලා කියන්න කැමැතියි. මට පක්ෂ වැඩක් නැහැ; ආණ්ඩු වැඩක් නැහැ; මූලධර්ම වැඩක් නැහැ. මේක තමයි සත්‍ය කථාව. ඒ නිසා බොරුවට කථා කරලා හොරකම නතර කළා ද? දූෂණය නතර කළා ද? පහුගිය කාලයේ මිනී මරනකොට "රාජපක්ෂලාගෙ ආණ්ඩුව" කියා කිව්වා. එතකොට කිව්වේ එහෙමයි. හැබැයි, අද ඒ සියල්ල සිදු වෙනවා. ආණ්ඩුව මේ තත්ත්වය වෙනස් කරන්න නම් කරුණාකර අධ්‍යාපනයෙන් පන්ති කාමරය වෙනස් කරන්න ලෑස්ති වෙන්න. කූසේ ඉන්න දරුවගෙ මොළේ හදන්න, පපුවේ තෙතමනයක් ඇති, අනුන්ගේ දුකේදී ඇහැට කඳුළක් උනන, උණුහපුළු පැටවුන් නොවන මිනිසුන් හදන අධ්‍යාපනයක් හදන තාක් කල් මේ රටට අනාගතයක් නැහැ කියා මම ප්‍රකාශ කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

[අ.භා. 2.45]

**ගරු එස්.බී. නාවින්න මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. S.B. Nawinne - Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාවක් ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන් පහුගිය කාලය තුළ අත්පත් කර ගත් ජයග්‍රහණ කිහිපයක් ගැන සඳහන් කරන්නට මම කැමැතියි. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව රජයට අයත් බත්තරමුල්ලේ පිහිටි "සුහුරුපාය" ගොඩනැඟිල්ල තුළ දැන් ස්ථාපිත කරලා තිබෙනවා. ඒ අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට වෙන් වූ වර්ග අඩි 75000 වෙනුවට වර්ග අඩි 240,000 දක්වා ද, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට වර්ග අඩි 41510 සිට වර්ග අඩි 125000 දක්වා ද තුන් ගුණයකින් පමණ ඉඩකඩ වැඩි කර ගැනීම තුළින් මෙම දෙපාර්තමේන්තුවලින් සේවය ලබා ගැනීමට පැමිණෙන ජනතාවට විශාල සහනයක් ලැබී තිබෙනවා. ඒ වාගේම වඩාත් ඉහළ මට්ටමේ නූතන තාක්ෂණික උපකරණ "සුහුරුපාය" ගොඩනැඟිල්ල තුළ ස්ථාපිත කරලා තිබෙනවා. මෙම තත්ත්වය ආගමන හා විගමන සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවල කාර්යක්ෂමතාවය වැඩි කිරීමට ඉවහල් වී තිබෙනවා. දසකයක පමණ කාලයක සිට යෝජනාවක් වශයෙන් පවතින ජෛවමිතිකව හැඳුනුම් පත් නිකුත් කිරීම සඳහා අත්‍යවශ්‍යයෙන්ම සම්පූර්ණ කළ යුතු කරුණක් වන 1968අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත මේ වසර තුළ සංශෝධනය කර පාර්ලිමේන්තුවේදී සම්මත කර ගන්නට හැකි වීම විශාල ජයග්‍රහණයක් වශයෙන් සලකනවා. ඒ අනුව වයස අවුරුදු 15ට වැඩි සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවමිතික දත්ත ලෙස ඇඟිලි සලකුණු ද ඇතුළත්ව ජාතික පුද්ගල නාම ලේඛනය ස්ථාපිත කර ඒ මත විද්‍යුත් ජාතික හැඳුනුම් පත් නිකුත් කිරීමට නියමිතව තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331ක, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ඒකක පිහිටුවා තිබෙනවා.

මෙම වසර අවසානයේදී සියලුම ඒකක, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ජාලගත කිරීමට කටයුතු කරනවා. පරිගණක තාක්ෂණය ඔස්සේ හැඳුනුම් පත් නිකුත් කිරීමේ කටයුතු සිදු කරන අතර, ඒ තුළින් ගුණාත්මක සේවාවක් අප රටේ පුරවැසියන්ට ලබා දීමට හැකියාව ලැබී තිබෙනවා. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරීමට අප තීරණය කර ඇති අතර දැනටමත් උතුර සහ නැඟෙනහිර පළාත් කාර්යාල දෙක පිහිටුවා තිබෙනවා.

2017 ජනවාරි මාසයේ වයඹ පළාතේ කාර්යාලය ද ආරම්භ කිරීමට සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කටයුතු ද ඉතාම කාර්යක්ෂමතාවකින් යුතුව ඉටු වන බව ඔබ සියලු දෙනාම දන්නා කරුණක්. එම තත්ත්වය තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා 2016 වර්ෂය තුළදී විශේෂ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනු ලැබුවා. ඒ අනුව විදේශ ගමන් බල පත් නිකුත් කරන පුද්ගලයන්ගේ ඡායාරූප මාර්ගගත ක්‍රමයට ලබාගැනීමටත්, ඔවුන්ගේ ඇඟිලි සලකුණු පරිගණක පද්ධතියට ඇතුළත් කර ගැනීමටත් පියවර ගෙන තිබෙනවා. එහි දෙවන අදියර ලෙස නව ගමන් බල පත් නිකුත් කිරීමේදී පරිගණක පද්ධතියේ ඇතුළත් ඇඟිලි සලකුණු සමඟ සසඳා ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරමින් ගමන් බල පත්‍ර ලබා ගැනීම වළක්වා ගැනීමට පරිගණක පද්ධතිය වැඩිදියුණු කරනු ලැබුවා. තවද, නවීන තාක්ෂණය උපයෝගී කරගෙන ජෛවමිතික තොරතුරු ඇතුළත් විදේශ ගමන් බල පත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු මේ දිනවල සිදු කෙරෙමින් පවතිනවා.

2017 වර්ෂය අවසාන වන විට, ජෛවමිතික තොරතුරු ඇතුළත් නව විදේශ ගමන් බල පත්‍රය නිකුත් කිරීමට හැකි වනු ඇතැයි මා අපේක්ෂා කරනවා. ශ්‍රී ලාංකික වීසාව ජාත්‍යන්තර ප්‍රමිතියට ගැළපෙන ආකාරයට නවීන තාක්ෂණයෙන් යුත් ස්ටිකරයක් බවට පත් කිරීමට 2016 වර්ෂයේදී හැකි වුණා. මීට අමතරව පැය 24 පුරාම අඛණ්ඩ සේවාවක් ලබා දෙන ගුවන් තොටුපළ බලය ලත් නිලධාරින්ගේ සේවයේ පහසුකම් වැඩිදියුණු කිරීම පෙරදැරි කර ගෙන දැනට පවතින නේවාසිකාගාරයට අමතරව නවීන පහසුකම් සහිත තෙමහල් ගොඩනැඟිල්ලක් ඉදි කිරීමට පියවර ගැනීමට හැකි වීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙනවා.

එසේම දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් පුහුණු වැඩසටහන් ගණනාවකට එම නිලධාරින්ව යොමු කිරීමට අපට හැකියාව ලැබුණා.

නව රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සමඟ ගුවන් තොටුපොළ මඟී නිෂ්කාසන කටයුතුවල පැහැදිලි වර්ධනයක් දක්නට ලැබෙනවා. 2014 වර්ෂයේ මිලියන 5.8ක් වූ මඟී

[ගරු එස්.බී. නාවින්න මහතා]

නිෂ්කාසනය 2015 වර්ෂයේදී මිලියන 6.5 දක්වා වැඩි වූ අතර 2016 වර්ෂයේදී මෙම අගය මිලියන 7.5 දක්වා වැඩි වේ යැයි අපේක්ෂා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු එස්.බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විදේශගත ශ්‍රී ලාංකිකයන් ජාතික ආර්ථිකයට දායක කර ගැනීමේ අපේක්ෂාවෙන් ද්විත්ව පුරවැසිභාවය ලබා දීමේ කටයුතු වඩාත් කාර්යක්ෂමව නව ක්‍රමවේදයක් යටතේ, 2015 මාර්තු මාසයේදී නැවත ආරම්භ කරන ලද අතර, මේ වන විට දහඅටදහස් හත්සිය පණහකට ද්විත්ව පුරවැසි සහතික පත් ප්‍රදානය කිරීමට මවිසින් පියවර ගනු ලැබුවා. එමඟින් රුපියල් මිලියන තුන්දහස් පන්සිය හතළිස්දෙකක් රාජ්‍ය ආදායමට එකතු කිරීමට මෙම වසරේ ඔක්තෝබර් මාසය වන විට හැකියාව ලැබී තිබෙනවා.

දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය සාධනය ඉහළ නැංවීම මඟින් 2014 වර්ෂයේ බිලියන 8ක්ව පැවති ආදායම 2015 වර්ෂයේදී බිලියන 10 දක්වා වැඩි කර ගැනීමට හැකි වූ අතර මෙම වර්ෂයේදී බිලියන 15 දක්වා වැඩි කර ගත හැකි වන බව ඔබට පවසන්නේ ඉතාමත් සතුටින්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කාලය අවසානයි.

**ගරු එස්.බී. නාවින්න මහතා**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the speech tabled:*

"මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1877 කොළඹ ජාතික කෞතුකාගාරය ස්ථාපිත කිරීමෙන් පසුව මෑත ඉතිහාසයේ සිදු කළ විශාලතම ප්‍රතිසංස්කරණය රුපියල් මිලියන එකසිය අසූඑකක වියදමක් දරා සිදු කර තිබෙනවා. එම ප්‍රතිසංස්කරණ කටයුතු දැන් සාර්ථකව අවසන් වී තිබෙනවා. ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවේ කෞතුකාගාර පද්ධතියට අස්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය තුළ අස්ථික විද්‍යා මැදිරියක් නිර්මාණය කිරීමටත්, මහනුවර ජාතික කෞතුකාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමටත් මේ වසරේදී හැකි වුණා. 2016 වර්ෂය තුළදී කෞතුක භාණ්ඩ 180ක් අලුතින් අපේ කෞතුකාගාර පද්ධතියට එකතු වී තිබෙන බව සතුටින් ප්‍රකාශ කිරීමට කැමැතියි. නවීකරණය කරන ලද කොළඹ ජාතික කෞතුකාගාරය සඳහා පැමිණෙන මහජනතාවගේ පහසුව පිණිස නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් අවශ්‍ය පැහැදිලි කර ගැනීම් සහ දත්ත ලබා ගැනීමට අවශ්‍ය "ජංගම දුරකථන සඳහා ශ්‍රී ලංකාවේ කෞතුකාගාර" නමින් විද්‍යුත් භාවිතයක් හඳුන්වා දීමට හැකි වූ අතර ඒ සඳහා තොරතුරු තාක්ෂණ සම්මාන කිහිපයක්ද ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත මේ වසරේ ලැබී තිබෙන බව සතුටින් දන්වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වයඹ ලේකම් කාර්යාලය ස්ථාපිත කර මුළු වයඹ පළාතේම සංවර්ධනයේ නියමු බලවේගයක් බවට මගේ අමාත්‍යාංශය පත්වී තිබෙනවා. කුඩා වැව් ප්‍රතිසංස්කරණ, ග්‍රාමීය මාර්ග සංවර්ධනය හා පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම වැනි ජන ජීවිතයට වඩාත් සමීප ව්‍යාපෘති සිය ගණනක් දැන් වයඹ පළාත තුළ සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මේ මඟින් කුඩා වැව් 349ක්, පානීය ජල ව්‍යාපෘති 37ක්, ග්‍රාමීය මාර්ග 164ක් වයඹ ලේකම් කාර්යාලය මැදිහත් වීමෙන් වයඹ පළාත තුළ ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන දෙදහස් පන්සියයක් යොදවා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලාවේ ආරක්ෂාව හා උන්නතිය සඳහා කලාකරුවන්ගේ සුභසාධනය ඉතාම අත්‍යවශ්‍ය සාධකයක් වශයෙන් අපේ රජය කල්පනා කරනවා. එම නිසා ඉතිහාසයේ ප්‍රථම වතාවට දායකත්ව විශ්‍රාම වැටුපක් කලාකරුවන්ට ලබා දීමට 2016 වර්ෂයේදී අපිට හැකියාව ලැබුණා. ආරම්භක පියවරක් වශයෙන් 2016 වර්ෂයේදී මේ සඳහා රුපියල් මිලියන හතළිස් හතරක් මගේ අමාත්‍යාංශය විසින් දායකත්ව විශ්‍රාම වැටුප සඳහා යොදා ගෙන තිබෙනවා. මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වන ලෙස මම අපේ සමස්ත කලාකරුවන්ට ආරාධනා කරනවා. ඒ වාගේම මෙම වැඩ පිළිවෙළ තවත් ශක්තිමත්ව ඉදිරියට ගෙන යාමට ගරු මුදල් අමාත්‍යතුමාගේ සහාය තවදුරටත් අපේක්ෂා කරනවා. කලා ක්ෂේත්‍රය ඉතා විශාල පරාසයක විහිදී පවතිනවා. එම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සියලු කලාකරුවන් ඇගයීම පිණිස ජාතික මට්ටමේ සම්මාන උළෙල 15ක් 2016 වර්ෂය තුළදී සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබුවා. මෙම සම්මාන ප්‍රදාන වැඩ පිළිවෙළට 2016 වර්ෂයේදී අලුත්ම ක්ෂේත්‍ර තුනක් එකතු කිරීමට හැකිවීම අප ලද ජයග්‍රහණයක්. රාජ්‍ය ගුවන් විදුලි සම්මාන උළෙල, රාජ්‍ය ඡායා රූප සම්මාන උළෙල සහ රාජ්‍ය රූකඩ සම්මාන උළෙල එම අලුත් සම්මාන උළෙලවල් තුනයි. ඒ වාගේම තමයි රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලේ හොඳම නවකථාවට ලබා දෙන රුපියල් පණස් දහසේ ත්‍යාග මුදල රුපියල් ලක්ෂය දක්වා වැඩි කිරීමට අපිට හැකි වුණා. රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලේ ජයග්‍රහණ ලබන කෘති අමාත්‍යාංශය විසින් මිලදී ගැනීම මඟින් සම්මානනීය ලේඛකයින් දිරිගැන්වීමේ වැඩ පිළිවෙළක් ද ක්‍රියාත්මකව පවතිනවා. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම "දොළොස් මහේ පහන" නමින් නව නිර්මාණාත්මක වැඩසටහන් දොළහක් වසර පුරා ක්‍රියාත්මක කළා. ජාතික සමඟිය හා සංහිඳියාව ඇති කිරීම උදෙසා කලාව මඟින් සුවිශාල කාර්ය භාරයක් ඉටු කළ හැකි යැයි අපේ රජය කල්පනා කරනවා. ජාතීන් අතර සංහිඳියාව උද්දීපනය කිරීම සඳහා අපේ අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක වන සංස්කෘතික මධ්‍යස්ථාන 185ක් මේ වන විට පවතිනවා. මෙම කටයුතු වඩාත් පුළුල් කිරීම පිණිස 2016 වසරේදී තවත් ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන ගණනාවක් ඉදිකිරීම් සම්පූර්ණ කර විවෘත කිරීමට මගේ අමාත්‍යාංශය සංවිධාන කටයුතු සිදු කරනවා. 2016 වසරේ ජනගත කෙරුණු වැඩසටහන් අතරින් සිංහල, දෙමළ, මුස්ලිම් ජන ගී පදනම් කරගෙන සිංහල, දෙමළ, මුස්ලිම් දරුවන් තුන් සියයකගේ පමණ සහභාගිත්වයෙන් නිර්මාණය කළ "නාද නදී" ඔපෙරාව විශාල ජන ප්‍රසාදයක් දිනා ගත්තා.

සංස්කෘතික මධ්‍යස්ථානයන්හි සේවය ලබන සිංහල, දෙමළ, මුස්ලිම් දරු දැරියන් සිය ගණනකගේ සහභාගිත්වයෙන් දින හතරක් පුරා පසු ගියදා අනුරාධපුරයේ පැවැත්වූ "සංස්කෘතික කඳවුර" තවත් විශේෂ වැදගත්කමක් ඉසිලූ වැඩසටහනක්. සංස්කෘතික ක්ෂේත්‍රයේ පර්යේෂණ සංස්කෘතියක් ස්ථාපනය කිරීම පිණිස මේ වන විට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වන අපේ සංස්කෘතික මධ්‍යස්ථාන ඔස්සේ 2016 වසරේ සිදු කළ පර්යේෂණ දහයක් පදනම් කර ගත් "විචක්ෂණ පර්යේෂණ සමුළුව" නුදුරු දිනක පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කර අවසන්. මේ ආකාරයට සිංහල, දෙමළ හා මුස්ලිම් ජනවර්ග අතර සංහිඳියාවක් ගොඩ නැඟෙන ආකාරයේ වැඩසටහන් රාශියක් මෙම වර්ෂය තුළදී ජනගත කිරීමට අපේ අමාත්‍යාංශයට හැකියාව ලැබුණා.

ලාංකීය ජන සමාජය සිරිත් විරිත් හා චාරිත්‍රවලින් ඉතා පොහොසත් සංස්කෘතියක් සහිත ජන සමාජයක් බැව් මුළු ලෝකයම පිළිගන්නවා. එවැනි ආඩම්බර විය හැකි අපේ දේශීය ජීවන රටාව තවත් ශක්තිමත් කිරීම උදෙසා "ජීවත්වීමේ කලාව" සහ "අපේ සොඳුරු පවුල" යන වැඩසටහන් ජාතික වැඩසටහන් ලෙස 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබෙනවා. උතුරේ සහ දකුණේ කලාකරුවන්ට එකම සෙවණක් යටතේ සිය නිර්මාණ බිහි කිරීමට අවස්ථාව උදා කරමින් ගොඩනඟන උතුරු දකුණු මිතුරු සෙවණ තව නොබෝ දිනකින් ජනගත කළ හැකියි. එමෙන්ම ජෝන් ද සිල්වා සමරු රඟහල නවීකරණය කිරීමේ පළමු අදියරේ කටයුතු රුපියල් මිලියන දෙසියයක් වැය කර අවසන් කර තිබෙනවා. නේවාසික පහසුකම් සහිතව ඉදි කරන මහනුවර කුණ්ඩසාලේ ජාතික කලා නිකේතනයේ ඉදි කිරීම් ද මේ වර්ෂයේදී අවසන් කරනු ලැබුවා."

[අ.භා. 2.51]

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 අය වැයේ කාරක සභා අවස්ථාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව සතුටු වෙනවා.

ලැබී තිබෙන කාලය පිළිබඳව බැලුවාම, අපි වාගේ තරුණ නවක මන්ත්‍රීවරුන්ට ඒ කාලය හසුරවා ගන්න අපහසුයි. කෙසේ වෙතත්, ලැබුණු කාලයෙන් ප්‍රයෝජනය ගන්න ඕනෑය කියන විශ්වාසය මත මා කථා කරන්න පටන් ගන්නවා. අද දවසේ මා විශේෂයෙන් සතුටු වෙනවා, අටවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් විධියට අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගරු ඇමතිතුමා ඉදිරියේ මට කතා කරන්න ලැබීම පිළිබඳව.

එතුමා එදා කුලියාපිටිය ආසනයේ තරුණ බල මණ්ඩලයෙන් දේශපාලනයට ඇවිල්ලා අද ලංකාවේ අධ්‍යාපන ඇමතිවරයා බවට පත් වෙලා තිබෙනවා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ ජාතික යොවුන් පෙරමුණේ සභාපතිවරයා විධියට පත් වෙද්දී, මා නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාවේ ජාතික යොවුන් පෙරමුණේ සභාපතිවරයා. ඒ නිසා මගේ ගුරු පියාණන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඇමතිවරයා බවට පත් වෙලා ඉන්න මොහොතක, එතුමාගේ ගෝලයෙකු විධියට අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව මේ අදහස් ප්‍රකාශ කරන්නේ ඉතාමත් සතුටින්. අද අධ්‍යාපන අමාත්‍යාංශය නව මාවතකට ගන්න උත්සාහ කරන මොහොතක බොහෝ අය කියනවා, වසර ගණනාවක් තුළ අධ්‍යාපනයට වෙච්ච දෙයක් නැහැ කියලා. ඒකේ වගකීම භාර කරන්න වෙන්නෙත් ඒ කථා කරන අයටම තමයි.

පසු ගිය වසර 20 තුළ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් කළ යුතු දේ නොකිරීමේ ප්‍රතිඵලයයි අද අපට අත්විඳින්න වෙලා තිබෙන්නේ. ගුරුවරුන්ගේ ප්‍රශ්නය වාගේම දෙමාපියන් දරුවන්ව අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ ක්ෂේත්‍ර හරහා තරගකාරීත්වයට යොමු කරන්න ගත්තා වූ උත්සාහයේ ප්‍රතිඵලය දවසින් දෙකෙන් වෙනස් කරන්න බැහැ. අපේ නව රජයේ ගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් දැඩි විශ්වාසයක් ඇතිවයි අධ්‍යාපන අමාත්‍යාංශය මේ තරුණ නායකයාට භාර දීලා තිබෙන්නේ. කෙසේ හෝ ජනතාව තුළ ආකල්පමය වෙනසක් ඇති කරලා පටු දේශපාලන වාසි, බලාපොරොත්තු, අභිමත ඉෂ්ට කර ගන්නේ නැතිව රටේ සමස්ත ජනතාවගේ අධ්‍යාපනය ඉහළ නංවන්න ගත යුතු ක්‍රියාමාර්ග ගන්නය කියන ඉල්ලීම මතයි එතුමාට මේ අමාත්‍යාංශය භාර දීලා තිබෙන්නේ. ඒ නිසා අවුරුදු 20ක් ආණ්ඩු කරපු අයට මා කාරුණිකව කියනවා, තවම ගත වෙලා තිබෙන්නේ අවුරුද්දයි, ඉතිරි අවුරුදු 5ත් බලාගෙන ඉන්න, පපුවේ තෙතමනය තිබෙන ගුණගරුක සහ වැදගත් මිනිසෙක් බිහි කරන්න අවශ්‍ය කරන අධ්‍යාපනය අපි හදලා දෙන්නම් කියන එක.

අද දවස වයඹ පළාතට වැදගත් දවසක්. අපේ ගරු එස්.බී. නාවින්න ඇමතිතුමා වයඹ පළාත සංවර්ධනය කරන්න ඒ අමාත්‍යාංශය භාර ගෙන තිබෙනවා. ඒ අනුව වයඹ පළාත තුළ දැවැන්ත සංවර්ධන කටයුතු ගණනාවක් කරන්නට එතුමාට නව රජය යටතේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් භාර දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පළාත් සභාව තුළ ප්‍රධාන අමාත්‍යාංශයේ වගකීම ඉසිලූ බුද්ධිමත් සහ ජනතාවගේ දැඩි කීර්තියට ලක් වුණු ජනතා නායකයා අද දවස වන විට, වයඹට කැකිරි - කොළඹට පමණක් කිරි වෙලා තිබුණු යුගය වෙනස් කරලා, වයඹටත් කිරි ගෙනෙන්න වැඩකටයුතු ආරම්භ කර තිබෙන බව මේ සභාවට මතක් කරන්නට ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ඒ නිසා එම කාරණාවත් එක්ක මට ලැබී තිබෙන කාලය අවසන් නිසා මට කථාව අවසන් කරන්න වෙනවා. මේ කාරණාවත් එක්ක මම එක පණිවුඩයක් මතක් කරනවා.

සමාජයේ බොහෝ දේවල් වෙනස් කරන්න, දීර්ඝ කාලයක් තිස්සේ මිනිසුන්ගේ ඇට මිදුළුවල තිබෙන දේවල් වෙනස් කරන්න දවසකින් දෙකකින් බැහැ. එම නිසා දීර්ඝ කාලයක් මේ රට දැවැන්ත විනාශයකට, දැවැන්ත අගාධයකට ඇද දැමූ එදා ආණ්ඩුවේ මැති ඇමතිවරු, මේ ආණ්ඩුවේ ගමන් මඟ වෙනස් කරන්න, එහෙම නැත්නම් මේ ආණ්ඩුවේ ගමන් මඟට මඩ ගහන්න අද විපක්ෂයේ ඉඳලා උත්සාහ කරනවා. පළමුවැනි වසර අවසන් වෙලා දෙවැනි වසරටයි අපි පියමං කරන්නේ. රටේ ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා මේ වසර අවසන් වෙද්දී අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් දැවැන්ත සංවර්ධනයක් ඇති කරන්නත් පුළුවන්. ඒ දෙස නිහඬව බලාගෙන ඉන්නය කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 2.56]

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்திலே எனக்கு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் கொடுத்ததற்காக நன்றி. முக்கியமாக, இலங்கையின் கல்வி நிலைமை பற்றிப் பல்வேறுபட்ட விடயங்கள் இங்கு பேசப்பட்டாலும் கௌரவ கல்வி அமைச்சர் அவர்களும் கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களும் சபையிலே இருக்கின்ற நிலையில் முன்பள்ளிக் கல்வி தொடர்பான சில விடயங்களைப் பேசலாமென நினைக்கின்றேன். இதைப்பற்றிப் பல தடவைகள் நான் இந்த மன்றிலே பேசியிருக்கின்றேன். இருந்தாலும், இந்த முன்பள்ளிக் கல்வியானது, இலங்கையில் கவனத்திலெடுக்கப் படாத ஒரு கல்வித்துறையாகவே காணப்படுகின்றது.

நாட்டிலே தரம் ஒன்றிலிருந்து தரம் 13 வரை கல்வித் தரத்தை விரிவுபடுத்த வேண்டும்; O/L ஐ அதாவது க.பொ.த. சாதாரண தரத்தை ஒரு தடைதாண்டற் பகுதியாக இல்லாமற் செய்து, 13ஆம் தரம் வரை மாணவர்கள் தொடர்ச்சியாகக் கற்கலாம் என்ற நிலை இன்று காணப்படுகிறது. ஆனால், இலங்கையிலே தரம் ஒன்றுக்கு பாடசாலைகளில் அனுமதிக்கப் படுகின்ற மாணவர்களின், 3 வயதிலிருந்து 5 வயது வரையுமான முன்பள்ளிக் காலத்திற்கென ஒரு கல்விக் கொள்கை இல்லை என்பதை ஏன் இதுவரை காலமும் கல்வியமைச்சு கவனத்திலெடுக்கவில்லை? என்ற கேள்வியை நான் இந்த மன்றிலே முன்வைக்க விரும்புகின்றேன். "ஐந்திலே வளையாதது ஐம்பதில் வளையுமா?" என்று தமிழிலே ஒரு பழமொழி இருக்கின்றது. ஆகவே, மூன்றில் வளையாததைப் பதினாறில் வளைக்கலாமா என்பதை நீங்கள் சிந்திக்க வேண்டும். ஏனென்றால், 3 வயதுக் குழந்தைகள் பாடசாலைக் குச் செல்கின்றபோது அவர்களுக்கு வழங்கப்படுகின்ற வசதிகள் என்ன? அந்தப் பிள்ளைகளுக்கு வழங்கப்படுகின்ற உதவிகள் என்ன? அவர்களுக்காகத் திட்டமிடப்பட்ட

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

கல்வியின் வகைகள் என்ன? என்பவற்றை முதலிலே இலங்கையின் கல்வியாளர்கள் சிந்திக்கவேண்டும்.

இங்கு பல்வேறுபட்ட கல்விச் சிந்தனைகள் முன்வைக்கப்படுகின்றன. இலங்கையிலே தேசியக் கல்வி நிறுவகம் இருக்கின்றது. கல்விச் சேவைகள் ஆணைக்குழு இருக்கின்றது. இதனைவிட 17க்கும் மேற்பட்ட பல்கலைக்கழகங்கள் இருக்கின்றன. இவையெல்லாம் கல்வி பற்றிய ஆய்வுகளைச் செய்கின்றன. ஆனால், இலங்கையிலே இன்னும் முன்பள்ளிக் கல்விக்கான ஒரு சரியான திட்டம் வகுக்கப்படவில்லை. இதனைத் தயவுசெய்து கவனத்திலெடுக்க வேண்டும். இந்த முன்பள்ளிக் கல்விக்கான திட்டம் வகுக்கப்படும்வரை நாட்டிலே சரியான வழிக்கு கல்வித்துறையைக் கொண்டுவர முடியாது.

நாட்டிலே இருக்கின்ற 97இற்கு மேற்பட்ட கல்வி வலயங்களிலே ஒவ்வொரு வலயத்திலும் முன்பள்ளிகளுக்கான உதவிக் கல்விப் பணிப்பாளர்கள் நியமிக்கப்பட்டுள்ளார்கள். ஆனால், அந்தந்த மாவட்டங்களிலுள்ள வலயங்களுக்கு அவர்கள் சென்று முன்பள்ளிகளுக்கான கல்வி நிலைப்பாடுகளை அறிவதற்கு வசதியாக அவர்களுக்கு மோட்டார் சைக்கிள்கூட வழங்கப்படவில்லை. இந்த நிலையில் எவ்வாறு முன்பள்ளிப் பிள்ளைகளுடைய ஆரம்பக் கல்வி வளர்ச்சியடையும்? கிளிநொச்சி மாவட்டத்திலே கிட்டத்தட்ட 370 முன்பள்ளிகள் இருக்கின்றன. ஒரு முன்பள்ளி உதவிக் கல்விப் பணிப்பாளர், அவருக்கு எந்தவித வாகன வசதியுமில்லாது எவ்வாறு மாவட்டம் தழுவிய முள்பள்ளிக் கல்வியை வளர்க்க முடியும்? இது இந்த நாடு பூராவும் இருக்கின்ற குறைபாடாகும்.

கௌரவ கல்வியமைச்சர் அவர்களே, நான் சொல்கின்ற இந்த விடயத்தைத் தயவுசெய்து கவனத்திலெடுங்கள்! அதாவது, வடக்கிலே சில மாவட்டங்களில் இராணுவம் முன்பள்ளிகளை நடத்துகின்றது. இது தொடர்பில் பல தடவைகள் நாங்கள் சபையிலே சொல்லியிருக்கின்றோம். "ஆதாரங்களைக் காட்டுங்கள்!" என்று கூறினார்கள். கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, நான் கடந்த 16ஆம் திகதியும் இந்தச் சபையிலே, இராணுவம் முன்பள்ளிகளை நடத்திக்கொண்டிருப்பதற்கான ஆதாரங்களைக் காட்டியிருந்தேன். இராணுவத்திற்குப் பணம் வழங்குவது அரசாங்கம். ஆகவே, அரசாங்கம் கல்வியமைச்சினூடாக அந்தப் பணத்தை வழங்கி, இந்த முன்பள்ளிகளைக் அதனூடாக நடத்துவதற்கு ஏன் ஒழுங்கு செய்யமுடியாது? ஆகவே, இது இந்த நாட்டிலே கவனிப்பாரற்று அல்லது கவனத்திலெடுக்கப்படாமல் தள்ளிப் போடுகின்ற ஒரு விடயமாகவே பார்க்கப்படுகின்றது. உதாரணமாக, கல்வி இராஜாங்க அமைச்சர் அவர்களுக்குக் கூட இங்கு பேசுவதற்கு இன்று நான்கு நிமிடங்கள்தான் ஒதுக்கப்பட்டிருந்தன. அதனால், அவரே கவலைப்பட்டுக் கொண்டு அமர்ந்தார். இந்த நிலைமையில், அவரால் பெரிதாக எதைச் செய்யமுடியும்? ஆகவே, இந்த நாடு எங்கே போய்க் கொண்டிருக்கின்றது? சபையிலே கதைக்கின்ற விடயங்கள் நல்லிணக்கமான முறையில் நடைபெறுகின்றனவா? போன்ற கேள்விகள் இங்கே எழுகின்றன.

පසුගිය අවුරුද්දේ 'ළඟම පාසල-හොඳම පාසල' වැඩසටහන යටතේ බස්නාහිර පළාත් සභාවේ විතරක් නොවෙයි, මුළු ලංකාවේම තිබෙන පළාත් සභා පාසල් රාශියක ගොඩනැගිලි හදන්න, යටිතල පහසුකම් දියුණු කරන්න, ඒ වාගේම ඒවාට අවශ්‍ය භෞතික සම්පත් ලබා දෙන්න අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් ලබා දීලා, විශාල වැඩ කොටසක් කළා. මා නියෝජනය කරන 'මැද කොළඹ' ආසනය තුළ පාසල් දියුණු කිරීම සඳහා එතුමා ලබා දෙන සහයෝගය නවත්වන්න යම් යම් බලවේග ක්‍රියා කරද්දීත් එතුමා නිර්භීතව ඒවාට මුහුණ දීලා අපේ ආසනය තුළ ඉන්න දුප්පත් ළමයින්ගේ අධ්‍යාපනය නඟා සිටුවන්න අපට විශාල මුදලක් ලබා දුන්නා. මම ඒ පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා. අභියෝග මැද්දේ තමයි එතුමා අද ඒ වැඩ පිළිවෙළ කරගෙන යන්නේ. සමහර කාරණාවලදී එතුමාගේ දරදඬු ප්‍රතිපත්ති එක්ක අපිත් ගැටෙන අවස්ථා තිබෙනවා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු වුණත්. නමුත් එතුමා ඒ අරගළය දියත් කරන්නේ සියලු දෙනාටම සාධාරණත්වය ඉටු කළ හැකි අධ්‍යාපන ප්‍රතිපත්තියක් සෑදීම වෙනුවෙන් බව අපට පැහැදිලියි. ඒ වෙනුවෙන් අපි එතුමාට සුබ පතනවා.

මීට කලින් කථා කළ අපේ රාජ්‍ය අමාත්‍ය ෆවුසි මැතිතුමා මේ සභාවට වැරදි පණිවුඩයක් ලබා දුන්නා, මාලිගාවත්ත දරුස්සලාම් මුස්ලිම් මහා විද්‍යාලයට ලැබෙන්න තිබුණු විශාල මුදලක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නැවැත්වූවා කියලා. අධ්‍යාපන අමාත්‍යාංශය කිසි විටෙකත් පෞද්ගලික සංවිධාන, දානපතියන් ලබා දෙන කිසිම මුදලක් නවත්වලා නැහැ. 2016 ජනවාරි මාසයේදී ජනාධිපතිතුමාගේ අතින් මුල්ගල් තියලා ගොඩනැඟිල්ලක් හදන්න පටන් ගත්තා. මාස නවයක් තිස්සේ ඒ ගොඩනැඟිල්ලේ වැඩ පටන් ගත්තේ නැහැ. ඒ මුල්ගල තවම එතැන තිබෙනවා. එහෙම තිබෙද්දී 2016 සැප්තැම්බර් මාසයේදී අපි ඒ පාසල 'ළඟම පාසල-හොඳම පාසල' වැඩසටහනට ඇතුළත් කළා. ඒ අනුව අපි යෝජනා කළ තට්ටු හතරේ ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අපට මුදල් ලැබුණා. ව්‍යාපාරිකයින් එක්ක එකතු වෙලා ලියුම් දීලා ඒ රුපියල් මිලියන 58ක මුදල් ප්‍රතිපාදනය නවත්වන්න රජයේ ඇමතිවරයෙක් මැදිහත් වෙලා කටයුතු කිරීම පිළිබඳව අපි ඉතාම කනගාටු වෙනවා.

'ළඟම පාසල-හොඳම පාසල' කියන්නේ ජාතික වැඩසටහනක්. පෞද්ගලික ව්‍යාපාරිකයින් එක්ක එකතු වෙලා ඒ ජාතික වැඩසටහන කඩාකප්පල් කරන්න එතුමා කටයුතු කිරීම පිළිබඳව අපි ඉතාම කනගාටු වෙනවා. කොහොම නමුත් අද ඒ වැඩසටහන පටන් අරගෙන තිබෙනවා. දරුස්සලාම් මුස්ලිම් මහා විද්‍යාලයට රජයෙන් ලබා දුන් රුපියල් මිලියන 58ක ව්‍යාපෘතිය අද පටන් අරගෙන තිබෙනවා. රජයේ පාසල්වලට ආධාර කරන්න, උදවු කරන්න ඕනෑම කෙනෙකුට පුළුවන් කියලා අපි කියනවා. නමුත්

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

එකක් මතක තියා ගන්න ඕනෑ. ඒ පාසල් පෙන්වලා, දුප්පත් දරුවන් පෙන්වලා වෙළෙඳාම් කරන්න, සල්ලි හම්බ කරන්න කාටවත් ඉඩ දෙන්න බැහැ. එක එක පාසල් පෙන්වලා මුස්ලිම් වෙළෙඳ ව්‍යාපාරිකයින්ගෙන් මුදල් හම්බ කරගෙන ජීවත් වන තත්ත්වයක් අද තිබෙනවා. අපි ඒවා හෙළා දකිනවා. ඒවාට ඉඩ ලබා දෙන්න අපට බැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයත් ඒ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. එක එක ව්‍යාපාරිකයින්ට පාසල් පෙන්වලා, දුප්පත් ළමයි පෙන්වලා, පැල්පත් පෙන්වලා මුදල් හම්බ කර ගෙන මඩිය තර කර ගන්නා ව්‍යාපාරයක් අද ක්‍රියාත්මක වෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය ඒ සඳහා මැදිහත් වෙන්න ඕනෑ කියලා මම කියනවා. රජයේ පාසල් පෙන්වලා කාටවත් මුදල් හම්බ කරන්න දෙන්න හොඳ නැහැ.

වෙලාව සීමිත නිසා මම ඊළඟට අවධානය යොමු කරන්න කැමැතියි, අපේ ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා මීට දවස් කිහිපයකට කලින් සඳහන් කළ කාරණයක් සම්බන්ධව. අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත් අද දින සාකච්ඡාවට භාජන වන නිසා මම ඒ පිළිබඳව සඳහන් කරන්න කැමැතියි. එතුමා කිව්වා, ISIS සංවිධානයට ලංකාවේ තිස් දෙදෙනෙක් සම්බන්ධයි කියලා. එතුමාට කවුරු ඒ සංඛ්‍යා ලේඛන ලබා දුන්නා ද කියන්න මම දන්නේ නැහැ. මම එතුමාට කියන්න ඕනෑ, ඒ සංඛ්‍යා ලේඛන නිවැරදි නැහැ කියලා. මීට අවුරුදු එකහමාරකට කලින් බුද්ධි අංශ වාර්තා කළා, ලංකාවේ හතරදෙනෙක් ISIS සංවිධානයත් එක්ක සම්බන්ධකම් පවත්වලා, මේ රටින් පිට වෙලා ගියා කියලා. ඒක අවුරුදු එකහමාරකට කලින් වුණු සිද්ධියක්. හතර දෙනෙක් කියලා තමයි කිව්වේ. ඒකත් සැක කරනවා කියලා පමණයි බුද්ධි අංශ වාර්තාවේ තිබෙන්නේ. මේ රටේ ජාතික සංහිඳියාව ඇති කර ගෙන යන මේ වෙලාවේ අපි යම් යම් දේවල් කියන කොට ඉතා වගකීමෙන් කටයුතු කරන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. මේ රටේ ජාතික සමඟිය ගොඩ නඟන්නයි අපි මේ රජයක් හැටියට උත්සාහ කරන්නේ. මේ රටේ ජාතික සංහිඳියාව ඇති කරන්නයි අපි මේ උත්සාහ කරන්නේ. රජයේ අදහස් පළ කරන ඩේලි නිව්ස් පුවත්පත ඊළඟ දවසේ -2016 නොවැම්බර් 19 වන සෙනසුරාදා- පුවත් පතේ මුල් පිටුවේ ඒ පිළිබඳව මෙසේ සඳහන් කර තිබෙනවා:

"Thirty Two Lankans Join Islamic State Movement"

ඩේලි නිව්ස් පුවත්පතෙන් මම අහනවා, "සංහිඳියාව ඇති කරන්නද එහෙම කළේ?" කියලා.

මේ රජයේ අදහස, රජයේ මතය නියෝජනය කරන 'ඩේලි නිව්ස්' පුවත්පත මෙහෙම කරන්නේ රට තුළ ජාතික සංහිඳියාව ඇති කරන්නද, එහෙම නැත්නම් නැවත මේ රට වට්ටන්නද කියලා මම අහනවා. 'ඩේලි නිව්ස්' පත්‍රය මේ රටේ ජාතිවාදය ඇති කරන, ආගම්වාදය ඇති කරන කොන්ත්‍රාත් එක කරනවාද කියන සැකය අපට ඇති වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, පසු ගිය කාලය තුළම මේ චෝදනා තිබුණා; මුස්ලිම් ජනතාවට එරෙහිව චෝදනා තිබුණා. එතුමා කිව්වා, පිට රටවලින් දේශකයෝ ආවා කියලා. කිසිම ආගමික සිද්ධස්ථානයකවත්, ජාත්‍යන්තර පාසල්වලවත් කිසිම රටකින් දේශකයෝ ඇවිල්ලා උගන්වන්නේ නැහැ. සංචාරක වීසාවලින් ඇවිල්ලා කවුරුවත් ආගමික කටයුතුවල යෙදෙන්නේ නැහැ. එතුමා පළ කළ ඒ චෝදනා සියල්ල පසු ගිය කාලයේ මුස්ලිම් - සිංහල ගැටුම් ඇති කරන්න කටයුතු කළ සංවිධානවලින් කිව්ව දේවල්. ඒවා තමයි එතුමා ප්‍රකාශ කළේ. එතුමා එසේ ප්‍රකාශ කිරීම ගැන මම කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජාතික සංහිඳියාව ගැන කථා කරනවා. අපි මතක තියා ගන්න ඕනෑ, මේ රට හදන්න; මේ ආණ්ඩුව බලයට ගේන්න; මේ අලුත් ආණ්ඩුව ගොඩ නඟන්න ජනවාරි 08වැනිදා මේ රටේ සුළු ජන කොටස් විශාල කාර්ය භාරයක් කළ බව. සුළු ජන කොටස් එවැනි කාර්ය භාරයක් කළේ ඔවුන්ට මේ රටේ නිදහසේ ජීවත් වෙන්න ඕනෑ නිසායි.

පසුගිය මහින්ද රාජපක්ෂගේ පාලන කාලයේ ජාතිවාදයට ඉඩ දීලා, ආගම්වාදයට ඉඩ දීලා මේ රට ම්ලේච්ඡත්වය කරා ගෙන යන වැඩ පිළිවෙළක් තිබුණා. ඒකට විරුද්ධව මේ රටේ සියලු බලවේග එකතු වෙලා 2015 ජනවාරි 08වැනිදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති කළා. ඒකට හේතු වූ කාරණා ගණනාවක් තිබුණා. එකක් දූෂණයට විරුද්ධව, අනෙක භීෂණයට විරුද්ධව.

ඊළඟට, මේ රටේ ජාතිවාදය පරාජය කරලා, ජාතික සමගිය ගොඩ නඟන්න තමයි, මේ රටේ ඒ ජන කොටස් ටික මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දුන්නේ. ඒ වාගේම සුළු ජන කොටස් බලාපොරොත්තු වුණේ මේ ආණ්ඩුව යටතේ අපට නිදහසේ ජීවත් වෙන්න අවස්ථාව තියෙන්න ඕනෑ; අපේ ආගම, ධර්මය අදහා ගෙන, සංස්කෘතිය රැක ගෙන, මේ රටේ අනෙකුත් පුරවැසියන් එක්ක සමාදානයෙන් ජීවත් වෙන්න ඕනෑ කියන එකයි. ඒක මේ රටේ සුළු ජන කොටස්වල එකම බලාපොරොත්තුව වෙලා තමයි මේ ආණ්ඩුවට ඡන්දය දුන්නේ. එහෙම නැතිව හොරු අල්ලන්නවත්, බඩු මිල අඩු කරන්නවත්, අර කියන කොමිෂන් සභා ටික ස්ථාපිත කරන්නවත් නොවෙයි, මේ රටේ මුස්ලිම් ජනතාවත්, දෙමළ ජනතාවත් ඡන්දය දුන්නේ. මුස්ලිම් සහ දෙමළ ජනතාව ඡන්දය දුන්නේ එක දෙයක් වෙනුවෙන්. මේ රටේ අනෙකුත් ජන කොටස් එක්ක සමාදානයෙන් ජීවත් වෙන්න පරිසරය හදලා දෙන එක තමයි ඒ අයගේ එකම ඉල්ලීම බවට පත් වුණේ. නමුත් ඒ සමාදානය කඩන්න, ඒක නැති කරන්න, නැවත වෛරය ඇති කරන්න අද නොයෙකුත් බලවේග ක්‍රියාත්මක වෙනවා.

අපි දැක්කා, පසුගිය සතියේම ඒ බලවේග නැවත එළියට ඇවිල්ලා තිබෙන බව. ඒ බලවේග නැවත වෛරක්කාරී විධියට, ජාතීන් ඇන කොටා ගන්න තත්ත්වයට පත් කරන්න අද වැඩ කර ගෙන යනවා. ඒක නවත්වන්න අපි මැදිහත් වෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් සංවර්ධනය, නූතනවාදය, ආසියාවේ දියුණුම රට, ආසියාවේ තිබෙන හොඳම රට බවට පත් කිරීම වැනි අපි කථා කරන දේවල් අන්තිමට මේ ගරු සභාවට විතරක් සීමා වෙනවාය කියන එක මතක තියා ගන්න. ඒක නවත්වන්න දේශපාලන නායකයන් හැටියට පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව අප සියලු දෙනාටම වගකීමක් තිබෙනවා.

ජාතිවාදී ගිනිදැල්වලින් අපි අවුරුදු 30ක් දුක් වින්දා. උතුරේ ජනතාව, දකුණේ ජනතාව, නැඟෙනහිර ජනතාව අප සියලු දෙනාම ඒ ජාතිවාදී ගිනි දැල්වලින්, ඒ යුද්ධයේ විපාකයෙන් තවම එකතු වෙන්න බැරිව එක තැන ළ තැවෙනවා. ඒ මතකය අපෙන් ගිලිහී යන්න කලින්, අපට ඒක අමතක වෙන්න කලින් අපි අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. නැවතත් මේ ලංකාවේ ජාතිවාදීන් එළියට ඇවිල්ලා පිඹුම් ගහන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒකට ඉඩ දෙන්න එපා කියලා අපි රජයට කියනවා.

ඒක සිංහල වේවා, මුස්ලිම් වේවා, දෙමළ වේවා කවුරු කළත් ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. මොකද, අපි ශ්‍රී ලාංකිකයන් හැටියට මේ රටේ දෙමළ-සිංහල සමගිය ගොඩ නඟන්න ඕනෑ. අපි ජාතික ගීය කියනවා, "එක මවකගේ දරු කැල" කියලා. අපි යහ පාලන ආණ්ඩුව ගොඩ නැඟුවේ අන්න ඒ "එක මවකගෙ දරු කැල" කියන වචන, ඒ තේමාව යථාර්ථයක් කරන්නයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.03]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Megapolis and Western Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාමත් වටිනා වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ විවාද කරන මේ අවස්ථාවේදී අදහස් ඉදිරිපත් කරන්නට ලැබීම පිළිබඳව මම ඉතා සතුටු වෙනවා.

මම වැඩියෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. වයඹ සංවර්ධන අමාත්‍යාංශය යටතේත් අපේ රටට විශාල කාර්ය භාරයක්, සේවයක් සිද්ධ වෙනවා.

ඒ යටතේ තිබෙන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නවීකරණයකට ලක් වෙමින් පවතින මොහොතක ඉදිරි කාලයේදී සෑම පුරවැසියෙකුටම නව හැඳුනුම්පතක් ලබා දීමේ ක්‍රියාවලිය මේ දිනවල ආරම්භ වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ අපේ කාරක සභාවලටත් මේ සම්බන්ධව ලිපි ගණනාවක් ලැබී තිබෙනවා. එම නිසා මම අමාත්‍යතුමාගේත්, ලේකම්තුමාගේත්, අමාත්‍යාංශයේත් අවධානය ඒ සම්බන්ධයෙන් යොමු කරනවා. ඉතාම ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු හැඳුනුම්පතක් ලබා දීම පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය ඉතාමත් ඕනෑකමින් යොමු කරන්න කියන ඉල්ලීම මම ප්‍රථමයෙන් කරනවා. ඒ පිළිබඳව ලිපි, අදහස්, යෝජනා අපේ පාර්ලිමේන්තුවට ලැබී තිබෙනවා. මම ඒවා අමාත්‍යාංශයට යොමු කිරීමටත් කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන ගණනාවක් තිබෙනවා.

විශේෂයෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවත් නිහඬ විශාල සේවයක් කරන ආයතන දෙකක්. පාර්ලිමේන්තුවේ ගිණුම් කාරක සභාවට මේ ආයතන දෙකම සහභාගි වුණා. අපේ රට ලෝකයේ අනෙක් රටවලට වඩා වෙනස් වෙන එක කරුණක් තමයි අපේ රටට දීර්ඝ ලිඛිත ඉතිහාසයක් තිබීම. දීර්ඝ ලිඛිත ඉතිහාසයක් තිබෙන රටක් විධියට, අපේ රට අනෙක් රටවලට වඩා ඉදිරියෙන් ඉන්නවා. එම නිසා අපට යුතුකමක්, වගකීමක් පැවරෙනවා. අනෙක් රටවලට ඒ රටේ ඉතිහාසය, අතීතයේ යම් යම් දේවල් රැක බලා ගැනීමේ වගකීම අඩුයි. නමුත් අපේ රටට අනෙක් රටවලට වඩා දීර්ඝ ඉතිහාසයක් තිබෙන නිසා අපට රැක ගත යුතු දේවල් වැඩියි.

නිදහසෙන් පස්සේ සෑම රජයක් විසින්ම මේ සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් විවිධ උත්සාහයන් යොදාගෙන තිබුණත්, දැනට වඩා වැඩි අවධානයක් අය වැය තුළිනුත් මේ සඳහා යොමු කිරීමේ කාලෝචිත අවශ්‍යතාවක් තිබෙන බව මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. මේ අය වැයෙන් පමණක් නොවෙයි, ඉතිහාසයේ තිබුණු අය වැයවලදීත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දී තිබෙන ප්‍රතිපාදන පිළිබඳව සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් නැහැ.

ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට මා දන්නවා, ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් පුරාවිද්‍යාත්මක සිද්ධස්ථාන දාහකට ආසන්න ප්‍රමාණයක් ගැසට් පත්‍රයේ පළ කරලා තිබෙන බව. ඒවා, විවිධ යුගවලට අයත් විවිධ ස්ථානයි. මේවා අඛණ්ඩව සුරක්ෂිතව පවත්වාගෙන යාම පිළිබඳව ප්‍රශ්නකාරී තත්ත්වයන්වලට මුහුණ පාලා තිබෙනවා. අපේ යුතුකමක් හා වගකීමක් වෙනවා, මේවා රැක බලා ගැනීම හා අනාගත පරපුරට ඒවා ආරක්ෂා කර දීම. මේ අවස්ථාවේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සම්බන්ධයෙනුත්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සම්බන්ධයෙනුත් අපි දැනට වඩා වැඩි අවධානයක් යොමු කළ යුතුයි කියන ඒ කරුණ මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

අධ්‍යාපන අමාත්‍යාංශය අපේ රටේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක්; වැදගත් වගකීමක් ඉටු කරන්න තිබෙන අමාත්‍යාංශයක්. මම හිතනවා, ඒ කාර්ය වර්තමාන අමාත්‍යතුමාට ඉටු කරන්න ලැබෙයි කියලා. අපේ ආංශික අධීක්ෂණ කාරක සභාව තුළිනුත් ඒ අවශ්‍ය සහයෝගය සහ දායකත්වය නොඅඩුව ලබා දීමට අපි කටයුතු කරනවා. ඒ නිසා අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, අතීතයේ ඉඳන් මේ දක්වාම අපේ රටේ අධ්‍යාපනයේ ප්‍රගතියක් ලබා තිබෙනවාය කියා. ඒක නැහැයි කියලා කියන්න කාටවත් පුළුවන්කමක් නැහැ.

පැවැති සියලුම රජයන් ඒ පිළිබඳව විශේෂ ප්‍රමුඛතාවකින් යුතුව කටයුතු කර තිබෙනවා. -මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථාව කරගෙන යන්න බැහැ, මේ අවට සාකච්ඡා පැවැත්වෙන නිසා.- වර්තමානයේ අපට තිබෙන අභියෝග හඳුනාගෙන, අප ළඟා කරගෙන ආ ඒ දියුණුව එතැනින් එහාට ඉදිරියට ගෙන යෑමේ කාර්ය භාරයේ වගකීම තමයි අද අපට පැවරී තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට මේ දියුණුව ළඟා කර ගැනීම සඳහා විශේෂයෙන් අපේ ගුරු පරපුර, විදුහල්පතිවරු, නිලධාරින් ඉතාමත් කැප වීමකින් යුතුව කටයුතු කර තිබෙනවා. යම් විදුහල්පතිවරයකු, යම් ගුරුවරයකු යම් නීති විරෝධි වැඩක් හෝ වැරැදි වැඩක් හෝ කළොත්, ඒ දේ තමයි අද ජනමාධ්‍ය තුළින් -ප්‍රවෘත්ති මඟින් වෙන්න පුළුවන්, වෙනත් ආකාරයකින් වෙන්නත් පුළුවන්- බොහෝ විට අපට දකින්න, අහන්න ලැබෙන්නේ. නමුත් පාන්දර හයට පාසලට ගිහිල්ලා පන්ති කාමරයේ දරුවන්ට උගන්වන ගුරුවරු අපේ පාසල් පද්ධතිය තුළ ඉන්නවා. පාසල් වෙලාවෙන් පසුව පාසල්වල වැඩ කරන ගුරුවරු ඉන්නවා. විවිධ ආර්ථික අපහසුතාවන් තිබෙන දරුවන්ගේ අවශ්‍යතා පවා තමන්ගේ පෞද්ගලික මුදලින් ඉටු කරන විදුහල්පතිවරු, ගුරුවරු අපේ පාසල් පද්ධතිය තුළ ඉන්නවා.

අපේ රටේ විදුහල්පතිවරුන්ගෙන්, ගුරුවරුන්ගෙන් අතිමහත් බහුතරය මේ ආකාරයෙනුයි සිය අධ්‍යාපන කටයුතු කරන්නේ කියන තැන ඉඳගෙන අපි මේ කාර්ය භාරය ඉටු කළ යුතුව තිබෙනවා. එම ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට, නිලධාරින්ට අපේ ගෞරවය පිරිනමන්න ඕනෑ. ගුරු දිනය ළං වුණාම, පාසලක ත්‍යාග ප්‍රදානෝත්සවයක් පැවැත්වෙන කොට එවැනි අය අගය කරනවා. නමුත් මා පෞද්ගලිකව දකින්නේ, ඒ ඇගැයීමේ ක්‍රියාවලිය කෙරෙහි මීට වඩා වැඩි අවධානයක් යොමු කිරීම කාලෝචිත අවශ්‍යතාවක් වෙලා තිබෙනවාය කියලායි.

තමන්ගේ විෂයට අමතරව විෂය බාහිර ක්‍රියාකාරකම් කරන ගුරුවරු විශාල පිරිසක් පාසල් පද්ධතිය තුළ ඉන්නවා. ඒ වාගේම හොඳ ප්‍රතිඵල පෙන්වන ගුරුවරු විශාල ප්‍රමාණයක් ඉන්නවා. එවැනි ආකාරයෙන් ශුභවාදිව කටයුතු කරන නිලධාරින්, විදුහල්පතිවරුන්, ගුරුවරුන් ඇගැයීම පිළිබඳව රජයක් විධියට

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

දැනට වඩා වැඩි අවධානයක් අනිවාර්යයෙන්ම යොමු කළ යුතුව තිබෙනවා. එහෙම වුණොත්, අඩු පාඩු තිබෙන අයත් නිවැරදි වේවි කියා මා හිතනවා.

දිනපතාම පාසලට පැමිණෙන ගුරුවරයාටත්, හොඳම ප්‍රතිඵල පෙන්වන ගුරුවරයාටත්, තමන්ගේ විෂයට අමතරව විෂය බාහිර ක්‍රියාකාරකම්වලට දායක වන ගුරුවරයාටත් ලැබෙන වැටුප ම තමයි, ලැබෙන උසස්වීම ම තමයි, හැම දාම වාගේ පාසල් එන්නේ නැති ගුරුවරයාටත්, තමන්ගේ විෂය පිළිබඳ වගකීමවත් හරියාකාරව ඉටු කරන්නේ නැති ගුරුවරයාටත් ලැබෙන්නේ. අප මෙය නිවැරදි කර ගත යුතුයි. එම නිසා අධ්‍යාපන අමාත්‍යතුමා මේ කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, අපි දන්නවා, ඔබතුමා විදුහල්පතිවරුන් විදේශ සංචාරවලට සහභාගි කරවමින් එවැනි ඵලදායි වැඩසටහන් ක්‍රියාත්මක කරන බව. නමුත් මේවා වාර්ෂිකව පළාත් පට්ටමින්, කලාප මට්ටමින්, කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කර, අය වැය මඟින් හෝ වැඩි ප්‍රතිපාදන යොදවා එවැනි අය ඇගැයීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතුව තිබෙනවා. අධ්‍යාපනයේ දියුණුවක් තිබෙනවාය කියා අප කිව්වේ, මෙන්න මේ හේතුව නිසායි. අපට මතකයි, 1980 දශකයේ මුල් භාගය පමණ වනවිට අපේ රටේ සාමාන්‍ය පෙළ විභාගය සමත් වුණේ සියයට 17යි, උසස් පෙළ විභාගය සමත් වුණේ සියයට 26යි කියලා. නමුත් මේ වනවිට එය සියයට 60කට කිට්ටු කර තිබෙනවා. දැන් අපිට කථා කරන්නට පුළුවන්, සියයට 40ක් අසමත් කියා. අද ඒක තමයි සිද්ධ වෙන්නේ. අද කියනවා, සියයට 40ක් අසමත්ය කියා. හැබැයි අර සියයට 17 සිට සියයට 60 දක්වා ආපු ගමන ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ඒක වැරැදියි. එහෙම කරලා අපට සියයට 60 සිට සියයට 90 දක්වා යන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. සියයට 17 හා සියයට 26 සිට සියයට 60 දක්වා එන්නට දායක වුණු අය අගයලා, ඒ පිළිබඳව අවධානය යොමු කරලා, ඒ ගමනේදී සිදු වුණු අඩුපාඩුකම් හඳුනාගෙන, මෙතැන සිට ඉදිරියට යාමට අපි කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතුව, අද අධ්‍යාපනය පිරිහිලාය, සියයට 40ක් උසස් පෙළ අසමත්ය, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි විෂයයන් සියයට 50කට කිට්ටුවෙන්න අසමත්ය කියන තැන ඉඳගෙන මේ කාර්ය භාරය කරන්නට කොහෙත්ම පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. රටේ, ලෝකයේ ඇතිවන වර්තමාන අභියෝගවලට අනුව පාසලේ විෂය මාලාවන් වෙනස් විය යුතුයි. ඒක මේ දශක කිහිපය තුළම වෙනස් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පසු ගිය රජය තුළින් තාක්ෂණ විෂයය හඳුන්වා දීම ඉතාමත්ම හොඳ ඵලදායි වැඩක්. අධ්‍යාපනය කලා, වාණිජ, විද්‍යාව යන විෂය ධාරාවලට පමණක් සීමා වෙලා තිබුණා. මේ අතරින් සියයට 50කටත් වඩා වැඩි ප්‍රමාණයක් කලා විෂයය හදාරන්නේ; කලා උපාධිධාරීන්. ගණිත විද්‍යාව හදාරන සිසුන්ගේ ප්‍රතිශතය අඩු වෙලා තිබුණා. ඒ අනුව නව විෂය ධාරාවන් හඳුන්වා දුන්නා. මේ හඳුන්වා දුන් විෂය ධාරාවල තිබෙන ප්‍රගතිය, අඩුපාඩුකම් හඳුනාගෙන අඛණ්ඩව ශක්තිමත්ව ඉදිරියට ගෙන යා යුතුව තිබෙනවා. අද ඒ කාර්ය භාරය වර්තමාන රජය කරනවා.

ඒ විතරක් නොවෙයි. තවත් පියවරක් තබා තිබෙනවා. ඒ පියවර මොකක්ද? වසර 13ක පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීමයි. අපේ රටේ ඉතිහාසයේ මීට පෙර දශකවල පාසල් යන්නේම නැති දරුවන්ගේ ප්‍රමාණය වැඩියි. පස්වැනි පන්තියේදී පාසල් හැර යන ප්‍රමාණය වැඩියි. සාමාන්‍ය පෙළ, උසස් පෙළ පන්තිවලදී පාසල් හැර යන ප්‍රමාණය වැඩියි. නමුත් දැන් ඒ ප්‍රමාණය ක්‍රම-ක්‍රමයෙන් අඩු වෙලා තිබෙනවා. වර්තමානයේ තිබෙන විභාග ක්‍රමය අනුවත් සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු පාසල් හැර යන ප්‍රමාණය යම් සැලකිය යුතු ප්‍රමාණයක් වෙනවා. එම නිසා වර්තමාන රජය මේ අයටත් වසර 13ක අනිවාර්ය පාසල් අධ්‍යාපනය හැදෑරීම සඳහා ප්‍රායෝගිකව යම් යම් වෘත්තීන්වලට සම්බන්ධ වීමට හැකිවන පරිදි ඒ පාසල් පද්ධතියට නව විෂය මාලා විසි හතරක් සකස් කරමින් පවතිනවා. මෙයයි කළ යුතු කාර්ය භාරය බවට පත්වෙන්නේ.

අධ්‍යාපන අමාත්‍යාංශය දැඩි ලෙස අවධානය යොමු කළ යුතු කරුණක් මා පෞද්ගලිකව දකිනවා. අප පාසල්වල තොරතුරු තාක්ෂණය ඉගැන්වීමේ කටයුතු පිළිබඳව අවධානය යොමු කරනවා. හැබැයි පාසල්වල ඒ ඉගැන්වීමේ කටයුතු පිළිබඳව අවධානය යොමු කිරීමට පෙර අපේ අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා සහ පරිපාලනයට සම්බන්ධ සියලුම ආයතනය කොතරම් දුරට තොරතුරු තාක්ෂණය පාවිච්චි කරනවාද කියන එක අපි නිහතමානීව පිළිගත යුතුයි. අපේ පරිපාලනයට තොරතුරු තාක්ෂණය පාවිච්චි කරන්නේ නැහැයි කියා අපට කියන්නට පුළුවන්කමක් තිබෙනවා. අපි අන් අයට ආදර්ශයක් දීම තුළින් තමයි මේ සෑම කටයුත්තක්ම සාර්ථකව ඉටු කරන්නට පුළුවන්කමක් ලැබෙන්නේ. බොහෝ රාජ්‍ය ආයතන මේ තොරතුරු තාක්ෂණය පරිපාලනයට පාවිච්චි කළත්, අධ්‍යාපන අමාත්‍යාංශය ඒ පිළිබඳව ලබාගෙන තිබෙන ප්‍රගතිය ප්‍රමාණවත් නැහැ.

අපි ඒ ගැන අපේ කාරක සභාවේදීත් කථා කළා. එම නිසා ඉතාම කඩිනමින් අධ්‍යාපනයේ තිබෙන ප්‍රශ්න සඳහා ඵලදායි තීන්දු -තීරණ ගැනීමට, තොරතුරු තාක්ෂණය පරිපාලන කටයුතුවලට යොදා ගැනීම කාලෝචිත අවශ්‍යතාවක් විධියටයි මා පෞද්ගලිකව දකින්නේ. දැන් ඒ කටයුතු ආරම්භ කර තිබෙනවා කියලා කියනවා. නමුත්, අධ්‍යාපන ඇමතිතුමාට මා යෝජනා කරනවා, ඉලක්ක සහගතව, දින වකවානු ඇතිව මේ පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම අනිවාර්යෙන්ම සිදු විය යුතුයි කියලා. අද අපේ රටේ තිබෙන පාසල්වල ඉන්න ගුරුවරුන් කවුද, මොනවාද ඒ අයට තිබෙන සුදුසුකම්, පුහුණු ගුරුවරු ඉන්නේ කී දෙනෙක්ද, ඒ ඒ විෂයන්වලට ගුරුවරුන් ඉන්නවා ද, ලබන අවුරුද්දේ විශ්‍රාම යන්නේ කවුද යනාදී වශයෙන් තොරතුරු ගන්න අද ප්‍රායෝගිකව අපහසුයි. ඒකට හේතුව, නිවැරදි තොරතුරු නොමැතිකමයි. ඒ නිසා, ගුරුවරයෙක් විශ්‍රාම ගියාට පසුව තමයි, ඒ පුරප්පාඩුවට ගුරුවරු හොයන්නේ. විදුහල්පතිවරයෙක් විශ්‍රාම ගියාට පසුව තමයි-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මම මේ කියන්නේ ඔබතුමා දැනුවත් කරන්නයි. අපි දැන් database එකක් හදලා තිබෙනවා. දැන් අපි ළඟ ඒ සියලු තොරතුරු තිබෙනවා. ඇත්ත වශයෙන්ම මීට පෙර ඒ තොරතුරු තිබුණේ නැහැ. නමුත්, දැන් අපි පවත්වා ගෙන යන දත්ත පද්ධතිය තුළින් තමයි ඉදිරියේදී ගුරුවරුන් බඳවා ගැනීම සහ අනෙක් සියල්ල තීරණය වන්නේ. උදාහරණයක් විධියට කිව්වොත්, අපි දැන් විද්‍යා පීඨවලට සිසුන් බඳවා ගන්නේත් තව වසර තුනකින් විශ්‍රාම යන ගුරුවරුන් ගැනත් සලකා බලලා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ඒ විධියට දත්ත පද්ධතියක් තිබෙනවා නම් ඉතාම හොඳයි ගරු ඇමතිතුමා. මීට මාස හතරකට පමණ පෙර රජයේ ගිණුම්

කාරක සභාවට අමාත්‍යාංශයේ නිලධාරින් සහභාගි වූ අවස්ථාවේදී දැනගන්න ලැබුණා, එහෙම දත්ත පද්ධතියක් තිබුණේ නැති බව. අපි ඒ වෙලාවේදී එය අඩු-පාඩුවක් ලෙස පෙන්වා දුන්නා. පෙන්වා දීලා, මාස හතරකට පස්සේ අද ඒ දත්ත පද්ධතිය තිබෙනවා නම් අපිත් සතුටු වනවා. මොකද, එය විය යුතු දෙයක් නිසා. හැබැයි, මේ කටයුත්ත අනිවාර්යෙන්ම අඛණ්ඩව සිදු විය යුතුයි. යම් ගුරුවරයෙක් යම් පාසලකින් මාරු වුණා නම්, ඒ තොරතුර ඒ දත්ත පද්ධතියට ඇතුළත් විය යුතුයි. ඒ ක්‍රියාවලිය එසේ සිද්ධ විය යුතුයි.

අපි සමහර පාසල්වලට ගිහිල්ලා අහනවා, ඇයි, මෙවර පහේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල අඩු, ඇයි, අපොස (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල අඩු, ඇයි, අපොස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අඩු කියලා. එතකොට, සමහර පාසල්වලින් කියන එකක් තමයි, වර්ෂය මැද දී අදාළ විෂය ඉගැන්වූ ගුරුවරයා මාරු වුණා, එහෙමත් නැත්නම් ඒ ගුරුවරයා විශ්‍රාම ගියා කියලා. ඉතින්, ඒක ඒ ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා සෘජුවම බලපානවා. අපි ඒ නිසා තමයි යෝජනා කරන්නේ, අධ්‍යාපන පරිපාලන පද්ධතියට මේ ආකාරයේ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මට විනාඩි 23ක් තිබෙනවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ කාලයෙන් තමයි විනාඩි 3ක් ඉතිරි වෙලා තිබෙන්නේ.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
අපි යෝජනා කරන්නේ, අනිවාර්යෙන්ම මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළ යුතු බවයි.

අනෙක් ප්‍රධානතම කරුණ වන්නේ, අධ්‍යාපනයේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව දැනට වඩා වැඩි අවධානයක් අනිවාර්යෙන්ම යොමු විය යුතු වීමයි. අද විදුහල්පතිවරයෙකුට, කලාප අධ්‍යක්ෂවරයෙකුට, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකුට අධ්‍යාපනයේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව අවධානය යොමු කරන්න තිබෙන කාලය අඩුයි. ඒ නිසා තමයි, විදුහල්පති රැස්වීමක් තිබ්බත් චක්‍රලේඛ දෙසට වැඩි අවධානයක් යොමු කරන්න සිදු වෙලා තිබෙන්නේ. ගුරු නිවාඩු කියයි, වැටුප් වර්ධක කියයි, inventory තියා ගන්න ඕනෑ කියයි, ළමයි ඇතුළත් කිරීම කියයි. මෙවැනි කටයුතු රාශියත් තිබෙන නිසා අපි අධ්‍යාපනය සංවර්ධන පැත්තට අවධානය යොමු කරන්නේ කොහොමද? මම යෝජනා කරන්නේ, සෑම පාසලකටම අධ්‍යාපන පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වෙනම නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් පත් කරලා, විදුහල්පතිවරයා සහ තවත් නියෝජ්‍ය විදුහල්පතිවරයෙකුට අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලියේ වගකීම අනිවාර්යෙන්ම භාරදිය යුතු බවයි. අපොස (සාමාන්‍ය පෙළ) විභාගය, අපොස (උසස් පෙළ) විභාගය අවසාන වුණාම, එම විභාගවලදී අපේ දරුවන් ප්‍රශ්නයෙන් -ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබෙන්නේ කොහොමද කියලා සලකා බැලීමේ ක්‍රමවේදයක් තිබෙනවා. එය විභාග දෙපාර්තමේන්තුව සෑම පාසලකටම යවනවා. නමුත් මේවා භාවිතයට ගන්නේ නැහැ. මේවා භාවිතයට ගැනීම පිළිබඳව සොයා බැලීමක් කරන්නේ නැහැ. එම නිසා අපි මේ අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව, දැඩි අවධානයක් අනිවාර්යයෙන්ම යොමු කළ යුතුව තිබෙනවා.

විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්න සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින සේවා ව්‍යවස්ථා සම්බන්ධයෙන් දශක ගණනාවක් තිස්සේ ආපු ප්‍රශ්නවලට අද මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි ඒ සියලුම සේවා ව්‍යවස්ථාවලට බලපාන ප්‍රශ්න කඩිනමින් නිරාකරණය කර දීම සඳහා වැඩි අවධානයක් අනිවාර්යයෙන් යොමු කළ යුතුව තිබෙනවා. අපි ඒ සේවා ව්‍යවස්ථා සංශෝධනය කළ යුතුව තිබෙනවා.

විදුහල්පතිවරුන් තෝරා ගැනීම සඳහා පවත්වන තරග විභාගයේදී ප්‍රශ්න පත්‍ර තුනක් සඳහා ලකුණු 300ක් ලබා ගත යුතුව තිබෙනවා. මේ ලිඛිත විභාගයෙන් පමණක් සමත් වන අයට පාසලක විදුහල්පතිකමක් කරන්න පුළුවන්කමක් තිබෙනවාද කියන ප්‍රායෝගික ප්‍රශ්නය ගැන අපි අවධානය යොමු කළ යුතුව තිබෙනවා. දැනට තිබෙන ඒ ක්‍රමවේදය හරි. විදුහල්පතිවරුන් බඳවා ගැනීමට පවත්වපු ලිඛිත විභාගයට 19,000ක් විතර වාඩි වුණා. මේ අයගෙන් ලකුණු 120ට වඩා වැඩියෙන් ගත්ත අය තමයි තෝරා ගත්තේ. නමුත්, මේ 19,000 අතුරින් ලකුණු 120ට වඩා ලබා ගත් 2,500 දෙනෙක් ඉන්නවා. මේ විදුහල්පති විභාගය සමත්වීමට නම් ඒ එක ප්‍රශ්න පත්‍රයකින් ලකුණු 40ක් ලබාගත යුතුයි. සාමාන්‍ය දැනුම, ප්‍රායෝගික සිද්ධි අධ්‍යයනය යනාදී කරුණු සම්බන්ධවයි ඒ විභාගය පවත්වන්නේ. මෙවැනි ලිඛිත පරීක්ෂණයකින් පමණක් පාසලකට විදුහල්පතිවරයෙක් පත් කිරීම වෙනුවට, අපි මීට වඩා ප්‍රායෝගික ක්‍රමයක් අනුගමනය කළ යුතුව තිබෙනවා.

පසුගිය දා බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති වාර්ෂික ඇගැයීම් උත්සවයේදී, සබරගමු පළාතේ සහ වයඹ පළාතේ වැඩ බලන විදුහල්පතිවරුන්ට තමයි වැඩිම ජනාධිපති සම්මාන ගණනක් ලැබුණේ. ඒ අය ක්‍රියාවෙන් ඔප්පු කරලා තිබෙනවා, පාසලක විදුහල්පති භූමිකාව කරන්නේ කොහොමද කියලා. එම නිසා මේ කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතුයි.

මේ වන විට ගුරු උපදේශකවරුන්ගේ සේවා ව්‍යවස්ථාවේ කටයුතු අවසාන අදියරේ තිබෙන්නේ. මේ සියලුම සේවා ව්‍යවස්ථා සම්බන්ධයෙන් තිබෙන ගැටලු, වර්තමාන රජයේ ප්‍රශ්නයක් විධියට, වර්තමාන අධ්‍යාපන අමාත්‍යවරයාට අසාධාරණ විධියට අපි ඉදිරිපත් කරන්නේ නැහැ. නමුත්, පසු ගිය දශක කිහිපයක සිට තිබෙන මේ ප්‍රශ්න නිරාකරණය කිරීමකින් තොරව අපට ඉදිරි වැඩ පිළිවෙළ එළදායී විධියට ගෙන යන්නට පුළුවන්කමක් නැහැයි කියන එකයි මගේ පෞද්ගලික මතය.

ගරු අමාත්‍යතුමාට මේ අමාත්‍යාංශයේ කටයුතුවලදී අපේ සම්පූර්ණ සහයෝගය, දායකත්වය ලබා දෙනවාය කියන පණිවුඩය ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මහතා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.27]

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස් කිහිපය තුළ අපේ පාර්ලිමේන්තුව නිරීක්ෂණය කිරීමේදී අපට පෙනී ගියේ, මෙය ශාස්ත්‍රීය විද්වත් කථිකාවලින් ඈත් වෙලා බවයි. මඩ ගැසීම්, අවලාද, අඥෝනා, ශාප කිරීම්වලින් පිරුණු ස්ථානයක් බවට මේ උත්තරීතර සභාව පත් වෙලා තිබුණු බව නොරහසක්. ශාස්ත්‍රීය අධ්‍යාපන ක්‍රමයෙන් වියුක්ත වෙන සමාජයක් තුළ ඉතිරි වන ඵලවල නෂ්ටාවශේෂ තමයි ඒ පෙන්නුම් කළේ. උසස් ආධ්‍යාත්මයක් සහිත මිනිසෙක් නිර්මාණය කිරීම පිළිබඳව ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා කරුණු පැහැදිලි කළා.

අපේ අධ්‍යාපන ක්‍රමය ආසියාවේ ඉහළම සාක්ෂරතාව සහිත, උසස් අධ්‍යාපනයක් සහිත එකක් බවට සමස්ත ලෝකයම පිළිගන්නවා. ඒ උසස් තත්ත්වයට පත් වුණේ, නිදහස් අධ්‍යාපනයට පින් සිද්ධ වෙන්නට. ඒ නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගත්ත ගුරු භවතුන් මේ රටේ දරුවන්ට ඒ නිදහස් අධ්‍යාපනයේ ඵලය ලබා දෙනවා. ඔවුන් ගුරු භූමිකාව, උත්තරීතර ගුරු ගෞරවය තුළ ඉඳගෙන ශිල්ප ලබා දෙමින් තමයි, ශාස්ත්‍රීයව සහ අධ්‍යාත්මිකව දරුවා සංවර්ධනය කරන්න වෙහෙසුණේ.

එම නිසා අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය කිසියම් ආකාරයකින් මූල්‍යමය කරුණුවලට තල්ලු වෙනවා නම්, යම් විධියකින් පෞද්ගලික ව්‍යාපාරිකයන් අතට යනවා නම්, මේ රජය හැම විටම අනුගමනය කරන විකුණා දැමීමේ ප්‍රතිපත්තිය සහ ලාභ ලබාගැනීම සඳහා ක්‍රම සොයා ගැනීම සඳහා වූ ප්‍රතිපත්තිය අධ්‍යාපන කෂේත්‍රය සම්බන්ධයෙනුත් ආදේශ කරනවා නම්, එය අපේ රටේ උසස් අධ්‍යාත්මයක් සහිත දරුවන් නිර්මාණය කිරීම පිළිබඳ සැබෑ ප්‍රශ්නයට අප යොමු කරවනවා. මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරපු මේ අය වැය ලේඛනයේ අධ්‍යාපනය මුදලට තල්ලු කිරීමේ එවැනි උත්සාහයක් තිබෙන බව මට ඔප්පු කර පෙන්වන්න පුළුවන්. ඒක පිටු මාරු කරලා තමයි මුදල් ඇමතිතුමා සිද්ධ කරන්නේ.

මේ රටේ ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් තිබුණා. උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගත්තා. විද්‍යා පීඨ ගුරුවරුන් බඳවා ගත්තා. ඇතැම් අවස්ථාවල ස්වේච්ඡා ගුරුවරුන්ට අවස්ථා සැලසුණා. ඉතා දුෂ්කර ප්‍රදේශවල සුවිශේෂ කරුණු මත බඳවා ගැනීම් සිද්ධ කළා. හැබැයි, එම ක්‍රමවේදයට අතිරේක ක්‍රමවේදයක් මේ අය වැය ලේඛනයේ 118වැනි ඡේදය යටතේ මුදල් ඇමතිතුමා යෝජනා කර තිබෙනවා. ඒක අධ්‍යාපන ක්ෂේත්‍රයටයි එන්න ඕනෑ. නමුත්, මුදල් ඇමතිතුමා එය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ කරලා, කොළය වහලා තමයි වැඩේ දීලා තිබෙන්නේ. මම එම විස්තරය දැන් කියවන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැය ලේඛනයේ 118 වන ඡේදයේ මෙසේ සඳහන් වෙනවා:

> "...ග්‍රාමීය පාසල්වල විද්‍යාව, ගණිතය, තාක්ෂණය සහ ඉංග්‍රීසි වැනි විෂයන්වලට ඉහළ දක්ෂතා ඇති ගුරුවරුන්ගේ හිඟය පිරවීමට කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් අනුමත කරන ලද රාජ්‍ය නොවන විද්‍යායතනවල ගණිතය, විද්‍යාව, තාක්ෂණය සහ ඉංග්‍රීසි යන විෂයන්ට අදාළව අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා හැදෑරීමට සිසුන් සඳහා රුපියල් 500,000 ක සියයට 100 ක පොලී සහන ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීමට මම යෝජනා කරනවා...."

කැමැති කට්ටිය තමයි ඒ ණය ගන්නේ. එම විද්‍යායතනවල මුදල් ගෙවා ඉගෙන ගන්න දරුවන්ට අවස්ථාව සැලසෙනවා. ඒ වාගේම මුදල් ඇමතිවරයා ව්‍යංගයෙන් සහතිකයක් දෙනවා, ඒ අයව ගුරු සේවයට බඳවා ගන්නවා කියලා. ඒ ඊළඟ වාක්‍යයයි. මෙන්න, අධ්‍යාපන ක්ෂේත්‍රය පෞද්ගලීකරණය කිරීමේ ඊළඟ වාක්‍යය. ඒක කොළය වහලා ලියා තිබෙන්නේ.

එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "...ග්‍රාමීය පාසල්වල අවම වශයෙන් වසර 3 ක් සේවය කළ යුතුයි. ඔවුන් වසර තුන සම්පූර්ණවීමට පෙර එම පාසල්වලින් ඉවත් වන්නේ නම් එසේ ඉවත්වන අවස්ථාවේදීම අදාළ ණය මුදල සම්පූර්ණයෙන්ම ආපසු ගෙවීමට ඔවුන්ට සිදුවනු ඇත...."

විශ්වවිද්‍යාල නොවන වෙනත් විද්‍යායතන පිහිටුවලා, ඒ විද්‍යායතනවලින් අධ්‍යාපනය ලබන තැනැත්තන් ගුරු සේවයට බඳවා ගන්නවාය කියන සහතිකය තමයි මේ ලබා දෙන්නේ. එහෙම නම් එය අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමක් නොවෙයිද? එම නිසා මේක අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සාකච්ඡා කළ යුතු ප්‍රශ්නයක්. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට විශාල සහනයක්, දිරි දීමනාවක් දෙන්න යනවා කියා තමයි මේ පෙන්වන්න උත්සාහ කරන්නේ. මෙතෙක් අපේ රටේ පැවති උපාධිධාරීන්, විද්‍යා පීඨ ගුරු භවතුන් සහ ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය වෙනස් කර තිබෙන බව සහ එය මුදල් මත, මූල්‍යමය කරුණු මත බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකට අවතීර්ණ වන බව තමයි මේ අය වැයෙන් ප්‍රකාශ කර තිබෙන්නේ. මම කියන මෙම කාරණාව මෙවර අය වැය ලේඛනයේ -මුදල් ඇමතිතුමාගේ මූල්‍ය ප්‍රකාශයේ- 118වැනි ඡේදය යටතේ සඳහන්ව තිබෙනවා.

අප දන්නවා විද්‍යාව, ගණිතය සහ තාක්ෂණය කියන විෂයන්වලට ගුරුවරු හිඟ බව. එම ගුරුවරු හිඟ නම් ඔවුන් දිරිමත් කිරීමේ වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. අද නිලධාරින්ගේ කුටියට පැමිණී සිටින අධ්‍යාපන නිලධාරිනුත් දන්නවා ඇති, පසු ගිය කාල පරිච්ඡේදවල ගුරු සේවයට උපාධිධාරින් බඳවා ගනිද්දි, රුපියල් ලක්ෂ එකහමාරක් වැනි ඉහළ වැටුප් තලවල සිටි ගණකාධිකාරිවරු, ගණකාධිකාරිවරියන් තම සේවය අත්හැරලා -පෞද්ගලික අංශයේ රැකියාව අත්හැරලා- ගුරු සේවයට පැමිණි බව. අනිකුත් තාක්ෂණික විෂයන්වලට සම්බන්ධ අයත් එහෙමයි. රසායන විද්‍යා උපාධිධාරිනුත් එහෙමයි. තමුන් කරමින් සිටි පෞද්ගලික අංශයේ රැකියාවෙන් ඈත් වෙලා රාජ්‍ය අංශයේ ගුරු සේවයට එනවා. ඒ අපේ ගුරු සේවය පිළිබඳව ගොඩනැඟුණු අභිමානය නිසායි.

විශ්‍රාම වැටුප් ක්‍රමය අහෝසි කරලා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කරනවා කියලා ගිය අවුරුද්දේ අය වැයේදී මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා. ගිය අවුරුද්දේ කිව්වාට වඩා මේ අවුරුද්දේ එය පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා. දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කරනවා නම්, අපේ ගුරු සේවයට කුමක් වෙයිද? අපේ ගුරු මව්වරු, ගුරු පියවරු තමන්ගේ සෑදෑ සමය සතුටෙන් ගත කළේ ඒ විශ්‍රාම වැටුප නිසායි. ඔවුන් ගුරු සේවයට ආකර්ෂණය වුණේ ඒ විශ්‍රාම වැටුප නිසායි. එය අහෝසි වනවා නම්, මේ අධ්‍යාපන ක්ෂේත්‍රයට එන්නේ කවුද? අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් පෙළ විෂයන් සඳහා ගුරුවරු ඇතුළු වන එක නවතිනවා.

ගරු ඇමතිතුමනි, ඒක නිසා මේ ගැටලුවට ඔබතුමා ලක් වන එක අහන්න දෙයක් නොවෙයි.

අධ්‍යාපන ඇමතිතුමා තාක්ෂණික විෂයයන් කෙරෙහි උනන්දුවක් දක්වනවා කියලා අපි දන්නවා. ඒක අපි අගය කරනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාල පරිච්ඡේදයේ බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වය යටතේ තාක්ෂණික විද්‍යා පීඨ මෙලෙස ආරම්භ වුණා. දිස්ත්‍රික්ක මට්ටමෙන් එවැනි

තාක්ෂණික විද්‍යා පීඨ ඇති වීම සහ අනෙකුත් තාක්ෂණාගාර ඇති වීම අද වන කොට නැවතිලා තිබෙනවා. ඒ නිසා අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් ඒ දිරි ගැන්වීම මූලික කාරණයක් වනවා. දරුවෙකුට Tab එකක් දුන්නා කියලා ඒ දරුවා තාක්ෂණික විප්ලවකාරයෙකු වෙයි කියලා මම හිතන්නේ නැහැ. ඒක විසඳුමක් නොවෙයි. මම හිතන්නේ ඒක බොහොම සරල සුන්දර සටන් පාඨයක්.

මොකද, පසුගිය 2016 වර්ෂයේ මුදල් ඇමතිතුමාගේ අය වැය ප්‍රකාශයේ 331 යෝජනාවේත් මෙවැනිම දෙයක් තිබෙනවා. විශ්වවිද්‍යාල සඳහා free Wi-Fi කලාප ඇති කරනවා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ සියලු දෙනාටම laptop ලබා දෙනවා, ඒ සඳහා රුපියල් මිලියන 300ක් ලබා දෙනවා කියලා මුදල් ඇමතිතුමා පසු ගිය අය වැය ලේඛනයෙනුත් යෝජනා කර තිබෙනවා. ඒ නිසා පසු ගිය අය වැය ලේඛනයත් බොහොම සුන්දරයි. මේ අය වැය ලේඛනයත් ඒ වාගේම සුන්දර වෙයි. අය වැය ලේඛනයකින් මෙවැනි යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි, අපි එක දෙයක් කියනවා. අපේ සමහර පාසල්වලින් ඉල්ලන්නේ laptop නොවෙයි, "ටොප් ලැට්" එකක් ඉල්ලන්නේ. හොඳ වැසිකිළියක් ඉල්ලන්නේ.

මම සංඛ්‍යා ලේඛන කියන්න යන්නේ නැහැ; මම සංඛ්‍යා ලේඛන මත ගැටෙන්න යන්නේ නැහැ. මා ළඟ වාර්තා තිබෙනවා. මෙවරත්, මීට පෙර වර්ෂවල පැවැති අපේ ආණ්ඩුවත් ඉතා විශාල මුදලක් සනීපාරක්ෂක පහසුකම් සඳහා වෙන් කළා කියලා අපි දන්නවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 වර්ෂයේ සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් 200ක් තිබුණා. අපි 2015දී ඒ සංඛ්‍යාව 74 දක්වා අඩු කරලා තිබෙනවා. 2016 වර්ෂය අවසන් වනකොට සියලුම පාසල්වලට සනීපාරක්ෂක පහසුකම් සපයන්න අවශ්‍ය සියලුම පියවර අපි අරගෙන තිබෙනවා. ඊ ළඟ වර්ෂයේ ඉඳලා ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව ළමයින් 50කට එක වැසිකිළියක් බැගින් ඉදිකරනවා කියන ඒ නිර්ණායකය මත අපි කටයුතු අපි කරනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
හොඳයි. මගේ අවස්ථාව දෙන්න, ගරු ඇමතිතුමනි. අපි ඔබතුමාව අගය කරනනවා.

මා සංඛ්‍යා ලේඛන කියන්න උත්සාහ කරන්නේ නැහැයි කියලා කිව්වා. ඔබතුමා සනීපාරක්ෂක පහසුකම් සඳහා වෙන් කළ මුදලෙන් කොපමණ ප්‍රමාණයක්ද වියදම් කරලා තිබෙන්නේ කියලා ඔබතුමා දන්නවා. ගණන් හදලා බලන්න. මම සංඛ්‍යා ලේඛන කියන්න යන්නේ නැහැ. ඔබතුමා අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් සම්පූර්ණ කරලා ඇති. ඔබතුමා වෙන් කළ මුදල සහ ප්‍රායෝගිකව වැය කළ මුදල අතර පැහැදිලි පරතරයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බදු වැඩිවීම තුළ ඔබතුමන්ලා ලබා දෙන Tabs, පරිගණක ඇතුළු නව තාක්ෂණික උපකරණ පාවිච්චි කරන්න පුළුවන්කමක් තිබෙනවාද කියන කාරණයයි මම අහන්න උත්සාහ කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
දුරකථන සඳහා අය කරන බදු දවසින් දවස වැඩි වෙලා තිබෙනවා. මේ මාස 22 ඇතුළේ සියයට 46කින් දුරකථන ගාස්තුව තමුන්නාන්සේලාගේ ආණ්ඩුව වැඩි කරලා තිබෙනවා. මේ මාස 22 ඇතුළේ අන්තර්ජාල පහසුකම් සඳහා ගෙවන සේවා ගාස්තු සියයට 31කින් වැඩි වෙලා තිබෙනවා. අන්තර්ජාල පහසුකම් ක්‍රියාත්මක කරන්න වැය වන මුදලට වඩා වැඩි මුදලක් ඔබතුමන්ලා බදු වශයෙන් ජනතාවගෙන් උදුරා ගන්නවා; ශිෂ්‍යයන්ගෙන් උදුරා ගන්නවා. ඊට අමතරව අන්තර්ජාල පහසුකම් භාවිත කිරීම සඳහා සියයට 25ක අතිරේක ගාස්තුවක් මෙවර අය වැය යෝජනාවල ආදායම් ලබා ගැනීමේ මාර්ගයක් වශයෙන් සඳහන් කරලා තිබෙනවා. කොහොමද වැඩය? එදා වේල කන්න නැති දරුවන් එක්ක නව තාක්ෂණයට යන්න ඔබතුමා උත්සාහ කරනවා නම්, ඒක ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියා මම අහනවා.

අපේ ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මගේ කථාවේ අවසාන විනාඩි කිහිපයේ මම ඉතාම අවධානයෙන් ඔබතුමාට කියනවා, අපේ අධ්‍යාත්මය උසස් කරන්න; නමුත් අපේ ඉතිහාසය මකන්න යන්න එපාය කියා. අද විවිධ කුමන්ත්‍රණ, විවිධ බටහිර කුමන්ත්‍රණ තිබෙන බව මේ පාර්ලිමේන්තුව තුළත් කථා වෙනවා මම අහගෙන හිටියා. ඉතිහාසය විකෘති කරනවා. ඉතිහාසය උතුරට එකක්, දකුණට එකක්, නැඟෙනහිරට එකක් වෙන්න බැහැ. ඉතිහාසය එකයි. ඒ නිසා ඉතිහාසය වෙනස් කරන්න හදන කුමන්ත්‍රණවලට රැවටෙන්න එපා. රාජ්‍ය නොවන සංවිධානවල, ආයතනවල පුහුණුව ලැබුවාට කමක් නැහැ. අධ්‍යාපන විශේෂඥයන් නෝර්වේවල ඉගෙන ගෙන ආවාට කමක් නැහැ. හැබැයි, ඉතිහාසය වෙනස් කරන්න යන්න එපා; අපේ සංස්කෘතිය වෙනස් කරන්න යන්න එපා; අපේ අධ්‍යාත්මය වෙනස් කරන්න යන්න එපා.

අපේ පැරණි ගීත, අපට රසාස්වාදය ගෙනැත් දුන් ගීත, සාහිත්‍ය විචාර විෂය නිර්දේශවලින් ඉවත් කරන්න යන්න එපා. ඒවා නැවත ඇති කරන්න. උසස් රස වින්දනයක් ඇති කිරීම සඳහා අමරදේවයන්ගේ ගීත සාහිත්‍ය නැවත විචාරය කරන්න. ඒ සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂය නිර්දේශයට "අමරදේවයන්" නමින් අලුත් පරිච්ඡේදයක් එක් කරන්න. ඒ තුළින් තමයි අපට උසස් අධ්‍යාත්මයක් සහිත හොඳ දරුවෙක් නිර්මාණය කර ගන්න පුළුවන් වෙන්නේ. ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පියල් නිශාන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

ඊට පෙර ගරු එඩ්වඩ් ගුණසේකර මැතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. J.M. ANANDA KUMARASIRI *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පියල් නිශාන්ත ද සිල්වා මන්ත්‍රීතුමා.

[අ.භා. 4.40]

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ කාරක සභා අවස්ථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මම ප්‍රථමයෙන් ස්තුතිවන්ත වනවා. "ජාතියේ ඉරණම දරුවන්ට දෙන අධ්‍යාපනයෙන් තීරණය වේ." මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක මම කියන කථාවක් නොවෙයි. ලූවී කොසුත් කියන දාර්ශනිකයා කියපු කථාවක්. ඒ නිසා අපට අධ්‍යාපනය ගැන තීන්දු තීරණ ගැනීමේදී ඉතාමත්ම ප්‍රවේශමෙන් එම තීන්දු තීරණ ගන්න සිද්ධ වනවා.

මට මතකයි, 2015 මේ ආණ්ඩුව ආවාට පසුව දින 100 වැඩසටහන තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දරුවන්ට, ගුරුවරුන්ට සහ මේ සියලු දෙනාට ලබාදුන්නු සුන්දර පොරොන්දු මොනවාද කියලා. 2016 අය වැයේදීත් ඒ වාගේම සුන්දර පොරොන්දු අපට ලබා දීලා තිබෙනවා. 2017දීත් ඉතාමත්ම ආකර්ෂණීය පොරොන්දු රාශියක් අපට ලබා දීලා තිබෙනවා. මම අපේ අධ්‍යාපන ඇමතිතුමා පිළිබඳව බොහොම ආඩම්බර වෙනවා. අපි පැහැදිලිවම දන්නවා, අධ්‍යාපන ඇමතිතුමා අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් යමක් කරන්නට දැඩි උත්සාහයක් ගන්නා කෙනෙක් බව. හැබැයි, මුදල් ඇමතිතුමා මේ අය වැය නිර්මාණය කරනකොට මේ වාගේ සුන්දර පොරොන්දු ලබා දීලා තිබුණත් ඒ පොරොන්දු ඉටු කළාද කියන එක පිළිබඳව තමයි අපට සිතන්න වෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින අය කථා කරනවා, මෙවරත් බොහොම හොඳ ලස්සන පොරොන්දු ටිකක් ලබා දීලා තිබෙන බව. නමුත් මේ පොරොන්දු ඉටුවෙයි ද කියන සැකයත් එක්ක තමයි මේ අය වැය පිළිබඳව අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු අය අද කථා කරන්නේ. අධ්‍යාපන ඇමතිතුමාට මේ අය වැයෙන් වෙන්වුණු ප්‍රතිපාදන තුළින් 2017 වර්ෂයේදී මේ පොරොන්දු ටික ඉටු කරන්නට හැකියාව ලැබේවි කියා අපි විශ්වාස කරනවා; ඒ වාගේම හැකියාව ලැබේවා! කියා අපි ප්‍රාර්ථනා කරනවා.

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, අධ්‍යාපනය ගැන කථා කරනකොට, විධිමත් පාසලට අපේ දරුවා ඇතුළත් කරන්න ඉස්සෙල්ලා අපි පූර්ව ළමා විය එහෙම නැත්නම් පෙර පාසලට තමයි දරුවා ඇතුළත් කරන්නේ කියන කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේ අය වැයෙන් පෙර පාසල් සඳහා ගෙනෙන ලද අලුත් යෝජනා මොනවාද?

විධිමත් වැඩ පිළිවෙළ මොකක්ද? පෙර පාසල් දරුවා පිළිබඳව, පෙර පාසල් ගුරුවරයා පිළිබඳව අද වැඩි අවධානයක් යොමු නොකිරීම ඉතාම කනගාටුවට කරුණක්. විශේෂයෙන්ම මේ අධ්‍යාපන ක්‍රමවේදයත් එක්ක පෙර පාසල පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. මෙවර අය වැයේදී විශේෂයෙන්ම මතු කර තිබෙනවා, සේවකයෝ 500ක් සිටින ආයතනවල දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට. එය පමණක් යෝජනා කරලා මෙම වග කීමෙන් ඉවත් වෙන්න බැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රජයට පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් ලොකු වග කීමක් තිබෙනවා. මුළු ලංකාවේම පෙර පාසල් 12,353ක් තිබෙනවා. ඒ නිසා තමයි, පෙර පාසල් සම්බන්ධව දැඩි අවධානයක් යොමු කරන්න කියලා අපි කියන්නේ.

මට මතකයි, අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳව පළාත් මට්ටමේ ඉඳලා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ බව. ඒ වාගේම පෙර පාසල් ගුරුවරියට රුපියල් 2,500ක දීමනාවක් ලබා දීමට එතුමා යෝජනා කළා. අපි හිතුවා මේ අවුරුද්දේ හෝ ඒ අහිංසක පෙර පාසල් ගුරුවරියට යමක් කරන්න මේ යහ පාලන ආණ්ඩුව කටයුතු කරයි කියලා. නමුත්, ඒ කටයුත්ත ඉටු කර ගන්න බැරි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතු පාසල් පිළිබඳව කථා කළොත් බස්නාහිර පළාතේ වතු පාසල් 43ක් තිබෙනවා. ඒ 43න් 38ක්ම තිබෙන්නේ, මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ. කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන වතු පාසල් සඳහා විධිමත් වැඩ පිළිවෙළක් තවමත් ක්‍රියාත්මක කර නැහැ. හැබැයි, අපි හැම දාම කථා කරනවා, වතුවල දුක් විඳින අහිංසක සේවකයා පිළිබඳව; වතුවල ඉන්න දරුවන් පිළිබඳව. ඒ අය පිළිබඳව කථා කළාට, විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා නැහැ. ලංකාවේම වතු පාසල් 843ක් තිබෙනවා. මෙවර අය වැයෙන් වතු පාසල් 25ක් සංවර්ධනයට කිරීමට රුපියල් මිලියන 250ක් වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා. එම යෝජනාවේ මෙසේ සඳහන් වනවා:

> "අපගේ රජයේ සියලු අංශ ඇතුළත් සංවර්ධන ක්‍රමෝපායන්ට අනුව දැනටමත් උසස් තත්ත්වයට පත් කර ඇති විශේෂයෙන්ම කෑගල්ල සහ බදුල්ල දිස්ත්‍රික්කවල වතු පාසල් 25ට අමතරව තවත් වතු පාසල් 25ක තත්ත්වය උසස් කිරීම සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා."

මේ 2017 අය වැයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනාව. මේ වෙන් කර තිබෙන මුදල එම කාර්යය සඳහා ප්‍රමාණවත් නැහැ කියන එකයි මගේ අදහස.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් දරුවන්ට Tabs දෙන්න යෝජනා කරනවා. ඒක ඉතාම හොඳ කටයුත්තක්. දරුවන්ට මෙවැනි දෙයක් ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාටත්, මෙම යෝජනාව කරපු යහ පාලන ආණ්ඩුවේ නායකයින්ටත් අපි ස්තුතිවන්ත වනවා. හැබැයි, මෙය අය වැය යෝජනාවක් හැටියට තිබුණාට මදි. ක්‍රියාත්මක වනවා නම් තමයි හොඳ. එතැනදීත් පොඩි ගැටලුවත් තිබෙනවා. සිසුන් 175,000කට තමයි Tabs දෙන්න තීරණය කර තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, 2015දී දරුවෝ 210,340ක් උසස් පෙළ පන්තිවලට ඇතුළත් වෙලා තිබෙනවා. දරුවෝ 175,000කට Tabs ලබා දුන්නොත් ඉතුරු 50,000ට මොනවාද ලබා දෙන්නේ කියන එක පිළිබඳව මම මේ ගරු සභාවෙන් දැන ගන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පළාත් සභාවලට වෙන් කරන මුදල්වල කප්පාදුවක් කර තිබෙනවා. බස්නාහිර පළාත් සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් හැටියට මා දන්නවා, පළාත් සභාවල මුදල් කප්පාදුවත් එක්ක විශාල ගැටලුවක් ඇති වනවා.

අපි පැහැදිලිවම දන්නවා, පළාත් සභාවෙන් තමයි පළාත් සභා පාසල්වල සංවර්ධන කටයුත්ත ඉටු කළේ. ඒ පාසල්වල භෞතික සංවර්ධනය ඇති කළේ, ගුරු පුහුණුව ලබා දුන්නේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ අංශවලට ඒ අවශ්‍ය දේවල් ලබා දුන්නේ පළාත් සභාවේ මුදල්වලිනුයි. අද ඒ මුදල් කප්පාදු කර තිබෙන නිසා බස්නාහිර පළාත් සභා ප්‍රධාන අමාත්‍ය, ඉසුර දේවප්‍රිය මැතිතුමා වාගේම මධ්‍යම පළාත් සභා ප්‍රධාන අමාත්‍ය සරත් ඒකනායක මැතිතුමා සහ සියලු දෙනාම දැඩි කනස්සල්ලකින් කථා කරනවා, මේ අය වැය සම්බන්ධව.

අද පාර්ලිමේන්තුවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු හැමෝම කථා කරනවා, මේ අය වැය බොහොම හොඳයි කියලා. හැබැයි, මේ යහපාලන ආණ්ඩුවේම ඉන්න මහ ඇමතිවරු සහ මන්ත්‍රීවරු අද දැඩි කලකිරීමකට පත් වෙලා ඉන්නවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ අය වැය විවාදයත් එක්ක ඉදිරියේදී පළාත්

සභාවට මුදල් ලබා දීලා පළාත් සභා පාසල්වල ඉන්න අහිංසක දරුවන් වෙනුවෙන් යමක් කරාවි කියලා. මොකද, ලංකාවේ පාසල්වලින් සියයට 95.5ක්ම පළාත් සභාවට අයිති පාසල්. ඒ නිසයි මෙය විශේෂයෙන්ම කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)

මට තව විනාඩියක් ලබා දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වන විට විදුහල්පතිවරුන් මුහුණ දෙන ගැටලු රාශියක් තිබෙනවා. 2000 වර්ෂයේදී ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ හිටපු අයට වාහන බලපත්‍රයක් ලබා දුන්නා, ගරු ඇමතිතුමාට මතක ඇති. ඒ වාහන බලපත්‍රය ලබා දීමේ කටයුත්ත අද ක්‍රියාත්මක නොවීම නිසා විදුහල්පතිවරු දැඩි කලකිරීමෙන් ඉන්නවා. ඒ නිසා අධ්‍යාපන සංවර්ධනය දරුවන්ට නිවැරදිව ලබා දෙන්න නම්, තෘප්තිමත් ගුරු පරපුරක් ඇති කරන්න, තෘප්තිමත් විදුහල්පති පරපුරක් ඇති කරන්න දායකත්වය ලබා දෙන්න අපේ යුතුකමක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ජාතික පාසල්වල ගුරුවරුන්ට අද හිඟ වැටුප් ගෙවන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. මධ්‍යම රජයෙන් ඒ මුදල් ප්‍රතිපාදන ලබා දීලා නැහැ. ගුරුවරුන්ට ආපදා ණය ලබා ගැනීමට විධිමත් වැඩ පිළිවෙළක් නැහැ. ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව විසඳන්න කටයුතු කරලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න.

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)

මීට පෙර අග්‍රහාර රක්ෂණයට රුපියල් 125යි ගුරුවරයකුගෙන් කපා ගත්තේ. දැන් රුපියල් 600ක් කපා ගැනීමට යෝජනා කර තිබෙනවා. මෙවැනි ගුරු ගැටලු රාශියක් තිබෙන මේ ක්ෂේත්‍රය ඉහළට ඔසවා තියන්න ඕනෑ නම්, දරුවන්ට නිවැරදි අධ්‍යාපනයක් ලබා දෙන්න ඕනෑ නම් අපි ගාව නිවැරදි වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ වැඩ පිළිවෙළට දායකත්වය දෙන්නය කියා ඉල්ලා සිටිමින්, පක්ෂ භේදයකින් තොරව අධ්‍යාපනය වෙනුවෙන් කරන සෑම හොඳ ක්‍රියාකාරකමක් වෙනුවෙන්ම අපේ දායකත්වය ලබා දෙන බවට ගුරුවරයකු හැටියට ප්‍රතිඥා දෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 4.51]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு இந்த நேரத்தை ஒதுக்கித் தந்தமைக்காக உங்களுக்கும் தங்களு டைய நேரத்திலே ஒரு பகுதியைத் தந்தமைக்காக கௌரவ நவவி அவர்களுக்கும் அண்ணன் கௌரவ சிவலிங்கம் அவர்களுக்கும் எனது நன்றியைக் கூறிக்கொள்கின்றேன். கல்வி அமைச்சு, உள்ளக அலுவல்கள், வடமேல் மாகாண அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு ஆகியவற்றின் நிதி ஒதுக்கீடுகள் மீதான இந்தக் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு கௌரவ பாராளுமன்ற உறுப்பினர்கள் பலரும் பல்வேறு கருத்துக்களைக் கூறினார்கள். மிகுந்த ஆற்றலுள்ள கல்வி அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்கள் இந்த அமைச்சுப் பதவியேற்ற குறுகிய காலத்தில் - இரண்டு வருட காலத்தில் அதனை மிகச் சிறந்த முறையில் இயக்கி வருகின்றார். ஆகவே, அமைச்சர் அவர்களின் பணிகுறித்து நான் இந்த உயரிய சபையில் என்னுடைய கட்சியின் சார்பில் அவருக்குப் பாராட்டுக்களைத் தெரிவித்துக்கொள்கின்றேன். அதேநேரம் மிகுந்த அனுபவ முள்ள ஒரு மூத்த அமைச்சரான நாவின்ன அவர்களை வயம்ப அபிவிருத்திக்குப் பொறுப்பாக நியமித்திருப்பது ஒரு சிறந்த தெரிவாகும். ஆகவே, இந்த அமைச்சு மக்களுக்குப் பிரயோசன முள்ளதாக அமையும் என்பதில் நம்பிக்கை இருக்கின்றது.

கல்வி அமைச்சைப் பொறுத்தவரையிலே கௌரவ அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்கள் மிகவும் நேர்மையாகச் செயற்படுபவர். அண்மையில் அதிபர் பதவிகளுக்கான பரீட்சை நடத்தப்பட்டு அதில் சித்தியெய்தி யவர்களுக்கு கடும் சிரமங்களுக்கு மத்தியில் நியமனங்கள் வழங்கப்பட்டன. அதேநேரம் மாகாண சபை குறித்த நிமயனங்களைச் சரியான முறையில் வழங்காமையால் சம்பந்தப்பட்டவர்கள் கஷ்டப்பட்டு வருவதாக நாம் அறிகின்றோம். எனவே, அமைச்சர் அவர்கள் இவ்விடயத்தில் கவனம் செலுத்த வேண்டும் என்று வேண்டுகோள் விடுக்கின்றேன். அதுமட்டுமல்ல, இந்தப் போட்டிப் பரீட்சையில் தோற்றுவதற்குச் சில அதிபர்களுக்குச் சந்தர்ப்பம் வழங்கப்படவில்லை. ஆனால், அவர்கள் சிறந்த நிர்வாகிகள். வயதின் அடிப்படையிலேயே அவர்கள் அந்தச் சந்தர்ப்பத்தை இழந்தார்கள். ஆகவே, இன்றும் அவர்கள் சாதாரண ஆசிரியர் தரத்திலேயே இருக்கின்றார்கள். அவர்களுக்கு அநீதி இழைக்கப்பட்டுள்ளது என்பதை நீங்களும் உணர்வீர்கள். அது சம்பந்தமாக நான் ஏற்கெனவே உங்களிடம் பேசியிருக் கின்றேன். எனவே, நீண்டகாலம் அதிபர்களாக இருந்துவந்த, வயது காரணமாக அதிபர் பரீட்சையை எழுத வாய்ப்புக் கிடைக்காத அவ்வாறான ஆசிரியர்களுக்கு ஒரு சந்தர்ப்பம் வழங்குமாறு நான் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

வடக்கு, கிழக்குக்கு வெளியே சில பிரதேசங்களிலே முஸ்லிம் கல்விப் பிரிவுகளும் அதேபோல தமிழ்க் கல்விப் பிரிவுகளும் இயங்குவதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அவற்றுக்குப் பொறுப்பாக ஓர் உதவிக் கல்விப் பணிப்பாளர் அல்லது பிரதிப் பணிப்பாளர் நியமிக்கப்பட்டிருக்கின்றார். ஆனால், குறித்த பாடசாலையுடைய நலனை அல்லது கல்விச் செயற்பாடுகளைக் கண்காணிக்கின்ற எந்த அதிகாரமும் அவர்களுக்கு வழங்கப்படவில்லை. இதனால் அவர்களிட மிருந்து எந்தப் பிரயோசனமும் கிடைப்பதில்லை. எனவே, அவர்களுக்கு அதிகாரம் வழங்கி அப்பாடசாலைகள் பயனடை கின்ற வகையில் ஏற்பாடு செய்ய வேண்டும் என்று வேண்டுகோள் விடுக்கின்றேன்.

அடுத்து மௌலவி ஆசிரியர் நியமனம் பற்றிய விடயம். கடந்த காலங்களிலே அமைச்சர் சுசில் பிரேமஜயந்த அவர்கள் கல்வி அமைச்சராக இருந்தபோது மௌலவி ஆசிரியர் நியமனத்துக்கான பரீட்சை நடத்தப்பட்டது. அதில் சித்தியெய் தியவர்களுக்குக் கட்டம் கட்டமாக நியமனம் வழங்கு வதாகச் சொல்லப்பட்டு முதற்கட்ட நியமனம் வழங்கப் பட்டாலும்

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

ஏனையவர்களுக்கு அந்த நியமனம் கிடைக்கவில்லை. பௌத்த மதமாக இருக்கலாம், கத்தோலிக்க மதமாக இருக்கலாம், இந்து மதமாக இருக்கலாம், இஸ்லாமிய மதமாக இருக்கலாம், எந்த மதமாக இருந்தாலும் சம்பந்தப்பட்ட மாணவர்கள் அந்த மதத்தைக் கற்க வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, இன்று பல பாடசாலைகளிலும் மௌலவி ஆசிரியர் வெற்றிடங்கள் இருப்பதாக நாங்கள் அறிகின்றோம். எனவே, அந்த வெற்றிடங்களை நிரப்புவதற்கான ஓர் ஏற்பாட்டைச் செய்து தாருங்கள் என்று உங்களிடம் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, வட மேல் மாகாணத்தை எடுத்துக்கொண்டால், புத்தளம் மாவட்டத்திலுள்ள ஆனமடுவ தொகுதியிலே 203 பாடசாலைகள் இருக்கின்றன. ஆனமடுவ தொகுதியில் ஒரேயொரு கல்வி வலயத்தின் கீழ் வரும் 203 பாடசாலைகளையும் இரண்டு தொகுதிகளாகப் பிரித்து, ஆனமடுவ தொகுதிக்கு ஒரு தனிக் கல்வி வலயத்தையும் புத்தளம் தொகுதிக்கு ஒரு தனிக் கல்வி வலயத்தையும் உருவாக்கித்தருமாறு வேண்டுகோள் விடுக்கின்றேன். இது சம்பந்தமாக உங்களோடு ஏற்கெனவே பேசியிருக்கின்றேன். இதுபற்றி நானும் கௌரவ உறுப்பினர் நவவி அவர்களும் உங்களுக்கு எழுதிய கடிதங்களின் பிரதிகளை ஹன்சாட்டில் உள்ளடக்குவதற்காகச் சபாபீடத்தில் *சமர்ப்பிக்கின்றேன்.

அதேநேரம் அம்பாறையிலே, பொத்துவில் தொகுதி தனியான ஒரு கல்வி வலயமாக இருக்க வேண்டும் என்று சம்பந்தப்பட்டவர்கள் பல தசாப்தங்களாகக் கேட்டு வருகின்றார்கள். அது சம்பந்தமாக அண்மையிலே நான் உங்களை வந்து சந்தித்தபோது பெருந்தன்மையுடன் அதைச் செய்து தருவதாக உறுதியளித்திருந்தீர்கள். அதற்கு உங்களுக்கு நன்றியைக் கூறிக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, now wind up please.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen )
தற்பொழுது நீங்கள் ஒரு புதிய குழுவை அமைத்துப் புதிதாகக் கல்வி வலயங்களைப் பிரிப்பதற்கான system ஒன்றைக் கொண்டுவந்திருக்கின்றீர்கள். அதற்கு நான் உங்களுக்கு முதலிலே நன்றி கூறுகின்றேன். நான் குறிப்பிட்ட இந்த இரண்டு தொகுதிகளையும் அதிலே நீங்கள் கட்டாயம் உள்வாங்க வேண்டும் என்று அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன். "ළඟම පාසල හොඳම පාසල" திட்டத்தை மிகச் சிறப்பாக மேற்கொண்டு வருவதையிட்டும் நான் உங்களைப் பாராட்டுகின்றேன்.

பாடசாலைகளில் மலசலகூடங்கள் அமைப்பது மற்றும் laptop வழங்குவது சம்பந்தமாக எல்லாம் இங்கு குறிப்பிடப் பட்டது. அதற்காகப் பிரதம அமைச்சர் அவர்களுக்கு எங்களுடைய பாராட்டுக்களைத் தெரிவித்துக்கொள்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen )
විනාඩියක කාලයක් ලබාදෙන්න.

குறிப்பாக, வட மாகாணத்திலே யுத்தத்தினால் பாதிக்கப் பட்ட தமிழ், முஸ்லிம், சிங்கள மாணவர்கள் பல கஷ்டங் களோடு கல்வியைத் தொடர்கிறார்கள். பல பிரச்சினைகள் அங்கே இருக்கின்றன. ஒவ்வொரு பாடசாலையாக நான் அதைக் குறிப்பிட்டுச் சொல்லாவிட்டாலும் அந்தப் பிரதேசத் திலே இருக்கின்ற பிரச்சினைகளை வட மாகாண சபையுடன் இணைந்து நீங்கள் தீர்க்க வேண்டும். கிழக்கு மாகாணத்திலும் அப்படியான பிரச்சினைகள் காணப்படுகின்றன. வடக்கு, கிழக்குக்கு வெளியே 900க்கும் மேற்பட்ட தமிழ்மொழி மூலமான இஸ்லாமியப் பாடசாலைகள் இருக்கின்றன. அவற்றிலும் நிறையப் பிரச்சினைகள் இருக்கின்றன.

இலங்கை நிருவாக சேவை, வெளிநாட்டுச் சேவை, திட்டமிடல் சேவை, கல்விச் சேவை, கணக்காளர் சேவை என இவ்வாறான சேவைகளைப் பார்க்கின்றபொழுது எங்களுடைய சமூகத்தைச் சார்ந்தவர்கள் அவற்றில் மிகக் குறைவாகவே இருப்பதைக் காணலாம். அதாவது, மூன்று சதவீதமானவர்கள்தான் அச்சேவைகளில் இருக்கின்றார்கள். ஆனால், பத்து சதவீதமான முஸ்லிம் சமூகம் இந்த நாட்டிலே வாழ்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, wind up please.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen )
அந்த வகையில், அவர்களையும் கல்வியிலே உயர்த்த வேண்டுமென்று உங்களிடத்தில் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன். இந்த நாட்டிலே சமத்துவமாக, சகோதரத்துவமாக எல்லோருடனும் சேர்ந்து வாழ்கின்ற நல்ல பக்குவமுள்ள கல்விச் சமூகமாக அவர்கள் வருவதற்கு நீங்கள் ஒத்துழைக்க வேண்டும்.

மேலும், கௌரவ அமைச்சர் நாவின்ன அவர்களுடைய அமைச்சுக்குக் கீழே பல விடயங்கள் வருகின்றன. வடமேல் மாகாணத்திற்கான அபிவிருத்திக் கருத்திட்டங்கள் உள்ளடங்கிய “2017 - 2021” என்ற ஐந்தாண்டுத் திட்டம் தயாரிக்கப் பட்டிருப்பதாக அமைச்சின் முன்னேற்ற அறிக்கையில் குறிப்பிடப்பட்டிருக்கிறது. அந்த வகையில் புத்தளம், கற்பிட்டி, நுரைச்சோலை, புளிச்சாக்குளம் போன்ற பிரதேசங்களும் அபிவிருத்தியடைய இருக்கின்றன. புத்தளம் தொகுதியென்பது யுத்தத்தால் பாதிக்கப்பட்ட சுமார் ஓரிலட்சம் முஸ்லிம் அகதிகளைத் தாங்கிய, பல துன்பங்களை அனுபவித்த, நிறைய தேவைகளுள்ள ஒரு தொகுதியாகும். அந்த தொகுதியையும் உங்களுடைய ஐந்தாண்டுத் திட்டத்தில் உள்வாங்க வேண்டும். முதலமைச்சராக இருந்த காலத்தில் சிறந்ததொரு முதலமைச் சராகச் நீங்கள் செயற்பட்டீர்கள். அந்தக் காலகட்டத்தில் எவ்வாறு நீங்கள் உங்களுடைய பணியைச் சிறப்பாக

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

செய்தீர்களோ, அதேபோல எதிர்காலத்திலும் அந்தப் பிரதேசத்திற்கு உதவி செய்ய வேண்டும். டாக்டர் சாபி அவர்கள் குருநாகலில் இருக்கின்றார் சகோதரர் நவவி அவர்கள் புத்தளத்திலே இருக்கின்றார். அபிவிருத்திப் பணியிலே அவர்களையும் இணைத்துக்கொள்ள வேண்டும். உங்களுடைய எதிர்கால ஒதுக்கீடுகளிலே அந்தப் பிரதேசத்திற்கு நிறைய உதவி செய்ய வேண்டுமென்று அன்பாக வேண்டிக் கொள்கின்றேன். கௌரவ அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்கள் வயதிலே குறைந்தவராக இருந்தாலும் இவ்வாறான பாரிய பொறுப்புள்ள அமைச்சை சிறப்பாகச் செய்கின்றார். அவருடைய பணி தொடர எங்களுடைய வாழ்த்துக்களைக் கூறிக்கொள்வதோடு, உங்கள் எல்லோருடைய எதிர்காலச் செயற்பாடுகளுக்கு எங்களுடைய ஒத்துழைப்பும் இருக்குமென்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[பி.ப. 4.59]

**ගරු මුතු සිවලිංගම් මහතා**
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி அமைச்சின் நிதி ஒதுக்கீடு சம்பந்தமான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்கு எனக்கும் சிறிது நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு நன்றி கூறுகின்றேன். இவ்வரவு செலவுத் திட்டத்திலே ஏற்கெனவே, தரமுயர்த்தப்பட்ட கேகாலை மற்றும் பதுளை மாவட்டங்களிலுள்ள 25 பெருந்தோட்டப் பாடசாலைகளுக்கு மேலதிகமாக மேலும் 25 பெருந்தோட்டப் பாடசாலைகளைத் தரமுயர்த்தும் நோக்குடன் ரூபாய் 250 மில்லியன் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. இவ்வாறு ஒதுக்கப்பட்டுள்ள போதிலும், இன்னும் கூடுதலான நிதியை ஒதுக்கி, இரத்தினபுரி, களுத்துறை போன்ற பகுதிகளிலுள்ள பாடசாலைகளையும் தரமுயர்த்துமாறு நான் கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

21ஆம் நூற்றாண்டு அறிவுப் பொருளாதாரத்தை நோக்கியதாக அமைந்துள்ளது. இதனால் கல்வியும் அறிவுப் பொருளாதாரச் சவால்களுக்கு முகங்கொடுக்கக்கூடியதாக இருத்தல் வேண்டும். இந்நிலையில் நாம் பாடசாலைக் கல்வியில் அதிகரித்த அக்கறையைச் செலுத்தவேண்டியவர்களாக உள்ளோம். இலவசக் கல்வியின் தந்தையாகப் போற்றப்படுகின்ற கலாநிதி சி.டபிள்யு.டபிள்யு. கன்னங்கர அவர்களது 1945ஆம் வருட -

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අධ්‍යාපන අමාත්‍යතුමා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, කෑගල්ලේ සහ බදුල්ලේ වතු පාසල්වලට විතරයි මුදල් වෙන්කර තිබෙන්නේ කියලා ඔබතුමා කිව්වා. ඒක මේ අය වැය යෝජනාවලත් තිබෙනවා. නමුත්, මේ රටේ තිබෙන සියලුම වතු පාසල්වලට බලපැවැත්වෙන පරිදි එය ක්‍රියාත්මක කරනවා කියලා අපි සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා. කෑගල්ලේයි, බදුල්ලේයි වතු පාසල්වලට විතරක් නොවෙයි, මේ මුදල අපේ රටේ සියලුම වතු පාසල්වලට-

**ගරු මුතු සිවලිංගම් මහතා**
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

සුළු මුදලයි නේ වෙන්කරලා තිබෙන්නේ. ඒ මුදල ප්‍රමාණවත්ද දන්නේ නැහැ?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

අපි දැනට මුදලක් වෙන්කරලා තිබෙනවා. ගිය අවුරුද්දේත් මුදල් වෙන්කළා. තවත් මොනවාට හෝ අවශ්‍යතාවක් තිබෙනවා නම් අපට මේ ප්‍රතිපාදනවලින් මුදල් මාරුකර ගන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු මුතු සිවලිංගම් මහතා**
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

Thank you.

இலவசக் கல்வியின் தந்தையாகப் போற்றப்படுகின்ற கலாநிதி சீ.டபிள்யு.டபிள்யு. கன்னங்கர அவர்களது 1945ஆம் வருட "பாலர் பாடசாலை முதல் பல்கலைக்கழகம் வரை இலவசக் கல்வி" என்ற சித்தாந்தமும், அதை நோக்கிய முழு நாட்டினதும் நடவடிக்கைகளும் பெருந்தோட்டங்களையும் பெருந்தோட்டப் பாடசாலைகளையும் சென்றடையவில்லை. 1977ஆம் ஆண்டிலிருந்தே பெருமளவு தோட்டப் பாடசாலைகள் அரசினால் சுவீகரிக்கப்பட்டு வந்தன. இதன் பின்னரே தோட்டப் பாடசாலைகள் தேசிய நீரோட்டத்தில் இணையத் தொடங்கின. இதனால், பெருந்தோட்டக் கல்வியானது முழு நாட்டினது கல்வியிலும் ஏறத்தாழ 30ஆண்டுகள் பின்தங்கியதாகவே காணப்படுகின்றது. கல்வியிலும் சாதனைகளிலும் இந்தக் குறைபாட்டை நிவர்த்திசெய்ய நடவடிக்கை எடுக்கப்படல் வேண்டும்.

அறிவுப் பொருளாதாரத் தேவைகளுக்கேற்ப நாம் பாடசாலைகளிலே விஞ்ஞானக் கல்வியை முழு அளவில் வெற்றிகரமாகக் கட்டியெழுப்ப வேண்டியுள்ளது. பெருந்தோட்டப் பாடசாலைகளிலும் விஞ்ஞானக் கல்வி ஊக்குவிக்கப்பட வேண்டும். இதற்காக ஏறத்தாழ 500 விஞ்ஞானப் பட்டதாரி ஆசிரியர்களை பெருந்தோட்டப் பாடசாலைகள் வேண்டி நிற்கின்றன. பட்டதாரி ஆசிரியர் நியமனங்கள் மாகாண சபைகளுக்கு உரித்தாக்கப்பட்டிருக்கின்றன. இருந்தபோதிலும், மாகாண சபைகள் அந்தந்த மாகாணங்களில் குறைந்தபட்சம் 03 வருட வதிவிடத்தைக் கட்டாயப்படுத்துவதால், தமிழ் மொழிமூலம் கல்வி கற்பிக்கக்கூடிய விஞ்ஞானப் பட்டதாரிகளை ஆட்சேர்ப்புச் செய்யமுடியாதுள்ளது. இது தொடர்பில் கல்வி அமைச்சு அக்கறை செலுத்தி, பெருந்தோட்டப் பாடசாலைகளில் விஞ்ஞானக் கல்வியை விருத்திசெய்ய நடவடிக்கைகளை மேற்கொள்ளல் வேண்டும்.

பெருந்தோட்டப் பாடசாலைகளில் நிலவிய ஆசிரியர் வெற்றிடங்களை உதவி ஆசிரியர் நியமனங்கள் ஓரளவு ஈடுசெய்துள்ளது. இந்த உதவி ஆசிரியர்கள் மாதாந்தக் கொடுப்பனவாக ரூபாய் 6,000 பெற்று வருகின்றனர் என்பது வேதனை அளிப்பதாகவுள்ளது. இவர்களில் பலர் இரண்டு, மூன்று பஸ்கள்மூலம் வீட்டிலிருந்து தமது பாடசாலைகளுக்குச் செல்லவேண்டியவர்களாக இருக்கின்றனர். இன்னும் சிலர்,

[ගරු මුතු සිවලිංගම් මහතා]

பயிற்சியின் பொருட்டு ஆசிரியர் பயிற்சிக் கலாசாலைகளுக்குச் செல்கின்றனர். இன்றைய காலகட்டத்தில் இவர்களது பொருளாதாரச் சுமையைக் குறைக்கும் வகையில், மாதாந்த வேதனத்தை அதிகரிப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்பட வேண்டும் என நான் அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

தொழில்நுட்பக் கல்லூரிகளால் - technical collegeகளால் - வழங்கப்படுகின்ற ஆங்கிலமொழி தேர்ச்சிக்கான "உயர் தேசிய டிப்ளோமா" - Higher National Diploma - சான்றிதழை அடிப்படையாகக்கொண்டு, பட்டதாரி ஆசிரியர் நியமனங் களுக்குச் சமமாக மாகாண சபைகளால் ஆங்கில ஆசிரியர் நியமனங்கள் வழங்கப்பட்டு வருகின்றன. பெருந்தோட்டப் பாடசாலைகளில் க.பொ.த. உயர்தரப் பரீட்சையில் சித்தி பெற்று, பல்கலைக்கழக அனுமதி கிடைக்காத பெருமளவு மாணவர்கள் இருக்கின்றார்கள். இவர்கள் தொழில்நுட்பக் கல்லூரிகளில் தமிழ்மொழிமூலம் உயர் தேசிய டிப்ளோமா பெற்றுக்கொள்ள நுவரெலியா மாவட்டத்தில் மட்டுமல்லாமல் கண்டி, இரத்தினபுரி, பதுளை போன்ற மாவட்டங்களிலும் வசதிகளை அமைச்சு ஏற்படுத்தித்தரவேண்டும்.

ஆங்கிலம், தகவல் தொழில்நுட்பம் - Information Technology, கணக்கியல் ஆகிய பாடநெறிகளில் தமிழ் மாணவர்கள் கல்வி பயில வசதிகள் ஏற்படுத்தித்தரவேண்டும். இதற்கான போதுமானளவு விழிப்புணர்வு நடவடிக்கைகள் பெருந்தோட்டப் பிரதேசங்களிலுள்ள பாடசாலைகளில் ஏற்படுத்தப்படவேண்டும்.

"ළඟම පාසල හොඳම පාසල" "அயற் பாடசாலையே சிறந்த பாடசாலை" என்ற அரசின் வேலைத்திட்டம் வரவேற்கத்தக்கது. இருந்தாலும் இதன்மூலம் கூடிய எண்ணிக்கையிலான பாடசாலைகளில் உட்கட்டமைப்பு வசதிகளை மேற்கொள்ள முடியாதுள்ளது. வருடத்திற்கு கிட்டத்தட்ட 20-25 பாடசாலை களுக்கே இத்திட்டத்தின்கீழ் உதவிகள் வழங்கப்பட்டு வருகின்றன. எமது பெருந்தோட்டப் பாடசாலைகள் இன்னமும் உட்கட்டமைப்பு வசதிகளையும் ஆய்வுகூடம், விவசாயகூடம், அழகியல்கூடம், நூலகம் ஆகிய வசதிகளையும் வேண்டி நிற்கின்றன. ஆகவே பாடசாலைகளின் உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்துவதில் பெருந்தோட்டப் பாடசாலை களைக் கருத்திற்கொண்டு நடவடிக்கைகளைத் துரிதகதியில் மேற்கொள்ள வேண்டும்.

பெருந்தோட்டப் பாடசாலைகளை அபிவிருத்திசெய்ய முயற்சிக்கின்றபோது தோட்ட நிர்வாகங்கள் தேவையானளவு நிலத்தைத் தரமறுத்து வருகின்றன. இதனால் பாடசாலை களுக்கு வேண்டிய கட்டட வசதிகளையும் பிற வசதிகளையும் பெறமுடியாதுள்ளது. 1987இல் இருந்து 1998 வரை SIDA நிதியுதவியுடன் அமுலாக்கிய பெருந்தோட்டப் பாடசாலை களின் கல்வி அபிவிருத்தி வேலைத்திட்டம் நாட்டிலுள்ள 833 பெருந்தோட்டப் பாடசாலைகளிலேயே அபிவிருத்தி நடவடிக்கைகளை மேற்கொள்ள முயற்சித்தது. அப்போது பிரதமராக இருந்த ஜே.ஆர்.ஜயவர்தன அவர்களுக்கும் எமது மறைந்த தலைவர் அமரர் சௌமியமூர்த்தி தொண்டமான் அவர்களுக்குமிடையே ஏற்படுத்திக்கொள்ளப்பட்ட உடன்பாடு காரணமாக ஒவ்வொரு தோட்டப் பாடசாலைக்கும் அபிவிருத் திக்கென 2 ஏக்கர் நிலம் தருவதாக ஏற்பாடுகள் செய்யப் பட்டிருந்தன. இப்போது பல தோட்ட நிர்வாகங்கள் தோட்டப் பாடசாலைகள் அபிவிருத்திக்கென 2 ஏக்கர் நிலத்தை வழங்க மறுத்து வருகின்றன. நிலத்தைத் தருவதில் இழுத்தடிப்பிலும் ஈடுபட்டன. இருந்தாலும் எமது முயற்சியால் தோட்டக் கம்பனிகள் தேவையான நிலத்தைத் தர முன்வந்தன. ஆனால், எல்லாப் பாடசாலைகளையும் தரமுயர்த்த முடியாது போய் விட்டது. இந்த அரசாங்கம் தோட்ட நிர்வாகங்கள் தோட்டப் பாடசாலை அபிவிருத்திக்கென 2 ஏக்கர் நிலத்தைத் தருவதை உறுதிசெய்ய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் அக்கறை காட்டினால் நன்றாக இருக்கும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු මුතු සිවලිංගම් මහතා**
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

பெருந்தோட்டப் பாடசாலைகளின் அபிவிருத்தியில் பாடசாலைக் கட்டடங்களுடன் ஆசிரியர்களுக்கான விடுதி களையும் உள்ளடக்க வேண்டும். தெரிவு செய்யப்பட்ட தொலைதூரப் பாடசாலைகளிலும் நகரப் பாடசாலைகளிலும் ஆசிரியர் விடுதிகள் அமைக்கப்படவேண்டும். இதனால் தரமான ஆசிரியர்களின் சேவையை நாம் தொடர்ந்தும் பெற்றுக்கொள்ள வழியேற்படும். பாடசாலைச் சூழலிலேயே விடுதிகள் அமைவதால் பாடசாலை நேரத்திற்கும் அப்பால் பிள்ளைகள் கற்றுக்கொள்வதற்கான வசதிகளையும் நாம் ஏற்படுத்திக் கொள்ளமுடியும்.

பெருந்தோட்டப் பாடசாலைகளைப் பொறுத்தவரையில் ஆரம்பக் கல்வியின் தரம் திருப்திகரமானதாக இருக்கின்றது. ஏறத்தாழ 90 வீதமானோர் ஆரம்பக் கல்வியில் அதாவது தரம் 1 முதல் தரம் 5 வரை கல்வி கற்று வருகின்றனர். கல்வியின் தரத்தை நாம் தொடர்ந்தும் உறுதிசெய்து கொள்வதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டியதாகவுள்ளது. அங்கு கல்வி வளர்ச்சிக்காகப் பாடுபட்ட ஆசிரியப் பெருமக்கள், பாடசாலை அதிபர்கள், கல்வி அதிகாரிகள், பெற்றோர்கள், பழைய மாணவர்கள், நலன்விரும்பிகள் என அனைவரையும் பாராட்டுகின்றேன்.

இப்போது நாம் இடைநிலைக் கல்வியில் அதிகரித்த கவனத்தைச் செலுத்த வேண்டியவர்களாக உள்ளோம். இப்போதுதான் தேசியப் பரீட்சைகளான க.பொ.த. சாதாரண தரத்திலும் க.பொ.த. உயர் தரத்திலும் பெருமளவு மாணவர்கள் தேர்ச்சிபெறச் சந்தர்ப்பம் ஏற்பட்டுள்ளது. பாடசாலைகள் தமது வசதிகளை நல்ல நிலையில் பராமரிப்பதற்குரிய நடவடிக்கை களை அமைச்சு மேற்கொள்ளவேண்டும். ஒவ்வொரு பாட சாலைக்கும் பராமரிப்புக்கென நிதி ஒதுக்கீடுகள் வழங்கப் படவேண்டும். 2005ஆம் ஆண்டு எஞ்சியுள்ள பெருந்தோட்டப் பாடசாலைகளை SIDA நிதியுதவியுடன் அபிவிருத்தி மேற்கொள்ள நடவடிக்கைகளை மேற்கொண்டோம். அப் போதைய தோட்ட உட்கட்டமைப்பு அமைச்சுமூலம் அந்த நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු මුතු සිවලිංගම් මහතා**
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)
Sir, please give me only one more minute.

அப்போது ஏற்கனவே SIDA நிதியுதவியுடன் அபிவிருத்தி செய்யப்பட்ட பாடசாலைகளின் உட்கட்டமைப்பு வசதிகள் உரிய பராமரிப்பு இல்லாமல் சீரழியும் நிலையில் காணப்படுகின்றன. அபிவிருத்தி செய்யப்பட்ட பாடசாலைகள் பராமரிப்பின்றிச் சீரழியும் நிலைமையைத் தடுத்து நிறுத்தி அவற்றை அபிவிருத்தியை நோக்கி நகரச்செய்வது அவசிய மாகும். இதனால் எந்தவித அபிவிருத்தியும் மேற்கொள்ளப் படாதிருந்த ஏறத்தாழ 400 தோட்டப் பாடசாலைகளை அபிவிருத்தி செய்யும் எமது முயற்சி, ஏற்கனவே அபிவிருத்தி செய்யப்பட்ட பாடசாலைகளின் பராமரிப்பில் கவனஞ்செலுத்த வேண்டியதாக மாறிவிட்டது.

அத்துடன் இடைக்கால நடவடிக்கையாக இப்பிரதேசங் களிலிருந்து கல்விப் பொதுத் தராதர உயர்தரத்தில் விஞ்ஞான, கணித பிரிவுகளில் பாடசாலைகளைக் கோரும் மாணவர் களுக்கு உதவும்பொருட்டு மத்திய மாகாணப் பாடசாலைகள் உதவ அமைச்சு வசதி ஏற்படுத்தித்தர வேண்டும். இல்லையேல், இப்பிள்ளைகள் பெரிதும் பாதிக்கப்படுவார்கள். அவ்வாறான வசதியை ஏற்படுத்தாது நாம் கல்வியில் பின்தங்கியிருக் கின்றோம் என ஆதங்கப்படுவதில் அர்த்தமில்லையென்று கூறிக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා. 5.09]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, ඔබතුමන්ලා ආණ්ඩුවේ අමාත්‍ය මණ්ඩලය හදන්න කලින් පොරොන්දුවක් දුන්නා, නව අමාත්‍ය මණ්ඩලය හදන්නේ විද්‍යාත්මක පදනමක් මත කියා. විද්‍යාත්මක පදනමක් මත අමාත්‍ය මණ්ඩලය පත් වුණා නම් අධ්‍යාපන, සංස්කෘතික හා ජනමාධ්‍යය කියන විෂයන් තුන තමයි එක අමාත්‍යාංශයක් යටතට ආ යුතුව තිබුණේ. නමුත් මෙතැන කිසිදු විද්‍යාවක් නැහැ. වයඹ සංවර්ධනය සහ සංස්කෘතිය එකට ඇමුණුවාම මොකක්ද තිබෙන විද්‍යාව? කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමා තමයි, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා. මේකේ ඇති විද්‍යාවක් නැහැ. ඒ නිසා ඔබතුමන්ලා පදනමෙන්ම බරපතළ වැරැද්දක් කළා.

එම වැරැද්ද නිසා තමයි පසුගිය කාලයේ කලා මණ්ඩලය බරපතළ ප්‍රශ්නයකට මුහුණ දුන්නේ. ඔබතුමන්ලාගේ අමාත්‍යාංශ විෂයයන් වෙන් කිරීමේ බරපතළ අවිද්‍යාත්මක පදනම නිසා නාට්‍ය අනු මණ්ඩලයට නාට්‍ය පෙන්වා ගන්න විධියක් නැතුව, කලා අනු මණ්ඩලයට අනුබද්ධ අනෙකුත් අනු මණ්ඩලවලට නාට්‍ය පෙන්වා ගන්න විධියක් නැතුව, තමන්ගේ නිර්මාණ ඉදිරිපත් කර ගන්න විධියක් නැතුව, මුදල් නැතුව ඔවුන් ප්‍රශ්න ගණනාවකට මුහුණ දුන්නා. ඒ නිසා මේ අවුරුදු පහම මේ විධියට යන්න එපා. තව අවුරුදු හතරක් තිබෙනවා නේ. අඩුම ගණනේ දැන්වත් මේක වෙනස් කරන්න. මේක වෙනස් කරලා මේ විෂයයන් එකිනෙකට සම්බන්ධ වන ආකාරයට මෙය අනුබද්ධ කරන්න. මොකද, මෙම ගැටලුව කලාකරුවන් ප්‍රශ්න රාශියකට මුහුණ දෙන එකක් වෙලා තිබෙනවා.

සංස්කෘතිය කියන්නේ ගොඩනැඟිලි කියා ඔබතුමන්ලා හිතනවා නම් ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් සංස්කෘතිය කියන්නේ ගොඩනැඟිලි නොවෙයි. ඊට එහා ගිය, ආධ්‍යාත්මික සංවර්ධනය පැත්තෙන් විශාල සේවයක් කරන්න පුළුවන් දෙයක් තමයි සංස්කෘතිය කියන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අනාගතයේදීවත් මැදිහත් වෙන්නය කියන කාරණය මුලින්ම ඉදිරිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, ඊට අමතරව කරුණු කිහිපයක් කෙටියෙන් ඉදිරිපත් කරන්න මා කැමැතියි. එයින් පළමුවැනි කාරණය මෙයයි. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ආරම්භ කරන්නත් කලින් තමයි, අපේ රටේ සාහිත්‍ය කලා ක්ෂේත්‍රයට විශාල මෙහෙවරක් කරපු පණ්ඩිතාරත්න, මහගමසේකර, සුගතපාල ද සිල්වා වැනි අයගේ සිට නූතන පරම්පරාවේ කලාකරුවන් වන ජයන්ත චන්ද්‍රසිරි, ජීවන් කුමාරණතුංග, රන්ජන් රාමනායක වැනි සියලු කලාකරුවන් බිහි වන්නේ. සාහිත්‍ය ක්ෂේත්‍රය, නැටුම් ක්ෂේත්‍රය, නාට්‍ය ක්ෂේත්‍රය වැනි සියලු කලා ක්ෂේත්‍රවලින් බිහි වූ කලාකරුවන්ගේ නිජ භූමිය තමයි, සිංහල සංස්කෘතික ආයතනය. සිංහල සංස්කෘතික ආයතනය මේ සියලු කලාකරුවන් බිහි කරපු ආයතනයක්.

ඒ විතරක් නොවෙයි. ලෝ පතළ නිර්මාණයන් බිහි කරපු ආයතනයක් තමයි සිංහල සංස්කෘතික ආයතනය. අපි කවුරුත් සාමාන්‍ය නාමකරණයෙන් එය හඳුන්වන්නේ, "සුදර්ශී ආයතනය" කියායි. සුදර්ශියෙන් ඉගෙන ගත්තේ නැති, සුදර්ශියේ නුග සෙවණ යට කලා කටයුතු නොකළ කලාකරුවකු අපේ රට තුළ සොයා ගන්න නැහැ. ඒ තරමට සුදර්ශියේ නුග සෙවණ තමන්ගේ දෙමව්පියන් -අම්මා, තාත්තා- වාගේ තමයි අපේ රටේ ප්‍රවීණ, ශ්‍රේෂ්ඨ කලාකරුවන් සලකන්නේ. නමුත් අද ඔබතුමන්ලා ඒ ආයතනය මුළුමනින්ම ජපානයේ පෞද්ගලික ආයතනයකට - රාජ්‍ය නොවන සංවිධානයකට- විකුණන්න හදනවා.

ඔබතුමන්ලා දැන් එම කටයුත්ත දිගට කරගෙන යනවා. එය පටන් ගත්තේ, 2009 මැයි මාසයේ 09 වැනි දා රාජපක්ෂ පාලනය කාලයේදීයි. රාජපක්ෂ පාලනය කාලයේ එවකට හිටපු සංස්කෘතික ඇමතිවරයා විසින් කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා. එම කැබිනට් පත්‍රිකාව අනුව සුදර්ශී ආයතනය ජපනයේ "සසකාවා" ආයතනයට විකුණන්න කැබිනට් මණ්ඩලය අනුමත කරලා තිබෙනවා. ඒ නිසා -[බාධා කිරීමක්] කැබිනට් පත්‍රිකාව මෙතැන තිබෙනවා. මේ තිබෙන්නේ කැබිනට් පත්‍රිකාව. ඒක වැරදියි කියන්න බැහැ. මා එය ඔප්පු කරලා පෙන්වන්නම්. මගේ අතේ තිබෙන්නේ එම කැබිනට් පත්‍රිකාවයි. එය කැබිනට් මණ්ඩලය අනුමත කරලා තිබෙනවා.

එසේ අනුමත කළත්, පසුව පැමිණි විරෝධතා නිසා ඔබතුමන්ලා එය හකුළා ගත්තා. නමුත් කැබිනට් මණ්ඩලයෙන් එය සම්මත වුණා. [බාධා කිරීමක්] ඒක පටන් ගත්තේ එදායි. කැබිනට් මණ්ඩලයෙන් අනුමත වුණු එකත් තිබෙනවා. එම සටහන් සියල්ල තිබෙනවා. එය අනුමත වෙලා ක්‍රියාත්මක කරන්න යද්දී, කලාකරුවන් විරුද්ධ වුණාට පසුව තමයි අවසානයේදී එය හකුළා ගන්න සිද්ධ වුණේ. වාසුදේව නානායක්කාර මැතිතුමාත් එදා ඒ කැබිනට් මණ්ඩලයේ සිටියා. එම කැබිනට් මණ්ඩලයෙන් තමයි මේවා අනුමත වෙලා තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි විරුද්ධ වුණා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඔබතුමා පෞද්ගලිකව දැක් වූ අදහස් මා දන්නේ නැහැ. නමුත් කැබිනට් මණ්ඩලය සාමූහිකව ඒක අනුමත කරලා තිබෙනවා. ප්‍රශ්නය ඒක නොවෙයි. ගරු ඇමතිතුමනි, එවැනි ශ්‍රේෂ්ඨ කලාකරුවන් බිහි කරපු සුදර්ශී ආයතනය විකිණීමේ කටයුතු, ඒ නතර කරපු තැනින් නැවත පටන් ගෙන, සසකාවා ආයතනයට

[ගරු විජිත හේරත් මහතා]

දෙන්න ඔබතුමන්ලා ලෑස්ති වෙනවා. ඒ නිසා ඉතා බරපතළ ප්‍රශ්නයක් විශේෂයෙන්ම කලාකරුවන්ගේ පැත්තෙන් මතු වෙලා තිබෙනවා. සුදර්ශිය කියන්නේ, දේශීය සිනමාවේ ඉඳලා, ගොක් කොළ කලාව දක්වා විවිධ නිර්මාණයන් බිහි කරපු ආයතනයයි; කලාකරුවන්ගේ නිජ භූමියයි. එම නිජ භූමිය විකුණන්න එපා. සුදර්ශි ආයතනය, අපේ රටේ සංස්කෘතියේ ආධ්‍යාත්මයයි; සිංහල, දෙමළ, මුස්ලිම් යන සියලු කලා ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය කිරීම සඳහා තිබෙන ප්‍රධාන මධ්‍යස්ථානයයි. එදා නමින් "සිංහල සංස්කෘතික ආයතනය" කියා හැඳින්වූවාට, පාර්ලිමේන්තුවේ සංස්ථාගත ආයතනයක් විධියට ලියා පදිංචි වෙලා තිබෙනවා. එසේ තිබියදීත් ඔබතුමන්ලා මේ ආයතනය සසකාවා ආයතනයට විකුණන්න ලෑස්ති වෙනවා. වහාම එය නතර කරන්න. එය නතර කළේ නැත්නම් කලාකරුවන් එයට විරුද්ධව පෙළ ගැහෙනවා. මේ රටේ සියලු ක්ෂේත්‍රවල කලාකරුවන් මෙයට විරුද්ධව අද පෙළ ගැසී ඉවරයි.

අද එහි වර්තමාන සභාපතිවරයා තමයි ජීවන් කුමාරණතුංග. ජීවන් කුමාරණතුංග කියන්නේ කලින් ආණ්ඩුවේ හිටපු ඇමතිවරයෙක්. ඔබතුමන්ලාගේ වර්තමාන හවුල් ආණ්ඩුවේ ප්‍රධාන උදවුකාරයෙක්. ඔහු සභාපතිධුරය දරන සුදර්ශි ආයතනය දැන් ජපානයේ සසකාවා ආයතනයට විකුණන්න ලෑස්ති වෙනවා නම් ඒක බරපතළ වැරැද්දක්. ජාත්‍යන්තර සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකරන්න ඕනෑ. ඒවා පිළිබඳ කිසි ගැටලුවක් නැහැ. ජාත්‍යන්තර සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකරනවා නම්, ඒ සඳහා කොළඹ ඕනෑ තරම් තැන් තිබෙනවා. සුදර්ශි ආයතනය කියන්නේ කලාකරුවන්ගේ ආධ්‍යාත්මය එක්ක බැඳුණු තැනක්. ඒ නිසා එම ආයතනය විකුණන්න ඉඩ දෙන්න බැහැ. කරුණාකර එම කටයුත්ත නතර කරන්නය කියන එක මා පළමුවැනි කාරණාව විධියට මතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණාව විධියට පුරාවිද්‍යා ක්ෂේත්‍රය පිළිබඳව කියන්න ඕනෑ. පුරාවිද්‍යාඥයින් බඳවා ගැනීම සහ පුරාවිද්‍යාඥයින්ගේ සේවා උසස්වීම් ලබාදීමේදී අනුගමනය කරන ක්‍රමවේදය, පසු ගිය කාලයේ පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ විශාල ආන්දෝලනයකට ලක් වුණු කරුණක් වුණා. ඒ සඳහා වන නිවැරදි ක්‍රමවේදයක් නැහැ. මට මතකයි, ඒ දවස්වල අපි අපි පුරාවිද්‍යා ජාතික ප්‍රතිපත්තිය සම්මත කළ බව. දැන් එතැනින් එහාට ඉදිරි පියවරක් ගත යුතුව තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අධ්‍යාපන අමාත්‍යතුමා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, අපි සුදර්ශි ආයතනය සසකාවා ආයතනයට දෙන්නේ නැහැ. මේ වන විට අපි ඒ ගැන තීරණයක් ගෙන තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
කොයි දවස්වලද? කැබිනට් තීන්දුවක් තිබෙනවාද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු අගමැතිතුමාගෙන් සැදුම්ලත් කමිටුවකින් මේ වන විට තීරණයක් ගෙන තිබෙනවා. ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය පියවර ගනීවි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ඒ කියන්නේ, විකුණන එක නතර කරනවා කියලාද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔව්.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
බොහොම ස්තුතියි. පළමුවැනි කාරණාව හොඳයි.

දෙවැනි කාරණාව තමයි පුරාවිද්‍යාඥයන්ගේ ප්‍රශ්නය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ ඉන් බාහිරව වැඩ කරන පුරාවිද්‍යාඥයන් සඳහා සේවා ව්‍යවස්ථාවක් සම්මත කිරීමේ කටයුත්ත කළ යුතුව තිබෙනවා. සේවා ව්‍යවස්ථාවක් සකස් කළා. ඒ කටයුත්ත කාලයක් තිස්සේ කෙරෙන්නේ නැතුව නතර වී තිබෙනවා. ඒ කටයුත්ත පඹගාලක පැටලිලා තිබෙනවා. ඒ නිසා කරුණාකර පුරාවිද්‍යාඥයන් සඳහා වන සේවා ව්‍යවස්ථාව වහාම සම්මත කර ක්‍රියාවට නැඟීම සඳහා මැදිහත් වීමක් කරන්නය කියන එකත් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මගේ තුන්වැනි කාරණාව මෙයයි. මට මතකයි, 2004 දී මා සංස්කෘතික අමාත්‍යවරයා හැටියට කටයුතු කළ කාලයේ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ යෝජනාවක් කැබිනට් මණ්ඩලය අනුමත කළා.

විශේෂයෙන්ම 1817 දී, ඒ වාගේම 1848 දී ඉංග්‍රීසීන්ට විරුද්ධව ලංකාවේ නිදහස වෙනුවෙන් සටන් කරපු අපේ රටේ ජාතික වීරයන්, සර් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ කාලයේදී විශේෂ ගැසට් නිවේදනයකින් රාජද්‍රෝහීන් බවට නම් කරලා තිබුණා. රාජද්‍රෝහීන් විධියට නම් කරපු, විශේෂයෙන්ම කැප්පෙටිපොළ නිලමේ ඇතුළු සියලු සටන්කාමීන් මේ රටේ ජාතික වීරයන් විධියට නම් කළ යුතුයි කියන එක, මා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට අනුව කැබිනට් මණ්ඩලය අනුමත කළා. එදා ගත් පියවර එතැනින් එහාට ගිහින් නැහැ. ඒ කටයුත්ත ඉස්සරහට ගියේ නැහැයි කියලා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා ඊයේ පෙරේදා මේ පාර්ලිමේන්තුවේදී උත්තරයක් දීලා තිබෙනවා.

අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, කැප්පෙටිපොළ නිලමේතුමා සම්බන්ධයෙන් අද පාසල් පෙළපොත්වල මොකක්ද තිබෙන්නේ කියලා. එතුමා "ජාතික වීරයෙක්" කියලා තමයි තිබෙන්නේ. කැප්පෙටිපොළ ජාතික වීරයෙක් කියලා අපට උගන්වනවා. හැබැයි හරියට ගත්තොත් තවමත් ඔහුව නම් කරලා තිබෙන්නේ ජාතිද්‍රෝහියෙක් විධියටයි. ඒක වෙනස් කරලා නැහැ. ඔබතුමන්ලා මේ සඳහා අවශ්‍ය කරන නීතිමය පියවර ගත යුතුයි. ඒක අධිකරණ ඇමතිතුමාගේ විෂය පථයට අයිති කාරණයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය දුන්නාට පස්සේ එතැනින් එහාට නීතිමය කටයුත්ත කිරීමේ වගකීම තිබෙන්නේ ඔබතුමන්ලාටයි. 2004 දී ලබාදුන් ඒ කැබිනට් අනුමැතිය, එහෙම නැත්නම් ඔවුන්ව ජාතික වීරයන් බවට පත් කිරීමේ තීන්දුව තවමත් ක්‍රියාවට නඟලා නැහැයි කියලා ඔබතුමන්ලා කියනවා. ඒ නිසා වහාම එය ඉටු කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම කරන්නය කියන එකත් මා මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව එක කරුණක් පමණක් මා කියන්නම්. දෙමළ වතු පාසල් පිළිබඳ ප්‍රශ්නය කාලාන්තරයක් තිස්සේ දිගින්දිගටම තිබෙන ප්‍රශ්නයක්.

අඩුම ගණනේ කෑගල්ල, බදුල්ල, නුවරඑළිය, මාතලේ, මහනුවර වාගේ දිස්ත්‍රික්කවල විද්‍යාව, වාණිජවේදය, කලා විෂයන් වැනි විෂයන් සහිත උසස් පෙළ පන්ති තිබෙන එක පාසලක්වත් පිහිටුවන්න. අඩුම ගණනේ ඒ එක දිස්ත්‍රික්කයකට ඒ වාගේ එක පාසලක් නිර්මාණය කරන්න; ඒ පාසලට අවශ්‍ය කරන පහසුකම් ටික දෙන්න. වතු පාසල්වලටත් පහසුකම් සපයන්න ඕනෑ. මොකද, බදුල්ලේ ළමයි තමයි හැටන් පාසල්වලට එන්නේ. [බාධා කිරීමක්]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වසරේ විතරක් වතු පාසල් 25ක් සම්පූර්ණයෙන් දියුණු කරන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ පාසල් 155ක් දියුණු කිරීමට අපි කටයුතු කර තිබෙනවා. අය වැය යෝජනා යටතේ පාසල් 25ක් සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා. මේ වනවිටත් මුදල් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ඉන්දියානු රජයෙන් සහ වෙනත් ආයතනවලින් මේ පාසල් සංවර්ධනය කරන්න අපට අරමුදල් ලැබිලා තිබෙනවා. අනෙක් පාසල් සඳහා පළාත් මට්ටමිනුත් ප්‍රතිපාදන ලැබිලා තිබෙනවා. සෑහෙන වැඩ කොටසක් සිද්ධ වෙලා තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු ඇමතිතුමනි, මම කියන්නේ වතු පාසල්වලට ප්‍රතිපාදන සපයන එක ගැන නොවෙයි. අඩුම ගණනේ උසස් පෙළ විද්‍යා විෂයයන් හදාරන්න පුළුවන් එක පාසලක්වත් ඒ ප්‍රදේශයක ඇති කරන්න. ඒකයි මම කියන්නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

උසස් පෙළ විද්‍යාව හා ගණිතය විෂය හදාරන්න පුළුවන් පාසල් 25ක් අපි මේ වසරේ,-[බාධා කිරීමක්]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

නැහැ, තවම නැහැ. මම උදාහරණයක් කියන්නම්, බදුල්ල දිස්ත්‍රික්කයේ උසස් පෙළ විද්‍යාව තිබෙන,-[බාධා කිරීමක්]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

අපි ගැසට් කරලායි තිබෙන්නේ. ඒක රාධක්‍රිෂ්නන් රාජ්‍ය ඇමතිතුමාත් දන්නවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගැසට් කරලා ඇති. නමුත්, තවම මහ පොළොවේ ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒකයි මේ කියන්නේ. අඩුම ගණනේ එක දිස්ත්‍රික්කයක එක පාසලක් හරියට දියුණු කරලා, පළමුවැනි පියවර විධියට පටන් ගන්න. ඒක ඔය දිස්ත්‍රික්කවල පටන් ගත්තාට පසුව පුළුල් කරගෙන යන්න පුළුවන්. අඩුම ගණනේ එතැනින් පටන් ගන්න කියන ඉල්ලීම කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.19]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතා වැදගත් අමාත්‍යාංශ දෙකක වැය ශීර්ෂ විවාදයට ගන්න අවස්ථාවේ මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. බොහෝ මන්ත්‍රීවරු අධ්‍යාපන අමාත්‍යාංශය ගැන තමයි අදහස් දක්වන්නට යෙදුණේ. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යතුමාත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් දෙදෙනාම ඉන්න මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. සංස්කෘතික කටයුතු භාර ගරු අමාත්‍යතුමාට මම මේ සම්බන්ධයෙන් අද දවාලේත් මතක් කළා. ගරු අමාත්‍යතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා අමාත්‍ය ධුරය දරපු කාලයේ අපේ ආසනයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පැරැලිය සුනාමි කෞතුකාගාරයේ වැඩ පටන් ගත්තා. සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිතුමනි, දැන් එහි වැඩ අවසන් වෙලා තිබෙනවා. එම නිසා ඉතා ඉක්මනින්ම ඔබතුමන්ලා ගිහිල්ලා ඒ කෞතුකාගාරය ජනතා අයිතියට පවරන්න කියන ඉල්ලීම ඉතා ගෞරවයෙන් කරනවා.

අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කථා කරන මේ අවස්ථාවේදී බොහෝ මන්ත්‍රීවරු උදේ ඉඳන්ම කථා කළේ හිටපු අධ්‍යාපන ඇමතිවරු ගැනයි. නිදහස් අධ්‍යාපනයේ පියා වන සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා වාගේම, “මහපොළ” නිර්මාතෘ ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා වාගේම, මේ රටේ බහුතරයක් ගුරුවරුන්ට ගුරු ව්‍යවස්ථාව ගෙනැල්ලා සහනයක් ලබා දුන්නේ, ගරු රිචඩ් පතිරණ හිටපු අධ්‍යාපන ඇමතිතුමායි. එම නිසා එතුමාත් ඉතා ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරන්න ලැබීම ඉතාම වැදගත් කාරණයක්. අපි ඒක කිසිසේත්ම බැහැර කරන්නේ නැහැ. එතැනදී අපි යම් යම් දේශපාලන කෝණවලට හිර වෙන්න අවශ්‍ය නැහැ. අපි හැම අවස්ථාවේම තමුන්නාන්සේලාට කියන්නේ, තමුන්නාන්සේලා කරන හොඳ වැඩ සාර්ථක කරගන්න අපි අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා කියලායි. එම නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමාට අපි

[ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

මුලින්ම කියන්න ඕනෑ, ඔබතුමා මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් යම් හොඳ වැඩ කොටසක් කරනවා නම්, ඒකාබද්ධ විපක්ෂය හැටියට එයට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේදී මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් කිසිම දෙයක් සිදු නොවුණු විධියටයි මේ සභාවේදී යම් යම් උදවිය කථා කළේ. මේ සභාවේදී කළ කථා අහගෙන ඉන්න කොට අපට හැඟිච්ච කාරණය ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිවම කියන්න ඕනෑ, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී අධ්‍යාපන අමාත්‍යාංශයට රටේ ජාතික නිෂ්පාදනයෙන් සියයට හයක් වෙන් කළාය කියලා ඉරි ගහලා නොපෙන්නුවාට, අපි විශාල වැඩ කොටසක් කළ බව. තවමත් තමුන්නාන්සේලාට අපි කරපු වැඩ කොටස් ක්‍රියාත්මක කරගන්න බැරි වෙලා තිබෙනවා. මහින්දෝදය විද්‍යාගාර, මහින්දෝදය තාක්ෂණ පීඨ ආදී විශාල වැඩ කොටසක් අපි කළා. මගේ ආසනයේ තිබෙන මහින්දෝදය විද්‍යාගාර තුනක් තවමත් සිසු අයිතියට පවරා නැහැ. රත්ගම දේවපතිරාජ විද්‍යාලයේ සහ හික්කඩුව සුමංගල විද්‍යාලයේ ඉදි කරපු මහින්දෝදය තාක්ෂණ පීඨ දෙකක් තවමත් සිසු අයිතියට පවරා නැහැ. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් ගරු ඇමතිතුමාට කියනවා, කරුණාකරලා මේවාට අවශ්‍ය සම්පත් දීලා, ඉතා ඉක්මනට ඒවා සිසු අයිතියට පවරන්න කියලා.

මට මතකයි, බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පාසල්වල වැසිකිළි-කැසිකිළි පහසුකම් සහ පන්ති කාමරවල තත්ත්ව වැඩි දියුණු කරන්න අපි විශාල මුදලක් වෙන් කළ බව. අපි ප්‍රාථමික පාසල් ආශ්‍රිතව සපිරි පාසල් 5,000ක් වැඩි දියුණු කරන්න විශාල වැඩ කොටසක් කළා. ඒ නිසා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයේදී මේ රටේ අධ්‍යාපනයට කරපු වැඩ කොටස කිසිසේත්ම බැහැර කරන්න බැහැ කියන කාරණය අපි කියන්න ඕනෑ. මම බොහොම වගකීමෙන් කියනවා, අපේ ආණ්ඩුව කරපු වැඩ කොටසෙන් දාහෙන් එකක්වත් තමුන්නාන්සේලා තවම කරලා නැහැ කියලා. ඒක තමයි ඇත්ත කාරණය. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, එහෙම කරලා තිබෙනවා නම්, ඒක ඔබතුමාගේ කථාවේදී කියන්න. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, දැන් අහගෙන ඉන්න. [බාධා කිරීමක්] මම එතැනටත් එන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය කථාව අරගෙන බලන කොට, මෙහි ඉතාම හොඳ යෝජනා තිබෙනවා. මේ අය වැයේදී ගරු මුදල් ඇමතිතුමා හොඳ යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, එතුමා අධ්‍යාපන ඇමතිතුමා එක්ක තරහක් තිබෙනවාද කියලා. මෙහි 87වැනි යෝජනාවේ තිබෙනවා, 2016 වර්ෂයේ තුන්වන කාර්තුව අවසන් වන විට අධ්‍යාපන අමාත්‍යාංශයට භාවිත කිරීමට හැකි වී ඇත්තේ, රුපියල් මිලියන 38,850ක් පමණයි. ඒ තත්ත්වය සැලකිල්ලට අරගෙන එතුමා මේ අය වැයෙන් ලබන අවුරුද්දේ මුදල් ප්‍රමාණය අඩු කරනවා කියලා තිබෙනවා. එතුමා මොන කාරණයක් නිසා එහෙම කිව්වාද කියලා අපි දන්නේ නැහැ.

පසුගිය අවුරුද්දේත් යෝජනා විශාල ප්‍රමාණයක් තමුන්නාන්සේලා ඉදිරිපත් කළා. නමුත්, ඒවායින් ඉටු කරපු ප්‍රමාණය බොහොම අඩුයි. ඒක තමයි අපට තිබෙන ප්‍රශ්නය. එහෙම තත්ත්වයක් යටතේ අද තමුන්නාන්සේලා- [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න. [බාධා කිරීමක්] -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී ඒක කියන්න.

මෙවර අය වැයේ ආකර්ෂණීය යෝජනා කිහිපයක් තිබෙනවා. යෝජනාවක් තිබෙනවා, "2017 වර්ෂයේ උසස් පෙළ පන්තිවලට ඇතුළත් වන ළමයි එක්ලක්ෂ හැත්තෑපන්දහසකට Tabs ලබා දෙනවාය කියලා. ඒ යෝජනාව හොඳයි. බැලුවාම, ඒක බොහොම ආකර්ෂණීය යෝජනාවක්. ඔබතුමන්ලාගේ තවත් යෝජනාවක් තිබෙනවා, "අවුරුදු දහතුනක පාසල් අධ්‍යාපනය අනිවාර්යයි" කියලා. ඔය කියන විධියට, අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ අසමත් වුණත්, ලබන අවුරුද්දේ ළමයි එක්ලක්ෂ හැත්තෑපන්දහසක් නොවෙයි, තුන්ලක්ෂ විසිපන්දහසකට ආසන්න ප්‍රමාණයක් උසස් පෙළ පන්තියට ඇතුළත් වෙනවා.

දෙවැනි වර විභාගයට මුහුණ දීලා ඇතුළත් වන පිරිසත් එක්ක ඒ ප්‍රමාණය තුන්ලක්ෂ පනස්දහසක් පමණ වෙනවා. නමුත් ඔබතුමන්ලා කියන්නේ එක්ලක්ෂ හැත්තෑපන්දහසකට Tabs දෙනවා කියලායි. එතකොට, ඒ ගණන ප්‍රමාණවත් නැහැ ගරු ඇමතිතුමනි. ඒ නිසා ඒ ගැන කරුණාකරලා හොයා බලන්න. ඒ වාගේම, තමුන්නාන්සේලා Wi-Fi පහසුකම් ලබා දෙන බවත් කිව්වා. මේ ගැන -[බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ වේලාවේදී කරුණාකරලා කථා කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වේලාව ලබා දෙන්නම්. මේ කාරණය පැහැදිලි කර ගන්න ගරු ඇමතිතුමාට අවස්ථාව ලබා දෙන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා දිගටම වැරදි කාරණා මේ සභාවේ කියනවා. [බාධා කිරීමක්]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
ගරු ඇමතිතුමනි, ඒ වැරදි කාරණාවලට ඔබතුමාගේ වේලාවේදී උත්තර දෙන්න. [බාධා කිරීමක්] ඔබතුමා මගේ වේලාව ගන්න එපා. මම කියන දේ වැරදි නම්, අධ්‍යාපන ඇමතිවරයා හැටියට ඔබතුමා ඒක නිවැරදි කරන්න. [බාධා කිරීමක්]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මේක කාරක සභා අවස්ථාව. ඒ නිසා පිළිතුරු දෙන්න පුළුවන්.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු ඇමතිතුමනි, එහෙම කරන්න එපා. ඔබතුමාගේ වේලාවේදී කථා කරන්න. අපි මේවා කියන්නේ ඔබතුමන්ලාට වරදක් වෙලා තිබෙනවා නම් ඒක නිවැරැදි කර ගන්නයි. ගරු ඇමතිතුමනි, Wi-Fi සම්බන්ධතා දෙනවාය කිව්වත්, මේ අය වැයෙන්ම අන්තර්ජාල පහසුකම්වලට තිබුණු බද්ද සියයට 25 දක්වා වැඩි කළා. ඉතින් මේක පොළොවේ පිහිටලා ක්‍රියාත්මක කරන්න පුළුවන් යෝජනාවක් නොවෙයි. ඒවාගේ බරපතළ කාරණා තව බොහොමයක් තිබෙනවා. මේ අය වැය යෝජනා ගැන කථා කරන්න කලින්, ඔබතුමන්ලා මොනවාද කරලා තිබෙන්නේ කියලා බලන්න පසු ගිය වතාවේ ඔබතුමන්ලාගේ අය වැය යෝජනා ගැනත් අපට කථා කරන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මුදල් ඇමතිතුමාගේ පසු ගිය අවුරුද්දේ අය වැය යෝජනාවේ තිබෙනවා, "පූර්ණකාලීන ගුරු වැඩසටහන් සඳහා රුපියල් මිලියන දහසක් දෙනවා" කියලා. ඒවා හොඳයි. ඒවා බැලූ බැල්මට ආකර්ෂණීය යෝජනා. හැබැයි, ඒ වෙනුවෙන් ඔබතුමන්ලා වැය කරපු මුදල රුපියල් මිලියන 35යි. ඒක ප්‍රතිශතයක් හැටියට ගත්තොත් සියයට 3.5යි. තව යෝජනාවක් තිබෙනවා, "ප්‍රාදේශීය සහ ග්‍රාමීය පාසල්වලට ගුරු නිවාස සහ ගුරු විවේකාගාර ලබා දෙනවා" කියලා. ඔබතුමන්ලා ඒ සඳහා රුපියල් මිලියන දෙදහසක් දෙනවාය කිව්වා. හැබැයි, මේ අවුරුද්දේ සැප්තැම්බර් මාසය වෙන කල් මේ වෙනුවෙන් ඔබතුමා සත පහක් වියදම් කරලා නැහැ. [බාධා කිරීමක්] - ගරු ඇමතිතුමනි, කරුණාකරලා ඔබතුමාගේ වේලාවේදී -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අධ්‍යාපන ඇමතිතුමාට අවස්ථාව දෙන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුරු නිවාස, විදුහල්පති නිවාස විශාල ප්‍රමාණයක් හදලා දැන් වැඩ කටයුතු අවසන් වෙමින් එන ඒවාත් තිබෙනවා. ඒවාට සත පහක්වත් වියදම් කරලා නැත්තේ නැහැ. අපි ඒවාට බැඳුම් ඇති කරගෙනයි තිබෙන්නේ; commit කරලායි තිබෙන්නේ. ඒ අනුව ඒ වැඩ කෙරී ගෙන යනවා. මේ සභාවේදී ගරු මන්ත්‍රීතුමා දිගින් දිගට බොරු නේ කියන්නේ.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

මට අයිතියක් තිබෙනවා, බොරු කියන්න. [බාධා කිරීමක්] ඇයි, මට අයිතියක් නැද්ද බොරු කියන්න? මම කියන්නේ බොරු නම්, ඔබතුමා ඒක බොරු කියලා පෙන්වන්න. ඔබතුමා මගේ කාලය ගන්න එපා. මම ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් ලබා දුන් සංඛ්‍යා ලේඛන අනුවයි කථා කරන්නේ. [බාධා කිරීමක්]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාට කවුරු හරි ලණුවක් දීලා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කිව්වා එතුමාට අයිතියක් තිබෙනවා කියලා බොරු කියන්න. නමුත් මේ සභාවේ බොරු කියන්න එතුමාට අයිතියක් නැහැ. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මේ සභාවේදී බොරු කියන්න අයිතියක් නැහැ. [බාධා කිරීමක්]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

අමාත්‍යතුමා කිව්වා මම බොරු කියනවා කියලා. [බාධා කිරීමක්] මම බොරු කියන්නේ නැහැ. කරුණාකරලා මම කියන එක අහගෙන ඉන්න. [බාධා කිරීමක්] මම බොරුවක් කියනවා නම්, ගරු ඇමතිතුමාට පුළුවන් ඒකට උත්තර දෙන්න. [බාධා කිරීමක්] ද්විතීයික පාසල්වල විධිමත් සනීපාරක්ෂක කටයුතුවලට ඔබතුමන්ලා රුපියල් මිලියන හාරදහසක් පසු ගිය වතාවේ දීලා තිබෙනවා. නමුත්, ඒවාට ඔබතුමන්ලා වියදම් කරලා තිබෙන්නේ, රුපියල් මිලියන 717යි. -සියයට 17.93යි- [බාධා කිරීමක්] - කරුණාකරලා ඔබතුමා මගේ අයිතියට බාධා කරන්න එපා. [බාධා කිරීමක්]-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා වැරදි සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරනවා. මම කිව්වා, 2014 වර්ෂයේ සනීපාරක්ෂාව වෙනුවෙන් වැසිකිළි 200ක් තිබුණාය කියලා. නමුත්, 2015 වර්ෂය වන විට එය 74ක් දක්වා අඩු වුණා. [බාධා කිරීමක්] - 2016 වසරේදී මේ සියල්ලම අවසන් කරන්න අප පියවර අරගෙන තිබෙනවා.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ඒක ඔබතුමාගේ කථාවේදී කියන්න. [බාධා කිරීමක්]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

දැන් තමුන්නාන්සේ කිව්වා නේ, වියදම් කළේ නැහැ කියලා. [බාධා කිරීමක්] 2016 වසර සඳහා වියදම් කරලා අවසන් වෙන්නේ ඉදිරියේදී. [බාධා කිරීමක්]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ඔබතුමන්ලා පසුගිය අවුරුද්දේ මොකක්ද කිව්වේ? දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට හයක් අධ්‍යාපනයට වෙන් කරනවා කියා කිව්වා. වෙන් කළා ද? නැහැ. ඔබතුමන්ලා මහ බොරුවක් නේ කළේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

වෙන් කළා.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

කොහේද වෙන් කළේ? දැන් බලන්න, ඔබතුමන්ලා කිව්වා රටේ අධ්‍යාපනයට-

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුද්දේ හෝ ඊට පෙර හෝ අපි කිසි විටෙක-

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අපි කිසි විටෙක කිව්වේ නැහැ, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට හයක් එකවර අධ්‍යාපනයට වියදම් කරනවා කියලා. පියවරෙන් පියවර තමයි අපි සියයට හයේ මට්ටමට යන්න ඕනෑ. මෙතුමන්ලාගේ කාලයේදී තමයි කප්පාදු කළේ. දැන් අපි පියවරෙන් පියවර සියයට හය කරා යනවා. පසුගිය වසරට වඩා විශාල වැඩිවීමක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමා මෙතැන බොරු කියන්න එපා.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
මම නොවෙයි බොරු කියන්නේ. ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරයෙක් කථා කරන කොට ඒ කරුණුවල සත්‍ය හෝ අසත්‍යභාවය සම්බන්ධයෙන් ඇමතිතුමාට යම් පිළිතුරක් දෙන්න අවශ්‍ය නම්, ඒ සඳහා එතුමාට වෙලාව තිබෙනවා. මෙතුමාගේ කාලය ගන්න එක සුදුසු නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ Committee Stage නිසා-

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරු කථාවේදී ඒ ගැන කියන්න. ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට පත් කරන්න, තමුන්නාන්සේලා බලයට පත් කරන්න මේ රටේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය ලොකු වැඩ කොටසක් කළා. තමුන්නාන්සේලා ඒක පිළිගන්නේ නැද්ද?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
පිළිගන්නවා.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
අද මේ ආණ්ඩුව පොරොන්දු කඩ කරලා තිබෙනවා. ඒක මම කියන කාරණයක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ආණ්ඩුව පොරොන්දු කඩනවා - විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයේ සභාපති කියයි" යනුවෙන් 2016 නොවැම්බර් මස 14 වන දින "ලංකාදීප" පුවත් පතේ පළ වී තිබෙන මෙම ලිපිය මා **සභාගත*** කරනවා. දැන් අද වෙලා තිබෙන්නේ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, බාධා කිරීම් නිසා ඔබතුමාට සිදු වූ පාඩුව වෙනුවෙන් ඔබතුමාට තව විනාඩියක කාලයක් ලබා දෙනවා.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
විනාඩියක්? අනේ! විනාඩියකින් මොනවා කරන්නද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම කරන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය ඉවරයි නේ.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනයේ සභාපති මොකක්ද කියා තිබෙන්නේ? "අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් වෙන් කිරීම ඇතුළු පොරොන්දු, ආණ්ඩුව බලයට පත් වීමට පෙර හා පසුව අවස්ථා ගණනාවකදී ලබා දී තිබෙන බවද..." මොකක්වත් කරලා නැහැ කියලා තමයි මෙහි කියා තිබෙන්නේ. මම නොවෙයි කියන්නේ. එතකොට ඔබතුමන්ලා කොහොමද, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට හයක් අධ්‍යාපනයට දීලා තිබෙනවා කියලා කියන්නේ? නැවතත් එතුමා කියා තිබෙනවා, "2016 අය වැයෙන් වංචාවක් කරමින් ප්‍රාග්ධන හා යටිතල පහසුකම් සඳහා යෙදවූ මුදල්ද එකතු කර බොරු අගයක් පෙන්නුවා" කියලායි කියන්නේ. මේවා අපි කියන කාරණා නොවෙයි. මේවා කියා තිබෙන්නේ ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහත්මයා. මම නැවතත් මගේ කථාවට එන්නම්. ගරු ඇමතිතුමනි, ඒවා බොරු නම් ඒක ඔබතුමාගේ කථාවේදී කියන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අල්ලපු ආසනයේ ඉන්නවා, අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමන්ලා දිගින් දිගටම වතු පාසල් ගැන කථා කළා. ඔබතුමා කිව්වා, මෙවර අය වැයෙන් රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා කියලා. පසුගිය අවුරුද්දේදීත් ඔබතුමන්ලා කිව්වා, රුපියල් මිලියන 250ක් දෙනවා කියලා. හැබැයි මේ අවුරුද්දේ සැප්තැම්බර් මාසය වෙනකල් ඔබතුමන්ලා වතු පාසල් වෙනුවෙන් මොකක්වත් කරලා නැහැ. ඒක තමයි ඇත්ත කාරණය. කිසිම ඵලදායක දෙයක් තමුන්නාන්සේලා කරලා නැහැ. ඔබතුමන්ලා මේ යහපාලනය නමැති රෙද්ද පොරවා ගෙන මේ රටේ ජනතාවට විශාල හානියක් සිදු කරනවා. ඔබතුමන්ලා හරියට 'බැටළු හම පොරවා ගත් වෘකයෝ" වාගෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලයට වඩා බොහෝ කාලයක් ගත වෙලා තිබෙනවා.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
කරුණාකරලා ඒ ආකාරයට වැඩ කටයුතු කරන්න එපා. ඔබතුමන්ලාට දීපු පොරොන්දු හරියාකාරව ඉෂ්ට කරන්න. එහෙම නැති වුණොත් හෙට-අනිද්දා වන විට මේ රටේ මිනිස්සු තමුන්නාන්සේලාට විරුද්ධව පාරට බහීවි කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
2016 අවුරුද්දේ වතු පාසල් සඳහා වියදම් කිරීමට රුපියල් මිලියන 250ක් අපට ලැබී තිබෙනවා. ලබන අවුරුද්ද සඳහා වියදම් කරන්නත් තවත් රුපියල් මිලියන 250ක් වෙන් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] බොරුවක් නොවෙයි, ඒක තමයි සත්‍යය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

මීළඟට, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා.

[අ.භා. 5.33]

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
වත්තක් තිබෙන කිට්ටුවකවත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරන්න.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම වඩාත් සතුටු වෙනවා. එතුමා සහ එතුමාගේ කණ්ඩායමේ බොහෝ දෙනෙක් මෙතැන කරපු කථාවල හරය මොකක්ද කියලා එතුමාගේ කටින්ම කියැවුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කට බොරු කිව්වත් දිව බොරු කියන්නේ නැහැ" කියලා කථාවක් තිබෙනවා. එතුමා කිව්වා, "මම කියන්නේ බොරු. මට බොරු කියන්න අයිතියක් තිබෙනවා" කියලා. ඉතින් එතැනින් එහාට මොකක්ද කියන්න තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහත්මයාගෙන් පසුව, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අධ්‍යාපනයේ විප්ලවයක් ඇති කළා. එයින් පසුව දැන් නැවත මේ ගමන් කරන්නේ අධ්‍යාපනයේ විප්ලවකාරී යුගයකටයි කියලා මේ රටේ හැම කෙනෙක්ම දන්නවා. අර මන්ත්‍රීතුමන්ලාට කියන්න අමතක වුණු කාරණයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ කාරණය තමයි, එතුමන්ලා අපට භාර දීලා ගියේ පාසල් 60කට විතර දරුවෝ ඇතුළත් කරන තරගයක් ඉතිරි කරලා බව එතුමන්ලාට අමතකයි. අන්තිමට මොකද වුණේ? ජනප්‍රිය පාසල් ගණනාවකට ලක්ෂ ගණන් අල්ලස් දෙන්නේ නැත්නම් දරුවකු ඇතුළත් කර ගන්න බැරි තත්ත්වයක් නිර්මාණය වුණා. මුදලින් විතරක් නොවෙයි, අල්ලස් ලබා ගත්තේ. සමහර අම්මලාට වෙන වෙන දේවලුත් විදුහල්පතිවරුන්ට දෙන්න සිදු වුණා. ඒක මේ රටේ මිනිස්සුන්ට රහසක් නොවෙයි. මේ රටේ අධ්‍යාපන ඇමතිවරයාවත්, වෙනත් කිසිම දේශපාලනඥයකුවත් පළමුවැනි ශ්‍රේණියට, හතර වැනි ශ්‍රේණියට, පස්වැනි ශ්‍රේණියට, හයවැනි ශ්‍රේණියට දේශපාලන ලැයිස්තු මත දරුවන් ඇතුළත් කළාය කියන චෝදනාව කරන්න කිසිම මන්ත්‍රීවරයකුට පුළුවන්කමක් නැහැ. ඒ නිසා තමයි, අද මෙවැනි පටු චෝදනා මේ සභාව තුළ ඉදිරිපත් කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
අයියෝ! කථා කරන්න පටන් ගත්තා විතරයි නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ අද ගමට විශාල සම්පත් ප්‍රමාණයක් ලැබී තිබෙන එක ගැන අපි සතුටු වෙනවා. මේ සභාවේ සඳහන් වුණු වැසිකිළි, කැසිකිළි පහසුකම් අද අපේ ගම්බද පාසල්වලට ලැබෙමින් තිබෙනවා.

අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට තව එක කාරණයක් කියන්න ඕනෑ. මේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී දකුණු පළාතේ සමහර තැන්වල ලොකු දුර්වලකම් ඇතිවෙලා තිබෙනවා. ඒක අපිම කථා කළ යුතු දෙයක්. ඔබතුමා මේ වැඩ සටහන ක්‍රියාත්මක කළේ ඉතාම සද්භාවයෙනුයි. මේ වැඩසටහන ක්‍රියාත්මක කර ගෙන යද්දී, පාර්ලිමේන්තුවට අපව ගෙන්වලා ඒ ගැන අප දැනුවත් කළා.

මම උදාහරණයකට කියන්නම්, වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරා ගත් 'ඒ' කාණ්ඩයේ පාසල් දෙකකට මේ වන තෙක් කිසිම සම්පතක් ලැබිලා නැති බව. ඒක ක්‍රියාත්මක කිරීමේ දී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් සිදු වුණු අඩුපාඩුවක්. මම දහ වතාවකට, පහළොස් වතාවකට වඩා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට කථා කර තිබෙනවා. බැරිම තැන තමයි, අද මේ සභාවේ කියන්න ඕනෑ කියලා කල්පනා කළේ. ඒ පාසල් දෙක ජනප්‍රියව තිබුණු පාසල් දෙකක්. නගරයේ පාසල්වලට දරුවෝ ඇදෙන ප්‍රවණතාව නැති කරන්නයි ගරු

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

ඇමතිතුමා "ළඟම පාසල හොඳම පාසල" වැඩ සටහන පටන් ගත්තේ. එම සංකල්පය නිසා අද ගම්බද පාසල්වල පළමුවැනි ශ්‍රේණියට අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ප්‍රමාණය වැඩි වෙමින් පවතිනවා, ගරු ඇමතිතුමනි. ඒ වෙනුවෙන් මුළුමහත් ජාතියේම ගෞරවය ඔබතුමාට හිමි වෙන්නට ඕනෑ. තව අවුරුද්දක් යන කොට තාක්ෂණික ලෝකයට අපේ දරුවන් අර ගෙන යන්න, අපේ රට අර ගෙන යන්න නව අධ්‍යාපනය තුළින් මංපෙත් විවර වෙලා තිබෙනවාය කියන එකත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

[பி.ப. 5.37]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அதிமேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களினதும் மாண்புமிகு பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களினதும் தலைமையிலான தேசிய அரசு கல்வியில் பாரிய பசுமைப் புரட்சியை ஏற்படுத்துமுகமாகப் பல சவால்மிகு செயற்றிட் டங்களை அமுல்படுத்துவதையிட்டுப் பெருமிதம் கொள்கின்றேன். "அண்மையிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" எனும் கருத்திட்டத்தின் அடிப்படையில், பிரசித்தி பெற்ற நகர்ப்புறப் பாடசாலைகளில் கல்விகற்கும் மாணவர் களுக்குக் கிடைக்கும் வசதிகளைப்போன்ற பௌதிக வளங்கள் மற்றும் ஆளணி வளங்களுட்படச் சகல வசதிகளுடனும்கூடிய பாடசாலைகளை நாட்டின் கிராமப்புற வறிய மாணவர் களுக்காகவும் ஸ்தாபிப்பது இலங்கையின் கல்வித்துறை வரலாற்றில் பாரிய வளர்ச்சிப் பாதையின் முன்னோடி நடவடிக்கையாகும்.

வட மாகாணத்தின் வன்னி மாவட்டத்தைப் பொறுத்த வரையில், ஆரம்ப காலங்களில் முழு இலங்கையிலும் கல்வி முன்னேற்றத்தில் முன்னோடியாக இருந்த மாவட்டங்களில் ஒன்றாக அது இருந்ததென்பது உங்களுக்குத் தெரியும். இருந்தாலும் தொடர்ச்சியான 30 வருட யுத்தத்தின் காரணமாக இன்று அம்மாவட்டம் ஒரு தேக்கநிலையை அடைந்துள்ளது. எனவே, இப்பிரதேச சமூக மேம்பாட்டின் அடித்தளமாக விளங்கும் அனைத்துப் பாடசாலைகளும் அபிவிருத்தி செய்யப்படவேண்டிய தேவையுள்ளது. இங்கு முக்கியமாக கணிதம், விஞ்ஞானம், ஆங்கிலம், தொழில்நுட்பம் மற்றும் தொடர்பாடல் போன்ற விடயங்களுக்கு ஆசிரியர் பற்றாக் குறை நிலவுகின்றது. அத்துடன், விளையாட்டு மைதானம், விஞ்ஞான ஆய்வுகூடம், வாசிகசாலை வசதிகள், கணனி அறைகள் மற்றும் உபகரணங்கள் என்பன உடனடியாக வழங்கப்பட வேண்டும்.

பொதுவாக ஆசிரியர் பற்றாக்குறையென்பது கல்வியில் சமத்துவமற்ற தன்மையின் வெளிப்பாடாகும். ஆகவே, தேசியப் பாடசாலைகளில் மிகையாகவுள்ள ஆசிரியர்கள் கிராமியப் பாடசாலைகளுக்கு மாற்றப்படவேண்டும். குறிப்பாக, வன்னிப் பகுதியின் எல்லைப் பிரதேச சிங்களக் கிராமங்களில் பாரிய ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்றது. தூரப்பகுதிகளிலிருந்து ஆசிரியர்கள் நியமிக்கப்பட்டாலும் அவர்கள் மிகக் குறுகிய காலத்திலேயே மாற்றலாகிச் செல்கின்றனர். இது உடனடியாகத் தீர்க்கப்படல் வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வவுனியா, இறம்பைக்குளம் மகளிர் தேசியப் பாடசாலைக்கு நீண்டகாலமாக ஒரு நிரந்தர விளையாட்டு மைதானம் இல்லாமலிருந்தது ஒரு பாரிய குறைபாடாகும். ஆனால், எமது அரசாங்கத்தின் நல்லெண்ணத்தின் வெளிப்பாடாக இன்று அது கிடைக்கச் செய்யப்பட்டுள்ளதென்பதனை இங்கு சுட்டிக்காட்ட விரும்புகிறேன். அதேபோல, நீண்டகாலமாக பதில் அதிபர்களாகக் கடமைபார்க்கும், அந்தந்தப் பாடசாலை களின் அபிவிருத்திக்கு அயராது உழைக்கும் அனைத்துப் பதில் அதிபர்களுக்குமான பதவி உயர்வு வழங்கப்பட வேண்டும். மேலும், வலயக் கல்விப் பணிப்பாளர்களது வசதிகளும் அதிகரிக்கப்பட வேண்டுமென்பதையும் கௌரவ அமைச்சரின் கவனத்துக்குக்கொண்டு வருகின்றேன்.

கல்வியே ஒரு சமூகத்தின் உயிர்நாடி! "கற்றவனும் கல்லாத வனும் சமமற்றவர்கள்" என இஸ்லாம் கூறுகின்றதேயன்றி, "பெண்கள் கல்வி கற்கக்கூடாது" என்று எங்கும் கூறப்படவில்லை. கல்வி அமைச்சின் வரவு செலவுத் திட்டக் குழுநிலை விவாதத்தை எதிர்க்கட்சி சார்பாக ஆரம்பித்து வைத்த ஜே.வி.பீ.யின் பாராளுமன்ற உறுப்பினர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள், இஸ்லாமிய கலாசாரம் மற்றும் தனியார் சட்டம் முஸ்லிம் பெண்களின் கல்விக்குத் தடையாகவுள்ளதென்ற ஒரு தவறான கருத்தை முன்வைத்தார். அதனை நான் முற்றாக மறுக்கிறேன். ஆண். பெண் வேறுபாடின்றி அனைவரும் கட்டாயம் கல்வி கற்கவேண்டு மென்பதையே இஸ்லாம் வலியுறுத்துகின்றது. பாகிஸ்தான் முஸ்லிம்கள் பற்றிய அறிக்கைகளை இலங்கை முஸ்லிம் பெண்களுடன் தொடர்புபடுத்த அவர் எடுத்த முயற்சி பொருத்தமற்றதாகும்.

அதுபோல, கடந்த வெள்ளிக்கிழமை கௌரவ நீதி அமைச்சர் விஜயதாச ராஜபக்ஷ அவர்களும் இப்பாராளு மன்றத்தில் முஸ்லிம்கள் சம்பந்தமாக தெரிவித்த கருத்துக்கள் உண்மைத்தன்மை அற்றவை. இதற்காக இலங்கை வாழ் முஸ்லிம்கள் சார்பாக எனது அதிருப்தியைத் தெரிவித்துக் கொள்கிறேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சுமார் 2,000 வருடங்களாக இலங்கையில் வாழ்ந்துவரும் முஸ்லிம்கள் இந்நாட்டின் அனைத்துச் சமூகங் களோடும் ஒற்றுமையாகவும் சமாதானமாகவும் வாழ்ந்து வருவது யாவரும் அறிந்த விடயமே. காலத்துக்குக் காலம் இந்த நாட்டில் அரசியல் இலாபம் கருதி இனவாதக் கட்சிகளும், ஜே.வி.பீ. போன்ற அமைப்புக்களும் ஆயுதமேந்தியிருந்தாலும் ஒருபோதும் இலங்கை முஸ்லிம்கள் அரசாங்கத்துக்கோ அல்லது சக இனக்குழுக்களுக்கோ எதிராகப் போராடியவர்கள் அல்லர்; எதிர்காலத்திலும் வன்முறையை அவர்கள் ஒரு தெரிவாக எடுக்கமாட்டார்களென்பதை இந்தச் சபையில் உறுதியாகக் குறிப்பிடுகின்றேன். தேசப்பற்றுமிக்க இலங்கை முஸ்லிம்கள் நாட்டில் சமாதானத்தையே விரும்புகின்றனர். அதற்காகவே அவர்கள் இந்த ஆட்சி மாற்றத்திற்கும் பூரண ஆதரவை வழங்கினர் என்பதையும் நான் உங்களுக்கு ஞாபகப்படுத்திக்கொள்ள விரும்புகிறேன்.

சுமார் 4 வருட காலமாக இனவாதிகள் இட்டுக்கட்டிய விடயங்களை இந்தச் சபையில் நீதி அமைச்சர் அவர்கள் நியாயப்படுத்த முயற்சித்ததன் பின்னணி மர்மமானது.

முஸ்லிம்களின் முக்கிய கல்வி நிறுவனங்கள் அமையப் பெற்றுள்ள பேருவளை, கல்எலியா, கல்முனை, குருநாகல் போன்ற பகுதிகளில் உல்லாசப்பயணி 'விசா'வில் வெளிநாடு களிலிருந்து வருகைதரும் கணிசமானோர் அடிப்படை வாதத்தைப் போதிக்கின்றனர் என்பது மிகவும் மோசமான குற்றச்சாட்டாகும். இந்த அனைத்து இஸ்லாமிய அமைப்புக் களும் உருவாக்கிய பல்லாயிரக்கணக்கான சிறந்த மேதைகள் இன்று நாட்டின் அபிவிருத்திக்கும் மேம்பாட்டுக்கும் பாரிய சேவையாற்றி வருவதைப் பட்டியலிட்டுக்கூற முடியும். ஆனால், கௌரவ அமைச்சர் அவர்களால் அங்கு உருவாக்கப் பட்ட ஒரு தீவிரவாதியின் பெயரையேனும் கூற முடியுமா? எனக் கேட்க விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ விஜயதாஸ ராஜபக்ஷ அவர்கள் குறிப்பிடுவதுபோல, சர்வதேசப் பாடசாலைகளில் தீவிரவாதம் போதிக்கப் படுவதாயின் ஏன், அரசு இங்குள்ள 104 சர்வதேசப் பாடசாலைகளையும் தடைசெய்துவிட்டு அங்கு கற்கும் ஓரிலட்சத்துக்கும் அதிகமான மாணவர்களை உடனடியாக அரச பாடசாலைகளில் இணைத்துக்கொள்ள நடவடிக்கை எடுக்கவில்லை? அவ்வாறு செய்வதாயின் நாம் எமது பூரண ஆதரவை வழங்குவோம்.

கொழும்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், வருடாந்தம் 5,000 முஸ்லிம் மாணவர்கள் பாடசாலைக்கான புதிய அனுமதி வேண்டி நிற்கின்றனர். ஆனால், துர்ப்பாக்கியவசமாக அவர்களில் 2,000 பேர் மாத்திரமே அரச பாடசாலைகளில் இணைத்துக் கொள்ளப்படுகின்றனர். ஏனையோர் அவர்க ளாகவே விரும்பி இந்தச் சர்வதேசப் பாடசாலைகளுக்குச் செல்லவில்லை. மாறாக, இவர்கள் நிர்ப்பந்தத்தின் அடிப்படை யிலேயே அப்பாடசாலைகளுக்குச் செல்கின்றனர்.

பாடசாலைகளில் கற்கும் காலத்தை நீடிப்பது ஒருபுறமிருக்க, ஆரம்பக் கல்வியைக்கூடக் கற்க பாடசாலை களின்றி ஏங்கும் சிறார்களுக்கு உரிய பாடசாலைகளை நிறுவி அவர்களை அதில் இணைப்பதற்கு அரசு நடவடிக்கை யெடுக்க வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
මට තව විනාඩියක් දෙන්න.

வளம்மிக்க சமூகங்களுக்கு பாடசாலைக் கால நீடிப்பு ஒரு முக்கியமான விடயமாக இருப்பினும், பாடசாலை அனுமதி யைப் பெறமுடியாமலிருக்கும் கொழும்புப் பிரதேசத்திலும் போதிய ஆசிரியர் மற்றும் வளங்கள் அற்ற கிராமப் புறங்களிலும் இதன் சாத்தியப்பாடு பற்றி நாம் தீவிரமாக சிந்திக்க வேண்டும். மேற்கத்தேயத்தை திருப்திப்படுத்துவதை அரசு விரும்பினாலும் அடிப்படைப் பிரச்சினைகளை நாம் சரியாகப் புரிந்து பணியாற்ற வேண்டும்.

கல்வி என்பது அனைத்துச் சமூகங்களினதும் அடிப்படை உரிமையாகும். எனவே, குக்கிராமங்கள் தொடக்கம் நகர்ப் பிரதேசங்களிலுள்ள சேரிகள் மற்றும் கொட்டில்களில் வாழும் அனைத்துப் பிள்ளைகளினதும் உரிமைகள் பாதுகாக்கப்பட வேண்டும். சமத்துவமற்ற கல்வி முறையை ஒரு பாரிய மோசடி அல்லது துரோகம் என்று கூடக் குறிப்பிடலாம். நன்றி.

[பி.ப. 5.43]

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று 2017ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத் திட்டத்தில் கல்வி அமைச்சுக்கான நிதியொதுக்கீடு மீதான குழுநிலை விவாதத் திலே பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பமளித்ததையிட்டு மலையக மக்கள் சார்பாக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்று காலையிலிருந்து இந்தக் கல்வி அமைச்சு சம்பந்தமாகப் பேசும்போது, விசேடமாக வடக்கு, கிழக்கு உறுப்பினர்கள், பெரும்பான்மை இனத்தைச் சேர்ந்த உறுப்பினர்கள், அமைச்சர்கள் எல்லோரும் மலையகக் கல்வியின் குறைநிறைகள் சம்பந்தமாகப் பேசியது எமக்கு மிகவும் மகிழ்ச்சியளிக்கின்றது. அந்த வகையில் இன்று அனைவரது பார்வையும் மலையக மக்கள் சார்பாகத் திரும்பியிருப்பதையிட்டு நான் பெருமிதமடைகின்றேன். கடந்த காலங்களில் தோட்டத் தொழிலாளர்களுடைய சம்பள உயர்வு சம்பந்தமாகவும் இந்தச் சபையில் அனைவரும் தமது கவனத்தைச் செலுத்தியதையிட்டும் நான் சந்தோஷ மடைகின்றேன்.

சற்றுமுன் பேசிய உறுப்பினர் ஒருவர், மலையகக் கல்வி சம்பந்தமாகக் குறிப்பிடும்போது, பெருந்தோட்டப் பாட சாலைகள் அபிவிருத்தியடையவில்லையென்றும் கடந்த வருடம் அங்கு கல்வி தொடர்பாக நிதியொதுக்கப் படவில்லை யெனவும் குறிப்பிட்டார். அதனை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். அவருக்குத் தோட்டத்தைப் பற்றி சரியாகத் தெரிந்திருக்காது என்று நினைக்கின்றேன். அங்கு குறை நிறைகள் இருக்கத்தான் செய்கின்றன. ஆனால், ஒன்றுமே செய்யவில்லை என்று சொல்வதை ஏற்றுக்கொள்ள முடியாது. அவர் தோட்டப்புறங்களுக்கு விஜயம் செய்திருந்தால் அதுபற்றிக் குறிப்பிடலாம். தற்போது கல்வி இராஜாங்க அமைச்சர் கௌரவ இராதாகிருஷ்ணன் அவர்களின் தலைமை யிலே மலையகத்தில் கல்வியில் பாரிய ஒரு முன்னேற்றம் ஏற்பட்டிருப்பதை எவரும் மறுக்கமுடியாது.

இன்று மலையகத்தைப் பொறுத்தவரையிலே விஞ்ஞானம் மற்றும் கணித பாடங்களுக்கு ஆசிரியர் பற்றாக்குறை இருக்கிறது. கௌரவ அக்கில விராஜ் காரியவசம் அவர்கள் ஒரு துடிப்பான இளைஞர்; ஒரு சட்டத்தரணி. இந்த நாட்டின் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்கள் இவரிடம் கல்வி அமைச்சை ஒப்படைத்திருக்கின்றார். இவர், குறுகிய காலத்தில் இந்த நாட்டின் கல்வித்துறையிலே நவீன முறையுடன்கூடிய ஒரு பாரிய மாற்றத்தை ஏற்படுத்தி வருவதை நாம் வரவேற்கின்றோம்.

விசேடமாக மலையகக் கல்வி சம்பந்தமாகப் பார்க்கும் போது, நான் ஊவா மாகாணத்தின் கல்வி அமைச்சராக இருந்த அனுபவத்தைக்கொண்டு பேசுகின்றேன், மலையகக் கல்வி யிலே ஒரு மாற்றம் தேவை; ஒரு புரட்சி தேவை என்பதிலே நாம் உறுதியாக இருக்கின்றோம். இதற்கு இந்தப் பாராளு மன்றத்தின் முழுமையான ஒத்துழைப்பு எங்களுக்குத் தேவைப் படுகின்றது. மக்கள் எங்களிடம் அதனை எதிர்பார்க்கின் றார்கள். எங்களுக்குப் பாரிய பொறுப்பொன்று இருக்கின்றது. நாம் கடந்த காலங்களில் இச்சபையிலே மலையகப் பெருந்தோட்டம் சம்பந்தமாக, தோட்டத் தொழிலாளர்கள் சம்பந்தமாகக் குரல் எழுப்பினோம். ஆனால், இன்று முற்று முழுதாக மலையக மக்களுடைய வாழ்வாதாரம், பொருளா தாரம் என்பன மாற்றப்பட்டிருக்கின்றன. இந்நிலையில், இன்று

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

நாங்கள் மலையகத்தின் கல்வியிலே ஒரு புரட்சியை ஏற்படுத்துவதற்கு கங்கணம்கட்டிச் செயற்பட்டுக் கொண்டிருக் கின்றோம். இந்த அரசாங்கம் மூலமாகவோ, பாராளுமன்றம் மூலமாகவே எந்த நிதி ஒதுக்கப்பட்டாலும், எவ்வாறான ஆசிரியர் நியமனங்கள் வழங்கப்பட்டாலும், எவ்வாறான வளங்கள் வழங்கப்பட்டாலும், எங்களுடைய பங்கு - மலையக மக்களுடைய பங்கு எங்களுக்குக் கிடைக்கப்பெற்று, மலையகத் திலேயுள்ள பாடசாலைகளின் தேவைகள் நிவர்த்தி செய்யப்பட வேண்டும் என்பதிலே நாம் தெளிவாக இருக்கின்றோம். தொடர்ந்தும் எவ்விதமான குறைபாடுகளும் அங்கு இருக்கமுடியாது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
Hon. Presiding Member, I have been given six minutes.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes. You have been allotted six minutes.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
I think I have spoken only three minutes. Anyway, give me one more minute.

ஆகவே, நான் இங்கு கூறிக்கொள்ள விரும்புவது என்னவெனில், மலையகத்தின் பங்கு எங்களுக்கு அவசியம். கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுடைய தலைமையிலே இருக்கின்ற இந்த அரசாங்கம் மூலமாகத்தான், எங்களால் மலையகத்திலே ஒரு பாரிய கல்விப் புரட்சியை ஏற்படுத்த முடியும். நாங்கள் கல்வி அமைச்சின் நிதி ஒதுக்கீட்டின் மூலமாக "ළඟම පාසල - හොඳම පාසල" என்ற திட்டத்தின் அடிப்படையில், என்னுடைய பிரதேசமான மடுல்சீமை, லுனுகலை, பசறை, ஹப்புத்தளை, பண்டாரவளை மற்றும் ஹாலிஎல பகுதியிலே ஒரு பாரிய மாற்றத்தை ஏற்படுத்தியிருக்கின்றோம். அதற்கு உறுதுணையாக கௌரவ இராஜாங்க கல்வி அமைச்சர் இராதாகிருஷ்ணன் அவர்கள் எம்மோடு இருக்கின்றார். கௌரவ அக்கில விராஜ் காரியவசம் அவர்கள் ஒரு கல்விமான் என்றவகையிலே, எங்களுடைய மலையகக் கல்விக்குப் பாரிய பங்களிப்பை வழங்கியிருக்கின்றார். அவருடைய தலைமையில் தேசிய ரீதியில் ஒரு பாரிய மாற்றத்தை நாம் காணக்கூடியதாக இருக்கின்றது.

இருந்தாலும்கூட, மாகாண சபைகளுக்குக் கீழ் இயங்குகின்ற சில பாடசாலைகளில் அநாகரிகமான செயற் பாடுகள் நடைபெறுகின்றன. ஊவா மாகாணத்தைப் பொறுத்தவரையிலே, இடமாற்றங்கள் இவ்வாறான செயற் பாடுகள்மூலம் இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. ஊவா மாகாணப் பாடசாலைகளில் அரசியல் முழுமையாக உள் வாங்கப்பட்டிருக்கின்றது. எனவே, கௌரவ அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்கள் அதனைத் தடுத்து நிறுத்துவதற்கு உரிய நடவடிக்கைகளை அமைச்சு மூலமாக முன்னெடுக்கவேண்டுமெனக் கேட்டுக்கொள்வதோடு, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
මන්ත්‍රීවරයෙක් වතුකරය ගැන කථා කළා. එතුමාගේ ගෙදර ළඟ තිබෙන වත්ත මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි. වතුකරයේ අඩු පාඩු සම්බන්ධව මන්ත්‍රීතුමෙක් කථා කළා. වතුකරයේ ප්‍රශ්න ගැන දන්නේ, අපි. ඌව පළාත් සභාවේ අධ්‍යාපන ඇමතිවරයෙක් විධියට හිටියේ මම. ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා වතුකරයට වෙනම රාජ්‍ය ඇමති කෙනෙක් පත් කරලා තිබෙනවා. නීතිඥවරයෙක් අධ්‍යාපන ඇමතිවරයා හැටියට පත් කරලා මේ කෙටි කාලයේදී සම්පූර්ණ වෙනසක් ඇති කරලා තිබෙනවා. ඒ නිසා වතුකරයේ තිබෙන අඩුපාඩු ගැන අපි කථා කරන්නම්. වතුකරයේ ළමයින්ට මේ කාල සීමාවේ තමයි ජාතිවාදය නැත්තේ. පසු ගිය කාලයේ ජාතිවාදයයි තිබුණේ. දැන් ලොකු වෙනසක් ඇති කරලා තිබෙනවා. ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාගේ නායකත්වයෙන් යුතු මේ ආණ්ඩුවෙන් අපි ලොකු වෙනසක් බලාපොරොත්තු වෙනවා. ඒක පටන් අරගෙන තිබෙනවා. 2020 වන විට වතුකර ක්ෂේත්‍රයේ අධ්‍යාපනය පැත්තෙන් අපි විශාල වෙනසක් කරන බව සත්‍යයි කියමින් මේ අවස්ථාව දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. நன்றி, வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. The next speaker is the Hon. Mohamed Navavi. You have only two minutes. Please try to finish your speech in two minutes.

**[5.50 p.m.]**

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Actually, I must thank the Minister, Hon. S.B. Nawinne, for the work that his Ministry has done in the Puttalam District. Similarly, I must thank the Hon. Minister of Education and the Hon. State Minister of Education for the wonderful work that they have been doing. I can remember, during the previous Government, under the programme for development of 1,000 secondary schools, we got only five schools. But after the present Minister took over, under " the closest school is the best school" concept this time we have got 39 schools, out of which we have started developing 13 schools. This shows the improvement in education in our area.

Especially I want to mention about the Puttalam Zone, where we have 203 schools. I think this is one of the biggest education zones in the whole country. My leader, the Hon. Risad Badhiutheen, has already made a request in this regard. Sir, we get the same facilities as

other smaller zones, because the facilities given to this zone are divided among 203 schools. Therefore, I have given a proposal to take four AGA divisions in the Puttalam Electorate - Puttalam, Vanathawilluwa, Mundalama and Kalpitiya - under one zone and the balance to go under Anamaduwa. Especially, Puttalam and Anamaduwa are backward areas. Actually you have given us more than what we require. We are very happy.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Sir, please give me one more minute.

Last time I spoke about the shortage of teachers. I am very happy to say that you have filled 75 per cent of the vacancies. I remember I spoke about the Advanced Level teachers. Of course, you have promised that you would look into that.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Sir, please give me half a minute.

In the morning, the Hon. Bimal Rathnayake spoke about the education of Muslim ladies. I assure you that they are being educated. In fact, when you go to most of the offices, you can see Muslim girls, wearing *fardha,* working in many offices . Therefore, in no way, can their education be stopped.
Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you very much. The nest speaker is the Hon. Seyed Ali Zahir Moulana. You too have only four minutes.

**[5.52p.m.]**

**ගරු සෙය්යිඩ් අලී සාහීර් මව්ලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா )
(The Hon. Seyed Ali Zahir Moulana )
Thank you, Sir. First and foremost let me commend the Hon. Akila Viraj Kariyawasam and the Hon. Radhakrishnan for introducing reforms that are targeted at ensuring zero dropouts, mandatory education for 13 years and expanding the options for students to continue their higher education with focus on science and technology, based education creating an abundance of multi-faceted and skilled individuals ready to take on tomorrow.

Secondly, let me commend the proposal to introduce a regulatory body towards monitoring and overseeing private and international schools to ensure that their curricular and standards are aligned with the government's expectations to ensure that our children receive the very best.

எங்களது பகுதிகளிலே பல பாடசாலைகளில் உயர்தரக் கல்விக்கான தொழில்நுட்ப ஆய்வுகூடங்கள் - Technical Laboratory - ஆரம்பித்து வைக்கப்பட்டுள்ளன. ஆனால், மாணவர்களுக்கு ஏற்ற அடிப்படையில் அவர்கள் பயனடையக் கூடிய அளவுக்கு அவற்றுக்கான உபகரணங்கள் இன்னமும் கொடுக்கப்படவில்லை. மேலும், போட்டிப் பரீட்சை மூலமாகப் புதிதாக பாடசாலை அதிபர் சேவைக்கு நியமனம் பெற்றவர்களுக்கு பாடசாலைப் பொறுப்புக்களை வழங்கும் அதேநேரத்தில், பாடசாலைகளில் நிரந்தர அதிபர் பதவிகள் வெற்றிடமாகவிருந்த சூழ்நிலையில் நிறைவேற்று அதிபர்களாக நியமிக்கப்பட்டு பல வருடங்களாகப் பணியில் இருக்கும் ஆசிரியர்களுக்கு அநீதி ஏற்படாதவகையில் அவர்களது தகுதியினையும் சேவைக் காலத்தையும் கருத்திற்கொண்டு அவர்களையும் நிரந்தர அதிபர் சேவைக்குள் உள்வாங்க அமைச்சரவை நடவடிக்கை எடுக்கவேண்டும்.

கிழக்கு மாகாணத்தில் முறையான ஆசிரியர், அதிபர் இடமாற்றத் திட்டம் பின்பற்றப்படுவதாகத் தெரியவில்லை. மிகவும் கஷ்டப் பிரதேசங்களில் கடமையாற்றும் அதிபர், ஆசிரியர்கள் தொடர்ந்தும் கஷ்டப் பிரதேசங்களுக்கே இட மாற்றம் செய்யப்படுகின்றனர். அதேவேளை, சில ஆசிரியர்கள் தொடர்ந்தும் நகரப்புறப் பாடசாலைகளிலே கடமையாற்றும் நிலையும் காணப்படுகின்றது. இந்த நிலைமை மாற்றியமைக்கப்பட வேண்டும்.

இன்று எங்களது கல்வி இராஜாங்க அமைச்சர் இராதா கிருஷ்ணன் அவர்களை நான் பாராட்டக் கடமைப் பட்டிருக்கிறேன். ஏனெனில், நீண்டகாலமாமகவே தீர்க்கப் படாமல் இருந்து வருகின்ற கிழக்கு மாகாணத் தொண்டர் ஆசிரியர்களது பிரச்சினைக்கு நல்லதொரு தீர்வைக் காண அவர் முயன்றுவருகின்றார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please, wind up now.

**ගරු සෙය්යිඩ් අලී සාහීර් මව්ලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா )
(The Hon. Seyed Ali Zahir Moulana )
அந்த வகையில், கஷ்டமான காலங்களிலும், போர்ச் சூழலிலும் எவ்வித பலனையும் எதிர்பாராது அர்ப்பணிப்புடன் பணியாற்றி மாணவர்களுக்குக் கல்வி புகட்டிய அனைத்துத் தொண்டர் ஆசிரியர்களுக்கும் நீதியான முறையில் நிரந்தர நியமனத்தைப் பெற்றுக்கொடுக்க நல்லாட்சி அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

கடைசியாக, ஏறாவூர் அலிகார் தேசியப் பாடசாலையில் ICT, Engineering Technology போன்ற பாடங்களைக் கற்பிப்பதற்கு ஆசிரியர்கள் இல்லை. 1,000 பாடசாலைத் திட்டத்தின் கீழ் 'கிரிக்கெட்' விளையாட்டுத்துறையை அபிவிருத்தி செய்வதற்கு வரவு செலவுத் திட்டத்தில் உள்ளடக்கப்பட்டுள்ள ஆலோசனை மிகவும் வரவேற்கத்தக்கது. இதேநேரம்,

[ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා]

மட்டக்களப்பு மத்தி கல்வி வலயத்தில் அலிகார் தேசியப் பாடசாலை, ஏறாவூர் றகுமானியா மகா வித்தியாலயம், மாக்கான் மாக்கார் வித்தியாலயம் ஆகிய பாடசாலைகள் மிகவும் குறைந்த விளையாட்டு வளங்களுடன் இயங்கி வருகின்றன. அப்படியிருந்தும் 'கிரிக்கெட்', உதைப்பந்து, எறிபந்து ஆகிய குழு விளையாட்டுக்களில் வருடாந்தம் தேசிய மட்டச் சாதனைகளை அப்பாடசாலைகள் நிகழ்த்திவருவது பாராட்டத்தக்கது. அப்பாடசாலைகளை அபிவிருத்தி செய்ய அமைச்சு விசேட கவனம் செலுத்தவேண்டுமென்று கேட்டுக் கொண்டு, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, அமர்கின்றேன்.

[අ.භා. 5.56]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**

(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)

(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අද විවාදයට සහභාගී වුණු සියලු දෙනාටම මගේ ස්තුතිය පුද කරනවා. අපේ අධ්‍යාපන අමාත්‍යාංශයට මෙතරම් මූලධන ප්‍රමාණයක් ලබා දුන්නු අපේ මුදල් අමාත්‍යතුමාට, අතිගරු ජනාධිපතිතුමාට, ගරු අගමැතිතුමාට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන කනගාටුව මෙයයි. මේ විවාදයේදී විපක්ෂයට අඩුම ගණනේ හරි මතයක් ගොඩ නඟා ගන්න හෝ අධ්‍යාපනය සඳහා වෙන් වෙච්ච වැය ශීර්ෂය වෙනුවෙන්, හරි තර්කයක් ගොඩ නඟා ගන්න හෝ පුළුවන්කමක් තිබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම පිළිතුරු දෙන්නවත් දෙයක් නැහැ. මම වර්තන වියදම් ගැන කථා කරන්නේ නැහැ. මූලධන වියදම් නැත්නම් ප්‍රාග්ධන වියදම් කපා හැරීමක් ගැන විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කථා කළා. "2016 වසරේ කපා හැරියා" ආදී වශයෙන් විවිධ කථා කිව්වා. මම මේ අවස්ථාවේ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට මේ කාරණය මතක් කරලා දෙන්න ඕනෑ. මෙතුමන්ලාගේ කාලයේ අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබුණු මුදල් ප්‍රමාණයත් එක්ක තමයි මෙතුමන්ලා අපේ ආණ්ඩුව ගැන කථා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ සංඛ්‍යා ලේඛන ගෙන්වා ගෙන බැලුවා. රාජපක්ෂ ආණ්ඩුව 2014දී ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරලා තිබෙන්නේ, බිලියන 15.1යි. ඒ කියන්නේ, මිලියන 15,000යි. 2015දී වෙන් කරලා තිබෙන්නේ, බිලියන 17.8යි. ඒකෙනුත් මුදල් දීලා තිබෙන්නේ, බිලියන 15.8ක් විතරයි. මේක තමයි එතුමන්ලාගේ ප්‍රාග්ධන වෙන් කිරීම. අපි 2016දී වෙන් කළා, මූලධන වියදම් බිලියන 82.5ක්. රාජපක්ෂ ආණ්ඩුව ප්‍රාග්ධන වියදම් විධියට වෙන් කළේ, බිලියන 15.8යි. අපි බිලියන 82.5ක් වෙන් කළා. මේ වෙන් කරපු මුදලින් ඉදිකිරීම් සඳහා බිලියන 64කුත්, භාණ්ඩ මිලදී ගැනීම් සඳහා බිලියන 17.6කුත් තමයි වෙන් කළේ. දැන් මෙතුමන්ලා කියනවා, "මේක කපා හැරලා. මෙතැනින් මෙච්චරයි තිබෙන්නේ. මේවා නැහැ" කියලා. මම කියන්න කැමැතියි, හරියට තොරතුරු හොයන්නේ නැතුවයි මේ කථා කරන්නේ කියලා. මම දන්නේ නැහැ, කාගේ සංඛ්‍යා ලේඛන අරගෙනද මෙහාට ආවේ කියලා. මෙතුමන්ලා වැරැදි තොරතුරුයි හොයාගෙන තිබෙන්නේ. එක්කෝ, කවුරු හරි ලණුවක් දීලා. මේ වෙන කොට ඉදිකිරීම් සඳහා අපි විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය දැන් ක්‍රියාත්මක කරනවා. මේ රටේ පාසල් 10,161ක් තිබෙනවා.

එයින් අපි පාසල් 7,000ක් තෝරා ගෙන "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහනට ඇතුළත් කර ගෙන ඒ පාසල් 7,000ට එක එක මට්ටමින් අවශ්‍ය විද්‍යාගාර වෙන්න පුළුවන්, වැසිකිළි කැසිකිළි වෙන්න පුළුවන් විවිධ ආකාරයේ ව්‍යාපෘතිවලට විතරක් අපි රුපියල් මිලියන 40,000ක - රුපියල් බිලියන 40ක- බැඳීම් ඇති කර ගෙන තිබෙනවා. ඊට අමතරව අපි ඉතිරි රුපියල් බිලියන 24 සඳහා ඇස්තමේන්තු සකස් කරලා ටෙන්ඩර් කර තිබෙනවා. අපට ඒවා නවත්වන්න පුළුවන්ද? ඒ නිසා අපි රුපියල් බිලියන 64ටම commit කර තිබෙනවා, එහෙම නැත්නම් අනෙක් කොටස සඳහා ඇස්තමේන්තු හදලා ටෙන්ඩර් කරලා තිබෙනවා. ඒ අනුව මේවා ඔක්කොම ක්‍රියාත්මක කරනවා. මේවා සඳහා පියවරෙන් පියවර තමයි සල්ලි දෙන්නේ. දැන් ප්‍රමාදය ගැන අහනවා. ප්‍රමාදයක් තිබෙනවා. ඒකට හේතුවකුත් තිබෙනවා.

පසුගිය ආණ්ඩුව වාගේ මිත්‍රයෝ ටික කැඳවලා ටෙන්ඩර් දුන්නේ නැහැ. පසු ගිය කාලයේ ටෙන්ඩර් කළේ නැහැ. ඔක්කොම ටික කැඳවලා මෙන්න මේවා කරන්න කියලා බෙදලා දුන්නා. අපි නව රජය බලයට පත් වුණාට පස්සේ හැම එකක්ම ටෙන්ඩර් දැම්මා. ඒක තමයි අපේ ප්‍රමාදයට හේතුව. ටෙන්ඩර් දමන්න ගියාම ඒ සඳහා ගත වන අවම කාලයක් තිබෙනවා. එහෙම අවම කාලය ගත වුණත් අපි ටෙන්ඩර් දමලා commit කරලා, නැත්නම් බැඳීම් ඇති කර ගෙන මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒ නිසා වැඩිම මුදල් ප්‍රමාණයකින් වැඩ කරන වසර ලෙස මේ වසර ඉතිහාසගත වෙනවා. ඒක කාටවත් නවත්වන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය සඳහා වෙන් කළ මුදල් ගැන කථා කළා. රාජපක්ෂ ආණ්ඩුව කාලයේ පරිගණක 60,000ක් අර ගෙන තිබුණ බව මම දැක්කා. ඒවා අර ගෙන තිබෙන්නේ එක එක ගණන්වලට. සමහර ඒවා එක පරිගණකයක් රුපියල් 1,10,000යි, රුපියල් 90,000යි. මම හැම වෙලාවේම කියන දෙයක් තමයි ගොඩක් ගන්න කොට ගණන අඩු වෙන්න ඕනෑ කියන එක. මේ අය පරිගණක 60,000ක් අර ගෙන කොම්පැනි පොහොසත් කළා. ගත්ත දවසෙ ඉඳලා විවිධ උපාංග නැහැයි කියලා විදුහල්පතිවරු ඒවා එක එක තැන්වලට විසි කරලා තිබුණා. අපේ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විධියට මම කිව්වා, "පරිගණක මිලදී ගන්න එපා. අපට දෙන්න, අපි rent එකට ගන්නම්" කියලා.

ගුරු මධ්‍යස්ථාන හතළිහක්! මුළු රටේම අධ්‍යාපන කලාප කාර්යාල තියෙන්නේ 98යි. ඒ අනු අටෙන් හතළිහක මේ වන විට ගුරු මධ්‍යස්ථාන හදන්නට පියවර ගෙන තිබෙනවාය කියන එක මම තමුන්නාන්සේට කියන්න ඕනෑ. පාසල්වල විද්‍යා අධ්‍යාපනය තවදුරටත් වර්ධනය කිරීම සඳහා උපකරණ ඇතුළත් ජංගම විද්‍යාගාර කට්ටල තුන්දාහක් පහසුකම් නොලද දුෂ්කර පාසල්වලට ලබා දීමට පියවර ගෙන තිබෙනවා.

දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හදන්නට කටයුතු කර තිබෙනවා. මේ ආදී වශයෙන් මට පැය ගණනක් කියවන්නට පුළුවන්, අපි කළ සේවා සහ මේ වනවිට ගෙන තිබෙන පියවර ගැන. කාලය අඩු නිසා ඉතා කෙටියෙන් මේවා ගැන කියන්නට බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ අපි බලාපොරොත්තු වෙන්නේ, ඉතාමත් කෙටි කාලයක් තුළ මේ රටේ පාසල් දසදහස් එකසිය හැටඑක්කේම පහසුකම්, භෞතික සම්පත් විතරක් නොවෙයි, ගුණාත්මක අධ්‍යාපනය දියුණු කරන්න අවශ්‍ය හැම පියවරක්ම ගැනීමටයි.

වැඩබලන විදුහල්පතිවරු පාසල්වලට දමා ගෙන පසුගිය ආණ්ඩුව කාලයේ පාසල් දේශපාලනීකරණය වෙලා තිබුණා. අපේ ආණ්ඩුව ආවාට පස්සේ, කිසිම භේදයකින් තොරව තුන්වැනි ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ගේ විභාගය පැවැත්වූවා. අපි මේ වන

විට එයින් 3,901දෙනෙක් ගෙන, මාස එකහමාරක පුහුණුවක් ලබා දී තමන්ගේ කාර්ය සාධනය පෙන්වූ හොඳම වැඩිම ලකුණු ප්‍රමාණය ගත් අයට විදේශ ශිෂ්‍යත්ව ලබා දී මැලේසියාවේ නොටින්හම් විශ්වවිද්‍යාලයේ දැන් කොටසක් පුහුණුව ලබනවා. අපට වුවමනා කරන්නේ අධ්‍යාපන පද්ධතිය ගුණාත්මක වශයෙන් දියුණු කරන්නයි. ඒ සඳහා අප පියවර ගෙන තිබෙනවා. අවශ්‍ය විදුහල්පතිවරු ටික රැගෙන ඉවරයි. කනගාටුවට කරුණ නම් මේ ගත් විදුහල්පතිවරු විදුහල්පතිවරුන් විධියටම දාන්න සමහර පළාත් සභාවලින් කටයුතු කරන්නේ නැහැ. ඒ සඳහා කැබිනට් පත්‍රිකාවකුත් දමා තිබෙනවා. ඒ ගැනත් මම කියන්න ඕනෑ.

අධ්‍යාපන පරිපාලන සේවයට කාලයකින් අරගෙන තිබුණේ නැහැ. අපි දේශපාලනය බින්දුවක්වත් නැතිව 852 දෙනෙක් අධ්‍යාපන පරිපාලන සේවයට ගන්න කටයුතු කර තිබෙනවා. හෙට අනිද්දා ඒ අය පුහුණු කරන්න ඒ වැඩකටයුතු සියල්ලම අපි ආරම්භ කර තිබෙනවා. ඊට අමතරව, ගුරු අධ්‍යාපන සේවයේ පුරප්පාඩු 1,190ක් තිබුණා. අපි ගැසට් නිවේදනයක් දාලා, විභාග පවත්වා, මේ සියලුම පුරප්පාඩු පුරවන්න කටයුතු කරනවා. මේවා අපි පියවරෙන් පියවර කර ගෙන යනවා.

අපට තිබෙන අනෙක් ප්‍රශ්නය ගුරු ප්‍රශ්නයයි. අපේ රටේ ගුරු ප්‍රශ්නයට එක හේතුවක් වන්නේ පසු ගිය කාලයේ දේශපාලනඥයන් එක එක විධියට, නියමිත ප්‍රතිපත්තියක් නැතිව ගුරුමාරු සිදුකිරීමයි. නියම ප්‍රතිපත්තියක් නැති නිසා අපේ රටේ ගුරු හිඟය 60,000යි; ගුරු අතිරික්තය 40,000යි.

ඇත්ත වශයෙන්ම ගුරු හිඟය තිබෙන්නේ විසිදාහයි. එක පාසලක අවුරුදු තිහක් සේවය කළ සමහර ගුරුවරු ඉන්නවා. සමහර ගම්බද ප්‍රදේශවලට ගුරුවරුන් නැහැ. මාත් අපේ ලේකම්වරයාත්, බොහොම කැපවීමෙන් කටයුතු කරන අපේ අමාත්‍යාංශයේ කණ්ඩායමත්, අපි හැමදෙනාම එකතුවෙලා පළාත් සභා එක්ක කථා කළා; ආණ්ඩුකාරවරු ගෙන්වූවා; පළාත් ඇමතිවරු ගෙන්වූවා; පළාත් අධ්‍යක්ෂවරු ගෙන්වූවා; පළාත් ලේකම්වරු ගෙන්වූවා. මේ සියලු දෙනාම ගෙන්වා අපි මේකට ස්ථිරසාර විසඳුමක් ගැන කථා කළා. එහෙම සාකච්ඡා කර අපි තීරණයක් ගත්තා, ගුරු තුලනය පුළුවන් තරම් උපරිමයෙන් කරන්න. එහිදී ජාතික පාසල් ද, රේඛීය අමාත්‍යාංශයෙන් පඩි ගෙවවාද කියන මේ කිසි දෙයක් බලන්නේ නැතිව ගුරු තුලනය කරන්න පුළුවන් තරම් උත්සාහ කරමුය කියා තීරණය කළා. ඊට අමතරව, ඒ ඒ විෂයයන් අනුව හිඟ ගුරුවරු ටික තෝරාගෙන, අලුත් විෂයයන්වලට එන ගුරුවරුත් සමඟ හතළිස්අටදාහක් පමණ ගුරුවරුන් අවුරුදු දෙක තුනක් ඇතුළත බඳවා ගන්න කටයුතු කරන්න තීරණය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්න විසඳන්න අපි පියවරෙන් පියවර යනවා. අපි අඩුපාඩු හොඳින් හඳුනාගෙනයි කටයුතු කරන්නේ. අපේ අමාත්‍යාංශයේ සියලුම දත්ත දැන් පරිගණකගත කර - computerize කර - තිබෙනවා. අපි දන්නවා, පාසල් 10,161ක් තිබෙනවා; ඒ ඒ විෂයයන් අනුව ඉන්න ගුරුවරු ඉන්නවා කියලා. විදුහල්පතිවරු, අනෙකුත් සේවක සේවිකාවෝ, භෞතික සම්පත්, වැසිකිළි, කැසිකිළි, වතුර මේ සියලු දෙයක්ම අපේ අමාත්‍යාංශයේ පරිගණකගත කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

***අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. EDWARD GUNASEKARA *left the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු සභාපතිතුමනි, ඊට අමතරව අපේ අධ්‍යාපන ආයතනය අවුරුදු පණහක්, සියයක් අනාගතය දැකලා, වැඩ ලෝකයට ගැළපෙන විධියට, අනාගත රැකියාවලට ගැළපෙන විධියට විෂය මාලාවල දැවැන්ත වෙනසක් මේ අවස්ථාවේදී කරමින් යනවා. අඩු පාඩු තිබෙන්නට පුළුවන්. මේ තිබෙන යන්ත්‍රණය තුළ මේ සියල්ලම කරන්න ගියාම සියයට 100ක්ම සාර්ථක ප්‍රතිඵල බලාපොරොත්තු නොවුණත් අපට යන්නට පුළුවන් උපරිම ප්‍රතිඵලය කරා අපි ළඟාවෙමින් පවතිනවා.

පසුගිය දවස්වල ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇති කරන කමිටුවකින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව අපේ අධ්‍යාපනඥයන්, අපේ ජාතික අධ්‍යාපන ආයතනය, විශේෂඥයන් ලෝකයේ තිබෙන දියුණුම අධ්‍යාපන ක්‍රම පිළිබඳව සම්පූර්ණයෙන් අධ්‍යයනය කර, නොබෝ දිනකින් අලුතෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කරන්න කටයුතු කරනවා. හරියට බැලුවොත්, අන්තර් කාලය හැරුණාම, අපට ජනතා සහයෝගය ලැබිලා, ජනතාවගේ ඡන්දය මත පත් වෙලා වසරක් ගතවෙලා අවසානයි. අපට තව අවුරුදු 4ක් තිබෙනවා.

අය වැය ලේඛනයේ තිබෙන්නේ, වසරක් තුළ ගන්නා පියවර සම්බන්ධයෙනුයි. ඒ යටතේ වසර 13ක අනිවාර්ය පාසල් අධ්‍යාපනය තුළින් අපි බලාපොරොත්තු වනවා, මේ රටේ ඉන්න සියලුම දරුවන් අපොස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත් වුවද, අසමත් වුවද ඔවුන් අපොස (උසස් පෙළ) කරා ගෙන යන්න. අපි අලුතින් විෂයයන් 24ක් හඳුන්වා දෙන්න බලාපොරොත්තු වනවා. වැඩ ලෝකයට ගැළපෙන පරිදි, තව අවුරුදු 25කින්, අවුරුදු 50කින් අනාගතයේ දී ඇති වන රැකියා පිළිබඳව දැන් තියාම තුන්කල් දැක්මෙන් බලලා ඒ විෂයයන් හඳුන්වා දෙන්න අපි බලාපොරොත්තු වනවා. ඒ විෂයයන් robotics වෙන්න පුළුවන්, ඒ විෂයයන් designersලා බිහි කරන විෂයයන් වෙන්න පුළුවන්, ඒ විෂයයන් සංචාරක ව්‍යාපාරයට අවශ්‍ය කරන විෂයයන් වෙන්න පුළුවන්, ඒ විෂයයන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ යන ගණිත, විද්‍යා, වාණිජ, කලා විෂයයන් වෙන්න පුළුවන්. අපොස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අසමත් වන එක්ලක්ෂ විසිදහසක් පමණ වන සිසුන්ට, ඒ විෂයයන් 24 තුළින් තමන් කැමැති කුමන හෝ විෂයයන් ප්‍රමාණයක් තෝරාගෙන උසස් අධ්‍යාපනය කරා යන්න අවස්ථාව ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා.

ගරු සභාපතිතුමනි, ඊට අමතරව මා මේ කාරණයත් කියන්න ඕනෑ. අප හැමදෙනාම දන්නවා, ඉස්සර පාසල්වලට හිටපු ගමන් පාසල් පරීක්ෂකවරුන් කඩා පනිනවාය කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ගිය වතාවේ නිල ඇඳුම් සඳහා කූපන් පත් ලබා දීම ඉතා සාර්ථකව නිම කළා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒක තමයි. ඔබතුමා දැක්කා, ඒකටත් -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මේ වතාවේ මොනවත් කියන්නේ නැහැ, හොඳට සවන් දෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මේ වතාවේදී අපි ඒවා යවන්නේ පාසලේ නම සඳහන් කරලායි.

අනික් කාරණය, ගිය වර අය වැයෙන් ඒ සඳහා රුපියල් මිලියන 2,700ක් වෙන් කරලා තිබෙනවා. මෙවර අපේ ලේකම්තුමන්ලා සියලුම දෙනා සමඟ එකතු වෙලා සාකච්ඡා කළාම, රුපියල් මිලියන 2,450යි වැය වන්නේ. මේ වතාවේ එය අඩු වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමනි, රක්ෂණ ක්‍රමය ගැනත් කියන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
කියනවා, ගරු සභාපතිතුමනි. මට කාලය දෙනවා නම්, මා ඒ සියල්ලම කියන්නම්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාලය හදලා හෝ දෙන්නම්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා, කූපන් ලබා දීමේ කාර්යය. ඒක අපට විධිමත්ව කරන්න පුළුවන්කම ලැබුණා. ඊට අමතරව, පාසල් පරීක්ෂණ ක්‍රමයක් තිබුණේ නැහැයි කියලා තමුන්නාන්සේලා දන්නවා. සමහර විට පාසල් අයාලේ ගියා. බොහෝ පාසල්වල ගුරුවරුන්ගේ ප්‍රමිතිය, කාර්ය සාධනය යනාදී සියල්ලම අඩපණ වෙලා තිබුණා. සමහර පළාත්වල නිවැරදිව කළා. අපි මේ අවස්ථාවේදී ස්වාධීන සුපරීක්ෂණ මණ්ඩලයක් ඇති කරන්න සියලු පිඹුරු පත් සකස් කරලායි තිබෙන්නේ. මේ ඔස්සේ ජාතික පාසලක් ද, පළාත් සභා පාසලක් ද, පෞද්ගලික පාසලක්ද කියා බලන්නේ නැතුව, ඒ හැම පාසලකම ඉගැන්වීම් කටයුතු, භෞතික සම්පත්, එහි ප්‍රමිතිය යනාදී සෑම දෙයක් ගැනම සුපරීක්ෂණය කරන්න නොබෝ දිනකින් ඉතා ශක්තිමත් සුපරීක්ෂණ මණ්ඩලයක් ඇති කරනවාය කියන එක කියන්න ඕනෑ.

ඊට අමතරව, ඉදිරියේදී පාසල් මණ්ඩල -school boards- ඇති කරන්න කටයුතු කරනවා. ඒක අපේ පනතේ තිබෙනවා. ස්වාධීන තීන්දු තීරණ ගනිමින් මේ පාසල්වලට ඒ මණ්ඩල ඔස්සේ යන්න දෙන්න ඕනෑ. දැන් බලන්න, Trinity College එක වෙන්න පුළුවන්, St. Thomas' College එක වෙන්න පුළුවන්, Musaeus College එක වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් ඒ මණ්ඩල මඟින් ක්‍රියාත්මක වන තවත් පාසල් ගණනාවක් තිබෙනවා. ඒ මණ්ඩලයට අවශ්‍ය කරන සියලුම මුදල් රජය දෙන්න බලාපොරොත්තු වනවා. අපි පාසල් මණ්ඩලයට මුදල් දෙනවා.

පාසල්වල අවශ්‍යතා වෙනුවෙන් වියදම් කිරීම පිළිබඳව මණ්ඩලය තීරණය කරන්න ඕනෑ. ඒ මණ්ඩලය තමයි ඉදිරියේදී තීන්දු තීරණ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන්නේ. අපි ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා. අපි මෙවැනි කරුණු කාරණා රාශියක් ක්‍රියාත්මක කරනවා. පාසල් පරීක්ෂක ක්‍රමය, පාසල් මණ්ඩල ඇති කිරීම, වසර 13ක අනිවාර්ය පාසල් අධ්‍යාපනය වැනි අලුත් වෙනස් කිරීම් කරන්න අපි බලාපොරොත්තු වනවා.

ගරු සභාපතිතුමනි, මෙවර අය වැය යෝජනා මොනවාද කියා අපි බලමු. මෙවර අය වැය යෝජනා තුළින් විද්‍යාගාර උපකරණ හා ලී බඩු ගැනීම වෙනුවෙන් තවත් රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා. ඊට අමතරව දිවයිනේ පාසල් 1,000ක් සඳහා මූලික පහසුකම් වන ජලය, විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් දැනටමත් රුපියල් මිලියන 3000ක් වෙන් කර තිබෙනවා. ඒ සඳහා මේ වතාවේ තවත් රුපියල් මිලියන 2,000ක් වෙන් කරනවා. දැන් සමහර අය අහනවා, මේවා ප්‍රමාද වන්නේ ඇයි කියලා. ඇත්ත වශයෙන්ම මෙවැනි ඉදි කිරීම් කළේ කවදාද? ගිය වතාවේ අය වැයෙන් ප්‍රාග්ධන වියදම් කියලා රුපියල් බිලියන 15ක් වැනි සොච්චමක් දුන්නා. ඒකත් කෑලි කෑලිවලට කැපුවා. මෙතරම් වැඩ විෂයයන් ප්‍රමාණයක් තිබුණේ කවදාද? වැඩ විෂයයන් දසදහස් ගණන් ලංකාවේම ක්‍රියාත්මක වෙද්දී ටෙන්ඩර් කැඳෙව්වත්, ටෙන්ඩර් ඉල්ලුම් කරන්නත් කවුරුවත් නැහැ. ඉදිකිරීම්කරුවන් කියන්නේ ඔවුන්ට වැඩ වැඩියි, ඇති වෙන්න වැඩ තිබෙනවාය කියලායි. ඒ නිසා දැන් අපි තීරණය කර තිබෙනවා, මේ කටයුතු ටික ඉවර කරන කල් වෙනත් පැත්තකට යොමු වෙන්න. ඒ අනුව තමයි අපි තීරණය කළේ අලුතින් මෙවැනි කටයුතු කරන්න.

සාමාන්‍ය පෙළ පන්තිවලින් උසස් පෙළ පන්තිවලට යන සිසුන් 1,75,000කට අපි Tab පරිගණක යන්ත්‍ර දෙනවා. මා හිතන හැටියට මේක විප්ලවීය වෙනසක්. පරිගණක යන්ත්‍ර දෙන එක ගැන එක එක කථා කියනවා. අපි ඒවා හරියාකාරව හදන්නම්, අනවශ්‍ය ඒවා block කරලා software එක හදන්නම්. ඒ සම්බන්ධයෙන් අපි විශේෂඥ කමිටු පත්කර තිබෙනවා. ලේකම්තුමා ඇතුළු නිලධාරි මණ්ඩලය වැඩ කරනවා. අපි ඒක ලස්සණට design කරලා, සියල්ලම කරලා, දරුවන්ට ප්‍රයෝජන ගන්න පුළුවන් විධියට, අවුරුදු 50ක ඉදිරි අනාගතයට ප්‍රයෝජනයක් ගන්න පුළුවන් විධියට ඒ Tab හදලා, අපි ඒ Tab පරිගණක ඒ සිසුන්ට ලබා දෙන්නම්. සිසුන් 1,75,000කට විතරක් නොවෙයි, ගුරුවරුන් 28,000කටත් අපි Tab පරිගණක ලබා දෙනවා. අද බලන්න, අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කළා. පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් මිල අඩු කළා.

ගරු සභාපතිතුමනි, අනික් වැදගත්ම කාරණය තමයි සෞඛ්‍ය රක්ෂණය. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඖෂධ වර්ගවල මිල සියයට 40කින් අඩු කර තිබෙනවා. දැන් දෙමවුපියන්ට තිබෙන බර මොකක්ද? දරුවන් අසනීප වුණාම, දරුවන් රෝහල්වලට ගෙන ගිහින් බෙත් හේත් ගන්න දෙමවුපියන්ට මිල මුදල් නැහැ. මේ සෞඛ්‍ය රක්ෂණය තුළින් දෙමවුපියන්ට අස්වැසිල්ලක් ලැබෙනවා. මේ රටේ අවුරුදු 5 සිට 19 දක්වා වයස් කාණ්ඩයේ පසුවන පාසල් සිසුන් ලක්ෂ 45කට රුපියල් ලක්ෂ දෙකක් වටිනා රක්ෂණ ආවරණයක් ලැබෙනවා. එතකොට දරුවන් පස්දෙනෙක් සිටින පවුලකට රුපියල් ලක්ෂ 10ක රක්ෂණාවරණ ලැබෙනවා. මෙම රක්ෂණ ආවරණය මඟින්,

රජයේ රෝහලකින් පමණක් නොවෙයි, පෞද්ගලික රෝහලකින් නේවාසික ප්‍රතිකාර ලබා ගත්තත් රුපියල් 1,00,000ක ගෙවීමක් කරනවා. බාහිර ප්‍රතිකාර සඳහා රුපියල් 10,000ක් ගෙවනවා.

ඒ විතරක් නොවෙයි. අපි ඒ සම්බන්ධයෙන් කමිටුවක් පත් කළා. තායිලන්තයේ හොඳ රක්ෂණ ක්‍රමයක් තිබෙනවා. ඒ කමිටුවෙන් තායිලන්තයේ රක්ෂණ ක්‍රමය ගැන අධ්‍යයනය කරලා බැලුවා. අපට ඉන්ෂුවරන්ස් එකක් තිබුණත්, මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් හැටියට අපි පෞද්ගලික රෝහලක නතර වෙලා එක දවසක් හිටියත්, මුළු දවසටම රුපියල් ලක්ෂ දෙකක බිලක් හදනවා.

ඇත්ත කථාව ඒක නේ. වෛද්‍යවරුන් සියලුදෙනාගේම නම් සඳහන් කරලා මුළු දවසටම බිල හදනවා. තායිලන්තයේ තිබෙනවා, එක එක රෝග වර්ගවලට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් සඳහන් කරලා. උදාහරණයක් වශයෙන්, appendicitis නම් ඒ සඳහා ගෙවිය යුතු මුදල -අපි හිතමු, මුදල් ඒකකය රුපියල් කියලා- රුපියල් 500 නම්, එයට ගෙවන්න පුළුවන් රුපියල් 500යි. ඊට වැඩි මුදලක් රක්ෂණයෙන් කපා ගන්න බැහැ. සියලුම රෝග, විශේෂඥ කමිටුවක් මඟින් හඳුනාගෙන, ඒ දෙන රක්ෂණයෙන් උපරිම ප්‍රයෝජන ගෙන ඒ රක්ෂණය තුළින් දරුවන්ට නියම ඵල ප්‍රයෝජන ගන්න පුළුවන් විධියට ඒ රක්ෂණය ලබාදෙන්න අපි බලාපොරොත්තු වෙනවා. මා කලින් කිව්වා වාගේ දරුවන් පස්දෙනෙක් ඉන්න පවුලකට රුපියල් ලක්ෂ 10ක රක්ෂණ ලැබෙද්දී දෙමවුපියන්ට බෙහෙත් හේත්වලට යන වියදම කොපමණ අඩු වෙනවාද? මේ ගැන සතුටු වෙන්නේ නැත්තේ ඇයි ? මේ දිහා කුහකත්වයෙන් බලන්නේ ඇයි? මේ ගැන දේශපාලන මානසිකත්වයෙන් හිතන්නේ ඇයි? මා කියනවා, මේ රටේ ජනතාව බුද්ධිමත්ය කියලා.

ගරු සභාපතිතුමනි, "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය පළාත් සභාව නොවෙයි, කවුරු කළත්, ඒක අපේ ආණ්ඩුවේ අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත්, අධ්‍යාපන ඇමති වශයෙන් මමත් එකතු වෙලා තමයි මේ ව්‍යාපෘතිය ගෙනාවේ. අපි තමයි මේ ව්‍යාපෘතිය හැදුවේ. කවුරු කළත් මේ ව්‍යාපෘතිය එකින් එක පරීක්ෂා කළේ අපේ රේඛීය අමාත්‍යාංශයයි. එකින් එක පරීක්ෂණ කරලා අධීක්ෂණය කරන්නේ මේ නව රජයේ රේඛීය අමාත්‍යාංශයයි. ඒක කාටවත් අයිති නැහැ. ඒක අපි සියලුදෙනාටම අයිති වන එකක්. ඒක අපට වැඩක් නැහැ. නමුත් කවදා හෝ ඒකේ ප්‍රතිඵලය ගමට යද්දී ගමේ ජනතාව දැනගන්නවා, මේක අලුත් ආණ්ඩුවේ අපි ගත්ත හොඳ සාධනීය ක්‍රියාමාර්ගයක්ය කියලා.

ගරු සභාපතිතුමනි, ඊට අමතරව මා කිව්වා, පාසල් 3,500ක් සඳහා rent එකට පරිගණක ලබා ගැනීමට යෝජනා කර තිබෙනවාය කියලා. අපි පරිගණක 50ක් එක පාසලකට දෙනවා. ඒවා හැම දාම කැඩෙනවා නේ. කොම්පැනි පොහොසත් වෙන්න ඒවා කඩනවා නේ. පරිගණක 50 ගණනේ පාසල් 3,500කට දුන්නාම මොකද වෙන්නේ? පරිගණක කැඩුණාද, අරක වුණාද, මේක වුණාද, connectionවලට මොනවා වුණාද කියන එක සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ට හෝ කාටවත් පරිපාලන ප්‍රශ්න නැහැ. පරිගණක සපයන්නා තමයි ඒ සියල්ල ගැනම බලා ගන්න ඕනෑ. අපි මාසිකව rent එක ගෙවනවා විතරයි. එතකොට මොකද වෙන්නේ? තවත් රැකියා උත්පාදනය වෙනවා. තවත් කෙනෙකුට පුළුවන්, computers 50ක් දමලා ඒකෙන් හම්බ කර ගන්න.

නිල ඇඳුම් සඳහා ලබා දුන් වවුචර් එක සම්බන්ධයෙනුත් ඒක නේ වුණේ. එදා දේශපාලකයන් කිහිපදෙනෙක් හම්බ කර ගත්තා, නිලධාරීන් කිහිපදෙනෙක් හම්බ කර ගත්තා, ව්‍යාපාරිකයින් කිහිපදෙනෙක් හම්බ කර ගත්තා වෙන්න පුළුවන්. අද මොකක්ද වෙන්නේ? අද ලක්ෂ 45ක් වෙළෙඳ පොළට ගිහින් වෙළෙඳ පොළෙන් රෙදි මිල දී ගන්නවා. එතකොට තරගයක් ඇති වෙනවා, මිල අඩු වෙනවා, හොඳ quality එකේ රෙදි මිල දී ගන්නවා. බලන්න, මේ ගැන පොඩ්ඩට හිතුවාට, macro level එකෙන් ගත්තාම මේකේ තිබෙන output එක වැඩියි. ඒ නිසා අපි මේ හැම එකක්ම කළේ හොඳින් හිතා බලලයි. පාසල් 3,500කට කුලී පදනම මත පරිගණක ලබා ගැනීමත් එහෙමයි.

ගරු සභාපතිතුමනි, විවිධ දක්ෂකම් තිබෙන අය, විවිධ සොයා ගැනීම් කරපු අය, ක්‍රීඩා අංශයේ අතිවිශිෂ්ටයින්, කලා අංශයේ අය අපි මුණ ගැහෙන්න අමාත්‍යාංශයට එනවා. උදාහරණයක් වශයෙන් අමරදේවයන් ගනිමු. එතුමාට එතැනට එන්න උදවු කළේ ජනතාව නේ. ජනතාව නේ එතුමා නඩත්තු කරලා තිබෙන්නේ.

මේ වාගේ විශිෂ්ටයන් අපි ළඟට එනවා. මේ වාගේ විශිෂ්ටයන් ආවාම අපට දෙන්නට දෙයක් නැහැ. දෙන්න ශිෂ්‍යත්වයක් නැහැ; අරමුදලක් නැහැ. අපි මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කළා, මේ වාගේ විශිෂ්ටයන්ට ශිෂ්‍යත්වයක් ලබා දෙන්න මුදල් ලබා දෙන්න කියලා.

මම ස්තුතිවන්ත වෙනවා ගරු රවි කරුණානායක ඇමතිතුමාට. එතුමා අපිට ඒ මුදල් ලබා දුන්නා. විවිධ ක්ෂේත්‍රවල විශිෂ්ට ළමුන් දහසකට මාසිකව රුපියල් 2,500 ගණනේ ලබා දෙන්නට තීරණය කරලා, ඒ සඳහා නිර්ණායක හදලා ඉදිරි කාලයේදී "සුබග" නමින් ශිෂ්‍යත්වයක් හඳුන්වා දීමට අපි කටයුතු කරනවා. මම දන්නවා, ඉදිරියේදී මේ ශිෂ්‍යත්වය මහපොළ ශිෂ්‍යත්වයටත් වඩා ජනප්‍රිය වෙයි කියලා. අති විශිෂ්ටයන්ට, -gifted children - තමයි මේ මුදල් ප්‍රතිපාදනය ලැබෙන්නේ ගරු සභාපතිතුමනි.

අපට පුළුවන්වෙලා තිබෙනවා, විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ දෛනික දීමනාව රුපියල් 50 සිට රුපියල් 150 දක්වා වැඩි කරන්නට. අපේ සමහර වැය ශීර්ෂ වෙන වෙන අමාත්‍යාංශවලටත් ගිහින් තිබෙනවා. පාසල් ක්‍රීඩා දියුණු කරන්න, පාසල් ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරන්න මුදල් වෙන් කරලා තිබෙනවා. වෙන වෙන අමාත්‍යාංශ හරහා ආවාට ඒවාත් අපේ පාසල්වලට එන සම්පත්; පාසල් දරුවන්ට එන සම්පත්. මේ සියලු දේවල් ක්‍රියාත්මක වුණාම අපට අධ්‍යාපනයේ විශාල වෙනසක් කරන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, මට කථා කරන්න තව විනාඩි ගණනයි තිබෙන්නේ. අධ්‍යාපනය ගැන විතරක් නොවෙයි මම සඳහන් කළ යුතු වන්නේ. මගේ අමාත්‍යාංශය යටතේ තවත් ආයතන ගණනාවක් තිබෙනවා. අපේ සංස්කෘතික උරුමයන් ගැනත් මම සඳහන් කළ යුතුව තිබෙනවා. පසු ගිය කාලයේ "අපේ ගම" ආයතනය යම් යම් කඩාවැටීම්වලට ලක් වෙලා තිබුණා. මධ්‍යම සංස්කෘතික අරමුදල ඒක අරගෙන, නවීකරණය කරලා, විදේශීය සංචාරකයන්ට අපේ සංස්කෘතිය ගැන ආකර්ෂණයක් ඇති වෙන විධියට අපේ ගම නඩත්තු කරගෙන යනවා. ඒ විතරක් නොවෙයි, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයෙන්, -ගරු රිෂාඩ් බදියුදීන් අමාත්‍යතුමාගෙන්- ලබා ගත් ණය සහ හිඟ ලෙස තිබෙන රුපියල් මිලියන 220ක මුදල, අපේ ආදායම වැඩි කරගෙන පියවරින් පියවර ගෙවීමටත් අපි භාර අරගෙන තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා යෝජනා කළා, අමරදේව මැතිතුමා වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් ආරම්භ කරමු කියලා. පසුගිය කාලයේ මධ්‍යම සංස්කෘතික අරමුදල හොර ගුහාවක් වෙලා තිබුණා. ඒකේ කොමිස් ගැහිලි, හොරකම් කෙරිලි විශාල වශයෙන් තිබුණා. අපි මේ වන විට මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආදායම විශාල වශයෙන් වැඩි කරලා තිබෙනවා. අපි ඒ

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

සඳහා ක්‍රමවේද හදලා තිබෙනවා. විශේෂයෙන්ම විද්‍යුත් ප්‍රවේශ දොරටු හඳුන්වාදීමට කටයුතු කරමින් යනවා. මේ වන විට සීගිරියේ ATM යන්ත්‍රයක් සවි කරලා තිබෙනවා. පොළොන්නරුව පූජා නගරයේ සංරක්ෂණ කටයුතු විධිමත් කිරීමට මෙන්ම, පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීමටත් අපි කටයුතු කරලා තිබෙනවා. මධ්‍යම සංස්කෘතික අරමුදල හරහා මෙවැනි බොහෝ දේවල් කරන්නට අපි මේ වන විට කටයුතු කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ සීගිරියේ බිතු සිතුවම්වල ප්‍රශ්න තිබුණා. පසුගිය රජය මේවාට අත ගහලා තිබුණේ නැහැ. සීගිරිය ලෝක උරුමයක්. සීගිරිය නැරඹීමට සංචාරකයන් කොච්චර එනවාද? අපි විදේශීය විශේෂඥයන් ගෙනැල්ලා විධිමත් ක්‍රම හදලා, දැන් ඒ ස්ථාන ආරක්ෂා කරන්නට, සංරක්ෂණය කරන්නට අවශ්‍ය පියවර ගනිමින් සිටිනවාය කියන කාරණයත් මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ගැනත් යමක් කියන්නට ඕනෑ. මෙහි විධායක ශ්‍රේණියේ නිලධාරීන් බඳවා ගැනීම වසර ගණනාවකින් සිදු වෙලා නැහැ. ඒ සඳහා ක්‍රමවේදයක් තිබුණේ නැහැ. දැන් අපි ඒ බඳවා ගැනීම් පටිපාටි හදලා අවසන් කරලා තිබෙනවා. ඉදිරියේදී එය අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

පසුගිය දිනක අතිගරු ජනාධිපතිතුමාත් මේ සම්බන්ධයෙන් කිව්වා. අපේ රටේ තිබෙන ඉතාම වටිනා ලේඛන සියල්ලම ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව හරහා digitalize කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. මේ සඳහා අවශ්‍ය අතිනවීන උපකරණ මිලදී ගන්නට අපි Cabinet Paper එකක් දානවා.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතට වැටෙන නීලගිරි සෑය, දීඝවාපි දාගැබ, යුදගනාව දාගැබ සහ තිවංක පිළිමගෙය සංරක්ෂණ ව්‍යාපෘති සම්බන්ධයෙන් අපි ප්‍රධාන වශයෙන් කටයුතු කරලා තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ අපි කිරීමට බලාපොරොත්තු වන සියලුම වැඩ ගැන මට ලැබී ඇති කෙටි කාලය තුළ කියන්න බැහැ.

ප්‍රසිද්ධ රූගත පාලක මණ්ඩලය ගැනත් යමක් කිව යුතුයි. එහි ඩිජිටල් ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් ස්ථාපනය කොට කුඩා සිනමා ශාලාව නවීකරණය කිරීමට අපි පියවර ගෙන තිබෙනවා. ඒ වාගේම, මේ වසරේ අලුත් ගොඩනැඟිල්ලක් ඉදි කිරීම සඳහාත් අපට මුදල් වෙන් කරලා තිබෙනවා.

ටවර් හෝල් රඟහල පදනම අයත් වෙන්නේත් මගේ අමාත්‍යාංශය යටතටයි. "මනමේ" නාට්‍ය සහ "රේඛාව" චිත්‍රපටයට 60 වසරක් පිරීම නිමිත්තෙන් ටවර් හෝල් රඟහල පදනමේ සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන පැවැත්වීමට විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වාගේම, නවීකරණය කරන ලද රුක්මණීදේවි රඟහල විවෘත කිරීමට කටයුතු කරලා තිබෙනවා. ටවර් හෝල් රඟහල පදනමේ, ජනකලා කේන්ද්‍රයේ, සෞන්දර්යය හා නාට්‍ය කලා පාඨමාලා පැවැත්වීමට අපි කටයුතු කරලා තිබෙනවා. මේ අනුව, ටවර් හෝල් රඟහල පදනම දෙවර්ෂ පූර්ණ කාලීන නාට්‍ය හා රංග කලා ඩිප්ලෝමා පාඨමාලා සඳහා සිසුන් 40ක්ද, ජනකලා කේන්ද්‍රය, නර්තන, සංගීත, චිත්‍ර සහ මූර්ති පාඨමාලා සඳහා සිසුන් 76ක්ද බඳවා ගැනීමට කටයුතු කරලා තිබෙනවා.

ශ්‍රී ලංකා කලා මණ්ඩලය අනු මණ්ඩල සමඟ දෘශ්‍ය කලා, නර්තන, සංගීත, අස්පර්ශ උරුම සාහිත්‍ය යන අංශවල කටයුතු ප්‍රමිතිකරණය සඳහා කටයුතු කරලා තිබෙනවා.

මේ විධියට අපඅ බොහෝ වැඩ කටයුතු කර තිබෙනවා, ගරු සභාපතිතුමනි. අධ්‍යාපනය විධිමත් කරන්න, අධ්‍යාපනය ගුණාත්මකව වර්ධනය කරන්න අපි කටයුතු කර තිබෙනවා. අපි කවදාවත් අධ්‍යාපන ප්‍රතිඵල වෙනස් කරන්නේ නැහැ. ඉස්සර වාගේ ලකුණු අඩු කරලා විභාග පාස් කරන ක්‍රමයක් අපේ නැහැ.

ඊළඟට, විභාග දෙපාර්තමේන්තුව ගැනත් මම කියන්න ඕනෑ. ඉස්සර විභාග දෙපාර්තමේන්තුව ගැන නොයෙක් කථා කිව්වා. මේ සභා ගැබේදී දී අපි ඒවා කොයි තරම් විවේචනය කරලා තිබෙනවා ද? නමුත්, පසු ගිය අවුරුදු දෙක තුළ ඒ වාගේ කිසිම බරපතළ ප්‍රශ්නයක් ආවේ නැහැ. ඒ සියලු කටයුතු අපි විධිමත් කර තිබෙනවා. ගැටලු විසඳලා, ඒ දේවල්වලට අපි නිසි ලෙස දේශපාලන නායකත්වය දුන්නා. ඉතිහාසයේ වුණේ, වැරදි කළා නම්, අඩු පාඩුවක් වුණා නම් ඒවා සම්බන්ධයෙන් තීන්දු තීරණ ගත්තේ නැති එක. නමුත් අපි ඒ හැම ප්‍රශ්නයකටම තීන්දු තීරණ අරගෙන, කොමසාරිස්වරයා යටතේ අද ඒදෙපාර්තමේන්තුව විධිමත් කරන්න කටයුතු කර තිබෙනවා. විභාග දෙපාර්තමේන්තුවත් digitalize කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, අතිරේක ලේකම්වරු, කොමසාරිස්වරු ඇතුළු අපේ අමාත්‍යාංශයේ සිටින සියලුම නිලධාරීන් බොහොම අවංකව, කැපවීමෙන් සහ පුළුවන් උපරිම ශක්තියෙන් වැඩ කරනවා. එතුමන්ලා සියලුදෙනාටම විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා.

"126 වන ශීර්ෂයෙහි 01වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.1,525,004,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 01වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන -මූලධන වියදම, රු.731,250,000

"126 වන ශීර්ෂයෙහි 01වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.2,731 50,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 01වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන -පුනරාවර්තන වියදම, රු. 30,580,455,000

"126 වන ශීර්ෂයෙහි 02වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 30,580,455,000, ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 02වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන -මූලධන වියදම, රු.38,794,000,000

"126 වන ශීර්ෂයෙහි 02වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.38,794,000,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 02වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**207 වන ශීර්ෂය.- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 132,065,000

"207 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 132,065,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

207 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු.7,500,000

"207 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 7,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

207 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 725,366,000

"207 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 725,366,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

207 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 58,600,000

"207 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 58,600,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

207 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**209 වන ශීර්ෂය.- ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 51,545,000

"209 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 51,545,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

209 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු.14,700,000

"209 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 14,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

209 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 59,674,000

"209 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 59,674,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

209 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු.233,100,000

"209 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 233,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

209 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**212 වන ශීර්ෂය.- විභාග දෙපාර්තමේන්තුව**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 3,112,245,000

"212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 3,112,245,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු.778,000,000

"212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 778,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**213 වන ශීර්ෂය.- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 56,715,000

"213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු. 56,715,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 83,500,000

"213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු. 83,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,525,004,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01 .- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 731,250,000

"தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 731,250,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02 .- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 30,580,455,000

"தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 30,580,455,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02 .-அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 38,794,000,000

"தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 38,794,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச்செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 207.- தொல்பொருள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01 .- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 132,065,000

"தலைப்பு 207, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 132,065,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 207, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01 .- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 7,500,000

"தலைப்பு 207, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 7,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 207, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02 .- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 725,366,000

"தலைப்பு 207, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 725,366,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 207, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02 .- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 58,600,000

"தலைப்பு 207, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 58,600,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 207, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 209.- தேசிய சுவடிக்காப்புத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01 .- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 51,545,000

